# 2019.04.02 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | ගරුසභාපති |
| කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රිනි |
| දිනයාදූර ධර්මදාස මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ලලිත් ධම්මික කොඩිකාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්. එම්. ලසන්ත අජිත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩෙනට් පනියන්දුවගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ අතුල ප්‍රියන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී. ජී. ආර්. පේෂලා කුමාරි මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රිනි |
| එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රිනි |
| එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්. එම්. නිලානි මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රිනි |
| ධනසේන මාදුවගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රිනි |

☸ පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ.ව. **9.30** රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී☸

**(01)**

**01.01** **2019 – 03 – 05 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම**

**2019-03-05** දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී දිනායාදූර ධර්මදාස මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ ඒ අනුව **2019- 03- 05** දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(02)** සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන නැත

**(03)** ලැබී ඇති පැමිණිලි ,පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**03.01 පදිංචි ඉඩම්වලට ප්‍රවේශ මාර්ගයක් ලබා ගැනීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ , පිරිස් වෙද මාවතේ ( විද්‍යාල මාවත ) පදිංචි නිවාස වලට ප්‍රවේශ වීමට මාර්ගයක් ලබා ගැනිම සඳහා. මේ කියන ප්‍රවේශය මාර්ගය වන්නේ නිතිඥ රෝනි මහත්මියගේ නිවස අසළින් කන්දේගොඩ නිවසට සම්බන්ධවන මාර්ගයක් තිබෙනවා. එම මාර්ගයේ අප බලප්‍රදේශයට ඡන්දය පාවිච්චි කරන ඡන්ද දායකයින් හතර දෙනෙකු සිටිනවා. අපට ඡන්දය දෙනු ලබන . එම කන්දෙගොඩ මාර්ගය හා මෙම මාර්ගයයි සම්බන්ධ කරන ලෙස තමයි ඔවුන් ඉල්ලා සිටින්නේ. මෙම ලිපියෙන් කියවෙනුයේ ඉහත සඳහන් මැයෙන් බොහෝ කලකට පෙර , එනම් 1998.11.19 දාතමින් ඔබ තුමන් වෙත එවන ලද ලිපියක පිටපතක් මේ සමඟ එවමි. බලපිටිය දිසා අධිකරණය මඟින්ද එහි අඩි 10 ක පාරක් ඇති බව තීන්දු කර ඇත්තේය. මේ සමඟ එන බලපිටිය දිසා අධිකරණයේ අංක ඉඩම් 2869 දරණ නඩුවට අදාල පිඹුරේ කැබලි අංක C යටතේ එකී මාර්ගය දක්වා තිබේ. එම කරුණු සලකා බලා එකී මාර්ගය නගර සභාව වෙත පවරාගෙන එම මාර්ගය සකස් කර දෙන ලෙස විමසේන ගොඩගේ මහතා විසින් ඉල්ලීමක් කර ඇත. මීට කලින් 1998 .11.19 වන දින ලිපිය අත්සන් කර ඇත්තේ රූපිසිරි ජසෙන්තුලියන, කේ ඇල් සුමණදාස ,අයි.ජී.එස්.ඩබ්.රවින්ද්‍ර කියන මහතුන් විසිනි. මීට ඉහත අපගේ හිටපු නගරික මන්ත්‍රි අනුර කිත්සිරි ලියනගේ මහතා විසින් ඉල්ලීමක් කළා මෙය සම්බන්ධ කරන ලෙසට. මෙය සම්බන්ධ කිරිමේදි මෙම මාර්ගයේ අන්තිම කෙළවරේ සිටින්නේ පෙරේරා කියා මහත්මයෙකි. ඒ අයගේ විරෝධතා නිසා මෙය කිරිමට නොහැකි වී තිබෙනවා. මෙම මාර්ගයක් අධිකරණයෙන් ලබා දුන්නාත් භෞතික පොළෙවේ නැත. පොළොවේ තිබෙනවා නම් අපට මෙය සදා දිය හැකිය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පලමුවෙන්ම නව ලේකම්තුමිය ගරු සභාවට ඉතා සාදරයෙන් පිළි ගන්නවා. මෙම යෝජනාව සම්බන්ධයෙන් මා දැනුවත් වි නැහැ. මීට පෙර මෙම මහත්ම මහත්මින් කිහිප විටක්ම මා සමඟ මේ පිළිබදව සාකච්ඡා කර තිබෙනවා. මා අපගේ තාක්ෂණසේවා නිලධාරි මහතුන් සමඟ ස්ථාන පරික්ෂාවට ගියා. එහිදි එම විරෝධතාවය දක්වන ලද පුද්ගලයා විශාල විරෝධතාවයක් දැක්වුවා.එහිදි අප පවසා සිටියා ඔවුන්ගේ කැමැත්ත නැතිව මෙම කටයුත්ත කිරිමට කිසිම අදහසක් නැති බව . එහිදි ඔහු විසින් ඉදිරිපත් කළා . මෙහි බෙදුම් නඩුවක් තිබෙනවා. මෙය නොකර ඉන්නවා නම් හොඳයි කියා. බෙදුම් නඩුවක් තිබෙන තැනක අපට කෙසේවත් මාර්ගයක් ලබා දිය නොහැක. නමුත් මේ වන විට එය විසඳි ඇති බව තමයි ඔය ඉල්ලුම්කරු විසින් කියා සිටින්නේ. මේ පිළිබඳව අපක්ෂපාති පරික්ෂණයක් පවත්වා නිලධාරින් යොදවා එම නිවැසියන්ගෙන් සම්පූර්ණ කැමැත්ත අකමැත්ත විමසා බලන්න. මෙම සම්බන්ධ කිරිමට ඉතාමත් වටිනවා. මොකද කන්දෙගොඩ සිට මාර්ගය එතැනින් අවසන් වෙනවා.

මෙම ප්‍රධාන විරුද්ධකරු සිතනවා මෙය එහා පැත්තේ ඇති ඉඩමකට මාර්ගය ලබා ගන්න තමයි මෙම පොදු මාර්ගය සාදන්නේ කියා. එම ඉඩම් කට්ටි වෙලත් ඉවරයි. නමුත් එම ඉඩම් කට්ටිය අයිති කන්දෙගොඩ ප්‍රදේශයට. අපට නෙමේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙම මාර්ගයේ අපට ඡන්දය දෙනු ලබන ඡන්ද දායකයින් 4කු සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

අපට ඡන්දය දෙනු ලබන ඡන්ද දායකයින් 4කු සිටිනවා. තිලකසිරි මහතාලා බදු පදනම මත සිටින එම මහතා හැර අන්තිම කොනේ සිටින නිවාස 4 . අනෙක් නිවැසියන්ටත් ඉතා ප්‍රයෝජනවත් වෙනවා. එක් පැත්තකින් . අනෙක් සියළුම ජනතාවට අම්බලන්ගොඩයි කන්දෙගොඩයි  කිරිමේ මාවතක් වෙනවා. මොන පහසුකම් තිබුණත් මේ ගමේ ජනතාවගේ විරෝධතාවය මත අපට මෙය කිරිමට හැකියාවක් නැහැ. මේ වන විට ගමේ ජනතාවගේ කැමැත්ත තිබෙනවාද කියා මා දන්නේ නැහැ. නමුත් අපගේ නිලධාරින් මේ සඳහා යොමු කර වාර්තාවක් ලබා ගෙන මෙය කිරිමට සුදුසු බව මා හිතනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නමුත් අපට ඡන්දය දෙනු ලබන ඡන්ද දායකයින් 4 කුගේ නිවෙස් මෙම කන්දෙගොඩ ප්‍රදේශයේ තිබෙනවා. ඔවුන්ට මෙම නිවෙස් වලට ප්‍ර වේශ මාර්ගය දැනට පවතින්නේ කන්දෙගොඩ ප්‍රදේශයෙන් . අම්බලන්ගොඩ ප්‍රදේශයෙන් නෙමේ. නමුත් මෙම ඉල්ලිම කරනු ලබන්නේ මේ 4 නා විසින්. ඔවුන්ට රේල්පාර අයිනෙන් ප්‍රවේශ මාර්ගයක් තිබෙනවා. මෙය ඡන්ද පොත විශ්ලේෂණය කරනු ලැබුවොත් හැර සමහරුන් සිතන්නේ මෙය බලපිටිය ප්‍රදේශයට අයිති බවයි. නමුත් මේ අය ඡන්දය දෙනු ලබන්නේ අම්බලන්ගොඩ නගර සභාවට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා කතා කරනු ලබන්නේ ඔවුන් 4 නා ගැන පමණක් නෙමේ. අවංකම පොදු මාර්ගයක් පිළිබඳවයි. එම 4ට මාර්ගය කොහොමත් තිබෙනවා කන්දෙගොඩ පැත්තෙන්. ඇත්තටම මෙම මාර්ගය සම්බන්ධ වුවහොත් විද්‍යාල මාවත  සම්බන්ධ වුවහොත් කළුවඩුමුල්ල, කන්දෙගොඩ සිට බොගහවත්ත ආදි ප්‍රදේශවල සියළුම පාසල් දරුවන්ට මෙය මාවතක් වනවා පාසල් නිමවි ඉක්මනින් නිවෙස් වලට යා ගැනීම සඳහා . අනෙක් කරුණ වාහන තද බදය ඇති අවස්ථාවක අම්බලන්ගොඩ නගරයේ මෙය අතුරු මාර්ගයක් වෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව තාක්ෂණසේවා නිලධාරි මහතුන් විසින් ගොස් පරික්ෂා කර බලා වාර්තාවක් ලබා දෙන්න.

**තීරණය**

පිරිස් වෙද මාවතේ පදංචි කරුවන් පිරිසක් විසින් ඉදිරිපත් කරන ලද පදිංචි ඉඩමට ප්‍රවේශ මාර්ගයක් ලබා ගැනීම සම්බන්ධව ඉදිරිපත් කරන ලිපිය සඳහා තාක්ෂණසේවා නිලධාරින් මහතුන් ලවා පරික්ෂා කර වාර්තාවක් ලබා ගැනීම  සුදුසු බවට  ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව  ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින්  සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

03.02 අම්බලන්ගොඩ ක්‍රීඩා හා පාපැදි සමාජය මඟින් පවත්වනු ලබන පාපැදි තරඟාවලිය පැවැත්වීම **සඳහා ලංකා බැංකුව අසළ භූමිය සහ කොඩි කණු 10ක් 2019.03.23 දින නොමිලේ ලබා දීම සම්බන්ධයෙන් සහා අනුමතියට යටත්ව ලිපිය සභාගත කරන ලදි**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ ක්‍රීඩා සමාජය විසින් තුන්වන වරටත් පවත්වනු ලබන පාපැදි හා තරඟාවලිය සඳහා ලංකා බැංකුව අසළ භූමිය සහ කොඩි කණු 10ක් 2019.03.23 දින නොමිලේ ලබා දෙන ලෙස අම්බලන්ගොඩ ,පනියන්දුව, පාපැදි සංගමයේ ලේකම් ඩබ්.දිපානන්ද මහතා විසින් කරන ලද ඉල්ලීම සභා අනුමතියට යටත්ව එය ලබා දි ඇත. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ ක්‍රීඩා හා පාපැදි සමාජය මඟින් පවත්වනු ලබන පාපැදි තරඟාවලිය පැවැත්වීම සඳහා ලංකා බැංකුව අසළ භූමිය සහ කොඩි කණු 10ක් 2019.03.23 දින සභා අනුමතියට යටත්ව නොමිලේ ලබා දිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.03 පෝරඹ , අම්බලන්ගොඩ පහත අංක හා නම් සඳහන් පදිංචිකරුවන් විසින් නිවෙස් වලට ප්‍රවේශ මාර්ගය පිළිසකර කර සංවර්ධනය කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**150/1- ආර්.එම්.එස්.නලින්ද මහතා**

**150/2- රුවන් ධර්මරත්න**

**150/3- ටී.මහින්ද ලාල්**

**150/3A - ටී.එන්.එන්. ද සිල්වා**

**150/3B - ගිනිගේ කෝකිලා**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

පෝරඹ , අම්බලන්ගොඩ පහත අංක හා නම් සඳහන් පදිංචිකරුවන් විසින් නිවෙස් වලට ප්‍රවේශ මාර්ගය පිළිසකර කර සංවර්ධනය කිරිම සඳහා නගර සභාවට පවරා දෙන බවට 150/1- ආර්.එම්.එස්.නලින්ද මහතා , 150/2- රුවන් ධර්මරත්න , 150/3- ටී.මහින්ද ලාල්, 150/3A- එන්.එන්. ද සිල්වා, 150/3B - ගිනිගේ කෝකිලා යන අය විසින් ඉල්ලීමක් කර ඇත.

<u>**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**</u>

හිටපු නගර සභා මන්ත්‍රී මහින්ද මහතාගේ නිවස එහා පැත්තෙන් යාමට ඇති සිංහ ක්‍රීඩාංගනය අසළ මාර්ගය.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේ කියන ලද මාර්ගය වන්නේ පි.කේ. සිල්වා මහතාගේ නිවස අසළ යි. මෙහි කැමැත්ත ප්‍රකාශ කරන ලිපි ලේඛණ ( පැවරුම් නියෝග ) අත්සන් කර ගරු මන්ත්‍රිතුමා ඉදිරිපත් කරන්න. ඉන්පසු එය සාදා දෙන්නම්.

ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි , එම ලිපිය ඉදිරිපත් කළා. දැන් සුමාන දෙකකට කලින් ගෙනත් දුන්නා.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

එම ලිපි ගොණුවක් සමඟ සභාවට ඉදිරිපත් කරන්න. මෙම 4 සමඟ නඩුවකුත් තියෙනවා. බලන්න මේ සඳහා කැමැත්තක් තිබෙනවා ද කියා. සභාවේ තිබෙනවා පැවරුම් නියෝග ඒවා ගෙනගොස් පුරවා ගෙනත් භාර දෙන්න.

**තීරණය**

අම්බලන්ගොඩ , පෝරඹ පහත අංක හා නම් සඳහන් පදිංචිකරුවන් විසින් නිවෙස් වලට ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා එම නිවැසියන්ගෙන් පැවරුම් නියෝග ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

150/1- ආර්.එම්.එස්.නලින්ද මහතා

150/2- රුවන් ධර්මරත්න

150/3- ටී.මහින්ද ලාල්

150/3A - ටී.එන්.එන්. ද සිල්වා

150/3B - ගිනිගේ කෝකිලා

**03.04 නිරෝගී බව සහ යහපැවැත්ම සඳහා වගකීමෙන් යුතු නිෂ්පාදනය හා පරිභෝජනය සඳහා නාගරික ජනතාව යොමු කිරීම සඳහා වන ව්‍යාපෘතිය සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

නීරෝගී බව සහ යහපැවැත්ම සඳහා වගකීමෙන් යුතු නිෂ්පාදනය හා පරිභෝජනය සඳහා නාගරික ජනතාව යොමු කිරීම සඳහා වන ව්‍යාපෘතිය . ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය විසින් ලිපියක් ඉදිරිපත් කර ඇත. උක්ත අරමුණින් පොල්වත්ත ග්‍රාම නිලධාරි වසමේ තෝරා ගන්නා ලද පවුල් 35 ක් සඳහා නිර්පාංශු ගෙවතු වගාවට අවශ්‍ය පහසුකම් සලසා දෙමින් , ගෙවතු වගාව දිරිමත් කිරීමටත් , නගර සභා බල ප්‍රදේශයේ බැහැරකරන කැළිකසළ ප්‍රමාණය අඩුකර ගෘහස්ථ කසළ කළමනාකරණය දිරිමත් කිරීම වැනි පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට කෘෂිකර්ම උපදේශකතුමියගේ සහයෝගය ඇතිව 86-පොල්වත්ත ග්‍රාම නිලධාරි වසමේ ආර්ථික සංවර්ධන නිලධාරි ගම්භීර කුලසේන මහතා විසින් සකස් කරන ලද ව්‍යාපෘති වාර්තාව ඉදිරි කටයුතු කිරීමට නිර්දේශය සහ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. මෙම ව්‍යාපෘතිය හඳුන්වා දීමේ වැඩ සටහන වි ඇත්තේ කැළි කසළ බැහැර කරළිම සහ ඒ තුලින් ආර්ථිකය නංවාලීමයි. එම ගමේ සිටින ජනතාව දිරිමත් කිරීමට මෙම කටයුත්ත කළ යුතුයි. මෙම කටයුත්ත සිදු කිරීමේදි යම්කිසි වියදමක් යනවා. මෙම කටයුත්තේදි ගෙවතු වගාව සඳහා කොම්පොස්ට් කිරීම , වෙනත් ආදේශක වගාවන් සමඟ තමයි මෙය සිදු කරනු ලබන්නේ. ඒ සඳහා අපට වියදම වශයෙන් රු.302200/= ක වියදමක් වැයවේ. මෙහි ඇත්තේ කොම්පොස්ට් පොහොර සෘජුහොම් පෙට්ටි සමඟ අල්බට් පොහොර වගාවන් වලට යොදා දිරිමත් කර ඒ සමඟ කොම්පෝස්ට් සාදා වගාවක් එම

ගමේ ඇති කිරිම සඳහායි. මෙම ආර්ථික සංවර්ධන නිලධාරි මහතා විසින් පොල්වත්ත කොට්ඨාශයේ මෙය කරන්න කැමතියි කියන 35කු ඔහු විසින් තෝරාගෙන තිබෙනවා. මෙම වැඩය හරිටටම කරන්න පුළුවන් පවුල් ප්‍රමාණයක් තමයි තෝරාගෙන ඇත්තේ. නිවෙස් වලට එතුමා ගොස් මේ පිළිබඳව නිවැරදිව තෝරාගෙන ඇත්තේ. එහිදි අප සෘජුපොම් පෙට්ටි මිලදි ගැනිම සඳහා රු.42000/= ක් පොලිතින් මිලදි ගැනිම සඳහා රු.21000/= ක් ගම් ටෙප් මිලදි ගැනිම සඳහා රු.21000/= ක් ඇල්බට් පොහොර මිලදි ගැනීම සඳහා රු.14750/=ක් කොප්ප මිලදි ගැනිම සඳහා රු.3500/=බීජ කොහුබත් දළුයියා මිලදි ගැනිම සඳහා රු.4000/= ක් කොම්පොස්ට් බඳුන් මිලදි ගැනිම සඳහා රු.160000/= ක මුදලක් ලබා යුතුයි. මෙය මුලින් පොල්වත්ත ග්‍රාමයෙන් පටන් ගෙන අනෙක් ප්‍රදේශවලටත් යොමු කළ යුතු හොඳ වැඩසටහනකි මෙය. එම පොල්වත්ත ග්‍රාමයේ ආර්ථික සංවර්ධන නිලධාරි මහතා තමයි මෙය ඉදිරිපත් කර තිබෙන්නේ. මුලින් මෙම කොට්ඨාශයේ මෙය ක්‍රියාත්මක කිරිමට ප්‍රමුඛතාවය ලබා දි අනෙකුත් ප්‍රදේශවලටත් ක්‍රියාත්මක කිරිමට පුළුවනි. මෙම ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරිමට අනුමතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , මෙම ආර්ථික නිලධාරියා මා දැක නැහැ. නමුත් මා අසා තිබෙනවා . රජයේ නිලධාරියෙක් ලෙස දැඩි කැපකිරිමෙන් හා උනන්දුවෙන් වැඩ කරන පුද්ගලයකු ලෙස . අද සෑම ගමකම ආර්ථික සංවර්ධන නිලධාරියෙක් සිටිනවා. මෙවැනි වැඩ සටහනක් සාදා ක්‍රියාත්මක කිරිමට හැකිනම් ඉතා හොඳයි. මෙහි පොඩි ගැටළුවකට ඇත්තේ මෙය 35කු අතර ක්‍රියාත්මක කිරිමයි.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ගරු මන්ත්‍රිතුමා මාත් මේ පිළිබඳව විමසුවා. ඔහු සඳහන් කරනු ලැබුවේ මෙය පොදුවේ හැම කෙනෙකුටම නැතිව මෙය නිසියාකරව හරියටම කරන පිරිසකට ලබා දිම සුදුසු බවයි. එවිට අනෙක් අය උනන්දු වෙන බව.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

පොල්වත්ත කියන්නේ විශාල ප්‍රදේශයකි. මේ ප්‍ර දේශයේ තෝරා ගනු ලැබු 35නා අතර හරියටම ක්‍රියාත්මක විය යුතුයි. මෙහිදි අපි එක් පුද්ගලයෙකුට රු.9000/= ක පමණ මුදලක් වැය කළ යුතුයි. මෙය අපගේ සෞඛ්‍ය අංශයේ සේවකයන් යොදවන වඩා මෙය හරියටටම ක්‍රියාත්මක වේ නම් ඉතා හොඳ වැඩසටහනකි. එහෙත් ක්‍රියාත්මක වීමේදි හරියටම ක්‍රියාත්මක වේද කියන්න අපි දන්නේ නැහැ. මෙම නිලධාරියා අප සභාව සතු නිලධාරියෙකු නොවේ. අප සභාවේ මුදල් මේ සඳහා යොදවා මෙය සාර්ථක නොවුණොත් එහෙම . මොහු ප්‍රා දේශිය ලේකම් කාර්යාලයට අයිති නිලධාරියෙකි. නමුත් මොහුගේ මෙම වැඩසටහන ඉතා අඟය කරනවා. මෙම වැඩසටහන ක්‍රියාත්මක වන විට පොල්වත්ත ප්‍ර දේශයේ පවුල් 450ක් විතර තිබෙනවා. නමුත් මින් පවුල් 35ක් පමණක් යෙදවීමට වඩා මින් පවුල් 225ක් වත් යෙදවිමට හැකිනම් එය වටිනවා. මෙය ඉතා හොඳ වටිනා වැඩසටහනක් නිසා ගරු සභාවේ අදහස් ලබාගෙන ක්‍රියාත්මක කිරිමට සුදුසු බව මාගේ අදහසයි.

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි. ඉතාමත් හොඳ යෝජනාවක් ඔබතුමා උදේ පාන්දර ගෙන තිබෙන්නේ. මොකද අම්බලන්ගොඩ නගර සභාවේ කුණු එකතු කිරිමට යන වියදම බැලුවාමත් මෙම කුණු දමන ස්ථාන බැලුවාමත් මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරිම ඉතා හොඳයි. මෙහි වැදගත්කම තිබෙන්නේ මෙම වැඩසටහන ක්‍රියාත්මක වන්නේ 35කු අතර වීම නොවේ . මෙම වැඩසටහන ක්රියාත්මක කර ජනතාව අතරට ගෙන යාම අපේ වගකිමයි. නමුත් අපි මේ කුණු එකතු කර දමන ස්ථානය බැලුවාම ඉදිරියට

ජනතාව උද්ඝෝෂණ පවා ඇතිවිය හැකියි. පෝරඹ ප්‍රදේශයට යන්න බැහැ. කුණු දමා ගඳ ගසනවා . මැස්සෝ වහනවා. මෙය දිර්ඝ කාලිනව සිදු කළත් යම්කිසි ක්‍රමවේදයක් සොයා ගත යුතුයි.එම පොල්වත්ත ප්‍රදේශයේ ආර්ථික සංවර්ධන නිලධාරිතුමා අපි දන්නා තරමින් ඉතාමත් උනන්දු වි වැඩ කරන කෙනෙකි.මෙහි පක්ෂ පාටක් නැහැ. කුණු එකතු කළ යුතුයි කාගෙත්. මෙයට යම් වැඩ පිළිවළකුත් තිබිය යුතුයි. මා දන්නා තරමින් දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා විසින් කොම්පොස්ට් පොහොර බඳුන් 500 ක් පමණ ඔබතුමාගේ සභාපතිත්වය යටතේ බෙදා දුන්නා. නමුත් පසු විපරමක් නැති නිසා මෙය කඩා කප්පල් වුණා. මෙම කොම්පොස්ට් පොහොර බඳුන් වල රෙදි දමන තත්වයට පත් වුවා. නමුත් පසු අධික්ෂණයක් හා ව්‍යාපෘතියක් සමඟ යන නිසා මෙය සාර්ථකත්වයට පත්වෙනවා. මොකද මෙයට පස සම්බන්ධ නොකරත් මෙහි වගා කටයුතු සිදු කර හැකි නිසා. මෙහි ඉතා දිර්ඝ විස්තරයක් තිබෙනවා. මෙය ඉතා හොඳ වටිනා ව්‍යාපෘතියකි. මෙය ක්‍රියාත්මක කරන්න. සමහරුන් මොන දේ පැමිණියත් මෙයට අකමැති තත්වයක් තිබෙනවා. හැම තැනම එකට සිදු කරන්න බැහැ. පොල්වත්ත ප්‍රදේශයේ මල් වවන්න්ගේ සංගමයේ තිබෙනවා. එම ප්‍රදේශයේ වගාවට සම්බන්ධ බොහෝ පිරිසක් සිටිනවා එය නොපෙනුනාට . මෙම ව්‍යාපෘතිය ආරම්භ කර වාර්තාවක් ලබා ගන්න. ගරු මන්ත්‍රිවරුන්ටත් මේ පිළිබඳව අධික්ෂණ කටයුතු සිදු කරන ලෙස කියා සිටිනවා. එසේ කිරිමෙන් මෙය අනෙක් කොට්ඨාශවලත් ආරම්භ කළ හැකියි. නගර සභාව විශාල ප්‍රශ්නයකට මුහුණ පා සිටිනවා. මේ කුණු සම්බන්ධව. මෙම තෝරා ගත් 35 දෙනා ගෙනවිත් මේ පිළිබඳව දැනුවත් කර මෙය ආරම්භ කරන්න. මේ පිළිබඳව අපගේ පුර්ණ සහායෝගය ලබා දෙනවා. කෘෂි රසායනික ද්‍රව්‍ය ඉවත් කර ස්වභාවික පොහොර යොදා සිදු කරන මෙම ව්‍යාපෘතිය ඉතාමත් වටිනවා. මෙම ව්‍යාපෘතිය ඔබතුමාට ඉදිරිපත් කිරිම සම්බන්ධව අපි ස්තුතිවන්ත වෙනවා. මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනිමට සැමදෙනාගෙම සහායෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපගේ ගරු මන්ත්‍රිවරු මේ පිළිබඳව කතා කරන විදියට සියළුදෙනාගේම මේ සඳහා කැමැත්තක් ඇති බව පෙනි යනවා. මා යෝජනා කර සිටිනවා ගරු මන්ත්‍රිවරු 21 දෙනාගේ නිවෙස් වලින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරිමෙන් සියළුම කොට්ඨාශ වලට මෙම පණිවිඩය ව්‍යාප්ත වේ කියා.මුලින්ම එම නිවෙස්වලින් මෙය ආරම්භ කරන ලෙස යෝජනා කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පිරිසිදු සිතින් කරන අධිෂ්ඨාන ඉටු වෙනවා ඒකාන්තයි. ආර්ථික නිලධාරි ගනීර මහතා විසින් ඉදිරිපත් කර ඇති මෙම ව්‍යාපෘතිය අපට ජයගත හැකියි. නීරෝගි බව සහ යහපැවැත්ම වගකීමෙන් යුතු නිෂ්පාදනය හා පරිභෝජනය සඳහා නාගරික ජනතාව යොමු කිරිම පිළිබඳවයි මෙම ව්‍යාපෘතිය නම් කර ඇත. අම්බලන්ගොඩ නගරයේ ඇත්තේ ඉතා සිමිත භූමි ප්‍රමාණයකි. මෙම සිමිත භූමි ප්‍රමාණයේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමෙන් අපගේ ජනතාවට ලබාදෙන ඵලදායිතාව පිළිබඳව අප ස්තුතිවන්න විය යුතුයි. අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ඉතා කඩිවැඩ කරන දක්ෂ නිලධාරි මහතෙක් ලෙස මෙතුමා නම් දරා සිටිනවා. ඔහුගේ විෂය ක්ෂේත්‍රයට අනුව මනා පරික්ෂණයක් කරිමෙන් තමයි මෙය සිදු කර ඇත්තේ. මෙම ව්‍යාපෘතියට 35කු තෝරා ගනු ලැබුවාවත් එවැනි කටයුත්තක් සිදු කිරිමේදි එවැනි නිධියක් තෝරාගෙන තමයි සිදු කළ යුත්තේ. එම නිසා මෙය ඉතා සාර්ථක වන බව මට විශ්වාසයි. මෙම 35 කු ගැන පමණක් ගැන නොසිතා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමට නගර සභාව පැත්තෙන් ලබා දිය යුතු උපරිම සහායෝගය ලබා දිය යුතුයි.එ සඳහා සියළුම දෙනාට විඥ්ඥානය පහලවේවායි පතමින් මා නිහඬ වෙනවා.

ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, කාලයකට පසු ඉතා හොඳ යෝජනාවක් ඉදිරිපත් වුණා. මේ ගනීර කුලසේන මහතා පඤ්ඤාලෝක මාවතේ මාගේ නිවස අසළ වාසය කරන කෙනෙකි. ඔහු ඉතා අවංක නිලධාරියෙකි. මෙම යෝජනාවත් ව්‍යාපෘතියත් ඉතාමත් හොඳයි. නව අලුත් ව්‍යාපෘති සඳහා අප යොමුවිය යුතුයි. අනෙක් කරුණ නම් ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික මහතා ප්‍රකාශ කර ආකාරයට ගරු මන්ත්‍රීවරු 21 නා මෙය බෙදා ගනු ලැබුවහොත් ඒ පිළිබඳව අපවාදයක් අපට ඇසීමට සිදු වෙනවා. ඒ සඳහා මා විරුද්ධ වෙනවා නෙමේ ඒ පිලිබඳව කොතෙක් දුරට ගැලපෙනවාද කියා සිතා බලන ලෙස ඉල්ලා සිටිනවා. මෙම ව්‍යාපෘතියට මා සුභ පතනවා.

ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්

ගරු සභාපතිතුමනි, මෙම ගනීර කුලසේන මහතා සකස් කරන ලද මෙම ව්‍යාපෘතිය නිවෙස්වල සිටින කාන්තාවන්ට බොහෝ වැදගත් වේ. කාන්තාවන්ට තිබෙන විශාලම ගැටළුව වී ඇත්තේ මේ නිවෙස් වල තිබෙන ඉවත් කරනු ලබන අපද්‍රව්‍ය ටික දමන එක විශාල ගැටළුවක් වී තිබෙනවා. මොකද මේ නිවෙස් වල ඇත්තේ ඉතා සීමිත බිම් කොටසකි.විශේෂයෙන්ම ඕකන්ද ප්‍රදේශය වගේ ගතහොත් ඇත්තේ පර්චස් 4ක වගේ ඉතා කුඩා ඉඩම් ප්‍රමාණයකි. එම ඉඩම් ප්‍රමාණයේ නිවස සාදා ගත් පසු කුණු වළ දැම්මටවත් ඉඩක් නැහැ. මෙවැනි වැදගත් ව්‍යාපෘතියක් හඳුන්වා දුන් පසු නගර සභාවේ ගරු මන්ත්‍රීවරු ලෙස මේ සඳහා අප ස්තුතිවන්ත විය යුතුයි.ඔහු ඉතා දක්ෂ අද කාලයට ඔබින නව ව්‍යාපෘති හඳුන්වා දෙන නිලධාරියෙකි. මේ සඳහා නගර සභාව විදියට අපි ඒ සඳහා සුදුසු අනුග්‍රහය ලබා දී මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනිමට සහායෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. මේ සඳහා පසු විපරමක් සිදු කර මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට කටයුතු සලසන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්

ගරු සභාපතිතුමනි, මේ ගනීර කුලසේන කියන ආර්ථික සංවර්ධන නිලධාරි මහතා විසින් ඉදිරිපත් කර ඇති ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අපි ඉතාමත් සතුටට පත්වෙනවා. මෙවැනි ව්‍යාපෘතියක් ඉදිරිපත් කිරිම ඉතාමත් කලෝචිතයි. නමුත් දැන් මෙය සිදු කරනු ලබන්නේ පොල්වත්ත ග්‍රාම නිලධාරි වසමේ. නමුත් ඉතාමත් කනගාටුයි අප ප්‍ර දේශයේ සිටින ආර්ථික සංවර්ධන නිලධාරිතුමා කවුද කියා අපි දන්නේ නැහැ. එම නිසා එතුමාට ඇති කර්තව්‍ය ඉතා උනන්දුවෙන් සිදු කරන නිසා මා මේ අවස්ථාවේ මාගේ හෘදයාංගම ස්තුතිය පුද කර සිටිනවා.අප ප්‍රදේශයටත් මේ කුඩම්මාගේ සැලකිලි නොමැතිව අම්මාගේ සැලකිලි ලැබේවායි ප්‍රර්ථනා කර සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, මෙතුමා පොල්වත්ත ප්‍රදේශයේ ආර්ථික සංවර්ධන නිලධාරි මහතා ලෙස මෙම ව්‍යාපෘතිය ගෙන එම පිළිබඳව ගරු සභාවේ ස්තුතිය පුද කර සිටිනවා. අපගේ මේ සියළු මන්ත්‍රීවරු අදහස් දැක්වූ ආකාරයට මෙය ඉතාමත් හොඳ යෝජනාවකි. ඉතාමත් කලෝචිතයි. නගර සභාව පැත්තෙන් අපට එකඟ විය හැකි යම් යම් කරුණු තිබෙනවා. නමුත් එක ගම් ප්‍රදේශයකට එක් සංවර්ධන නිලධාරියෙකු බැගින් පත් කර තිබෙනවා. මෙම සංවර්ධන නිලධාරියා මෙම ව්‍යාපෘතිය ඉදිරිපත් කර සාර්ථක වූ විට අනෙක් සංවර්ධන නිලධාරිනුත් මෙම ව්‍යාපෘතිය ඉදිරිපත් කරනවා. එවිට ව්‍යාපෘති 12ක් වෙනවා.එසේ නැතිනම් මෙම ව්‍යාපෘතිය ගම් 12 යනවා. එවිට මේ මුදලට බැලුවිට ලක්ෂ 36 ක් පමණ වැයවේ. මෙය ක්‍රියාත්මක කිරිමට කලින් අපි බැලිය යුතුයි මෙයට සම්බන්ධ පුද්ගලයා පිළිබඳව. එතුමා සම්බන්ධ වී ඇත්තේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට.එම නිසා අපි සම්බන්ධ විය යුත්තේ ප්‍රාදේශිය ලේකම්තුමිය හරහා. එම නිසා එතුමියගෙන් දැනගත යුතුයි රජය විසින් මේ පිළිබඳව සම්බන්ධ වන්නේ කොහොමද කියා දැන ගත යුතුයි. මේ වැඩ සටහන ඉදිරිපත් කිරිම පිළිබඳව මේ

නිලධාරින්ට මේ වැඩසටහන් පිළිබඳව අවබෝධයක් තිබෙනවා. අපි මේ ගරු සභාව මේ සඳහා මුදල් ගෙවීමට ඉදිරිපත් වුණාට. නමුත් ඉතාමත් හොඳ දෙයක් මේ ඉදිරිපත් වීම පිළිබඳව. නමුත් මේ සභාවේ මුදල් මේ වසම් 12ටම මුදල් ගියහොත් මේ ඉතාම සරල මේ යෝජනාව ක්‍රියාත්මක කිරිමට ලක්ෂ 36ක් වැයවේ. අනෙක් කරුණ මෙය ක්‍රියාත්මක කිරිමට මේ ගරු සභාවේ එකඟත්වය පළකළහොත් මා මිට විරුද්ධ වුවා කියා ප්‍රශ්නයක් නැහැ.ඒ ආකාරයෙන් එය ක්‍රියාත්මක වනවා නම් මේ ග්‍රාමසේවා වසම් 12 ප්‍රජා සමිති තිබෙනවා. ඒ ප්‍රජා සමිති සැම එකම මුදල් තිබෙනවා. මොකද ඒ ප්‍රජා සමිති වලට කොන්ත්‍රාත් කිරිමෙන් ලැබෙන 5% ක මුදල් තිබෙනවා. එම නිසා මේ ප්‍රජා සමිති මේ සඳහා දායකත්වය කර ගන්න.අඩුම වශයෙන් මෙහි තිබෙන ප්‍රධාන දායකත්වය වන්නේ කොම්පොස්ට් පොහොර බඳුන් සඳහා යන වියදමයි.ඒ බඳුන් පිළිබඳව ප්‍රජා සමිතියට පසු විපරම පිළිබඳව වගකීම පැවරුවු විට මෙය නිසියාකාරව ක්‍රියාත්මක වේ.ගරු නගර සභා මන්ත්‍රි රාහුල මහතා ප්‍රකාශ කළ පරිදි ගරු ප්‍රධාන අමාත්‍යතුමා දෙනු ලැබු කොම්පොස්ට් බඳුන් වල රෙදි දැම්මට තමයි නැතිනම් යොදා ගනු ලබන්නේ. හැබැයි කලාතුරකින් වචනයේ පරිසමර්ථයෙන්ම කොම්පෝස්ට් පොහොර බඳුන් 4 ක 5ක තමයි මෙම ක්‍රියාවලිය නිසියාකාරව සිදු වන්නේ.මේ ප්‍රජා සමිති අයිති නගර සභාවට. මෙහි මුදල් තිබෙන්නේ නගර සභාවේ. අපේ අනුමතියෙන් තොරව ඒ මුදල් වියදම් කිරිමට බැහැ එම සමිති වලට.මෙම කොම්පොස්ට් බඳුන් වල දායකත්වය එම සමිති මඟින් දැරු විට නගර සභාවේත් මුදල් තත්වයට යහපත්වේ. එසේම මෙම වසම් 12 ප්‍රජා සමිති ආරම්භ කර නැහැ.මෙම ප්‍රජා සමිති ආරම්භ කිරිමට මුලිකත්වය දැරුවේ ගරු මන්ත්‍රිවරුන්ගේ මුලිකත්වයෙනි. එහෙත් සමහර ප්‍රදේශවල මේ දායකත්වය දැරිමට ප්‍රජා සමිති නොමැති වුවහොත් වෙනත් වසමක ප්‍රජා සමිති මඟින් මෙම කාර්ය සිදු කරනු ලබයි. ඒ එම ගමට අයිති මුදල්. මා නියෝජනය කරන කරිත්ත කන්ද ප්‍රජා මුල මණ්ඩලයේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා අවශ්‍ය මුදල් තිබෙනවා. අඩුම වශයෙන් මෙහි යම් දායකත්වයක් ඔවුන්ට දිය හැකියි. මේ සමිතිය යම් දෙයක් මේ ගමට කළා වෙනවා. නැත්නම් මේ අය විනෝද චාරිකා පමණක් යාම සිදු කරයි. මෙයට මොකුත් කියන්න බැහැ. ඒ ඔවුන්ගේ මතයයි. මේ වන විට ගම්වල ප්‍රජා සමිති 7 -8 ක් ආරම්භ වි තිබෙනවා. ඉන් මා හිතන්නේ අනෙක් ගම්වලත් මේ ප්‍රජා සමිති ආරම්භ කරන්න වෙනවා. මෙහි මා යෝජනාවක් විදියට ප්‍රකාශ කරන්නේ අර රු.5000/= ක් විතර යන කොම්පොස්ට් බඳුන් හෝ ප්‍රජා සමිති හරහා ලබා දිමට කටයුතු කර විශේෂයෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා ප්‍රාදේශිය ලේකම්තුමිය හරහා අනුමතියට එනවා නම් හොඳයි. අපි මේ ව්‍යාපෘතිය ක්ර්යාත්මක කළත් පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමතිය යා යුතු වෙනවා. මේ සඳහා අපි අත ඔසවා කැමැත්ත අනුමතිය ලබා දුන්නාත් මේ මුදල් සඳහා එක් එල්ලේ අපිට තිබෙන ව්‍යාපෘතියක් නොවන නිසා. කොම්පෝස්ට් පොහොර සම්බන්ධයෙන් කසළ කළමනාකරණය සම්බන්ධයෙන් මෙම ව්‍යාපෘති පිළිබඳව අපිට දායකත්වය දිය හැකියි. රජය විසින් අනාන්ත අප්‍රමාණ මුදල් මේ ව්‍යාපෘති සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලට ලැබි ඇත. මේ ව්‍යාපෘතිය සිදු කිරිම සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයත් , ප්‍රජා සමිතිත්, නගර සභාවත් එක්වි ක්‍රියාත්මක කළ යුතු යයි මා යෝජනා කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගම්හීර කුලසේකර මහතා විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘතියට ගරු සභාවේ මන්ත්‍රිවරුන් විසින් අදහස් පළ කරනු ලැබුවා. මේ සඳහා ලක්ෂ 3ක පමණ ප්‍රමාණයක් එක් කොට්ඨාශයකට වැයවන බවට අපගේ ගරු නගර සභා මන්ත්‍රි සරත් ශ්‍රී ලාල් මහතා සඳහන් කළා. එතුමාගේ කරුණ සමඟ මාත් යම් කරුණු ඉදිරිපත් කළ යුතුයි. එක කොටසකට ලක්ෂ 3කට වැඩි ප්‍රමාණයක් වැය කළ විට කෙටස් 12ක් ලක්ෂ 36 ක පමණ මුදලක් නගර සභාවට වැය කළ යුතු වෙනවා. මෙම ව්‍යාපෘතිය අදාල නිලධාරිතුමා විසින් ඉතාමත් යහපත් චේතනාවෙන් කරන ලද ව්‍යාපෘතියකි. මෙයට අපි උදවු කළ යුතුයි.එසේම මෙවැනි ව්‍යාපෘති සඳහා මධ්‍යම රජයෙන් මුදල් ලැබෙනවා. ගරු නගර සභා මන්ත්‍රි සරත් ශ්‍රී ලාල් මහතා ප්‍රකාශ කළ පරිදි අපි ප්‍රා දේශිය

ලේකම්තුමියගෙන් කරුණු විමසිය යුතුයි අපි නගර සභාවේ මන්ත්‍රීවරු මේ සඳහා එකඟතාවය පල කරන බවත් , මධ්‍යම රජය පැත්තෙන් මේ සඳහා ලැබෙන ප්‍රතිපාදන මොනවාද ? අපිට මධ්‍යම රජයේ අදාල අමාත්‍යාංශයෙන් මේ සඳහා උදවු ලබා ගත හැකියි. ඒවා මොනවාද ? ඒ පිළිබඳ විමසා බලා ඔබතුමා ලිපියක් යවන්න. මධ්‍යම රජයෙන් අදාල අමාත්‍යාංශයෙන් යමක් කිරීමට තිබේනම් ඒ සඳහා යම් ප්‍රමාණයකට මට ඉදිරිපත් විය හැකියි. මොකද පරිසර අමාත්‍යාංශය තිබෙන්නේ අතිගරු ජනාධිපතිතුමා යටතේ තිබෙන්නේ. ඒ වුණත් කිසි ගැටළුවක් නැහැ. මේ පිළිබඳව අපි එතුමාට කරුණු ඉදිරිපත් කර දායකත්වය ලබා ගත හැකියි. අනිවාර්යෙන්ම මේ හොඳ ව්‍යාපෘතියක් නිසා සියයට සියයක්ම දායකත්වය ලබා දෙයි. ඒ ආකාරයට මේ ව්‍යාපෘතිය සිදු කරන ලෙසට මා යෝජනා කර සිටිනවා. අපගේ නගර සභාවේ මුදල් ලක්ෂ 36ක් පමණ මුදලක් මේ සඳහා වැයවේ. අපගේ බරපතල ප්‍රශ්නය වී ඇත්තේ වසර ගණනාවක් වසා ඇති ක්‍රීඩාංගනය. මේ ක්‍රිඩාංගනය හදන එක තමයි අපගේ වගකිම යුතුකම. මෙවැනි ලක්ෂ 30 , 40 වියදම් කර මෙවැනි දේවල් සිදු කරන්න ගියහොත් අපට තව අවුරුදු 2 , 3 කට බැරි වෙයි ක්‍රිඩාංගනයේ වැඩ නිම කර ගැනිමට. එම නිසා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මධ්‍යම රජයේ මුදල් මේ සඳහා දැරිමට උත්සාහ කරන්න. මේ ඉතා හොඳ ව්‍යාපෘතියකි. මේ ව්‍යාපෘතිය අපගේ වසම් 12 ටම ක්‍රියාත්මක කරන්න . ප්‍රා දේශිය ලේකම් කාර්යාලයෙන් විමසා මේ සඳහා ලැබෙන ප්‍රතිපාදන මොනවාද කියා සහ විෂයභාර අමාත්‍යවරයාගෙන් මේ පිළිබඳව විමසා මේ යෝජනාව ක්‍රියාත්මක කරන ලෙසට යෝජනා කර සිටිනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙම යෝජනාවට එකඟත්වය ලැබිම පිළිබඳව මා සියළුම ගරු මන්ත්‍රීවරුන්ට ස්තුතිය පුද කර සිටිනවා.මෙහිදි මා මතක් කළ යුතුයි සෑම කොට්ඨාශයකම ආර්ථික සංවර්ධන නිලධාරි මහතුන් සිටියත් වැඩක් කිරිමට උත්සාහ දරන්නේ කිහිප දෙනෙකු පමණකි. එම කිහිප දෙනා අතර මේ ගනීර කුලසේන මහතා එක් පුද්ගලයෙකි. එතුමා ඉදිරිපත් කළ මෙම ව්‍යාපෘතිය සාර්ථක වුවහොත් අපට හොඳ දෙයක් කළ හැකියි. අම්බලන්ගොඩ නගර සභාව විදියට වර්ෂයදකට කසළ කළමනාකරණය කිරිම සඳහා ලක්ෂ 500 පමණ මුදලක් වැය කරනවා. අපි මෑතකදි නම් මැනිමක් කලේ නැහැ. මිට වසර 10 කට පෙර නම් අම්බලන්ගොඩ නගරයේ දවසක කුණු ටොන් 20 ප්‍රමාණයක් එකතු කළා. දැන් එම ප්‍රමාණය ටොන් 30, 35 ක ප්‍රමාණයක් වි ඇත. එම නිසා අපි කල්පනා කළ යුතුයි අපට ගෙන යායුතු මේ ටොන් ගණන අඩු කර ගැනීමට. අඩුකර ගැනීමට හොඳම දෙය තමයි ගෘහස්ථව කොම්පෝස්ට් කිරිම හා යම්කිසි ආකාරයකින් ඒ අයට ආර්ථික වාසියක් සිදු කිරිම. මා මේ නිලධාරි මහතා සමඟ සාකච්ජා කර මෙම ව්‍යාපෘතියට ලුණු ඇඹුල් ටිකක් දමා තිබෙනවා. අනෙක් වසම් 12 ට මෙය ක්‍රියාත්මක කිරිමට කැපවුණු නිලධාරින් සිටිය යුතුයි. අපි කොම්පෝස්ට් බඳුන් දුන්නාට එම කොම්පෝස්ට් සාදනවාද කියා බැලිම සඳහා වසමකට නිලධාරින් නැහැ. මේ සඳහා අපට හොඳ දේ තමයි ග්‍රාමසේවා මහතා, ආර්ථික සංවර්ධන නිලධාරි,සමෘද්ධි නිලධාරි සිටිනවා. එසෙම කෘෂි කර්ම නිලධාරි සිටිනවා. මෙය ක්‍රියාත්මක වන රජයේ නිලධාරින් 4කු ගමේ සිටිනවා. එම 4 දෙනාම අපේ වැඩ කොටසටත් යොදා ගත යුතු වෙනවා. මිට කලින් අපි උත්සාහ දැරුවා කෘෂි කර්ම නිලධාරින් නගර සභාවට කැඳවා මෙම කාර්ය කිරිමට. නමුත් එම නිලධාරින් ලවා ඇත්තටම මෙය කර ගැනිමට නොහැකි වුවා. අපි නගර සභාවෙන් ගෙවතු වගාවන් සඳහා තරඟයක් පවත්වා ඒ සඳහා අපි මුදල් ලබා දුන්නා. ඒ අවස්ථාවේදිත් මෙම කෘෂි කර්ම පර්යේෂණ නිලධාරින් මෙය හරියට සිදු කළේ නැහැ. දැන් එක් නිලධාරියෙක් මේ සඳහා ඉදිරිපත් වි තිබෙනවා. මා ඔහුට ප්‍රකාශ කළා මේ සඳහා පසු විපරම සහ මේ සඳහා උනන්දුව තිබෙන කැමැත්ත තිබෙන හරි පිරිසක් තෝරා ගන්නා ලෙස. ඔහු පොල්වත්ත ග්‍රාමයේ ඇවිද ගෙන ගොස් මේ සඳහා කැමැත්ත තිබෙන 35කු බව පවසා සිටියා. මෙම පවුල් 35 ක්‍රියාත්මක කර අනෙක් අයට පෙන්විය හැකි බව පැවසුවා මේ පිළිබඳව යම් දෙයක් කළ හැකි බව. කිසිම කොට්ඨාශයකට අඩු සැලකිලි වැඩි සැලකිලි කිරිමක් නොවේ සිදු කර තිබෙන්නේ. මෙම නිලධාරියා කරන ලද ඉල්ලීමයි.අපේ පොල්වත්ත සමිතිය ලියා පදිංචි වි තිබෙනවාද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

ලියාපදිංචි වී තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එසේනම් සමිතියේ මුදලුත් මේ සඳහා හවුල්කාරිත්වය සඳහා යොදා ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙහි සාර්ථකත්වය බලා අනෙක් එවාගෙත් ක්‍රියාත්මක කළ හැකියි. එවිට තමන්ට පුළුවනි ගරු මන්ත්‍රීවරුන්ගෙන් ප්‍රතිපාදන ලබා ගන්න. මේ මාර්ග හදනවා වගේ මේ සඳහා යම්කිසි මුදලක් ඉල්ලා ගත හැකියි. ගරු මන්ත්‍රීවරු වශයෙන් අපෙත් වගකීමක් තමයි මේ සඳහා මුදල් සොයා දෙන එක. මෙය හොඳ වැඩක් නිසා. මේ කසළ ගෙන යනු ලබන ට්‍රැක්ටර් වල සේවක මහතුන් බැණුම් අසනවා. මොකද දිරන හා නොදිරන කසළ ගෙන යාම සම්බන්ධව. මොකද නොදිරන කසළ ගෙන යනු ලබන්නේ එක දිනයක පමණයි.දිරන කසළ ගෙන යන දිනයක නොදිරන පෙලිතින් කැබැල්ලක් තිබුණත් ජනතාව බනින්නේ ඔවුන්ට. මෙම ව්‍යාපෘතියේ කරුණු 3කි. එකක් වගාව , අනෙක් කරුණ කොම්පෝස්ට් කිරිම, අනික කුණු මාර්ගයට දමන එක හරි ටිකක් අවම වෙනවා. එවිට අපගේ ඉන්ධන වියදම ඉතිරි වේ. මෙම ලක්ෂ 3ක පමණ මුදලක් 35 යන එකනෙමේ වැදගත් කම . මෙම කසළ දමන ස්ථානය. තව ටික දිනකින් ගොස් බලන්න එහි තිබෙන තත්වය. කැමැත්තෙන් හෝ අකමැත්තෙන් හරි මෙම කටයුත්ත කරන වෙනවා. එතුමා ඉදිරිපත් කළ ව්‍යාපෘතිය ඉතා හොඳයි. එය සාර්ථක කර ගැනිමට අපගෙත් උනන්දුවක් තිබිය යුතුයි. අපි එතුමාට එම සහායෝගය දිය යුතුයි. එම නිසා එකතු වී මෙය ඉටු කරන්න. නගරයේ කාටවත් පක්ෂ පාටක් නැහැ මෙහිදි. නිලධාරින් දැන් හැංගි වැඩ කරන්නේ. දැන් වැඩ වලට නිලධාරින් එන්නේ නැහැ. එම නිසා අපි එතුමාට ස්තුති වන්ත වෙනවා. ගමට වැඩ කිරිමට නිලධාරින් කිහිප දෙනෙක්ම සිටිනවා පත් කර. සමහර පුද්ගලයන්ගේ ගරු මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළ ආකාරයට නම දන්නේත් නැහැ.අදාල උපදෙස් ලබා ගෙන මෙය සාර්ථක කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එසේ නම් මෙම යෝජනාව අපගේ ප්‍රජා සංවර්ධන නිලධාරි මහත්මිය යටතේ ක්‍රියාත්මක කිරිමට කටයුතු කරන්න. ගරු මන්ත්‍රීවරුන්ගේ අදහසුත් ලබා ගෙන ක්‍රියාත්මක කරන ලෙසට ලේකම්තුමියට දන්වා සිටිනවා.

**තීරණය**

පොල්වත්ත ග්‍රාම නිලධාරි වසමේ ආර්ථික සංවර්ධන නිලධාරි ගහීර කුලසේන මහතා විසින් ඉදිරිපත් කරන ලද පොල්වත්ත ග්‍රාම නිලධාරි වසමේ තෝරා ගන්නා ලද පවුල් 35ක් සඳහා නිර්පාංශු ගෙවතු වගාවට අවශ්‍ය පහසුකම් සඳහා ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය යටතේ ක්‍රියාත්මක කිරිමටත්, ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් ලබාගැනිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.05 දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා විසින් අම්බලන්ගොඩ ගා/පී. ද එස් කුලරත්න විද්‍යාලයේ පළමු ශ්‍රේණිය සමාන්තර පන්ති 5 සක්‍රිය කිරිම සම්බන්ධව 2019.03.12 වන දිනැති ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා විසින් අම්බලන්ගොඩ ගා/පී. ද එස් කුලරත්න විද්‍යාලයේ පළමු ශ්‍රේණිය සමාන්තර පන්ති 5 සක්‍රිය කිරිම සම්බන්ධවයි.උක්ත කරුණ සම්බන්ධව මා ඇමතු 2019.02.18 දිනැති ලිපිය හා බැඳේ. ගා/පී ද එස් කුලරත්න විද්‍යාලය 1986 වර්ෂයේ ආරම්භ කර ඇත්තේ ධර්මාශෝක විද්‍යාලයේ ප්‍රාථමික පංති ඉවත් කිරිමත් සමඟය. එහෙත් 1990 වර්ෂයේ නැවතත් ප්‍රථමික පන්ති ආරම්භ කිරිමත් සමඟ කුලරත්න විද්‍යාලය ආරම්භ කිරිමේ පරමාර්ථ බිඳ වැටි ඇත. කුලරත්න විද්‍යාලයේ සමාන්තර ශ්‍රේණි පන්ති 4 පවත්වාගෙන යාම ප්‍රමාණවත් බවත් කලාප අධ්‍යක්ෂ විසින් දැනුම් දී ඇත. කුලරත්න විද්‍යාලය ඇතුළු නාගරික සිමාවේ පවතින පාසල් 6 1ශ්‍රේණියේ සමාන්තර පංති වල එකතුව 22කි.නාගරික සිමාවේ වර්ෂයකට උපත් 250-300 දක්වා බවත් , මෙම සංඛ්‍යාව ඇතුලත් කිරිමට එම පන්ති ප්‍රමාණය ප්‍රමාණවත් බවත්, මා වෙත වාර්තා කර ඇත.මේ වන කුලරත්න විද්‍යාලයේ 1-2 ශ්‍රෙණි වල සමාන්තර පන්ති 4 බැගින් ද 3,4හා 5 ශ්‍රේණිවල සමාන්තර පන්ති 5 බැගින් පවත්වාගෙන යනු ලබයි. මෙම පාසල ආසන්නයේ කිලෝ මිටර් 2 ඇතුලත ප්‍රථමික පන්ති පැවැත්වෙන පාසල් 4ක් ඇති අතර මෙම විද්‍යාලයේම පෝෂිත ප්‍ර දේශයේ පිහිටි කන්දේගොඩ මහ විද්‍යාලය හා අනෝමදස්සි කනිටු විද්‍යාලය 2009 වර්ෂයේ සිට සමාන්තර ශ්‍රේණි සඳහා පන්තිය බැගින් වැඩිකර ඇත. කුලරත්න විද්‍යාලයේ සමාන්තර ශ්‍රේණි පන්තියක් ආරම්භ කිරිම අවශ්‍ය නොවන බවත් 2019 සමාන්තර ශ්‍රේණි 4ක් ඇතුලත් කරනු ලබන පන්ති සංඛ්‍යාව 5 ශ්‍රේණිය දක්වා නොවෙනස්ව පැවතිය යුතු බවත් අම්බලන්ගොඩ අධ්‍යාපන කලාප ව්‍යුහ කමිටුව විසින් නිර්දේශ කර ඇත. ඒ අනුව දකුණු පළාතේ අධ්‍යාපන ව්‍යුහ කමිටුව ගා/පී ද එස් කුලරත්න විද්‍යාලයේ පලමු ශ්‍රේණිය සඳහා සමාන්තර පන්තියක් වැඩි නොකිරිම සිදු නොකළ යුතු බවත් දකුණු පළාතේ අධ්‍යාපන ව්‍යුහ කමිටුව විසින් තීරණය කළ බව දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක විසින් දන්වා ඇත.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , කවුද දන්නේ නැහැ ඔය ව්‍යුහ කමිටුවේ ඉන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එය මන් දන්නේ නැහැ. මෙය එවා තිබෙන්නේ දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකතුමා. නගර සභාවෙන් ගා/පි ද එස් කුලරත්න විද්‍යාලයේ සමාන්තර පන්තියක් වැඩි කිරිමට කරන ලද ඉල්ලිම සම්බන්ධවයි.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, දැන් අම්බලන්ගොඩ නගරයේ ජනතාවට කන්දේගොඩ මහ විද්‍යාලය සහ අනෝමදස්සි කනිටු විද්‍යාලයත් තිබෙනවා කියා. මෙය පෝෂිත ප්‍රදේශයකි. මෙහෙ කෙනෙක් තමයි මෙයට සම්බන්ධ වි ඇත. විශේෂයෙන්ම ඔය අධ්‍යක්ෂතුමාලාගේ දරුවන් මෙහෙට එවන්නේ නැහැ. කුලරත්න විද්‍යාලයට තිබෙන ඉල්ලුම අනුව විශේෂයෙන්ම තල්ගස්ගොඩ , කෙරමිනිය , පින්නදූව , ගොඩහේන, පොල්වත්ත, ඕකන්ද කියන ප්‍රදේශ වල ජනතාවටයි. විශේෂයෙන්ම මේ අසාධාරණය සිදු වන්නේ අම්බලන්ගොඩ සිට එම ප්‍රදේශ වලට සුනාමිය නිසා ගිය ජනතාවටයි. එම ජනතාවට ඔප්පු නැහැ. එම නිසා ලකුණු 10 ක් නිකම්ම කැපෙනවා. අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයට ඇතුලත් විය යුතු දරුවන් තමයි තල්ගස්ගොඩ , කෙරමිණිය, පොල්වත්ත ප්‍රදේශවලට පදිංචිවි ඇත්තේ. මේ එක් දරුවෙක්වත් අසුවෙන්නේ නැහැ මේ තියෙන චක්‍ර ලේඛයට අනුව ධර්මාශෝක විද්‍යාලයට හා දේවානන්ද විද්‍යාලයට. තිබෙන එකම පාසල කුලරත්න විද්‍යාලය. එම පාසලට ආසන්න තාවයෙන් ගත හැක්කේ ළමුන් 67 ක් පමණි. මේ ප්‍රදේශ තුනේම පමණක් සිටිනවා ළමුන් 67 ක් පමණ.

විශේෂයෙන් තල්ගස්ගොඩ ළමුන් 31 ක් සිටිනවා. භාගයට භාගයක් මේ සුනාමියෙන් පැමිණි දරුවන් සිටිනවා. මේ දරුවන්ගේ දෙමාපියන් කැමති නැද්ද හොඳ පාසලකට මෙම දරුවන් ඇතුලත් කරන්න.මේ අධ්‍යක්ෂතුමාන්ලාගේ දරුවන් පමණද හොඳ පාසල් වලට ඇතුලත් කළ යුත්තේ. විදුහල්පතිතුමා නෙමේ අපි තමයි මෙම ඉල්ලීම සිදු කළේ. මෙතුමා තමයි මෙම ඉල්ලීම කරනු ලැබුවේ. සම්බන්ධිකරණ රැස්වීමේදි සකච්චා කර මෙය විසඳා ගනු ලැබුවේ. සම්බන්ධිකරණ කමිටුව විසින් අනුමත කළා නම් මේ අයට ඇයි මෙය අනුමත කරන්න ඉඩ දෙන්න බැරි. පන්තිය ආරම්භ කිරිමට අනුමතිය ලබා දී තිබෙන්නේ. මේ ව්‍යුහ කමිටුවේ නිර්දේශය පමණයි අවශ්‍ය වී ඇත්තේ. මෙය ආරම්භ කිරිමට ඉඩ නොදෙන්නේ මොන හේතුවක් උඩට. මා දන්නා විදියට අම්බලන්ගොඩ එක් අධ්‍යක්ෂකවරයෙක් සිටිනවා මේයට අකමැති . අපගේ ගරු නගර සභා මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතා දැඩි වෙහෙසක් ගනු ලැබුවා පොල්වත්ත ප්‍රදේශයේ ජනතාව සම්බන්ධව. විශේෂයෙන්ම පොල්වත්ත විද්‍යාලය ආරම්භ කරනු ලැබුවේ 6 ශ්‍රේණියෙන් පසු කුලරත්න විද්‍යාලයට දරුවන් ඇතුලත් කර ගන්නවා කියා. දැන් එය සිදු වන්නෙත් නැහැ. ගැහැණු ළමුන් ප්‍රජාපති විද්‍යාලයටත් , පිරිමි දරුවන් කුලරත්න විද්‍යාලයට ඇතුලත් කරනවා කිව්වා. එ දෙකෙන් එකක්වත් වෙන්නේ නැහැ. ඕනැම දෙමාපියෙක් කැමතියි හොඳ පාසලකට ඇතුලත් කර තම දරුවන්ට අධ්‍යාපනය ලබා දීමට. මෙය හිතා මතාම තමන්ට ඕන විදියට කරන වැඩකි. අපි දැඩි පිළිකුලකින් හෙලා දකිනවා මෙම ලිපිය.අපි රජය නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකතුමාට ප්‍රකාශ කර සිටිනවා මෙයට විරුද්ධව නැගී සිටින්න. ඔබතුමාත් මෙයට සහායෝගය දැක්වුවා. මෙම පන්තිය වැඩි කර ගැනිම සඳහා. ධර්මාශෝක විද්‍යාලයට , දේවානන්ද විද්‍යාලයට ඇතුලත් කළ නොහැකි දරුවා ඇතුලත් කිරිමට බලාපොරොත්තු වන්නේ කුලරත්න විද්‍යාලයට. අධ්‍යක්ෂකතුමාලා ඒ අයගේ තනතුරු සමඟ සැම ඉතා විශාල හොඳ ජනප්‍රිය පාසලකටම තමන්ගේ දරුවන් ඇතුලත් කර ගන්නවා. අහිංසක ජනතාවට තමයි මේ හොඳ පාසලකට තම දරුවන් ඇතුලත් කර ගත නොහැක්කේ. මෙවැනි ලිපියක් ඉදිරිපත් කිරිම පිළිබඳව අපි බලවත් කනගාටුව ප්‍රකාශ කර සිටිනවා. අපගේ විරෝධතාවය පල කරනවා. මේ ගරු මන්ත්‍රීවරු 21 ම කතා කරන්නේ අම්බලන්ගොඩ ජනතාවගේ දරුවන් වෙනුවෙන්. මෙයටත් ඉඩ දෙන්නේ නැතිනම් මෙම අධ්‍යක්ෂකතුමාලා මීට වඩා ඉහලට ගොස් ගරු ආණ්ඩුකාරතුමා සමඟ හෝ මුණ ගැසි සාකච්ජා කර මෙයට දැඩි තින්දුවක් ගන්නා ලෙස ඉල්ලීමක් කර සිටිනවා.තල්ගස්ගොඩ ප්‍ර දේශයේ සිටින සුනාමිය නිසා පදිංචියට පැමිණි දරුවන් වෙනුවෙනි. දැන් මෙවර ඔප්පුව සඳහා දෙනු ලබන ලකුණු 15 ක ප්‍රමාණයක් අහිමි වි ඇත. එසේ සිදු වුණාම මෙම දරුවා කොහේටවත් ඇතුල් වෙන්නේ නැහැ. තව ළමුන් 35කුට පන්තියක් ඇති කරනවා කියන්නේ ලකුණු මට්ටම තව පහළ යනවා. මෙවර ළමුන් ඇතුලත් කර ගන්නා අවම ලකුණු මට්ටම වන්නේ ලකුණු 85යි. තව පන්තියක් ඇතුලත් කිරිමෙන් ලකුණු මට්ටම 80 දක්වා අඩු කර ගත හැකිය.මේ අනුමත වූ පන්තිය නැවත ආරම්භ කරන්න. පන්ති 5ක් තිබුණු පාසලේ මේ ධර්මාශෝක විද්‍යාලය නිසා පන්තියක් අයින් කරනු ලැබුවේ. මේ වන විට දේශපාලන අධිකාරිය අවසර දි තිබෙනවා. ලබන වසරේදිත් වත් මෙම පන්තිය ආරම්භ කිරිමට අපි සියළු දෙනාම නැගී සිටින බව ප්‍රකාශ කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ දකුණු පලාත් අධ්‍යාපන අධ්‍යක්ෂකතුමා විසින් කුලරත්න විද්‍යාලයේ සමාන්තර ශ්‍රේණියක් සක්‍රිය කිරිම සම්බන්ධ ලිපිය දැන් ඔබතුමා සභා ගත කළා. අනෝමදස්සියේ පන්තියක් වැඩි කිරිම වත් , කන්දේගොඩ පන්තියක් වැඩි කිරිම වත් නෙමේ මෙයට විකල්පය. අම්බලන්ගොඩ ඉපදුනු දරුවන්ට යාමට තිබිය යුතුයි අම්බලන්ගොඩ පාසලක්. එයයි අපගේ අරමුණ. අපගේ පරමාර්ථය එයයි.අපේ දරුවන් කන්දේගොඩට යැවීමට පන්තියක් වැඩි කිරිමට පන්තියක් වැඩි කිරිමට වඩා හොඳ නැද්ද මේ පන්තිය වැඩි කිරිම මොකක්ද වෙනස . එය මොළේ තිබෙන අධ්‍යාපන ව්‍යුහ කමිටුවට බැරිද එය කිරිමට. එතකොට අපේ දරුවන් බස්ගාස්තු ගෙවා ගෙන යා යුතුයි කන්දේගොඩට හා බටපොළට. ඔය පාසලට අහුවෙන්නේ නැත්තේ මා දන්නවා ස්ථිර රැකියාවක් නැති

කම්කරුවන්ගේ දරුවන්. මා දන්නවා අපගේ නිතිඥ මහත්වරු කොස්ගොඩ , අහුංගල්ල ප්‍රදේශ වල දරුවන් ඇතුලත් කර ගෙන තිබෙනවා කුලරත්න විද්‍යාලයට. මා මේ විවේචනය කරනවා නෙමේ. මේ සත්‍ය තත්වය දැකිය යුතුයි. අපේ අම්බලන්ගොඩ සිටින කම්කරුවාගේ දරුවා යා යුතුයි කන්දේගොඩට හා අනෝමදස්සියට.එතකොට අහුංගල්ල, කොස්ගොඩ , බලපිටිය නිතිඥ මහත්වරුන්ගේ දරුවන් පැමිණෙනවා කුලරත්න විද්‍යාලයට. මේයයි ක්‍රමය . මේ ක්‍රමය වෙනස් කිරිම සඳහා තමයි ඉල්ලා සිටින්නේ. මට දරුවන් නැහැ. නමුත් මා මේ කතා කරනු ලබන්නේ සෑම දරුවෙකු වෙනුවෙනි. අපි කතා කරන්නේ අවංකවම. අපි මේ සභාවට පත්වී ඇත්තේ යම් වැඩක් කිරිම සඳහායි. මහජනතාව ඡන්දය දී තිබෙන්නේ මොනවා හරි දෙයක් අපගෙන් බලාපොරෝත්තුවෙනි. අපිට මේ සඳහා ගත හැකි විකල්ප මාර්ග තිබෙනවා. අපිට පුළුවනි මේ ව්‍යුහ කමිටුවට වඩා ඉහිලින් ඇති කමිටුවට යාමට. ඒ සඳහා යාමට යෝජනාවක් සම්මත කරගෙන ඒ සඳහා යාමට අවශ්‍ය කටයුතු සලස්වා ගන්න. යම්කිසි සාකච්ඡාවකට යාමට අවශ්‍ය නම් එම සාකච්ඡාවටත් යොමු විම කරිමටත් , කටයුතු සලස්වන්න. දෙල්දුව , අම්බලන්ගොඩ අසරණ දරුවන් වෙනුවෙන්. මේ මෑතක අපගේ නිවස අසළ දරුවෙකු කුලරත්න විද්‍යාලයට ඇතුලත් කර ගැනිමට නොහැකිව සිටියා. එම දරුවා වසරක පමණ කාලයක් නිවසට වී සිටියා. මා කුලරත්න විද්‍යාලයේ විදුහල්පතිතුමාට කතා කරලා මේ වසරේ තමයි එම දරුවා 2 ශ්‍රේණියට ඇතුලත් කරනු ලැබුවේ. එම දරුවාගේ අයියා ඉගෙනුම ලබන්නේ කුලරත්න විද්‍යාලයේමයි.නැතිනම් එම දරුවා ඇතුලත් විය යුත්තේ කන්දේගොඩ විද්‍යාලයට හෝ අනෝමදස්සි විද්‍යාලයට. මේ ගමේ පාසලට යාමට වියදම් දැරිමට අමාරු දෙමාපියන් කන්දේගොඩ ප්‍රදේශයට යාමට ප්‍රවාහන පහසුකම් සඳහා වියදම් දැරිමට සිදු වී තිබෙනවා. මේ මොළේ නැති අධ්‍යක්ෂකවරුද කියා මේ ව්‍යුහ කමිටුවේ සිටින්නේ. මේ ව්‍යුහ කමිටුවේ සිටින නොනාවරුන්ගේ හා මහත්වරුන්ගේ දරුවන් විතරක් රාජකාරිය පාසල් වලට ඇතුලත් කරනවා. අම්බලන්ගොඩ නගරයේ සාමාන්‍ය ජනතාවගේ දරුවන් යායුතුයි කන්දේගොඩට හා අනෝමදස්සි ආදි පාසල් වලට. මා දැක තිබෙනවා මා වැඩි ඇරි යන විට මේ නගර සභාව ආසන්නයේ දිගේම බස්රථ. ධර්මාශෝක විද්‍යාලය, කුලරත්න විද්‍යාලය, ප්‍රජාපති විද්‍යාලය දිගේම බස්රථ නතර කර ඇත. අම්බලන්ගොඩ ජනිත වූ දරුවන් ඇයි අර පාසල් දෙකට යා යුතු වන්නේ නැහැ. අම්බලන්ගොඩ නගර සිමාවේ දරුවන් ඇතුලත් කිරිමට ධම්මකුසල විද්‍යාලය නැවත ආරම්භ කර දරුවන් ඇතුලත් කිරිමට කටයුතු කළානම් හරිනේ ඔච්චරම අමාරුවක් තිබෙන ව්‍යුහ කමිටුවට.එහෙනම් කමක් නැහැ. අම්බලන්ගොඩ නගර සිමාවේ දරුවන්ට පයින් ගමන් කිරිමට පුළුවනි. විකල්පයක් ලෙස ධම්මකුසල විද්‍යාලය නැවත ආරම්භ කර එහි දමන්න ප්‍රථමික අංශයක්. මේ සඳහා උසාවියෙනුත් තින්දුවක් ලබා දී ඇත. මේ ව්‍යුහ කමිටුව සමඟ ගරු මන්ත්‍රිවරු 21ට සාකච්ඡාවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින්න. එවිට අපි මේවාට පිළිතුරු ලබා දෙන්නම්. අම්බලන්ගොඩ නගරයේ දරුවන්ට සාධාරණයක් ඉටු කිරිමට එක් වෙමු පෙල ගැසෙන්න කියා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ බල ප්‍රදේශය ගැන මේලෝක දැනුමක් නැති ගැටළුව ගැන නොතෙරෙන අධ්‍යාපන ව්‍යුහ කමිටුව සිංහල භාෂාවෙන් අපට ලිපියක් එවා ඇත. සත්‍ය වශයෙන්ම අම්බලන්ගොඩ ජීවත්වන බත් කන ජනතාවද ? ව්‍යුහ කමිටුව යයි නාමික හඳුන්වා ගත් කමිටුවට ඇති බලය කුමක්ද අපට මෙවැනි ලිපියක් එවිමට. සත්‍ය වශයෙන්ම ඉක්මනින් දැන ගත යුතුයි මේ පුද්ගලයින් කවුද කියා.අම්බලන්ගොඩ, කන්දේගොඩ , පොල්වත්ත, පින්නදුව, තල්ගස්ගොඩ , පනියන්දුව , ඕකන්ද , කෙරමිණිය ප්‍රදේශවල ජනතාවගේ දරුවන්ට ජාතික පාසල් ඉල්ලා සිටින්නේ නැහැ. මොවුන්ට දේවානන්ද විද්‍යාලයත් අකැප වි යනවා. ඒ විතරක් නෙමේ තිබුණු එකම බලාපොරෝත්තුව මේ කුලරත්න විද්‍යාලය පමණකි. මෙම කුලරත්න විද්‍යාලයේ විදුහල්පතිවරයා අම්බලන්ගොඩ නගරයේ දරුවන්ට 2,3,4 ශ්‍රේණිවලින් හෝ අපට යම් යම් සහන ලබා දී තිබෙනවා. නමුත් ඇතැම් අවස්ථාවල එතුමාත් අසරණ වෙනවා. එම නිසා අපි ඉල්ලා සිටි මෙම ඉල්ලිම මෙම කමිටුව කොතැන සිටියත්

කෙසේ හෝ අපට සහනය සලසා දෙන ලෙස . නමුත් කවුරුත් නොසිතූ නොපැතූ කොහොදෝ සිටි කමිටුවක තින්දුවක් අපට දැනුම් දී තිබෙනවා. මේ අවස්ථාවේ මෙම කමිටුවේ තීරණය ඉක්මවා අපට යා හැකි උපරිමයට යාමට අපි කටයුතු සලසනවා. ජනතාව පෙළ ගස්වමින් මෙම ඉල්ලීම ක්‍රියාත්මක කිරිමට පෙළඹෙන අතරම උප සභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීවරු 21 ම සිටින බව අපට විශ්වාසයි. ගා / පි ද එස් කුලරත්න විද්‍යාලයේ 1ශ්‍රේණියේ පන්තිය නැවත සක්‍රිය කිරිමට ජනතාව පෙළ ගැස්විමටත් එය ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය කටයුතු සලසා ගන්නා බව ප්‍රකාශ කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,අම්බලන්ගොඩ නගරයේ ජනතාවගේ මුදුන් මල් කඩක් බඳු කුලරත්න විද්‍යාලය පිළිබඳ අම්බලන්ගොඩ අධ්‍යාපන ව්‍යුහ කමිටුව තින්දු ගැනිමට ඔවුන්ට ඇති අයිතිය කුමක්ද? මා දන්නා තරමින් මෙම ව්‍යුහ කමිටුවේ සිටින්නේ අම්බලන්ගොඩ ප්‍රදේශය නියෝජනය කරන එක් පුද්ගලයෙකු පමණි. අනිත් අය පිට පළාත් වලින් පැමිණි අය. ඒ පුද්ගලයන්ට අම්බලන්ගොඩ ගැන කැක්කුමක් නැහැ. පසුගිය දිනක කුලරත්න විද්‍යාලයට ගරු දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍ය රාහසුපුත්‍ර මැතිතුමා පැමිණි විට විමසා සිටිනවා මෙම ස්ථානයේ බස් නැවතුම්පොළක්ද ඩිපෝ එකක්ද මෙහි පවතින්නේ කියා. ඒ තරමටම පිට පළාත් වලින් බස්රථ පැමිණ එම ස්ථානයේ ගාල් කර ඇත. අපි මහජන නියෝජිතයන් 21කු මෙම සභාව තුල සිටිනවා. එම ව්‍යුහ කමිටුවට වඩා අපිට අයිතියක් තිබෙනවා මේ ජනතාව වෙනුවෙන් කතා කිරිමට. මෙම ව්‍යුහ කමිටුවට ඉහළින් ඇති දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ කමිටුවට හරි දැනුම් දී මෙම යෝජනාව සම්මත කර ගැනිමට අවශ්‍ය කටයුතු සලසා ගන්නා ලෙස යෝජනා කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,ගා/පි.ද එස් කුලරත්න විද්‍යාලයේ පන්තියක් වැඩි කිරිමට ඇත්තටම අවශ්‍යතාවයක් නැහැ. අනුමත පන්තියක් මෙය. මිට වසරකට ඉහත කාලයකදි සංවර්ධන කමිටුවේදි මේ පිළිබඳව විමසා සිටියා. එවිට සිටි කලාප අධ්‍යක්ෂකතුමිය ප්‍රකාශ කර සිටියේ අනුමත පංතියක් ඇති බව. කුමන හේතුවක් නිසා හෝ පළාත් සභාව විසින් මෙම පන්තිය නතර කිරිම තමයි හේතුව. හැබැයි අනුමතයි පන්තිය. එම නිසා මෙයට අලුතින් අනුමතියක් ලබාදිය යුතු නැහැ. මා පසුගිය වසර වල විදුහල්පතිතුමාට 1 ශ්‍රේණියට දරුවන් ඇතුලත් කිරිමේදි පොල්වත්ත, පින්නදූව, කෙරම්ණිය, ඕකන්ද, තල්ගස්ගොඩ, පනියන්දුව,ආදි ප්‍රදේශ වල දරුවන් විශාල සංඛ්‍යාවක් සිටිනවා. මේ අපගේ නගරයේ සම්බන්ධ දරුවන්.ඔබතුමා මෙම පන්තිය විවෘත කර මෙම දරුවන් ටික ගන්නේ නැත්තේ. ඔබතුමාට මොකක් හරි ගැටළුවක් තිබේ නම් අපි ඉහලින් විසඳා දෙන්නම්. ගරු උප සභාපතිතුමා ප්‍රකාශ කළ ආකාරයට තල්ගස්ගොඩ, පොල්වත්ත, ආදි ප්‍ර දේශවලට ඉඩම් ගෙන ගියේ කවුරුත් නෙමේ. මේ හිරේවත්ත, පටබැඳිමුල්ල ප්‍රදේශ වල සුනාමියට අසුවූ ජනතාවයි. මා ගරු ගයාන්ත කරුණාතිලක අමාත්‍යතුමාගෙන් ඉල්ලිමක් කර තිබෙනවා අම්බලන්ගොඩ නගරයේ ඔප්පු නැති සියළුම ජනතාවට ඔප්පු ලබා දිමට කටයුතු සිදු කරන ලෙස. එතුමා ඒ සඳහා ප්‍රා දේශිය ලේකම්වරු දැනුවත් කර මිනින්දොරු දෙපාර්තමේන්තුවේ අදාල කටයුතු සිදු කර ඒ සඳහා යම් ක්‍රියා මාර්ගයක් ගෙන ඇත. මා සිතනවා 2019 වර්ෂයේ ඔප්පු නැති සියළු දෙනාටම ඔප්පු ලබා දීමේ හැකියාවක් ඇති වේ. එවිට ඔප්පුව නැති වුණත් පන්ති ගණන වැඩි වන විට ලකුණු ගණන අඩු වෙනවා ගරු උප සභාපතිතුමා ප්‍රකාශ කළ ආකාරයට. මෙහිදි සිදු වන්නේ අම්බලන්ගොඩ පදිංචි වි සිට ඉහත ප්‍ර දේශවල පදිංචියට ගිය දරුවන්ට මෙම අසාධාරණය සිදු වන්නේ. මා දන්නවා මේ කියන විදියට බටපොළ පාසලට යනවා දරුවන්. බටපොළ කල්‍යාණතිස්ස විද්‍යාලයට යනවා. මා කතා කර දරුවන් එම පාසලට ඇතුලත් කර දී තිබෙනවා. අද එම දරුවන් එම පාසලට යා යුතු නැහැ. අපිට කනගාටුයි. මෙතැන තිබෙන බස් සංඛ්‍යාව දුටු විට එම දරුවන් ඇතුළත් විය යුත්තේ ධර්මාශෝක විද්‍යාලයටයි. අපි එම පාසලට ගමන් කරනු ලැබූ වේ පයින්. 1970 ගණන් වල ඉතිහාසයට ගිය විට මෙහි එක වාහනයක් තිබුණේ නැහැ. මෙම මාර්ග

වල ගාල් කර. අද අපි කනගාටු වෙනවා. මෙම ප්‍රශ්නයේදී අපි ගරු මන්ත්‍රිවරු සියළු දෙනාම පක්ෂ භේදයක් නොමැතිව එකම තිරණයේ සිටි. මා ඔබතුමාට ප්‍රකාශ කර සිටින්නේ මේ පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමාට ලියන්න. මේ එක එක ව්‍යුහ කමිටුව අපිට අදාල නැහැ. අම්බලන්ගොඩ ප්‍ර දේශය පිළිබඳ කැක්කුමක් නැති, අම්බලන්ගොඩ පිළිබඳ දැනීමක් නැති , අඩුම ගණනේ ඔය ව්‍යුහ කමිටුව දන්නේ නැතිව ඇති නිදහස් අධ්‍යාපනයේ පියාත් අම්බලන්ගොඩ නගරයේ ඉපදුන කෙනෙක් බව.මාගේ බලවත් අප්‍රසාදය ඒ පිළිබඳව. අපේ මුතුන් මිත්තන් ගෙන රැකගෙන ආ නගරය, බුද්ධිමතුන් බිහි කරන ලද නගරය අපේ අනාගත පරපුරත් ඒ මුතුන් මිත්තන් ගෙන ආ අම්බලන්ගොඩ නගරය ඉදිරියට ගෙන යාම සඳහා . එම නිසා නැවතත් කියා සිටිනවා කුලරත්න විද්‍යාලයේ අලුතින් පන්තියක් ආරම්භ කිරිමට නොවේ තිබුණ පංතිය නැවතත් ආරම්භ කිරිමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ගරු ආණුඩුකාරතුමාට දන්වා සිටින්න. ඒ විතරක් නෙමේ මෙම පාසලේ විදුහල්පතිතුමාට මා ප්‍රකාශ කර සිටියා 2019 වර්ෂයේ අවසානයේ හෝ ගොඩනැඟිල්ලක් ඉදිකිරිම සඳහා මා යම්කිසි මුදල් ප්‍රතිපාදනයක් ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ලබා දෙන්නම් කියා. මේ අපි කටයුතු කරන්නේ අපේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සිදු කිරිමට අවශ්‍ය පහසුකම් ලබා දිම සඳහායි. මෙම ප්‍රශ්නයට ගරු ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡාවක් ලබා ගෙන හරි මෙම ප්‍රශ්නය විසඳිමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසයි. ගරු මන්ත්‍රිවරු21 නා මෙම ප්‍රශ්නය විසඳිමට පාරට බැස හෝ පෙළ ගැසි කටයුතු සලසන බවට ප්‍රකාශ කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

මෙම යෝජනාව ගෙන එනු ලැබු ගරු ශ්‍රේෂන් කෙරමිණියගේ මන්ත්‍රීතුමා විසිනි. පාසල් වලට ළමුන් ඇතුළත් කර ගන්නා මුල් සතිය ඇතුළත මහජනතාවගෙන් එන ඉල්ලීම් අනුව දැඩි අපහසුතාවයට පත්වේ. මෙම කමිටුව ගත් තීන්දුව අනුව ළමුන් 250 හරි 300 ක් වන්නට පුළුවනි. ධර්මාශෝක විද්‍යාලය හා දේවානන්ද විද්‍යාලය ගත්විට භාගයක් පමණ ඇත්තේ මුහුදයි. ඔය 250 දමනවානම් එම පාසල් දෙකට ඇතුළත් කර හැකියි. චක්‍රලේඛ අනුව කටයුතු කරන විට විදුහල්පතිවරුන්ටත් යම් යම් ගැටළු ඇතිවේ. එම නිසා එතුමන්ලා කැමති වුණත් මෙම චක්‍ර ලේඛ අනුව කටයුතු සිදු කළ නොහැකිය. වැඩිම ප්‍රදේශ ගණනක් ඇත්තේ කුලරත්න විද්‍යාලය ආසන්නවයි. එතුමා දන්නවා මෙහි මන්ත්‍රිවරයෙකු ලෙස හිටිය නිසා. එතුමා එම නිසා තමයි ප්‍රකාශ කරන්නේ මෙම ක්‍රමවේදයට යන්න කියා. එතුමා එම පාසලේ සිටිමටත් පුළුවනි. එම විදුහලේ නොසිටීමටත් පුළුවනි. හැමදාම සිටින්නේ නැහැ. මෙම ප්‍රශ්නය වෙනත් විදුහල්පති කෙනෙකු පැමිණි විට පෝරඹ , පනියන්දුව , ඕකන්ද , කෙරමිණිය, පින්නදූව, තල්ගස්ගොඩ, මහ අම්බලන්ගොඩ ,දෙල්දූව , දූව ආදි ප්‍රදේශ වල ළමුන් ඇතුළත් කිරිමට වෙන්නේ නැහැ. නමුත් ඕනැම දෙමාපියෙක් බලන්නේ ජනප්‍රිය පාසලට තම දරුවන් ඇතුළත් කරන්න. එම නිසා තමයි මෙම යෝජනාව ගෙනඑන ලැබුවේ . ඒ තිබුණු පන්තිය සක්‍රිය කර ගැනීම සඳහා.දෙමාපියන්ගේ දැඩි කලකිරිමක් තිබෙනවා මෙම ප්‍රශ්නය පිළිබඳ . නගරයේ දරුවන් පාසලට ඇතුළත් කර ගැනීමට නොහැකි වීම පිළිබඳව. මෙම දරුවන් ඇතුළත් කර ගැනිම සඳහා වැඩි දායකත්වයක් දෙනවා කුලරත්න විද්‍යාලයේ විදුහල්පතිතුමා. එම නිසා තමයි කුලරත්න විද්‍යාලයට පන්තියක් වැඩි කිරිම සඳහා ඉල්ලිම කරන ලද්දේ. මෙම ව්‍යුහ කමිටුවේ එක් නිලධාරියෙක් විදුහල්පතිතුමා සමඟ තිබෙන ගැටළුවකි මෙය. අපි දන්නවා එම ප්‍රශ්න ගැටළුව සම්බන්ධව. ප්‍ර දේශවාසින්ගේ දරුවන්ට අසාධරණයකට ලක්වෙන්න ඉඩ තියන්න බැහැ. ඔබතුමා මූලිකත්වය ගෙන මේ සඳහා ගත යුතු ඉහළම තින්දුව ගත යුතුයි. මෙම තනිමතයට ඉඩ දි මෙම කටයුත්ත සිදු කරන්න බැහැ. මෙම පන්තිය සක්‍රිය කිරිම සඳහා ගරු මන්ත්‍රිවරු ලෙස අපි ඕනැම අවස්ථාවක එකඟතාවය පල කරනවා. මහජන නියෝජිතයන් ලෙස මෙම ප්‍රශ්නය පැමිණෙන්නේ අපිටයි. ජනතාව ඇවිත් පවසන්නේ මහජන නියෝජිතයාටයි. මෙම විදුහල්පතිතුමා මෙම පොල්වත්ත ප්‍රදේශයේම පදිංචි වි සිටින නිසා මේ සම්බන්ධව හොඳින් දන්නවා. අම්බලන්ගොඩ ප්‍රශ්න හොඳින් දන්නවා. මන්ත්‍රිවරුන් ගිහින් කතා කළාම එම ප්‍රශ්නත් හොඳින් දන්නවා.චක්‍රලේඛ පටහැනිව දරුවන් ඇතුළත් කරන්න බැහැ.

එසේ කළාම එතුමාට ප්‍රශ්න එනවා. මෙම සියළු ප්‍රශ්න වලට විසඳුම ලෙස මෙම පන්තිය සක්‍රිය කිරිම බවත් ඒ සඳහා ගතයුතු ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, අම්බලන්ගොඩ ප්‍රදේශයේ දරුවන් පළමු වසරට ඇතුළත් කිරිම සම්බන්ධව බරපතල ගැටළුවක් තිබෙනවා. එයට විසඳුමක් ලෙස තමයි නැවත එම පන්තිය ලබා දියයුතු කාරණාව මතු වන්නේ. මා හට ඇති ගැටළුව වන්නේ මෙම පන්තිය ආරම්භ කළ විට අම්බලන්ගොඩ ප්‍රදේශයේ සිටින සියළුම දරුවන් ඇතුළත් කර ගත හැකිද යන්න පිළිබඳවයි. සමහර විට එහෙම කරන්න බැරි වෙයි. ඒ අය ගණන් හැදුවට තව ගැටළු ඇති වේ. බුද්ධදත්ත විද්‍යාලයට 6 වන ශ්‍රේණිය සඳහා පන්ති ආරම්භ කරන ලෙස අපි යෝජනාවක් කරනු ලැබුවා. අපි කලාප කාර්යාලයට ගොස් මේ පිළිබඳව සකච්ඡා කළ විට එම නිලධාරින් ද්වේශයෙන් තමයි කතා කරනු ලැබුවේ. අපි ධර්මාශෝක විද්‍යාලයේ ආදි සිසුන් නිසා ඉතා ශිලාචාර ලෙස කතා කර පැමිණියා. නමුත් බලාපොරෝත්තු නොවූ තත්වයකි ඔවුන් සිදු කරනු ලැබුවේ. එහි වළලක් තිබෙන්නේ. කොට්ඨාශ අධ්‍යක්ෂක, කලාප අධ්‍යක්ෂක , ගරු ඇමතිතුමා. ගරු අමාත්‍යතුමා මුණගැසිමට දින දෙකක් ගියා. අපිට මුණ ගැසිමට නොහැකි වුණා. එවැනි තත්වයකි ඇති වි ඇත්තේ. වළල්ල සම්පූර්ණ වෙනවා මුදල් වලින් එක තැනකින්. මා පොල්වත්තේ , විදුහල්පතිතුමාත් පොල්වත්තේ. මා ග්‍රහණය වූ ගතියකින් තිබෙන්නේ. අනෙක් පසින් බැලූ විට ධර්මාශෝකයට හා දේවානන්ද විද්‍යාලයට දරුවකු ඇතුළත් කර ගැනීමට අපි කැමති වන්නේ එම පාසලේ ඇති කිර්තිනාමය නිසායි. එම විද්‍යාල වල ගුරුවරු වැටුප් ලබන්නේ මෙම ජනතාව ගන්නා ලද බඩුවලට ගෙවනු ලබන බදු මුදල් වලිනි. එම බද්දේ අයිතිය අප ගමේ සැමදෙනාටම තිබෙනවා. එහෙත් මෙම දරුවන්ට මෙම පාසලට යාමට අයිතියක් නැහැ. කුලරත්න විද්‍යාලයට යාමට අයිතියක් නැහැ. එහෙම නැති නිසා තමයි අපි ඉල්ලා සිටියේ පොල්වත්ත බුද්ධදත්ත විද්‍යාලයේ 6,7 පන්ති ආරම්භ කරන්න කියා. එයටත් ඉඩක් නැහැ. මේ අධ්‍යාපන ක්‍රමය සකස් වි ඇත්තේ කුලි වැඩ කරන පුද්ගලයන් , පොල්කඩන මිනිසුන් බිහි කිරිම සඳහායි. උසස්පෙළ සමත් සිසුන්ගෙන් 1% ක් පමණයි විශ්ව විද්‍යාල වලට ගනු ලබන්නේ. විශ්ව විද්‍යාල වලින් එළියට ආවම ඒ අයට රැකියාවක් නැහැ. ගුරු පත්විමක් දිමට නැවත ඔවුන්ට විභාගයක් තියෙනවා.එවැනි තත්වයකි රටේ පවතින්නේ. එම නිසා මෙම ප්‍රශ්නය පටුකර දකින්න කැමති නැහැ. ජනතාව වෙනුවෙන් කතා කරන්න අවස්ථාවක් හම්බ වුණාම කතා කරන්න ඕන. මේ ප්‍රදේශයේ පමණක් නොව ලංකාවම පුරාම සිටින දරුවන්ට අධ්‍යාපනය ලැබිමට අයිතියක් තිබෙනවා. එම අයිතිය තමයි අපේ නිලධාරින් විසින් කොටු කර ඇත්තේ. ලංකාවේ 6% ක මුදලක් අධ්‍යාපනය සඳහා වෙන්කරන ලෙස අපි යෝජනා කර සිටිනවා. නමුත් වෙන්කරනු ලබන්නේ 1% ප්‍රමාණයකි. අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙන් ගන්න පුළුවන් පියවරක් ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

ආණ්ඩුකාරතුමාගෙන් මෙ සම්බන්ධව ඉල්ලිමක් කිරිම සුදුසුයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

මේ සම්බන්ධයෙන් අම්බලන්ගොඩ නගරයේ ජනතාවට ඉතාමත් වැදගත් මාතෘකාවක් සකච්ජා කරනු ලැබුවේ. පලමුවෙන්ම මා කියා සිටින්නේ මේ ව්‍යුහත්මක කමිටුව අදාල වන්නේ පළාත් අධ්‍යක්ෂතුමාටයි. එවිට අධ්‍යාපනය බෙදා තිබෙනවා පළාත් අමාත්‍යාංශයට හා ජේඛිය අමාත්‍යාංශයට. ජේඛිය අමාත්‍යාංශයට ජාතික පාසල් අයිති. කුලරත්න විද්‍යාලය පළාත් පාසලකි. පළාත් අධ්‍යාක්ෂකතුමියට තමයි කුලරත්න විද්‍යාලය අයිති වන්නේ. මෙම ව්‍යුහාත්මක කමිටුවට පළාත් පෝෂිත අම්බලන්ගොඩ කාර්යාලයට අයිති පාසල් තිබෙනවා. එයට අයිති පාසල් තමයි මේ ඉදිපත් කර

තිබෙන්නේ. අම්බලන්ගොඩ නගර සභාවට මේ ගරු මන්ත්‍රීවරු 21 නා පත්කර ඇත්තේ ජනතාවයි. එම දෙමාපියන්ගේ දරුවන් වෙනුවෙන් තමයි මේ කතා රන්නේ. එම දරුවන් වෙනුවෙන් තමයි මේ ඉල්ලීම කරනු ලැබුවේ. එහෙත් මෙම චක්‍රලේඛයට අනුව තමයි ධර්මාශෝක විද්‍යාලය වැඩ අයිනේ සිටියත් දරුවකු පාසලට ඇතුලත් කර ගත හැකි වන්නේ. එක තමයි මෙම ගරු ලක්ෂ්මි මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරන ලද බස් , කාර්, වෑන් වල ප්‍රතිඵලය. එම චක්‍රලේඛයට අනුව ජාතික පාසල් අධ්‍යක්ෂකතුමා විසින් යම් යම් සංශෝධන වසරින් වසර ඉදිරිපත් කරනවා. නමුත් අවසනාවකට අම්බලන්ගොඩ ප්‍රදේශයට සුවිශේෂී ප්‍රශ්නයක් තිබෙනවා. නමුත් ගාල්ල ප්‍රදේශයට මෙය නැහැ. ගාල්ලේ ජාතික පාසල් 10 ක් පමණ තිබෙනවා. ඒවා එකිනෙක පරයා යනවා. සවුත්ලන්ඩ්,රිච්මන්ඩ්,රිපන්, සංඝමිත්තේ, ආදි යම් පිළිගත් ජාතික පාසල් දෙමාපියන්ට තිබෙනවා ඒ යම් පාසලකට දරුවන් ඇතුළත් කර ගැනිම සඳහා.අම්බලන්ගොඩට පාසල් පෙළ ගැස්සුවාම තිබෙන්නේ ජාතික පාසල් ලෙස තිබෙන්නේ ධර්මාශෝක විද්‍යාලය , දේවානන්ද විද්‍යාලය හා කුලරත්න විද්‍යාලය පමණයි. ධර්මාශෝක විද්‍යාලයෙන් බැරි වුණාම බලනවා ජාතික පාසල් වශයෙන් දේවානන්ද විද්‍යාලයට බලනවා. මෙම පාසල් දෙක අතරේ දෝලනය වී එම පාසල් දෙක අහිමි වෙන පුද්ගලයෝ කුලරත්න විද්‍යාලය බලනවා. මෙන්න මේ කුලරත්න විද්‍යාලය පමණයි ගමේ දරුවන්ට ඇතුළත් විය හැකි අන්තිම ස්ථානය. කුලරත්න විද්‍යාලයේ විදුහල්පතිවරයා කැමති වෙනවා නම් මධ්‍යම රජය මෙම පන්තිය අනුමත කර දෙනවා නම් පළාත් ව්‍යුහ කමිටුව මෙය ප්‍රතික්ෂේප කිරිම ඉතාම කනගාටුදායක කරුණකි.මෙය විදහල්පතිවරයා තමයි මෙම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ යුත්තේ. එතුමාට තමයි මෙම ප්‍රශ්නයේ බරපතල ගැටළුව තිබෙන්නේ. 1 වසරට පන්තියක් වැඩි කළ විට පන්ති 11 වසර දක්වා පන්ති කාමර ප්‍රශ්නයට එතුමා මුහුණ දිය යුතුයි. 1 පන්ති කාමරයක් ආරම්භ කළ විට පන්ති කාමර 13 ක් අවශ්‍ය වෙනවා.මේ තමයි ඇත්ත තත්වය. එම බර දැරිය යුතු වන්නේ විදුහල්පතිතුමා. ගමේ ජනතාව වෙනුවෙන් විදුහල්පතිවරයා කැමැත්ත දී ඇති විටක මෙම ව්‍යුහ කමිටුවට විරුද්ධව එතුමාට යා නොහැකිය. ව්‍යුහාත්මක කමිටුව පළාත් සභාවෙන් ක්‍රියාත්මක වන්නේ. ඒ අය කුමන ප්‍රදේශවලින් නියෝජනය කළත් මේ ගම් ප්‍රදේශයට අදාළ නම් ඒ අයගේ දරුවන් යන්නේ ධර්මාශෝක විද්‍යාලයට. එහි දෙකක් නැහැ. ඔය කතා කරන මැති ඇමතිවරු ආදි සියළු දෙනාම කෑ ගැසුවාට සියළු දෙනාම ප්‍රමුඛත්වය දෙනු ලබන්නේ ධර්මාශෝක විද්‍යාලයට. කෙසේ හෝ එම පාසලට ඇතුලත් කර ගැනීමට උත්සාහ දරනවා. අපට ඡන්දය දුන් ගමේ ජනතාවගේ දරුවන්ට ධර්මාශෝක විද්‍යාලය, දේවානන්ද විද්‍යාලය , කුලරත්න විද්‍යාලයවත් නැහැ. අන්තිමට පොල්වත්ත බුද්ධදත්තේත් නැහැ. දරුවන් කීදෙනෙකු පොල්වත්ත බුද්ධ දත්ත විද්‍යාලය නොමැතිව නිවෙස් වලට වි සිටිනවාද? මෙය ඉතාම ශෝචනීය තත්වයකි. මෙය ඉතාම කනගාටුදායක තත්වයකි. මෙය පළාත් අධ්‍යක්ෂකතුමා, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ කාලය අවසන් වන නිසා ගරු ආණ්ඩුකාරතුමා , ජාතික පාසල් අධ්‍යක්ෂකතුමා සමඟ කතා කළ යුතු ප්‍රශ්නයකි. ජාතික පාසල් අධ්‍යක්ෂකතුමා සමඟ ගරු මන්ත්‍රීවරු 21 ට සාකච්ඡාවක් අපගේ ගරු සංවිධායකතුමාට ලබා ගත හැකියි. එම අවස්ථාව ලබා ගන්න. මෙම ප්‍රශ්නය විශේෂයි. මෙය අපි කතා කළ යුතුව තිබෙනවා. මොකද මා ධර්මාශෝක විද්‍යාලයේ පාසල් සමිතයේ ලේකම්වරයායි. ආදි ශිෂ්‍ය සංගමයේ උපසභාපතිවරයා. මෙහි වසර 30ක කාලයක සිට අපි පොල් ගැවේ නැහැ. අපි දන්නවා මෙහි සිදු වන්නේ මොකක්ද කියා. මේ ගරු මන්ත්‍රීවරු සියළු දෙනා කෑ ගැසුවාට අපට කරන්න දෙයක් ඉතිරි වී නැහැ. අපි දන්නා සියළුම සෙල්ලම් දමා තමයි ලකුණු 88 -90 අඩුකර ගනු ලැබුවේ. නැතිනම් පෝරම කවදාවත් අසුවන්නේ නැහැ. ඉතිහාසයේ ප්‍රථම වතාවට විදුහල්පතිතුමාට පින්සිද්ධ වෙන්න තමයි ඔය අසු වුණේ. නිත්‍යානුකුල චක්‍රලේඛයට අනුව 100% කළානම් 91-92 වෙනවා ඇතුළත් වීමේ ලකුණු. අපි සැම විටම උත්සාහ දරනවා ගමේ ජනතාවට එක් අවස්ථාවක් හරි ලබා දිමට. එය ඒ ආකාරයෙන් ක්‍රියාත්මක වුණාට අපි මන්ත්‍රීවරු විදියට සභාවක් විදියට ගමේ උපන් ජනතාවගේ දරුවන්ට බුද්ධදත්තේට , කන්දේගොඩට,අනෝමදස්සියට, අලුත්වල මහ විද්‍යාලයට හරි එම පාසල් වලට යන්න කියනවානම් එය සාධාරත්මක නැත. ඉතිහාසසය පුරාවටම අපේ මුතුන් මිත්තන් මෙම පාසල් බිහි කරනු ලැබුවේ ගමේ දරුවන්ට අධ්‍යාපන කටයුතු සිදු

කිරිමට. අවසනාවකට වගේ රජයේ චක්‍රලේඛ නිසා තල්ගස්ගොඩ, කෙරමිණිය ආදි මහදුරට යන්න අවශ්‍ය නැහැ. මේ පටබැඳිමුල්ල ප්‍රදේශයේ දරුවන්ටත් දේවානන්ද විද්‍යාලය අහිමියි. පටබැඳිමුල්ලේ දරුවාටත් සමහරවිට ධර්මාශෝක විද්‍යාලය අහිමියි. ලකුණු 1,2,3 තත්වයෙන්. මේ උපසභාපතිතුමා නියෝජනය කරන ගම්බිම් වලට ගියේ කවුද ? මේතුමා නියෝජනය කරන මේ තල්ගස්ගොඩ ප්‍රදේශයේ ගම් බිම්වල පදිංචියට ගියේ කවුද ? හිරේවත්ත , පටබැඳිමුල්ල ප්‍රදේශවල පදිංචිව සිටි ජනතාව තමයි තල්ගස්ගොඩ, ගොඩහේන ප්‍රදේශවල පදිංචියට ගියේ. ඒ අය කැමැත්තෙන් ගියේ නැහැ. යන්න සිදු වුණ නිසා තමයි ගියේ.රජය විසින් නිවාස සාදා දෙනු ලැබුවේ තල්ගස්ගොඩ. එහෙම නැත්නම් ගොඩහේනේ. මහ අම්බලන්ගොඩ , පටබැඳිමුල්ලේ , හිරේවත්තේ හෝ නිවාස අපි සාදා දුන්නේ නැහැ. රජයේ අවශ්‍යතාවය මත නිවාස තනා දුන් නිසා තමයි ඔවුන්ට නිවාස මාරු කිරිමට සිදු වුයේ. ඒ අයගේ අයිතිය පිළිබඳ ජාතික පාසල් අධ්‍යක්ෂකතුමා සමඟ අපිට කතා කරන්න තිබෙනවා. එම චක්‍රලේඛණය වෙනස් කිරිමේ එකම ස්ථානය එතැනයි. විදුහල්පතිතුමාට කැගසා වත් දේවානන්ද විද්‍යාලයට කුලරත්න විද්‍යාලයට ඇඟිල්ල දික් කරලවත් මෙම ප්‍රශ්නය විසඳන්න බැහැ ගරු සභාපතිතුමනි. මෙයයි ඇත්ත තත්වය පාසල් වලට දරුවන් ඇතුළත් කිරිම සම්බන්ධව. ඊළඟ වසරේ ජුනි වෙන විට මෙම චක්‍රලේඛණය සංශෝධනය වි පැමිණෙනවා. අපි ජාතික පාසල් අධ්‍යක්ෂකතුමා සමඟ සකච්ඡාවකට ගියෝත් දැන් අවස්ථාව තිබෙනවා. මේ මාර්තු මාසයේ ජුනි මසයට කලින් ජාතික අධ්‍යක්ෂකතුමා සමඟ යම්කිසි සාකච්ජාවකට ගියොත් අම්බලන්ගොඩ නගරයේ පමණක් නොව ප්‍රශ්න තිබෙන නරග වල ජනතාවගේ දරුවන්ට යම්කිසි සංශෝධනයක් සිදු කර ගත හැකිය. මහි මාතෘකාව වී ඇත්තේ කුලරත්න විද්‍යාලයේ 1 වසර පන්තියක් සක්‍රිය නොකිරිමයි. මෙම ප්‍රශ්නයට ඒ අයගෙන් මේ කෙටි වචන කිහිපයට වඩා සවිස්තරාත්මක පිළිතුරක් ඉල්ලා සිටින්න. මොකක්ද ඔබතුමාලා ඉදිරිපත් කරන හේතුව. පෝෂිත ප්‍ර දේශයේ කන්දේගොඩ මහ විද්‍යාලයයි, අනෝමදස්සියයි තිබෙන එක අපිට නිකම්ම බැහැර කළ හැකිය. ඒ අයට කියන්න පුළුවන්ද කවුරු දෙමපියන් මේ පාසල් දෙක ඉල්ලා සිටිනවාද ? මොකටද අනෝමදස්සිය ඉල්ලන්නේ අම්බලන්ගොඩ දෙමාපියන්. එය වැරදියි. අම්බලන්ගොඩ ඉපදුන ජනතාවගේ අයිතිය තමයි අම්බලන්ගොඩ ප්‍රදේශයේ පාසලකට දරුවෙකු ඇතුළත් කර ගැනීම. එය අවම සුදුසුකම. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඒ ජනතාවට ඇති අයිතියක් නැහැ.චක්‍රලේඛ, නිතිරිති , විවිධ රජයන් මඟින් පවරනු ලබනවා. ගරු මන්ත්‍රිවරු 225 අත ඔසවා මෙවා අනුමත කරනවා. නමුත් ජනතාව මේවා දන්නේ නැහැ. නගර සභාවේ ගරු මන්ත්‍රිවරු වශයෙන් නිතිය පටහැනිව ඊට වඩා යම් දෙයක් කිරිමට බැහැ. යම් ආකාරයකින් ජාතික පාසල් අධ්‍යක්ෂකතුමා මුණගැසි මෙය සංශෝධනය කිරිමට හැකියාවක් තිබෙනවා. එසේම ජාතික පාසල් අධ්‍යක්ෂකතුමා මෙන්ම ගරු ආණ්ඩුකාරතුමා මුණ ගැසි මෙයට විසඳුමක් ලබා ගනිමු යන මතයේ මා සිටිනවා. ගරු ඩෙනට් පනියන්දුවගේ මහතා කරන ලද යෝජනාව ඉතාමත් ප්‍රශස්තයි. ධර්මාශෝකය ඉදිරිපිට, දේවානන්ද විද්‍යාලය ඉදිරිපිට බස් තිබේනවා කියා අපි මෙය කතා කර වැඩක් නැහැ. මේ ගමේ ජනතාව වරිපණම් ගෙවා සියළු පහසුකම් සහිතව දෙමාපියන් 15000/= වෙනුවෙන් දරුවන් 6000/= 7000/= ක් වෙනුවෙන් අපි නොපසුරුව ලබා දෙනවා. එම පහසුකම් දෙන ගමන් අම්බලන්ගොඩ ජනතාවට යම් අසාධාරණයක් වෙනවා නම් අපිට එය ඉවසන්න බැහැ.අපි 21 නා පාරට බැස හරි මේ ප්‍රශ්නයට විසඳුමක් සෙවිය යුතු බවට යෝජනා කර සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මේ සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමා සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකතුමා සමඟ සකච්ජාවක් ලබා

**තීරණය**

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා විසින් අම්බලන්ගොඩ ගා/පී. ද එස් කුලරත්න විද්‍යාලයේ පළමු ශ්‍රේණිය සමාන්තර පන්ති 5 සක්‍රිය නොකිරීමට ගන්නා ලද තීරණය සම්බන්ධව ගරු මන්ත්‍රීවරු 21 ට ගරු අණ්ඩුකාරතුමා හා දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකතුමා සමඟ සාකච්ඡාවක් ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.06 අම්බලන්ගොඩ ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලයේ ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ අවුරුදු උත්සවය සඳහා වර්ණ ධජ හා කොඩිකණු 20 ක් , ප්ලාස්ටික් පුටු 100 ක්, කැනපි 05 ක් නොමිලේ ලබා දීමේ ලිපිය සභා ගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලයේ ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ අවුරුදු උත්සවය සඳහා වර්ණ ධජ හා කොඩිකණු 20 ක් , ප්ලාස්ටික් පුටු 100 ක්, කැනපි 05 ක් 2019 අප්‍රේල් මස 07 වන දින නොමිලේ ලබා දීම සඳහා සභා අනුමතිය ඉල්ලා සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලයේ ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ අවුරුදු උත්සවය සඳහා වර්ණ ධජ හා කොඩිකණු 20 ක් , ප්ලාස්ටික් පුටු 100 ක්, කැනපි 05 ක් නොමිලේ ලබා දිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.07 ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ වාර්ෂික සාමාජික මුදල පිළිබඳ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ශ්‍රී ලංකා පළාත් පාලන සංසදයේ වාර්ෂික සාමාජික මුදල පිළිබඳ මුදල සම්බන්ධව ලිපියක් ඉදිරිපත් කර ඇත. මෙම ලිපියේ දිර්ඝ විස්තරයක් තිබෙනවා. මෙහි අපි සාමාජිකයෙක්. එම සාමාජිකත්වය සඳහා නගර සභාව විසින් රු.10000/= ක මුදලක් ගෙවිය යුතුයි. එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා. මෙම රු.10000/= ගෙවිමට ප්‍රථම ගරු ඇමතිතුමාගේ අනුමතිය ලබා ගන්න.රු.1000 ක් පමණයි අපට ගෙවිය හැක්කේ. රු10000/= ගෙවන විට අනුමතිය ලබා ගත යුතුයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ඔය සංසදය තුළින් නගර සභාවටත් මොනවා හරි ගත හැකි ක්‍රමවේදයක් තිබේනවා නම් එය ලබා දෙන්න. කලින් මේස වගයක් දුන්නා කිවුවා. ඔබතුමා එදා කිවුවා මෙය නගර සභා ලේකම්තුමිය විසින් හොරා ගත්තා කියා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙම මේසය පළාත් පාලන සංසදයේ මේසයක් .එහි තිබ් තමයි ගලවා ගෙන ඇවිත් තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

හොරා ගත්තා වෙන්නේ නැහැනේ අපි සාමාජික මුදල් ගෙවනවානේ. නගර සභාවට මොනවා හරි දෙයක් ලබා ගැනීමට තිබේ නම් ලබා ගන්නා ලෙස අපි ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා මෙය බිහි කිරිමට දායකවු ප්‍රධාන පුද්ගලයෙකි. මෙහි හඳුන්වා දි තිබෙනවා අතුරු ව්‍යවස්ථා මාලාව හඳුන්වා දීම , නව පළාත් පාලන ක්‍රමය පිළිබඳ , පළාත් පාලනය හඳුන්වා දීම, නියෝජිතයන් හා නිලධාරින් දැනුවත් කිරිම , විදේශයන්ගේ පැවැත්වෙන පළාත් පාලන සමුළු සම්මන්ත්‍රණ පැවැත්විම සහ නියෝජිතයන් විශාල පිරිසක් සහභාගි කර වීම, මහ නගර සභා හා නගර සභා වල කාලින අවශ්‍යතාවයට අනුරූපිව ප්‍රසම්පාදන ක්‍රමයක් හඳුන්වා දීම. පළාත් පාලන නියෝජිතයන් විශාල ප්‍රමාණයකට පළාත් පාලනය විෂය කෙරෙහි කුසලතා දැනුවත් කිරිම,මුදල් කොමිසම සමඟ සකච්ජා පවත්වා පළාත් පාලනය වෙත ලැබිය යුතු මුදල් අප්‍රමාදව ලබා ගැනීමට කටයුතු කිරිම. මෙම සංගමය මැදිහත් වීම නිසා රජයේ සේවකයන්ගේ වැටුප් 20% ක් වැටුපෙන් හොරකම් කළා. එම හොරකම වලක්වා ගැනීමට හැකි වුයේ මෙම සංගමයට පිංසිද්ධ වෙන්න. තෙරතුරු දැන ගැනිම සඳහා පළාත් පාලනයට අනුගත කිරිම. පාළාත් පාලනය සඳහා නව ප්‍රසම්පාදන ක්‍රමයක් හඳුන්වා දීම ආදි වැඩ කටයුතු රාශියක් සිදු කර ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙතුමාට ඕනේ පළාත් සභාවම මෙයට පටලවා ගැනිමටයි. නමුත් යන්න ඉන්නෙත් පළාත් සභාමයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පළාත් සභාවට ඇත්තේ තව දින 7කි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දින 7 කින් අවසන් වන එක නෙමේ මා පවසන්නේ. මා ඉතිං දන්නවානේ ඔබතුමා සමඟ මා මේවට ගියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමා සිටින කාලයේ ගෙවනු ලැබුවේ 80% ක මුදලකි. රජයේ සේවකයන්ගේ වැටුප් නගර සභාවට එවනු ලැබුවේ 80% කි

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් ඒ හොඳ දේ අපි අභයනවා. අපි කියන්නේ එක නෙමේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඊට පසු වැටුප් කොමිසමට ගිහින් අහලා බැලුවාම 100% ගෙවනවා. පළාත් සභාවෙන් ඒ කාලයේ හොරකම් කරලා.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

මෙයත් සමඟ නගර සභාවට යම් සේවයක් වන විදියට වැඩ කටයුතු සිදු කළ යුතුයි. රු.10000/= ක මුදලක් බැඳ සාමාජිකත්වය ලබා ගන්න නිසාය. සමහර ගරු සභාපතිවරුන් පිටරට වල පවා යනවා. මේ සඳහා ප්‍ර යෝජනවත් වන විදියට වැඩ පිළිවළක් සකස් කරන ලෙසට යෝජනා කර සිටිනවා.

**තීරණය**

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය විසින් රු.10000/= ක වාර්ෂික සාමාජික මුදලක් එම ආයතනයට වෙත ගෙවන ලෙස කරන ලද ඉල්ලීම අනුව එම මුදල ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.08 දිස්ත්‍රික් රෝහල - අම්බලන්ගොඩ 2019.03.24 දින අම්බලන්ගොඩ දිසා රෝහල හා බලපිටිය මූලික රෝහල සමඟ පැවැත්වෙන සුහද ක්‍රිකට් තරඟය සඳහා පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණය නොමිලේ සහා අනුමතියට යටත්ව ලබා දිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

අම්බලන්ගොඩ දිසා රෝහල හා බලපිටිය මූලික රෝහල සමඟ පැවැත්වූ සුහද ක්‍රිකට් තරඟය පැවැත්වීම සඳහා ක්‍රිඩා පිටිය නොමිලේ ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිය පුද කරන අතර කැනපි 2 ක් හා පුටු 25 ක් සහා අනුමතියට යටත්ව නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

දිස්ත්‍රික් රෝහල - අම්බලන්ගොඩ 2019.03.24 දින අම්බලන්ගොඩ දිසා රෝහල හා බලපිටිය මූලික රෝහල සමඟ පැවැත්වෙන සුහද ක්‍රිකට් තරඟය සඳහා පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණය නොමිලේ සහා අනුමතියට යටත්ව ලබා දිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.09 ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ක්‍රීඩා නිළධාරි , ඩී. එච්.ඩී.එස්. කරුණාරත්න මහතා විසින් අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මලල ක්‍රීඩා උළෙල - 2019 වර්ෂයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හා පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය එක්ව සංවිධානය කරනු ලබන ක්‍රීඩා උළෙල සඳහා2019.03.23 දින පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය සඳහා කැනපි 06, පාට කොඩි කණු සමඟ 30, ප්ලාස්ටික් පුටු 50, ඔසවන කොඩි කණු (මුද්ද සහිතව) 03 සහා අනුමතියට යටත්ව ලබා දිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

අම්බලන්ගොඩ අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මලල ක්‍රීඩා උළෙල - 2019 වර්ෂයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හා පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය එක්ව සංවිධානය කරනු ලබන ක්‍රීඩා උළෙල සඳහා2019.03.23 දින පියසේන ක්‍රීඩාංගනය සඳහා කැනපි 06, පාට කොඩි කණු සමඟ 30, ප්ලාස්ටික් පුටු 50, ඔසවන කොඩි කණු (මුද්ද සහිතව) 03 සහා අනුමතියට යටත්ව නොමිලේ ලබා දි ඇත. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ක්‍රීඩා නිළධාරි , ඩී. එච්.ඩී.එස්. කරුණාරත්න මහතා විසින් අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මලල ක්‍රීඩා උළෙල - 2019 වර්ෂයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හා පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය එක්ව සංවිධානය කරනු ලබන ක්‍රීඩා උළෙල සඳහා2019.03.23 දින පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය සඳහා කැනපි 06, පාට කොඩි කණු සමඟ 30, ප්ලාස්ටික් පුටු 50, ඔසවන කොඩි කණු (මුද්ද සහිතව) 03 සහා අනුමතියට යටත්ව ලබා දිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.10 පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මඟින් අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම් දීම සම්බන්ධ 2019.03.11 දිනැති ලිපිය සභා ගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

අමත්‍ය මණ්ඩල තීරණ දැනුම් දීම. අමාත්‍ය මණ්ඩල තීරණ අංක 830:08 උක්ත කරුණට අදාළව පළාත් පාලන කොමසාරිස් විසින් මා වෙත යොමු කරන ලද 04/04/04හා 2019.02.22 දිනැති ලිපිය හා බැඳේ. දකුණු පළාත් සමාජ සුභ සාධන දෙපාර්තමේන්තුව මඟින් අඩු ආදායම්ලාභි ප්‍රජාව වෙනුවෙන් ලබා දෙනු ලබන ආධාර මුදල් වැඩි කිරිම සඳහා 2018.11.21 දින පැවති පළාත් පාලන අමාත්‍ය මණ්ඩල රැස්වීමේදි අමාත්‍ය මණ්ඩල තීරණ අංක - 830:08(05) යටතේ අනුමත කර ඇත. ඒ අනුව සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන වැඩිහිටි නිවාස, පුණ්‍යායතන ලෙස සළකා වැඩිහිටි නිවාස වල නේවාසිකව සිට මිය යන පුද්ගලයින්ගේ ආදාහන කටයුතු දකුණු පළාත් සභාව යටතේ පාලනය වන මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශිය සභා යටතේ පාලනය වන ආදාහනාගාර/ සුසානභූමි තුළ මුදල් අයකිරිමකින් තොරව සිදු කිරිමට අමාත්‍ය මණ්ඩලය අනුමත කර ඇති බව පළාත් පාලන කොමසාරිස්තුමා විසින් දන්වා ඇත.

**තීරණය**

සමාජ සුභ සාධන , පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන වැඩිහිටි නිවාස , පුණ්‍යායතන ලෙස සලකා වැඩිහිටි නිවාස වල නේවාසිකව මිය යන පුද්ගලයන්ගේ ආදාහන කටයුතු සඳහා මුදල් අයකිරිමකින් තොරව සිදු කිරීම කළ යුතු බවට පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයට, දකුණු පළාත් සමාජ සුභ සාධක දෙපාර්තමේන්තුව මඟින් අඩු ආදායම්ලාභි ප්‍රජාව වෙනුවෙන් ලබා දෙනු ලබන අධාර මුදල් වැඩිකිරිම සඳහා 2018.11.21 දැන පැවති පළාත් පාලන අමාත්‍ය මණ්ඩල තීරණ අංක -830:08(05) දැනුම් දීම පිළිබඳව ගරු සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

**03.11 ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් 2019 අන්තර් යෞවන සමාජ ප්‍රාදේශිය ක්‍රීඩා උළෙල සඳහා මානාන ක්‍රීඩාංගනය 2019.04.21 දින නොමිලේ ලබා ගැනිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

2019 වසරේ 31 වෙනි ජාතික යෞවන ක්‍රීඩා උළෙලේ ප්‍රථම අදියරයේ තරඟ යටතේ පවත්වනු ලබන අම්බලන්ගොඩ අන්තර් යෞවන සමාජ කණ්ඩායම් තරඟවන එල්ලේ, කබඩි, දැල්පන්දු තරඟ පැවැත්විම සඳහා මානාන ක්‍රීඩාංගනය මුදල් අයකර ගැනීමකින් තොරව ලබා දෙන ලෙස ඉල්ලා ඇත. පසුගිය වසරවලද ක්‍රීඩාංගනය ලබා දිම වෙනුවෙන් ස්තුතිවන්ත වන අතර තරුණ කටයුතු සම්බන්ධයෙන් ඔබ දක්වන සහාය ඉතා අගය කරයි.

**තීරණය**

ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් 2019 අන්තර් යෞවන සමාජ ප්‍රාදේශිය ක්‍රීඩා උළෙලේ ප්‍රථම අදියරේ තරඟ පැවැත්වීම සඳහා මානාන ක්‍රීඩාංගනය 2019.04.21 දින නොමිලේ ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ එකමතිකව සහා අනුමතිය ලබා දෙන ලදී.

**03.12 විදුලි සංදේශ , විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යාංශය සහ විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ක්‍රියාත්මක සුරක්ෂිත විගමනික සංක්‍රමණය පිළිබඳ ප්‍රචාරක වැඩ සටහන - ග්‍රාමීය මට්ටමේ දැනුවත් කිරිම පිළිබඳ ලිපිය සභා අනුමතියට යටත්ව ලබා දිම සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

විදුලි සංදේශ , විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යාංශය සහ විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ක්‍රියාත්මක සුරක්ෂිත විගමනික සංක්‍රමණය පිළිබඳ ප්‍රචාරක වැඩ සටහන - ග්‍රාමීය මට්ටමේ දැනුවත් කිරිම ඒ අනුව ට්‍රක් රථයකින් සමන්විත වන ප්‍රදර්ශන එක්දින වැඩසටහනක් පෙරවරු 08.30-පස්වරු 05.00 දක්වා සිදු කිරිමට සැලසුම් කර ඇත. මෙය සභා අනුමතියට යටත්ව ලබා දී තිබෙනවා. ඒ සඳහා සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

**තීරණය**

විදුලි සංදේශ , විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යාංශය සහ විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ක්‍රියාත්මක සුරක්ෂිත විගමනික සංක්‍රමණය පිළිබඳ ප්‍රචාරක වැඩ සටහන - ග්‍රාමීය මට්ටමේන් මහජනතාව දැනුවත් කිරිම සඳහා අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ ඉදිරිපිට භූමිය නොමිලේ සහා අනුමතියට යටත්ව ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ එකමතිකව සහා අනුමතිය ලබා දෙන ලදී.

**03.13සී.ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය මගින්වෙසක් තොරණට අධාර පිණිස පවත්වනු ලබන විනෝද ක්‍රීඩා විනෝද බද්දෙන් නිදහස් කර දෙන මෙන් ඉල්ලා ඇති ලිපිය සභා ගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

සී.ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය මගින්වෙසක් තොරණට අධාර පිණිස පවත්වනු ලබන විනෝද ක්‍රීඩා විනෝද බද්දෙන් නිදහස් කර දෙන මෙන් ඉල්ලා ඇත. ඉහත නම සඳහන් අප සමිතිය මගින් වසරක් පසා පවත්වනු ලබන වෙසක් තොරණ මෙම වසරේද 26 වන වරටත් අම්බලන්ගොඩ තනායම්පොළ ඉදිරිපිටද මාර්ගයේදි මහජන ප්‍රදර්ශනය සඳහා සියළුම කටයුතු සංවිධානය වෙමින් පවති. පසුගිය වර්ෂ වලදි මෙන්ම මෙම වර්ෂයේදිත් විශාල මුදලක් වැය කිරිමට සිදුවේ. මුදල් සපයා ගැනීමට තොරණට ආධාර පිණිස ප්රදර්ශනය කරනු ලබන විනෝද ක්‍රීඩාවන් වූ මැරිගෝ රවුම , කතුරු ඔන්චිල්ලාව , පුංචි කෝච්චිය යන ක්‍රිඩා මගීනි.එම ප්‍රදර්ශනයෙන් ලැබෙන ආදායම විනෝද බද්දෙන් නිදහස් කරන ලෙසට ඉල්ලීමක් කර ඇත.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, දෙන එකනම් කමක් නැහැ. ගියපාර තරුණ බෞද්ධ සංගමය මගින් ඉදිකරන ලද තොරණ සඳහා විරුද්ධ වුණා. මෙම තොරණ් ඉදිකරනු ලැබුවා මේ එන ලාභ වලට මොනවා වෙනවාද කියා දන්නේ නැහැ. විනෝද බද්දෙන් නිදහස් කෙරෙනවා නම් මොනවා හරි ප්‍රජා කටයුත්තක් මේ සමිති වලින් සිදුවිය යුතුයි.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

මෙතුමිය මේ කියන කතාව මෙයයි. ඔබතුමා සාකච්ඡාවකට කැඳවා කියා සිටින්න එක ක්‍රිඩාවකට අයකරන මුදල රු.200/= ,රු250/= ක් අයකරනවා.දරුවන් 3කු මේ එක් ක්‍රිඩාවකට රු.200/= ගණනේ සහභාගා වුවහොත් ඔවුන්ට එක් ක්‍රිඩාවකට යනවා රු.600/= ක මුදලක් වැයවෙනවා.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

එය අපට තීරණය කළ නොහැකිය. එය සංවිධායක මණ්ඩලය තමයි තීරණය කරනු ලබන්නේ.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

ඔබතුමා ප්‍රකාශ කරන්න මෙම විනෝද ක්‍රිඩා සඳහා විනෝද බද්ද නිදහස් කරනවා නම් මහජනතාවටත් යම්කිසි සහනයක් ලබා දෙන ලෙස. රු.100/= ක් වගේ නම් කමක් නැහැ. එවිට රු.300/= ක් මුදලක් තමයි වැය වන්නේ. එතකොට විනෝද බදු ගෙවන්න අවශ්‍ය නැහැ. සාකච්ඡා කර වැඩපිළිවළක් සකස් කරන්න. නැතිනම් අමාරුයි. තරඟ 5ක් තිබෙනවා. එම තරඟ 5 ට මෙපමණ මුදලක් වැයවන බව ජනතාව අපට පවසනවා.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

එහෙනම් අපි මෙසේ කිරිම සුදුසුයි. ලබා ගන්නා ලද ටිකට් එකෙන් විනෝද බද්ද අඩු කර ගන්න කියා. ඒ කියන්නේ රු.100/= නම් රු.25/= අඩුකර රු.75/= අඩු කරන්න. එවිට එය ජනතාවටයි.

ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්

එය සාධාරණයි.

**තීරණය**
සී. ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය මඟින් වෙසක් තොරණට ආධාර පිණිස පවත්වනු ලබන සියළුම විනෝද ක්‍රීඩා සඳහා අයකරනු ලබන ටිකට් පතක් සඳහා 25% ක මුදලක් අඩුකර ලබා ගැනීම සුදුසු ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රිවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.14 සී.ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය මඟින් පවත්වන වෙසක් තොරණේ ප්‍රචාරක කටයුතු සඳහා මැයි 18 සිට මැයි 24 වන දින දක්වා ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරිමට අවසර ඉල්ලීම සම්බන්ධ 2019.02.20 දිනැති ලිපිය සභාගත කරන ලදි.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

**සී.ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය මඟින් පවත්වන වෙසක් තොරණේ ප්‍රචාරක කටයුතු සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරිමට අපගේ අවසර ඉල්ලා සිටිනවා.**

**තීරණය**

සී. ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය මගින් වෙසක් තොරණේ ප්‍රචාරක කටයුතු සඳහා මැයි 18 සිට මැයි 24 වන දින දක්වා ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීම සඳහා සභාවේ අනුමතිය ලබා දිම සුදුසු බව ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.15 සී.ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය මගින් 2019 වර්ෂයේ වෙසක් තොරණ ඉදිකරලීමට අවසර ඉල්ලීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

**වෙසක් තොරණ ඉදිකිරිමට අවසර ඉල්ලා සිටිනවා. මෙය අපගේ මාර්ගයේ තමයි ඉදිකරනු ලබන්නේ. එම අවසරය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.**

**තීරණය**

සී. ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය මගින් වෙසක් තොරණ ඉදිකිරීම සඳහා අවසර ලබාදීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.16 මිටියාගොඩ ඇනෝන ක්‍රීඩා සමාජය හා වෙළඳ ප්‍රජාව සංවිධානය කරනු ලබන සංගීත සංදර්ශනයේ කටවුට් දෙකක් අම්බලන්ගොඩ නගරයේ ප්‍රදර්ශනය කිරිම සඳහා සභා අනුමතියට යටත්ව අනුමතිය ලබා දිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාවේ මන්ත්‍රි ඩබ්.ජී. ඉන්දිකා මහත්මිය විසින් ඉල්ලිමක් කර තිබෙනවා. සංගීත සංදර්ශනයේ කටවුට් දෙකක් ප්‍රදර්ශනය කිරිම සඳහායි. මීටියාගොඩ ඇනෝන ක්‍රිඩා සමාජය වෙළඳ ප්‍රජාව විසින් සංවිධානය කරනු ලබන සංගීත සංදර්ශනයේ 2019 මාර්තු මස 23 වන දින මීටියාගොඩ මහජන ක්‍රිඩාංගනයේදි පැවැත්විමට කටයුතු සංවිධානය කර ඇත . ඒ වෙනුවෙන් අම්බලන්ගොඩ නගරය තුල නොමිලේ කටවුට් දෙකක් ප්‍රදර්ශනය කිරිම සඳහා අවසර ඉල්ලා ඇත.

<u>**ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

එය බස්නැවතුම්පොළේ හැර ලබා දෙන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

නෑ දැන් මෙය ලබා දි අවසන්. බස්නැවතුම්පොළේ තිබුනේ නැහැ. මෙය සභා අනුමතියට යටත්ව ඉටුකර දි ඇත.

**තීරණය**

මිටියාගොඩ ඇනෝන ක්‍රීඩා සමාජය හා වෙළඳ ප්‍රජාව සංවිධානය කරනු ලබන සංගීත සංදර්ශනයේ කටවුට් දෙකක් අම්බලන්ගොඩ නගරයේ ප්‍රදර්ශනය කිරීම සඳහා සභා අනුමතියට යටත්ව ලබා දීම සුදුසු ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

**03.17 කැටන්තොට පාර - 1 පටුමග හිටපු නාගරික මන්ත්‍රී දිප්ති සරත් චන්ද්‍ර මහතා නමින් නම් කරනු ලෙසට කරනු ලබන ඉල්ලීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

කැටන්තොට පාර - 1 පටුමග හිටපු නාගරික මන්ත්‍රී දිප්ති සරත් චන්ද්‍ර මහතා නමින් නම් කරන ලෙස කරන ලද ඉල්ලීමයි. අම්බලන්ගොඩ මහ අම්බලන්ගොඩ කැටැන්තොට පාර 1 පටුමග ප්‍රතිසංස්කරණය කිරීමේදි හිටපු නාගරික මන්ත්‍රී දිප්ති සරත් චන්ද්‍ර මහතා පුරෝගාමීව කටයුතු කර ඇති අතර මෙම මාර්ගය පහත නම් සඳහන් අප විසින් භාවිතා කරන මාර්ගයයි. එම නිසා එතුමාට ගෞරවයක් වශයෙන් මෙම පාර දිප්ති ද සිල්වා මාවත නමින් නම් කරන ලෙස ජුවන්වඩු ජස්ටින් සිල්වා, කේ.පී.හේමලතා ද සිල්වා,හේතුමුනි පියවති සිල්වා,පී.කේ.ධම්මිකා, ඩී.ශ්‍යාමා ලක්මාලි, ආර්.එම්.චතුරිකා මධුෂාණි,එම්.ඩබ්.විමලසිරි, කේ.ඒ.වෙරි නන්දසිරි, කේ.කේ.පී.උෂාන්ත,එම්.සුමතිපාල,පින්නඳුවහේවා සන්ධ්‍යා සුදර්ශනි යන අය විසින් ඉල්ලීමක් කර ඇත.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, එතුමා හිටපු ගරු මන්ත්‍රීවරයෙක් මෙන්ම අප සියළු දෙනාම හඳුනන සමාජයට සේවයක් කරන ලද පුද්ගලයෙකි. අනෙක් කරුණ මෙය ප්‍රධාන මාර්ගයකුත් නෙමේ. මේ සඳහා නමකුත් නැහැ. එතකොට මේ අඩිපාර හදන්න මූලික වි කටයුතු කර ඇත්තේ මෙතුමා. ජනතාවට වාහනයක් ගෙන යාමේ තත්වයට පත් කර ඇත්තේ එතුමායි. එම නිසා මා යෝජනා කර සිටිනවා. මේ නගර සභාව නියෝජනය කරමින් ඒ කාලයේ තිබුණේ කොට්ඨාශ ක්‍රමයක් නෙමේ මනාප ක්‍රමයකි. එම ක්‍රමය තුලත් මේ නගරයට යම් සේවයක් කරන ලද ගරු මන්ත්‍රීවරයෙකි. මෙම ජනතාව කරන ලද එම ඉල්ලීම දිප්ති සරත් චන්ද්‍ර මහතා නමින් නම් කිරීම ඉතා හොඳයි. එය නම්කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**</u>

වාම දේශපාලනයේ යුග පුරුෂයකු වූ අම කරුණාරත්න මැතිඳුන්ට සවිමත් අත්වැලක් වූ හිටපු නාගරික මන්ත්‍රීසර දිප්ති සරත් චන්ද්‍ර සිල්වා නමින් එම පටුමග නාමකරණය කිරීම පිළිබඳ අපගේ සතුට පළ කරනවා. උදාතරයෝ පහළ වන්නේ ඉතාම කලාතුරකිනි. එදා මහ අම්බලන්ගොඩ ප්‍රදේශය බැබළීමට ලක් කළ එ ගරු නාගරික මන්ත්‍රීතුමන් එතුමන්ගේ ඒ සාධනීය ලක්ෂණ අපි කුඩා වුවත් සංදියේ දුටුවා.එතුමන්ගේ වචනය , ක්‍රියාව එම කාලයේදි අප අත් දුටුවා. එතුමා ගැන පැහැදුනු එම ගම් වැසියන් තම වසන මාර්ගය එතුමා නමින් මෙම මාර්ගය නම් කළ යුතු යයි යෝජනා කර ඇත. අපගේ ගරු විපක්ෂ නායකතුමා සඳහන් කළ පරිදි සභාවක් විදියට මේ සඳහා විරුද්ධ විමට කිසිම හේතුවක් නැත. මා සිතනවා ගරු සභාවේ අදහසත්, එම වැසියන්ගේ අදහසත් සමපාත වෙනවා කියා. අපට ඇත්තේ නිත්‍යානුකූලව මෙම කටයුත්ත ඉටුකර දිම පමණයි. එ සඳහා ඔබතුමාට මේ සාධණිය අදහස පහල වේවා, අපේ ගරු මන්ත්‍රී මණ්ඩලය මේ සඳහා එකඟ වේවා.

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි,ගරු සභාපතිතුමා, මාත් 1197 වර්ෂයේ නගර සභාව නියෝජනය කිරිමට පත් වු කාල වකවානුවේ තමයි එතුමාත් නගර සභාවට තේරි පත්වුයේ. අපි දෙදෙනාගේ ආසන තිබුණේ එක කිට්ටුවෙනි. එකතැන සිට එම සභාව නියෝජනය කරනු ලැබුවා. ආවසනාවකට වගේ ඉතා වටිනා සම්පතක් අම්බලන්ගොඩ නගරයට අහිමි වුණා. එතුමා අපගෙන් වෙන් වි ගියා. දැඩි ජනතාවාදි නායකයෙකු ලෙස තමයි එතුමා දකින්නේ. එතුමා ප්‍රදේශය වෙනුවෙන් වැඩ කරන විට කැප කිරිමෙන් වැඩ කළ මන්ත්‍රිවරයෙකි. පාරවල් නම්කර බෝඩ් සැකසිමට ගිය අවස්ථාවල එකිනෙක මිනිසුන් ඒවා සවි කිරිමට ඉඩ දුන්නේ නැහැ. මට මතකයි ගරු ශ්‍රේෂන් කෙරම්ණිය මන්ත්‍රිතුමාගේ ගරු ස්වාමින් වහන්සේගේ නම යොදා සකස් කිරිමට ගිය අවස්ථාවේ අනුමත වෙලත් ක්‍රියාත්මක කරන්න හම්බ වුණේ නැහැ. එම නිසා එතුමාට අගෞරවයක් වන විදියට මෙය කරන්න එපා. හරියට විරෝධතා කැඳවා නිත්‍යානුකුලව මෙය සිදු කරන්න. නම ගසා ගලවන තත්වයට උදා කරන්න එපා. වම් කිසි ප්‍රශ්නයක් ඇති වුවහොත් මේ සභාව නියෝජනය කරපු එතුමාට අගෞරවයක් වන විදියට මෙය සිදු කරන්න එපා. එතුමාට ගෞරවයක් ඇතිවන ආකාරයට මෙය සිදු කරන්න. නියම මහජන නියෝජිතයකු ලෙස මේ සභාව නියෝජනය කරනු ලැබුවා. එම ගෞරවය එතුමාට ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්

ගරු සභාපතිතුමනි, මහ අම්බලන්ගොඩ ප්‍ර දේශයෙන් බිහි වු මහජන නියෝජිතයෙකු ලෙස දිප්ති සරත් චන්ද්‍ර මහතා පිළිබඳව කතා කළ යුතුමයි.1997 දි එතුමා ගරු නගර සභා මන්ත්‍රිවරයෙක් ලෙස කටයුතු සිදු කරන අවස්ථාවේදි මාත් එම අවස්ථාවේ ගරු මන්ත්‍රිවරියක් ලෙස සේවය කළා. අපි ඉතාමත් සුහදව මහ අම්බලන්ගොඩ ප්‍රදේශය වෙනුවෙන් වැඩ කටයුතු සිදු කළා. විශේෂයෙන්ම සද්ධාසේන මාවත ( දෙල්දුව පාර) පුළුල් කර සංවර්ධනය කරන විට ඉතාමත් සහායෝගයෙන් වැඩ කටයුතු සිදු කළා. අපි අවේගශිලි වන විට එතුමා මහජනතාව සමඟ ඉතා සුහදශිලිව වැඩ කටයුතු සිදු කළා. අද මහ අම්බලන්ගොඩ තිබෙන මහජන පුස්තකාලයත් පෙර පාසලත් හිටපු ගරු නගර සභා මන්ත්‍රි හේමසිරි මහතාත් මාත් එතුමාගේත් දැඩි කැපකිරිම් කර උත්සාහ කිරිමෙන් තමයි එවැනි දේවල් සිදු කිරිමට කටයුතු කරනු ලැබුවේ. මේ මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලිමක් තමයි මේ ඉල්ලා ඇත්තේ. හෘද සාක්ෂියට එකඟව පිදිය යුත්තන් පිදීම අප සිදු කළ යුතු නිසාය. එතුමා අකාලයේ අප අතරින් වෙන්ව ගියත් මහ අම්බලන්ගොඩ ජනතාවගෙත් නගර සීමාව තුල ජිවත්වන අම්බලන්ගොඩ ජනතාවගේත් ලොකු ගෞරවයක් එතුමා කෙරෙහි තිබෙනවා. මොකද අද දේශපාලන අධිකාරිය දිහා බැලුවිට ඔවුන් වැඩ කටයුතු සිදු කරන්නේ පුද්ගලික අරමුණු කරායි.ගමේ ජනතාව යම්කිසි ප්‍රශ්නයක් ගෙනවිත් ඉදිරිපත් කළ විට මහජන නියෝජිතයකු ලෙස එය ඉටු කිරිමටයි කටයුතු සිදු කළේ. මෙම යෝජනාව ගෙන එම සම්බන්ධව ඇත්ත වශයෙන්ම සහෝදර ගරු මන්ත්‍රිවරුන් මේ සඳහා සහායෝගය ලබා දෙයි කියා සිතනවා. දිප්ති චන්ද්‍ර මහතා නමින් නම් කිරිමට කටයුතු කරනු ලැබුවේ බවානි පාපඩම් ආයතනය අසළින් යන මාර්ගයයි. එම මාර්ගය සැදිමට මුලිකවම කටයුතු කරනු ලැබුවේ එතුමා. ඒ ඔබතුමාත් එවකට සභාපතිත්වය දරන සමයේ. එතුමා වෙනුවෙන් මෙම මාර්ගය නම් කිරිමට නිත්‍යානුකුලව මෙය සිදු වෙන ආකාරයට සාර්ථක ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්

ගරු සභාපතිතුමනි, ගරු හිටපු නගර සභා මන්ත්‍රි දිප්ති සරත් චන්ද්‍ර මහතා නමින් මෙම මාර්ගය නම් කිරිමට යෝජනා කර ඇත්තේ එතුමා විසින් ගමට වැඩ කිරිම සහ හිතවාදිව කැප කිරිමෙන් කටයුතු සිදු කළ නිසාය. පළමුවෙන්ම මෙවැනි කෙනෙකුගේ නමින් එම මාර්ගය නම් කිරිමට යෝජනා කිරිම ගැන එම ගම් වැසියන්ට ස්තුති වන්ත වෙනවා. ගම්වැසියන් සමඟ හිතවාදිව ගමට සේවයක් කරන ලද දිප්ති

සරත් චන්ද්‍ර මහතා නමින් මෙම මාර්ගය නම්කරන ලෙසට ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.ගරු උප සභාපතිතුමා ප්‍රකාශ කළ ආකාරයට නීත්‍යානුකූලව මේ මාර්ගය නම්කිරිම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන්න. ගම්වැසියන් එතුමාට ගෞරව කිරිමක් ලෙස මෙම මාර්ගය නම් කළා සේ එතුමාට කැළලක් නොවන පරිදි මෙය සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතාකතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ ජනතාවගෙන් දිප්ති සරත් චන්ද්‍ර මහතා නමින් නම් කිරිම සම්බන්ධව ගෙන එනු ලැබූ යෝජනාව ඉතාමත් සතුටින් පිළිගන්නවා. මෙය ගම් වාසින්ගේ ඉල්ලිම . එම ගම් වාසින්ගේ ඉල්ලිම හිස් මුදුනින් පිළිගන්නවා. එතුමා වමේ දේශපාලනයෙන් ඉතිහාසගත පවුලකින් පැවත එනු ලබන පුද්ගලයෙකි. අවාසනාවකට අකාලයේ මිය ගියත් ඔවුන් විසින් සිදු කරනු ලැබූ සේවය මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ ජනතාව ඉතා හොඳින් දන්නවා. එයට කෘතගුණ සැලකිමක් වශයෙන් තමයි මෙම යෝජනාව ගෙන එනු ලබන්නේ.ලංකාව පුරාම මෙවැනි දේ සුලභ දෙයක් ලෙස අදාල මාර්ග නම්කිරිම සභාවේ සභාපතිතුමා නමින් හෝ මන්ත්‍රීවරුන් නමින් නම් කිරිම සාමාන්‍ය දෙයකි.මේ සභාවට යෝජනා ගෙනවිත් , එය සම්මත කර එතුමා නමින් මෙම මාර්ගය නම් කිරිම ඉතාමත් කලෝචිත බව මා ප්‍රකාශ කර සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මෙය දැන් සාකච්ඡා කළ පසු යෝජනාවක් ගෙන ආ යුතුයි. මෙය ඉදිරියට කටයුතු සිදු කරනවා.

**තීරණය**
කැටන්තොට පාර - 1 පටුමග හිටපු නාගරික මන්ත්‍රී දිප්ති සරත් චන්ද්‍ර මහතා නමින් "දිප්ති ද සිල්වා " මාවත ලෙස නම්කරන ලෙස ගම්වැසියන් විසින් කරනු ලබන ඉල්ලිම ගරු සභාව විසින් පිළිගත් අතර මේ සම්බන්ධව ලබන සභාවට යෝජනාවක් ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.18 අම්බලන්ගොඩ නගර සභාවේ කර්මාන්ත සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා දිනමිණ , තිනකරන්, Daily News ආදි පත්තර වල ඉංග්‍රීසි හා සිංහල මධ්‍යයෙන් දැන්වීම් පල කිරිම සඳහා සහා අනුමතියට යටත්ව දැන්වීම් පලකිරිම පිළිබඳ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ නගර සභාවේ කර්මාන්ත සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා දිනමිණ , තිනකරන්, Daily News ආදි පත්තර වල ඉංග්‍රීසි හා සිංහල මධ්‍යයෙන් දැන්විම් පල කිරිම සඳහා රු.136494/= ක මුදලක් වැයවෙනවා. මේ සඳහා ඉල්ලිමක් කර තිබෙනවා. සිංහල හා ඉංග්‍රීසි මධ්‍යයෙන් පමණක් පළ කරන ලෙසට. ඒ සඳහා සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

මොනවා සම්බන්ධ ද දැන්විම් පලකරනු ලබන්නේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

නැ. භාෂා තුනේන්ම දැමිය යුතු බව පවසනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

මෙම මුදල අඩුකරගත නොහැකිද? මෙම දැන්වීම කුඩා කර. රු.136000/= ක් කියන්නේ මධ්‍ය ඉතා සුලභ වන නිසා රජයේ ආයතනයක් කියා ලේක්හවුස් ආයතනයට මෙවැනි විශාල මුදලක් ගෙවීම ප්‍රශ්නයකි. ඇයි කුඩා කිරීමට බැරි. මේ දැන්වීමේ ලොකු ප්‍රතිලාභයක් නගර සභාවට ලැබෙන්නේ නැහැනේ. මෙම දැන්වීමට එක් පුද්ගලයෙක් හෝ දෙදෙනෙක් තමයි ප්‍රතිචාර දක්වනු ලබන්නේ. වරිපණම් දැන්වීමද ? මොකක්ද මේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ප්‍රසම්පාදන දැන්වීම්. ටෙන්ඩර් කරනු ලබයි. මාර්ග ඉදිකරන ඒවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

කොහොම කළත් මෙය ගන්නවා කොන්ත්‍රාත් කරු නොපැහැදිලි අකුරෙන් ගන්නවා. . මෙය නිත්‍යානුකූල තත්වය ඇතිකිරීම සඳහා වුවත් මේතරම් මුදලක් විශාල මුදලක් වැය කිරීම සුදුසු නැහැ. රු50000/=,රු.60000/= ක් දක්වා අඩුකර ගත හැකියි. මේ වෙනුවෙන් අපට ප්‍රතිලාභයක් නොමැති නිසා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙය මා හිතන්නේ සිංහලෙන් විතරක් පළ කළාම ඇති.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ඔව් මෙය සිංහලෙන් විතරක් පල කළාම ඇති. ඉංග්‍රීසියෙන් අවශ්‍ය නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

මෙය තව අහල් 3ක් විතර අඩුකර ගත හැකියි.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ අප සකස් කරන ලද ලිපියයි. පත්තර දැන්වීම තිබෙනවා වෙනම.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මෙම කර්මාන්ත ඉදිකිරීම සඳහා ප්‍රදේශවල බොහෝ පිරිසක් සිටිනවා. එසේ සිටියදි ටෙන්ඩර් කිරීම සිදු කර ඇත්තේ ඇයි?

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රීවරුන්ට මෙම මාර්ග සඳහා කොන්ත්‍රාත් කරුවන් ඉදිරිපත් කරන්න කිවූ විට ඔවුන් ඉදිරිපත් වුයේ නැහැ. ඒ ඉදිරිපත් වන තුරු සිටින වාට වඩා අපගේ වැඩ ටික ඉවර කළ යුතුයි. එම නිසා ප්‍රසිද්ධ දැන්වීමක් මඟින් ඕනෑම කොන්ත්‍රාත්කරුවෙකුට පැමිණ වැඩය කිරීමට පුළුවනි.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**

මේ සඳහා අපි කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් කර තිබෙනවා. නමුත් තාක්ෂණසේවා නිලධාරින්ගේ ප්‍රමාදය තමයි තිබෙන්නේ. එම නිසා තමයි ඔවුන්ට මෙය කරගත නොහැකි වුයේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නෑ. එහෙම එකක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණයගේ මහතා කතා කරමින්</u>**

මොකද එහෙම දෙයක් සිදු නොවුයේ. එහෙම තමයි සිදුවුයේ අපේ ප්‍රදේශයේ. අපේ ඇස්තමේන්තු බලා දෙතුන් සැරේ පැමිණ මේ අය රාස්තියාදු වෙනවා. තාක්ෂණසේවා නිලධාරින් වෙන වෙන වැඩ. එම නිසා නැවත හැරි ගියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙම ඇස්තමේන්තුව බලා සමිතියක් තිබේ නම් ගරු මන්ත්‍රීතුමා යෝජනා කර තිබෙනවා නම් එය සිදු කිරිමට හැකියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණයගේ මහතා කතා කරමින්</u>**

මා සිතන්නේ ඒ සඳහා යන වියදම අපරාදේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ කොට්ඨාශ වල සියළු මන්ත්‍රිවරුන්ට කියා සිටියා ඒ කොට්ඨාශවල කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් කරන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණයගේ මහතා කතා කරමින්</u>**

මා ඉදිරිපත් කළා. කිහිප දිනකම ඇවිත් බැලුවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා  නම් මුණ ගැසුනේ නැහැ. ඔබතුමා ලිපියක් දී එවන්න . අදාල සමිතියට මෙය පවරන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණයගේ මහතා කතා කරමින්</u>**

භය නිසා මුණ ගැසිමට එන්නේ නැතිව ඇති.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නෑ . මා මුණ ගැසිමට බයවෙන්න දෙයක් නැහැ. ලිපියක් දී එවන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ප්‍රදේශයේ වැඩ කටයුතු ලංකාව පුරාම සිටින අයට ඉටු කිරිමට නොදෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැනට ආරධනා කර තිබෙනවා. දැනට සාධාරණව බැලුවොත් එහෙම කොන්ත්‍රාත්කරුවන් 2 කු පමණයි සිටින්නේ. මේ දෙදෙනාගෙන් මේ නගරයේ අවශ්‍යතා අපිට ඉටුකළ නොහැකියි. එසේ බැරි නිසා තමයි ලංකාව පුරාම දැන්විම පළකර මෙය කරන්න ආරධනා කර තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙහි තිබෙනවා කිසියම් ගැටළුවක්. ගෙවිම පරක්කු වුණාම ඔය ඉන්න කට්ටිය එන්නේ නැහැ. අරක නැහැ. මේක ගෙව්වේ නැහැ කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සියල්ල පරක්කු කරන්නේ පළාත් සභාවෙනි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නැහැ පළාත් සභාවෙන් නෙමේ. අපෙන්. මේවා නිසිලෙස යවන්නේ නැති නිසා තමයි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

කලින් ප්‍රශ්නය නෙමේ දැන් සිදු වි තිබෙන්නේ. දැන් වෙනදා සභාවෙන් අනුමත කරන්න කිව්වාම ගෙවිම් කරනවා. දැන් සභාවෙන් අනුමත කර පළාත් සභාවටත් යැවිය යුතුයි මේවා ගෙවීමට. පළාත් සභාවෙනුත් අනුමත වි ගෙවිම් කරන්න මාස 2 ක් විතර යනවා . එහෙම තමයි ප්‍රමාද වීම සිදු වන්නේ. සභාවේ නැතිව වෙන ප්‍රමාදයක් නෙමේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමා ඔහොම කියනවා. දැන් මූල්‍ය කමිටුවට සහභාගි වූ විට සමහර ගෙවීම් නිලධාරින්ගෙන් එන ඒවා අඩුයි. එවිට ගරු සභාපතිතුමාට ප්‍රකාශ කරනවා මෙය ගෙවන්න කියා. එතන නෙමේ අර ලිපිගොණු වල මොකක් හරි අඩුපාඩු තිබෙනවා.එසේ නම් කොන්ත්‍රාත්කරුවෙකු මෙය සිදු කළත් මෙයයි සිදු වන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔබතුමා මෙය පැහැදිලි කරන්න. ඔබතුමා කලින් කිව්වේ ගෙවිම් පරක්කු වෙනවා කියා. ගරු මන්ත්‍රිතුමා යමක් කිව්වාම පිළිගන්න. ඔබතුමා දන්නවා මේ සභාවේ ගෙවිම් කළේ කොහොමද කියා. මේ සභාවේ අනුමත කළානම් මෙච්චර මුදලක් ගෙවන්න කියා තාක්ෂණසේවා නිලධාරි මහතාගේ නිර්දේශය පරිදි අනුමත කරනවා නම් ලේකම්තුමිය , සභාපතිතුමිය අත්සන් කරනු ලැබුවා . දැන් ලක්ෂ 5 ට වැඩියේ මේ සභාවට ගෙවන්න බැහැ. මෙය කෙලින්ම පළාත් සභා යැවිය යුතුයි.එහි ඉංජිනේරු මහතා සහතික කර, කොමසාරිස්තුමා සහතික කිරිමෙන් පසු තමයි මෙහාට එවන්නේ. එ නිතිය කලින් තිබුණේ නැහැ. සභාව වෙනස් වු පසුවයි එය සිදු වුයේ. ඇත්ත කතාව එයයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ එහෙම නිතියක් කලින් සිදු වුයේ නැහැ. අපි අප්‍රේල් මස 10 පසු එය වෙනස් කර ගැනිමට බලාපොරෝත්තු වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙතුමා පළාත් සභා යැව්වානම් ඕනම වැඩක කරගත හැකියි. මෙතුමාගේ ඕන වැඩක් කරගනු ලබන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එය ගරු ආණ්ඩුකාරතුමා 10 පසු එම තත්වය වෙනස් කර දෙන්නම් කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඊට වඩා හපන් වෙයි.ගරු ප්‍රධාන අමාත්‍යතුමා නිසා ඔහොම හරි කළා. ඔබතුමා ගරු ප්‍රධාන අමාත්‍යතුමා සමඟ ඔබතුමා තරහා නිසා තමයි එසේ ප්‍රකාශ කරන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි තරහක් නැහැ. අපි ඉතා යාළුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමා හිතා ගන්න. මීට වඩා හපන් වෙයි. ඔබතුමා දුරකථනයෙන් කතා කරගෙන යම් යම් කරුණා ඉෂ්ඨ කර ගන්නවා. එය ප්‍රකාශ කරන්නේ නැහැ ඔබතුමා. ඔබතුමා හිතන් විදියට වැඩ කෙරෙන්නේ නැහැ. ඔය ගරු ප්‍රධාන අමාත්‍යතුමා සිටින නිසා තමයි ඔහොම හරි වැඩ ගන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ නිසා වෙන්නැති අපගේ නමට රේජිස්ටර් කරන ලද ට්‍රැක්ටරය හික්කඩුව නගර සභාවට දී තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් එදා කිවුවා මුදල් එවන්නේ නැහැ කියා. එහෙත් ලක්ෂ 80ක මුදලක් එවනු ලැබුවා. ඔබතුමා ඔතන සිටින විට මා විමසුවා. එදිනම පොතට දමා තිබුණා ලක්ෂ 150 ක මුදලක්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තව 150ක් විතර තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමා ප්‍රකාශ කරන්නේ පොහොට්ටුවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමෙක් පත් කර ගන්නවා කියා. ඒවා සිහිනනේ. එම නිසා මේ තියෙන විදියට වැඩය කරගෙන යන්න.

ගරු සභාපතිතුමනි , මෙම තාර දමන වැඩ අපේ සභාවෙන් කිරිමට බැරිද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තව ටික දිනකින් කිරිමට පුළුවනි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මට පෙනෙන විදියට ඇස්තමේන්තුවල ගණන අඩු නිසා කොන්ත්‍රාත්කරුවන් එන්නේ නැති තත්වයක් තමයි මට පෙනෙන්නේ.මෙම ක්‍රමවේදය කුමක්ද ? මෙය අපේ ඇස්තමේන්තුවටමද දෙන්නේ. නැතිනම් ඊටත් අඩුවෙන් ද දෙන්නේ .

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඇස්තමේන්තුවට දමන ගණන තමයි ඉදිරිපත් කරන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ඇස්තමේන්තුව බලලා මෙය කරන්න බැහැ කියා යනවා. ඊට පසු මෙය දැම්මට පස්සේත් එය ක්‍රියාත්මක විය යුතුයි. නැතිනම් ටෙන්ඩර් එක දමා ඊට වඩා වැඩි ගණනකට ලබා දෙනවාද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නෑ එහෙම දෙන්නේ නැහැ. ඔබතුමා ටෙන්ඩර් කමිටුවේ සිටිනවානේ. හැමදෙනාම සිටින තැන තමයි මෙය කඩන්නේ. මෙය මගේ තනි තීන්දුවක් නෙමේ. සමස්ත සභාවේ තීන්දුව තමයි තීන්දු කරනු ලබන්නේ.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ කර්මාන්ත සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා දිනමිණ , Daily News ආදි පත්තර වල ඉංග්‍රිසි හා සිංහල මධ්‍යයෙන් දැන්වීම් පල කිරිම සුදුසු බවටත් , ඉදිරියේදි එවැනි දැන්වීම් පළ කිරිමේදි සිංහල මධ්‍යයෙන් පමණක් දැන්වීම් පල කිරිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.19 2019.12.31 දින පවත්වන ලද පුස්තකාල පොත් සමික්ෂණයේ නිර්දේශ හා යෝජනා ක්‍රියාත්මක කිරිම ( ප්‍රධාන පුස්තකාලය හා ශාඛා පුස්තකාල) සම්බන්ධ ගොනුව සභා ගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2018.12.31 දිනට වෙන්දේසි කළ යුතු භාණ්ඩ වෙන්දේසි කිරිම. ඒ සඳහා කමිටුවක් පත් කර තිබෙනවා. ලේකම් , ප්‍රධාන කළමනාකාර සහාකාර , විමර්ශන නිලධාරි , අභ්‍යාන්තර විගණන නිලධාරි , ප්‍රධාන කළමනාකාර සහාකාර ගිණුම්, ආදායම් පරික්ෂක නිලධාරින් දෙදෙනා, තාක්ෂණ නිලධාරි, ගරු සභාපති .ගබඩා භාණ්ඩ සමික්ෂණ මණ්ඩලය, ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමික්ෂණ මණ්ඩලය හා ගරු මන්ත්‍රිවරුන් තිදෙනෙකුගේ නම් යෝජනා කරන ලෙස ඉල්ලා සිටිනවා.මේ සඳහා ගරු මන්ත්‍රිවරුන් තිදෙනෙකු නම් කරන්න. විපක්ෂ මන්ත්‍රිවරු නම් වඩාත් හොඳයි. ගරු නගර සභා මන්ත්‍රි අතුල ප්‍රියන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා, ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර මහතා,

**<u>ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , බොරුවට මා භාර ගත්තාට මට එන්න ලැබෙන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එසේ නම් ගරු මන්ත්‍රිතුමිය චම්පා සුමුදු කුමාරි මහත්මිය ඒ සඳහා නම්කර සිටිනවා. තව කමිටුවක් පත්කළ යුතුයි භාණ්ඩ විනාශ කිරිම සඳහා. ඒ සඳහා එම තිදෙනාම පත් කර සිටිනවා.

**තීරණය**

2019.12.31 දින පවත්වන ලද පුස්තකාල පොත් සමීක්ෂණයේ නිර්දේශ හා යෝජනා ක්‍රියාත්මක කිරිමට අදාල ( ප්‍රධාන පුස්තකාලය හා ශාඛා පුස්තකාල) භාණ්ඩ වෙන්දේසි කිරිම සහ එකි භාණ්ඩ අපහරණය කිරීම සඳහාත් නිලධාරින් මණ්ඩලය පත්කිරිම නි ර්දේශ කර ඇති අතර ඒ සඳහා ගරු නගර සභා මන්ත්‍රි අතුල ප්‍රියන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා හා ගරු නගර සභා මන්ත්‍රි චම්පා සුමුදු කුමාරි මහත්මිය සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

## 03.20 Inspiration 2019 ප්‍රසංගයේ ඉතිරි ප්‍රවේශපත්‍රවල බදු මුදල් නිදහස් කර ගැනීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

2019පෙබරවාරි මස මාසික සභාවේ තීරණ අංක 12:18 යටතේ මෙම ප්‍රසංගය විනෝද බද්දෙන් නිදහස් කර ඇත. විනෝද බදු ආඥා පණතට අනුව ප්‍රසංගය පවත්වා මසක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කර ශුද්ධ ආදායමෙන් 40% හෝ අඩු මුදල ආදාල ආයතනයට පුණ්‍ය කටයුතු වෙනුවෙන් ගෙවිය යුතුය. ඒ අනුව ප්‍රසංගය පවත්වනු ලැබුවුවන් විසින් අයවැය වාර්වක් ඉදිරිපත් කරන ලදි. රු.50000/= ලාභයක් මෙම ප්‍රසංගයෙන් ලැබි ඇත. මෙම ප්‍රසංගයෙන් ලද ශුද්ධ ආදායම විලේගොඩ ආරියධම්ම හිමිපාණන්ට පිරිනමා ඇත. මෙම විනෝද බදු ලෙස තැන්පත් කර ඇති රු.179000/= ක මුදල හා ඉතිරි ප්‍රවේශපත්‍ර වලට අදාල තැන්පතු ලෙස රු198500/=ක් ලෙස එම මුදල් නිදහස් කරන ලෙස ඉල්ලා ඇත. මෙය නිදහස් කරන්න.

**තීරණය**

රම්ෂා ශාමෙන් රණවික්‍රම මහත්මිය විසින් ඉදිරිපත් කරනු ලැබු Inspiration -2019 ප්‍රසංගගය සඳහා විනෝද බදු ලෙස තැන්පත් කරන ලද රු.377500/= ක මුදල, විනෝද බදු තැන්පතු ලෙස රු.179000/= ක් ද , ඉතිරි වු ප්‍රවේශපත්‍ර වලට අදාල තැන්පතු ලෙස රු.198500/= ක් වශයෙන් නිදහස් කිරීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**(04)** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න නැත

**(05)** hථා පරිදි කල් දී ඇති යෝජනා ඇත

**05.01.** **සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා :-**

**05.01.01** **චෙක්පත් අත්සන් කිරිම සඳහා බලය පැවරිම සම්බන්ධව 2019.03.22 පැවති මුල්‍ය කමිටුවේදි ගත් තින්දුව සහා අනුමතියට යටත්ව බලය පැවරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.**

**<u>ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

චෙක්පත් අත්සන් කිරිම සඳහා බලය පැවරිම සම්බන්ධව 2019.03.22 පැවති මුල්‍ය කමිටුවේදි ගත් තින්දුව සහා අනුමතියට යටත්ව බලය පැවරිම සුදුසු බව යෝජනා කර සිටිනවා. එහි පළමු අත්සන ලෙස ලේකම් රණසි උත්පලා වජිරංගි ගුණවර්ධන මිය , එම මහත්මිය නිවාඩු යන අවස්ථාවලදී ප්‍රධාන කළමනාකරණ සහාකාර එස්.පී. දයාරංසි මහත්මිය , දෙවැනි අත්සන ගිණුම් අංශ ප්‍රධානි එම්.එම්. රෝෂිණි මිය සහ එම මහත්මිය නිවාඩු යන අවස්ථාවලදි ප්‍රධාන ආදායම් සහාකාර ආර්.ජී. ඉන්දිකා මහත්මිය අත්සන් කිරිම සුදුසු බවත් ඒ සඳහා සහාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

**තිරණය :-**

අම්බලන්ගොඩ නගර සභවේ ලේකම් බී.ඒ. ධම්මිකා මිය හා ප්‍රධාන කළමණාකරන සහකාර ලෙස සේවය කළ මිහිරි කාන්ති ද සිල්වා මිය ස්ථාන මරු ලැබිම හේතුවෙන් ( කාර්යාලයේ චෙක්පත් සඳහා පලමු අත්සන තැබිම , එම නිලධාරින් විසින් සිදු කල බැවින් ) පහත පරිදි චෙක්පත් සඳහා අත්සන් කිරිමේ බලය හා ජංගම හා ඉතිරි කිරිමේ ගිණුම් වලින් අවශ්‍ය අවස්ථාවලදි මුදල් ආපසු ගැනිම සඳහා අත්සන් කිරිමේ බලය ලබා ගැනීම සඳහා පළමු අත්සන ලේකම් රන්සි උත්පලා වජිරංගි ගුණවර්ධන මිය , එම මහත්මිය නිවාඩු අවස්ථාවලදි ප්‍රධාන කළමනාකරණ සහකාර එස්.සී දයාරන්සි මියටත් , දෙවන අත්සන ගිණුම් අංශ ප්‍රධානි එච් එම් රෝෂිණි මිය , එම මහත්මිය නිවාඩු අවස්ථාවලදි ප්‍රධාන අදායම් කළමනාකරණ සහකාර ආර්.ජී.ඉන්දිකා ස්වර්ණමාලි මියටත් චෙක්පත් සඳහා අත්සන් කිරිමේ බලය පැවරිම සඳහා මුල්‍ය කමිටු තීරණයත් සහා අනුමතිය යටත්ව ලබා ගැනීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

**05.01.02 අම්බලන්ගොඩ ඕකන්ද , සිරිල් මහතාගේ නිවස අසළින් ඇති පාර සංවර්ධනය කිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.**

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

**තිරණය :-**

අම්බලන්ගොඩ ඕකන්ද , සිරිල් මහතාගේ නිවස අසළින් ඇති පාර සංවර්ධනය කිරිමේ කර්මාන්තයට අදාළ යෝජනාව පිළිගැනිම සුදුසු බවටත්, එම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්දා අයිරාංගනි මහත්මියගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

**05.01.03 නගර සභා මහජන ක්‍රීඩාංගනයේ ළිඳ ඉදිකිරිමේ ( Type 01 ) කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.**

**තීරණය-**

නගර සභා මහජන ක්‍රීඩාංගනයේ ළිඳ ඉදිකිරිමේ( Type 01) කර්මාන්තයට අදාළ යෝජනාව පිළිගැනිම සුදුසු බවටත්, එම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**05.01.04 මේධානන්ද මාවතේ අතුරු පාර ( අකුර පුද්ගලික අධ්‍යාපන ආයතනය අසළ ) ඉදිකිරිමේ කර්මාන්තය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.**

**තීරණය-**

මේධානන්ද මාවතේ අතුරු පාර ( අකුර පුද්ගලික අධ්‍යාපන ආයතනය අසළ ) ඉදිකිරිමේ කර්මාන්තය සභා අරමුදලින් සිදු කිරිමට අදාළ යෝජනාව පිළිගැනිම සුදුසු බවටත්, එම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රිවරුන් 8 කු විසින් අත්සන් කරනු ලැබූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ යෝජනාව ඉදිරිපත් කරන්න

**05.02 ගරු උපසමාපති කමල් වැල්ලගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව**

**05.02.01 රජය විසින් පනවා ඇති කාබන් බද්ද ඉවත් කරන්නැයි ගරු සභාවට යෝජනා කර සිටිනවා.**

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

රජය විසින් පනවා ඇති කාබන් බද්ද ඉවත් කරන්නැයි ගරු සභාවට යෝජනා කර සිටිනවා. එම යෝජනාව ස්ථිර කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, රජය විසින් ඉතාමත් අසාධාරණ ලෙස කාබන් බද්දක් පනවා තිබෙනවා. මෙයට විරුද්ධව මුළු ලංකාව පුරාම උද්ඝෝෂණ පවත්වනු ලබනවා. මේ රජය අපහසුතාවයට පත් කිරිමටවත් වෙනත් කිසිම දෙයකට නෙමේ මා මෙය ඉදිරිපත් කළේ. මේ නිසා පීඩාවට පත්වන්නේ මධ්‍යම පන්තික ජනතාවයි. වසර 5 ඉක්මවා ගිය වාහන සඳහා විශාල කාබන් බද්දක් මෙම බදු ක්‍රමය හරහා හිමි වි තිබෙනවා.උදාහරණයට ගන්නේ මාගේ වාහනයක් තිබෙනවා. මෙහි බලපත්‍ර ගාස්තු රු.4600/= ක් වුවත් කාබන් බද්ද රු.12600/= කි.විශේෂයෙන්ම සඳහන් කළ යුතුයි රජයකට කාබන් බද්ද හා දුම් බද්ද කියා දෙකක් පැනවීමට නොහැකිය. අපි වාහන සඳහා බලපත්‍ර ගැනිමට යනවිට දුම් බද්ද කියා බදු පනවා ඇත.ඊට අමතරව තමයි මේ වසරේ සිට කාබන් බද්ද අයකිරිමට ගත්තේ. මධ්‍යම පන්තික ජනතාව පව්ච්චි කරනු ලබන්නේ ඉහළ පන්තියේ ධනවත් පුද්ගලයින් පාවිච්චි කිරිමෙන් පසු විකිණිමෙන් මිලදි ගත් වාහනයි. මෙවා වසර 5කට අධිකව පැරණිය. වසර 10 වැඩි සැම වාහනයකටම කාබන් බද්ද රු.10000/= වැඩි මුදලක් අයකරනු ලබයි. මේ පිළිබඳව රජයෙන් අපි ඉල්ලිමක් කර සිටිනවා. මෙය ඉතා ඉක්මනින් ඉවත් කරන ලෙසට . මක්නිසාද මධ්‍ය පන්තික ජනතාව මේ හරහා ලොකු බද්දක් ගෙවිම නිසා පීඩනයකට හසුවෙනවා. වාහනය සඳහා බලපත්‍රය ගැනිමට ගිය විට රු25000/= වැඩි මුදලක් යනවා.බලපත්‍රය ලබා දෙන්නේ නැහැ කාබන් බද්ද ගෙවන්නේ නැතිව. මෙය

මා රජයට යෝජනා කරනු ලබන්නේ. මෙය ඉදිරියේදි මුළු ලංකාව පුරාම සිදු වෙයි. මෙය ඉවත් කරන ලෙසට රජයට බලකරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ගරු උප සභාපතිතුමා කළ යෝජනාව සම්බන්ධයෙන් යම් කරුණු දැක්වීමක් සිදු කළ යුතුයි. මේ කාබන් බද්ද ගැන සඳහන් කරන විට ඉතා අමාරුවෙන් තමයි මධ්‍යම පන්තික කෙනෙක් වාහනයක් ගනු ලබන්නේ. ඔවුන් මෙම වාහනයේ දුම් බැලීම සඳහාත් ගාණක් ගෙවිය යුතුයි. එවිට වාහන බලපත්‍රයක් ගැනීමට කාබන් බද්දයි, දුම් බද්දයි, රක්ෂණ මුදලයි, ආදායම් බද්ද ආදිය ගෙවන විට ජනතාවට විශාල මුදලක් ගෙවීමට සිදු වී තිබෙනවා. වසර කිහිපයක් ධාවනය කළ වාහනයක්නේ ගන්නේ. එවිට ඔවුන්ට මෙම බර වැඩිවෙනවා. අම්බලන්ගොඩ නගර සභාව මේ සඳහා විරෝධතාවය පල කරන බව රජයට බල කර සිටින්න. අතර මේ සදහා මාගේ විරෝධතාවය ප්‍රකාශ කර සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ගරු උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබුවේ ඉතාමත් කලෝචිත යෝජනාවකි. මේ කතා කරනු ලබන්නේ මේ නිතිය පැනවූ අයට හෝ පවතින රජයකට විරුද්ධවත් නෙමේ. ගරු මන්ත්‍රිවරු සියළුදෙනාම ප්‍රකාශ කළා වගේ දුම්බද්දට අමතරව තමයි මේ කාබන් බද්ද ගෙවා තිබෙන්නේ. කාබන් පිටවෙන්නේ වාහන වලින් විතරද ? කර්මාන්තශාලාවලින් පිටවන්නේ නැද්ද? ඒවා සඳහා අයකරනවාද ? එම කර්මාන්ත සියල්ලම වසනවාද ? මේ කිවූ ආකාරයට මධ්‍ය පන්තික ජනතාවට තමයි මෙම බදු මුදල ගසා ඇත්තේ. අවුරුදු 10,15,20 ට වැඩි වාහන සඳහා. අවුරුදු 20 ක් වන වාහනය රු.25000/= දක්වා මෙම බද්දට යටත් වෙනවා. රජය මේ බද්ද අයකරනු ලබන්නේ ඕසොන් ස්ථරය රැක ගැනිමට හෝ පරිසරය රැක ගැනිමට නම් මෙම බද්ද පනවනු ලැබුවේ මෙම බද්ද නතර වන ක්‍රමයක් සැදිය යුතුයි. මෙම මුදල් ගෙන රජයක් විසින් කළ යුතුව තිබුණේ එයයි. එම වාහන වසර 20 කට වැඩිය පැරණි නම් එම වාහන වල එන්ජින් එක ගලවා කාබන් අඩු කර මාර්ගයට දමන නිතියක් ඕන ගෙන යුත්තේ. මාර්ගයට දැමීම නතර කිරිම සඳහා. එම නිතිය වෙනුවට රජය ආදායමක් ගන්න ක්‍රමයකි මේ සාදා තිබෙන්නේ. අර එදා දවසේ ආදායම් උපයාගන්නා මිනිසා තවත් හිඟමනට පත්වෙනවා.ඔවුන්ට ලිසිං එක , ෆිනෑස් එක ගෙවා ගන්න බැහැ. මේ බදු වර්ග ගෙවා ගන්න බැහැ. ටයර් 4 දමා ගන්න බැහැ. ඔවුන් වාහන ධාවනය කරනු ලබන්නේ නැවත පිරවූ ටයර් 4 නි. වාර්ෂාව කාලයට ධාවනය කිරිමට නොහැකියි.99 න් බේරි යන්නේ. මෙවැනි වාහන හිමි අයට තමයි මේ බද්ද පනවා ඇත්තේ. ඉතාම කනගාටුදායකයි. අපි නගර සභාවක් විදියට ජනතාවගේ පැත්තෙන් බලා මෙයට විරුද්ධ වීම සාධාරණයි . මොකද හේතුව රජයකට ආදායම් මාර්ග ඕන. නමුත් මේ බද්ද පැනවීමේ මුලික අරමුණක් තිබෙනවා. මොකක්ද මුලික අරමුණ පරිසරය සුරකිම. පරිසරය සුරැකිම සඳහා මෙම වාහන නිසි පරිදි සකසා මාර්ගයට දැම්මයි කළ යුතු වන්නේ. ඉන් පරිසරය සුරැකෙනවා, ඕසෝන් ස්ථරය සුරැකෙනවා. අපි කියන්නේ මෙය ඉවත් කර පරිසරයට ඔරෝත්තු දෙන විදියට නිතිරිති සකස් කර එම වාහන හිමියන් දැනුවත් කර නිතියානුකුලව පරිසරයට හිතකාමිව තම වාහනය සකසා ගැනීම මිසක් මෙම බද්ද පැනවිම තුළින් එම කාරණාව ඉෂ්ඨ වන්නේ නැහැ කියන මතයේ සිටිනවා. ගරු මන්ත්‍රිවරුවිදියට මෙයට විරුද්ධවිමේ අවශ්‍යතාවයක් තිබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි,කාබන් බද්ද කුමන රජය පැවතියත් , තිබුණ රජය තිබුණත් දැන් තිබෙන රජය පැවතියත් , ඉදිරියට පැමිණිමට නියමිත රජය වුණත් යම්කිසි වකවානුවලදි අණපණත් ගෙන එනු ලබනවා. ඒ අනුව අද ලෝකයේම තිබෙනවා පරිසරික ප්‍රශ්නයක්. දැනට වසර 5 කට කලින් මෙම

උෂ්ණත්වය තිබුණේ නැහැ.ඊයේ දිනයේ සවස 5.30 ට පමණ මා සිටියේ බොරැල්ල කනත්තේ ස්ථාවර සාදන ලද දෙපැත්තේ දෙපැත්තම විවෘතව පවතින ලද ශාලාවක තමයි සිටියේ. ගරු ශ්‍රීමනි දිසානායක මහත්මියගේ ආදාහන කටයුත්තේ. අපි පස්දෙනෙකු පමණ නැගිට එළියට ගියා. මොකද ඇතුළේ ඉන්න බැහැ. ඒ තරමට උෂ්ණත්වය වැඩියි සවස 5.30 ටත්. මේ කාබන් බද්ද ගැන මතක් කිරිමට කලින් පසුගිය රජය කාලයේදි අපට ගැනීමට සිදු වුණා දුම් සහතිකයක්. අවංකම මුදලක් ගියත් මා සතුටු වෙනවා ඒ ගනු ලැබු තින්දුවට. මොකද එහෙම නොවුණානම් කළු දුම් තිබෙන වාහන තවමත් ධාවනය වෙනවා. පළමු වර දුම් සහතිකය ගැනිමට ගියවිට එම කළු දුම් ප්‍රමාණය වැඩිනම් ඊළඟ වතාවේ තම වාහනය නිසි පරිදි සකසා ගෙනවිත් දුම් වාර්තාව ලබා ගත හැකිය. එම දුම්පරික්ෂාව සඳහා රජය යම්කිසි මුදලක් ගනු ලැබුවේ රජයට ආදායම ලබා ගැනිමට නොවේ. රටේ පරිසරය ආරක්ෂා කර ගැනිමේ අරමුන ඇතිවයි. මේ දේශගුණික විපාර්යාසය හොඳම උදාහරණය. කුමන රජය තිබුණත් ඉදිරි අනාගත පරපුර වෙනුවෙන් යම්කිසි නිතිරිති  මේ රටේ හඳුන්වා දිමට සිදු වෙනවා. ලෝකයට සමගාමිව. මුදලක් ලබා ගැනීමේ පර්මාර්ථයෙන් නෙමේ. පසුගිය රජය දුම් සහතිකය ගෙන එනු ලැබුවේත් , දැන් කාබන් බද්ද පනවනු ලැබුවේත් . කාබන් ප්‍රමාණය වැඩිනම් ආණ්ඩුව කියන්නේ නැහැ ඒ අයට බස්රථය විකිණිමට. ඒ අදාල පුද්ගලයාට පුළුවනි එය අළුත්වැඩියා කර සහතිකය ලබා ගන්න. මින් රජය අපේක්ෂා කළේ , මෙය සාදන ලද විද්වතුන් කල්පනා කළේ ස්ථිර සාර වූ යම් මට්ටමකට මේවා පැනවිමෙන් මේ සිදුවන්නාවු පාරිසරික තත්වයට යම්තාක් දුරට පිළියමක් යෙදිම. මේ ආණ්ඩුව තව අවුරුදු දෙකකින් හරි තුනකින් හරි වෙනස් වෙයි. වෙනත් ආණ්ඩුවක් පැමිණෙයි. අපේ රටේ ජාතික ප්‍රතිපත්තියක් නැති නිසා තමයි මේ හෙණ කරුමේ වැදි තිබේන්නේ. අපට ආසන්නම රට ඉන්දියාවේ කුමන ආණ්ඩුවක් බලයට පැමිණියත් බලයෙන් ගියත් එම රටට ජාතික ප්‍රතිපත්තියක් තිබෙනවා. අපට ජාතික ප්‍රතිපත්තියක් නැහැ. එන ආණ්ඩුව එනවා . යනවා. මොනවා හරි පැලැස්තර ගහනවා. මා එයට විරුද්ධයි. මා මොන දේශපාලනය කළත් අපට තිබිය යුතුයි ඉදිරි අනාගත පරපුර ආරක්ෂා කිරිම සඳහා ජාතික වැඩ පිළිවළක්. යම් රජයක් මොන දේ කළත් රටට සුභවාදි විය යුතුයි. කාබන් බද්ද මුදලක් ගැනිමේ පරමාර්ථයෙන් නෙමේ .මේ ලෝකයේ සිදුවන්නාවු පරිසරික වෙනස් වීම සඳහාය. රාත්‍රියට නිදා ගන්න බැහැ වායුසමිකරණය හා විදුලි පංකාව නැතිව. එම නිසා මෙය වෙනස් විය යුතුයි. ලෝක පරිසරය මෙන්ම අපේ රටේ පරිසරය ආරක්ෂා කර ගැනීමට මීට වඩා අණ පණත් අවශ්‍යයි. ගහ කොළ කැපිමට පවා අණපණත් අවශ්‍යයි. රටේ දේශපාලනික වශයෙන් නෙමේ එ෦නැම රජයෙක් හොඳ තින්දු තිරණ ගනු ලැබුවත් මා රටේ පුරවැසියෙකු ලෙස එම තින්දු අනුමත කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අපගේ විපක්ෂ නායක ගරු නගර සභා  මන්ත්‍රී ඩෙනට් පතියන්දුවගේ මහතා ඉදිරිපත් කරන ලද සමහර කරුණු සමඟ මට එකඟ වීමට බැරි වෙනවා. මේ රජයෙන් ගරු උප සභාපතිතුමා ප්‍රකාශ කළ ආකාරයට අතිවිශාල ලෙස කාබන් බද්දක් අයකිරිමට තීරණය කර තිබෙනවා.දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් බදු ගැන නිර්වචනය කරනු ලබන්නේ මලකින් රෝන් ගන්නා වගේ දෙයක් ලෙසය. එහෙත් මෙහි සිදුවන්නේ මල නොතලා නෙමේ බෙල්ල මිරිකා අසිමිත ලෙස බද්දක් ගැනිම වැනි කර්තව්‍යයකි . එය වැරදියි. අනෙක් කරුණ තමයි පසුගිය රජයෙන් දුම් සහතිකයක් අනුමත කළා. නමුත් දුම් දාගෙන දුවන වාහන මාර්ගයේ ඕනැතරම් තිබෙනවා. රජයේ වාහන එකකටවත් දුම් බද්ද නැහැ. නමුත් අපි දුම් සහතිකයක් ගන්නවා. මාර්ගයේ දුමේ යනවා. එවිට අපේ අයිතියට හානි වී තිබෙනවා. දුම්සහතිකය ඇතිව හෝ නැතිව දුවන වාහන නිසා අපි පිඩා විඳිනවා. එවිට එහි අසාධාරණයක් වෙනවා. ගරු උප සභාපතිතුමා ගෙන එනු ලැබු යෝජනාවට මා එකහෙලාම කැමති වෙනවා.අනෙක් කරුණ තමයි දැන් මේ කාබන් බද්ද අයකළ විට අපගේ රස්නය අඩු කරනවා ද රජයෙන්. එහෙම එකක් කරන්නේ නැහැනේ. රස්නය එහෙමමයි. මෙම බදු මුදල් අය කිරිම නිසා අපගේ ඇඟේ රස්නය වැඩි වෙනවා.මුහුණු පොතෙන් හා විවිධ අන්තර් මධ්‍ය මඟින් අපි දකිනවා රක්ෂිත වනාන්තර අක්කර දහස් ගණන්  වල ගස් කපනවා. ඒවාට වත්මන් රජයෙන් මුකුත් නිතිමය

ක්‍රියා මාර්ගයක් නැහැ. එවා හමුවේ නිහඬයි. ඒ අස්සේ රස්නය අඩු කිරිම සඳහා කාබන් බද්දක් ගසනවා. මේවා ගැලපෙන්නේ නැහැ. අපේ සහෝදර ගරු මන්ත්‍රිවරු සමඟ මතවාදිව ගැටිමට සිදුවෙනවා. මා මේ කාබන් බද්ද පැනවීම පිළිබඳ විරුද්ධයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රි දිනායාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපේ ගරු උප සභාපතිතුමා ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව ඉතා වැදගත්. නමුත් විපක්ෂ නායක ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා ප්‍රකාශ කළා දැන් දැඩි රස්නයක් ඇති බව. නමුත් මේ දැන් දේශගුණික වශයෙන් රස්නය ලංකාවට දැඩි රස්නය පවතින කාලයයි. සෑම වසරකම මේ කාලයේ මෙම රස්නය තිබෙනවා. මීට වැඩිය පරිසරය විනාශ කරන අපේ අමාත්‍යවරු සිටිනවා. කැලෑ කපනවා, ගස් විනාශ කරනවා , නොයෙක් දෙවල් අමාත්‍යවරු සිදු කරනවා. මේ කාබන් බද්ද නිසා ජනතාව ඉතාමත් අපහසුතාවයට පත්වෙනවා. වාහන හිමිකරුවන්ගෙන් මෙම බදු අයකළ විට ඔවුන් බොහෝ වෙලාවට මේවා අයකරනු ලබන්නේ පාරිභෝගික ජනතාවගෙනි. ගරු උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාවට මා සභායෝගය දක්වනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

අද ජනයා ඉල්ලා සිටින්නේ බදු නෙමෙ. ජනතාව ඉල්ලන දේ නොදී මේ රජය බදු අයකිරිමට තරම් මුක්ත වී ඇත. පසුගිය දිනවල ත්‍රිපිටකාභිවන්දනා කියමින් හරි හරියට බණ පොත් ඔලු උඩ තියාගෙන හරි හරියට මහා පෙරහැරවල් ගියා . අපේ මේ අල්ලිය දේවාල භූමියෙත් පූජාවක් පැවැත්වුවා. ඇත්ත වශයෙන්ම ත්‍රිපිටකයෙන් වැඩක් ගත ජන නායකයෙක් සිටියා නම් ඒ ගරු හිටපු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන ශ්‍රීමතාණන් පමණයි. එතුමා නාහි වේරාණි , වේරාණන් ගථාව කියා මුළු ලෝක ධාතුවම සෙලවුවා. ජපානයේ අනුකම්පා දිනාගෙන ලංකාවට වැඩක් ගනු ලැබුවා. නමුත් අද එතුමා දිව්‍යාංගතයි. මේ වනවිට ත්‍රිපිටකයෙන් වැඩක් ගත් දෙවැනි ජන නායකයා ගරු හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ ශ්‍රී මාතාණන් පමණි. එතුමා අද සජීවි ජන නායකයෙකු ලෙස සිටිමින් අපගේ ත්‍රිපිටක ශ්‍රී සද්දාහම අනුව එ සියළු වෙහෙර විහාරස්ථාන රංජනය කරමින් මුළු මහත් සමාජයම බබුළුවමින් එතුමාන්ගේ මතය ජන සමාජගත කොට හමාරයි. මෙම ත්‍රිපිටකාභිවන්දනා වැඩ සටහන යටතේ පසුගිය රජය අපගේ ගරු උත්තරිතර මහා නායක හිමිවරු පවා හැල්ලුවට ලක් කළා. ඒ කුලභේදය අනුව අසුන් පනවා මුළු මහත් රජයම අපකීර්තියට පත් කිරිමට තරම් වර්තමාන ඒ අපේ ගරු අග්‍රමාත්‍යතුමන් සාමාර්ථතාවය දැක්වුවා. අද ජනතාව ඉල්ලා සිටින්නේ පළාත් සභා මැතිවරණයයි. මේ වන විට මුළු මහත් ලංකාවේම පළාත් සභා විසිරෙමින් පවතින යුගයක අපගේ දකුණු පළාත් සභාවට දින ඇත්තේ තව දින හතකි. මේ අවස්ථාවේ ජනතාවගේ ඉල්ලීම් වලට ඇහුම්කන් දිමෙන් ඉදිරි මැතිවරණය ලබා දෙන ලෙස අප ඉල්ලා සිටිය යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙම ත්‍රිපිටකාභිවන්දනා වැඩ සටහන ක්‍රියාත්මක කිරිමට ප්‍රමුඛත්වය ගනු ලැබුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජන නායක ගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේ මැතිතුමා. එතුමා තමයි මෙම වැඩ සටහන දියත් කරගෙන යනු ලබන්නේ. එතුමා තමයි මෙයට මූලිකත්වය ගෙන වැඩ කටයුතු සිදු කරනු ලබන්නේ. ගරු අග්‍රමාත්‍යතුමා නෙමෙ. ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණියගේ මහතා ප්‍රකාශ කළා මේ අසුන් පැනවිම පිළිබඳව. ගරු අග්‍රමත්‍යතුමා නෙමේ අසුන් පැනවිම සිදු කළේ. ගරු ජනාධිපතිතුමා තමයි එහි සියළු වැඩ කටයුතු සිදු කරනු ලැබුවේ. මේ කිසිම දෙයක් නොදන්නා මේතුමා මේ අසුන් පැනවිම පිළිබඳව චෝදනා කිරිම සම්බන්ධව මා එක්සත් ජාතික පක්ෂ කාන්තාවක් විදියට හෙලා දකිනවා. කවුරුන් විසින් සිදු කළත් එම ත්‍රිපිටකාභිවන්දනා වැඩ සටහන ඉතා හොඳයි. බෞද්ධයන් විදියට අපගේ මුදුන් මල් කඩක් බදු එය ජාතික උරුමයක් කිරිම ගැන අපි එතුමාට ගෞරව

කළ යුතුයි. ආශිර්වාද කළ යුතුයි. නිතරම බෞද්ධාගමේ කියා කැගැසුවාට යම් දෙයක් කළ විට එයට අපි ස්තුති වන්ත විය යුතුයි.එම නිසා එය අවතක්සේරු කරන්න එපා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා එම ත්‍රිපිටකාභිවන්දනාව පිළිබඳ කළ ප්‍රකාශය සම්බන්ධව මාගේ බලවත් අප්‍රසාදය පළ කර සිටිනවා. යමක් වැඩක් කිරිමේද සුළු අඩුපාඩුවක් සිදු වු විට එම අඩුපාඩුව උලුප්පා පෙන්වා එම හොඳ වැඩය යටපත් කිරිම සම්බන්ධව කනගාටු වෙනවා. අතිගරු ජනාධිපතිතුමන් ත්‍රිපිටකාභිවන්දනා ලෙස ත්‍රිපිටකය ලෝක උරුමයක් ලෙස නම් කිරිම පිළිබඳව අද මුළු මහත් ලෝකයේම ප්‍රසංඝාව හිමි වෙනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු නගර සභා මන්ත්‍රීවරුන් විසින් මෙම යෝජනාවට සහායෝගය ලබා දිම පිළිබඳ ස්තුති වන්ත වෙනවා. ගරු විපක්ෂ නායක ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් කරන ලද ප්‍රකාශයට මා එකඟ වන්නේ නැහැ. එතුමා ප්‍රකාශ කළා මේ කාබන් බද්ද ගෙන එම හොඳයි එතුමා ප්‍රකාශ කළ ආකාරයට මෙය එක මුදලකට තිබුණානම්. මෙම කාබන් බද්ද සි.සි. එන්. එකෙන් අවුරුදු පහෙන් පහට වෙනස් වි යන්නේ. වසර 5 වාහන වලට එක මුදලකුත් , 10 වාහන වලට එකකුත්, 15 ට එකකුත්, 20 වාහන වලට එකකුත් ලෙස. එවිට මේ සඳහා වෙනස් මුදලක් යන්නේ. කාබන් බද්දයි දුම් බද්දයි දෙකක් ගැසිමට බැහැ රටේ. මේ දෙකම සමානයි. අපි කානගාටු වෙනවා. මේයට උසාවි යා යුතු කරුණකි. එතුමා කළ ප්‍රකාශය සමඟ මා එකඟ වෙන්නේ නැහැ. මේ බද්ද පනවනු ලැබුවේ රජයට මුදල් ලබා ගැනිමේ පරමාර්ථයෙනි. මෙය ලංකාවට හොඳ ක්‍රියාවක් නම් මෙම බදු මුදල එක ගණනකට ගෙන ඒමට. මෙම බද්ද ඉවත් කර ගැනිම සඳහා තමයි මා මේ යෝජනාව ගෙන එනු ලැබුවේ. සහායෝගය දැක්වු සියළු මන්ත්‍රීවරුන්ට ස්තුතිය පුද කර සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මෙම යෝජනාව සම්බන්ධයෙන් කවුරුත් විරුද්ධ නැහැ නේද? මෙය එකමතිකව සම්මත වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

මා අදහස් දැක්වුවා නේ . එම නිසා ඒකමතිකව සම්මත වෙන්නේ නැහැ. එතුමා කළ දෙයට මා පිළිතුරු දුන්නා. එමනිසා ඔබතුමා ඡන්දයක් විමසන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

විරුද්ධ අය සිටිනවානම් අත ඔසවන්න.යෝජනාව විරුද්ධ පිරිස 5 කි. එමයෝජනාවට පක්ෂ අය 11 කි. යෝජනාව සම්මත වෙනවා.

**තිරණය :-**

රජය විසින් පනවා ඇති කාබන් බද්ද ඉවත් කරන්නැයි රජයට යෝජනා කර ඇති අතර ඒ සඳහා එම යෝජනාවට පක්ෂව ජන්ද එකළොහක් , විදරුද්ධව ඡන්ද පහකුත් හා මෙම යෝජනාවට තිදෙනෙකු විසින් ඡන්දය ප්‍රකාශ කිරිමෙන් වැලකි සිටි අතර එම යෝජනාව වැඩි ඡන්ද හයකින් සභා සම්මත වු අතර එම යෝජනාව යෝජනාව ගරු නගර සභා මන්ති ජී සරත් ශ්‍රී ලාල් මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව සභා සම්මත විය.

**05.03** ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව

**05.03.01** **කරිත්ත කන්ද ග්‍රාම නිලධාරි වසමේ , කන්ද ප්‍රදේශය තද ආසන්න ගම් වැසියන්ට ගාලු කොළඹ මහා මාර්ගය හරහා පාර මාරුවීමට කහ ඉරි දෙකක් සපයා දෙනමෙන් ගම්වාසින් විසින් කරන ලද ඉල්ලීම ගරු සභාවට යෝජනා කර සිටිනවා.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, කරිත්ත කන්ද ග්‍රාම නිලධාරි වසමේ , කන්ද ප්‍රදේශය තද ආසන්න ගම් වැසියන්ට පාර හරහා මාරුවීම සඳහා ගාලු කොළඹ මහා මාර්ගය හරහා පාර මාරුවීමට කහ ඉරි දෙකක් ලබා දෙන ලෙස තමයි මා යෝජනා කරනු ලැබුවේ

**<u>ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙම යෝජනාව ගරු සභාව විසින් මාර්ග සංවර්ධන අධිකාරියට හා අම්බලන්ගොඩ පොලිසියට යෝජනා කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මෙම යෝජනාව මා ඉදිරිපත් කරනු ලබන්නේ මාර්ග සංවර්ධන අධිකාරියටත් පොලිසියට දන්වා එය ලබා දෙන්න. මා එය ඉදිරිපත් කිරිමට සාධාරණ හේතුවක් තිබෙනවා. මහ මාර්ගයේ බොහෝ කහ ඉරි දී තිබුණත් මෙහි උදේට දරුවන් පාසල් යන අවස්ථාවේදි මෙන්ම දහවල් පාසල් නිම වන අවස්ථාවට දරුවන්ට හා දෙමාපියන්ට පාර මාරුවීම සඳහායි. මෙය හතර මං හන්දියකි. විශේෂයෙන්ම එම ඉල්ලීම කරනු ලැබුවේ ගම්වැසියන් විසිනි.

**තීරණය-**

කරිත්ත කන්ද ග්‍රාම නිලධාරි වසමේ , කන්ද ප්‍රදේශය තද ආසන්න ගම් වැසියන්ට පාර හරහා මාරුවීම සඳහා ගාලු කොළඹ මහා මාර්ගය හරහා පාර මාරුවීමට කහ ඉරි දෙකක් ලබා දිම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට හා පොලිසියට දන්වා යැවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රිවරුන් 14කු විසින් අත්සන් කරනු ලැබු ගරු නගර සභා මන්ත්‍රි සරත් ශ්‍රී ලාල් මහතාගේ යෝජනාව ඉදිරිපත් කරන්න.

**05.03.02** **කරිත්ත කන්ද ග්‍රාම නිලධාරි වසමේ , කන්ද මාවත අප සභාව සතු පොදු නාන ළිඳ අසල දකුණට වන්නට ඇති බිම් කොටසේ , බුදු මැදුරක් , සාදා ගැනිම සඳහා ගම්වාසින් විසින් කරන ලද ඉල්ලීම ගරු සභාවට යෝජනා කර සිටිනවා.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

කරිත්ත කන්ද ග්‍රාම නිලධාරි වසමේ , කන්ද මාවත අප සභාව සතු පොදු නාන ළිඳ අසල දකුණට වන්නට ඇති බිම් කොටසේ , බුදු මැදුරක් , සාදා ගැනිම සඳහා ගම්වාසින් විසින් කරන ලද ඉල්ලීම ගරු සභාවට යෝජනා කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනායාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**තීරණය-**

කරිත්ත කන්ද ග්‍රාම නිලධාරි වසමේ , කන්ද මාවත අප සභාව සතු පොදු නාන ළිඳ අසල දකුණට වන්නට ඇති බිම් කොටසේ , බුදු මැදුරක් , සාදා ගැනිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි දිනායාදු ධර්මදාස මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

**05.04.** **නිල සෙවන ඉදිකිරිම සඳහා දැනට ප්‍රජා ශාලා ගොඩනැගිල්ල ඇති බිමෙහි ජයබෝධි විහාරයට ඉදිරිපසට වන්නට භූමි ප්‍රදේශයේ මෙම ගොඩනැගීල්ල ඉදිකිරිමට අවශ්‍ය භූමි ප්‍රදේශය ලබා ගැනීම සුදුසු බවට මා ගරු සභාවට යෝජනා කරමි.**

**<u>ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රිවරු 4කු අත්සන් කරන ලද ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් කරනු ලබන යෝජනාව ඉදිරිපත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

නිල සෙවන ඉදිකිරිම සඳහා කරන අන්තිම ඉල්ලිමයි . 2019 මාර්තු මාසයේ සභාවේදි ගත් තිරණය අනුව කාර්මික නිලධාරි මහත්මිය විසින් ස්ථානිය පරික්ෂණයක් සිදු කළා. නමුත් ගරු මන්ත්‍රිවරු නම් සහභාගි වුයේ නැහැ. ඒ ගැන කනගාටු වෙනවා. එම පරික්ෂා කිරිමේදි එම භූමි භාගය කිසිදු ප්‍රශ්නයක් නොමැති බවය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේ න්‍යාය පත්‍රයට අනුව ද කටයුතු සිදු කරන්නේ.

**<u>ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රිවරු 4 කු අත්සන් කර යෝජනාව ඉදිරිපත් කර ඇත්තේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එම ගොඩනැගිල්ල එම භූමි ප්‍රදේශයේ ඉදිකිරිමට ලබා දෙන ලෙස යෝජනා කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙම යෝජනාවේ නිශ්චිතව තැන සඳහන් කර නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

නිශ්චිතව ප්‍රකාශ කර තිබෙනවා. ගිය සභාවේදි තීරණය කළ ප්‍රජා ශාලාවට යාබද කොටස . එහි ස්ථානිය පරික්ෂාවක් සිදු කළා. එම ස්ථානය කාර්මික නිලධාරි මහත්මයි විසින් මැන බලුවා. එහි එම ගොඩනැගිල්ල ඉදිකළ හැක. ගරු සභාවෙන් මා ඉල්ලා සිටිනවා මට කරදරයක් නොකර මෙය සැදිමට අවස්ථාව ලබා දෙන ලෙස. මා කිහිප වරක්ම මේ ගරු සභාවෙන් ඉල්ලා සිටියා. දැන් සභා වාර 4 ක 5

කතා වෙලා කා හටත් මෙය නීරස වී ඇත. මා ගමට පොදු වැඩක් කරන විට කවුරුත් එයට බාධා පමුණ වනවා නම් මා ඒ ගැන කනගාටු වෙනවා. මෙය ඉදිකිරිමට ගරු සභාපතිතුමා ඇතුළු ගරු සභාවෙන් ඉල්ලීමක් කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී ඊ ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් පාටක් , පක්ෂයක් ගමට වැඩ කිරිම සඳහා අවශ්‍ය නැති බව මා එදත් පැවසුවා. එතුමිය එක්සත් ජාතික පක්ෂයේ. මා පොදුජන පෙරමුණේ. අපි වමාංශික දේශපාලනයේ නියැලෙන විට එතුමිය ඒ දේශපාලනයේ නියැලෙනවා. දේශපාලන වශයෙන් කුමන අදහසක් දැරුවත් ගමට රටට වැඩක් සිදු වෙනවා නම් ගරු ඩෙනට් පනියන්දුවගේ මහතා ප්‍රකාශ කළ ආකාරයට ජාතික ප්‍රතිපත්තියක් තිබෙනවා නම් රටකට හොඳයි. මෙතුමිය කිරිමට යන වැඩය කාන්තාවක් විදියට මා අභය කරනවා. දැන් ගරු සභාවේ වාර ගණනක මෙතුමිය ආයාචනය කරනවා. මෙතුමියට කර ගන්න දෙයක් ලෙස තමයි මෙය ඉල්ලා සිටින්නේ.

**<u>ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි මෙයට කැමැත්ත ලබා දී තිබෙන්නේ. ගමේ ප්‍රශ්නයකි මෙය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

යම් හොඳ වැඩක් කිරිමට යන විට බාධක තිබෙනවා.මා නගර සභාවේ සිටි 2011- 2015 දක්වා සිටින කාල වලදී මාර්ග ඉදිකිරිමට ගිය විට ඔවැනි බාධක තිබුණා. සමහර මාර්ග කර ගැනිමට නොහැකි වී ප්‍රශ්න ඇති වී උසාවි පොලිසි ගිය අවස්ථා තිබුණා. මේ පිළිබඳව ගරු සභාපතිතුමා හොඳින් දන්නවා. වරාය නඩුවේ ධිවර වරායට යන මාර්ගය. ඒවා මම කිසි පැකිලිමකින් තොරව කළා. බලෙන් හරි කළා. එම නිසා ඔබතුමිය මෙයට බයවෙන්න එපා. මෙය කරන්න ගන්න. කාන්තාවක් විදියට මා ඔබතුමිය සමඟ මෙහිදි සිටිනවා. මෙය ගමට , අම්බලන්ගොඩ නගරයට කරන පොදු වැඩකි. කුමන රජයක් හෝ ඔබට ප්‍රතිපාදන ලබා දුන්නා නම් එම කාර්ය කරන්න. නගර සභාව පැත්තෙන් ලබා දිය හැකි උපරිම සහායෝගය ලබා දීමට කටයුතු කරන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටින අතර කාන්තාවක් විදියට එතුමිය මේ කිරිමට බලාපොරෝත්තු වන කාර්ය ඉටු කිරිමට ශක්තිය ධෛර්ය ලැබේවා ! මට පෞද්ගලිකව එතුමියට ලබා දිය හැකි සහායෝගය ලබා දෙන ලෙසත් ප්‍රතිඥා දි පොරොන්දු වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මෙම ගස කැපිමට මාගේ වැටුප හරි ලබා දෙන ලෙස ප්‍රකාශ කර සිටියා. මා හට දැන ගැනිමට අවශ්‍යයි. මා හට කිහිප දෙනෙකුම ප්‍රකාශ කර සිටියා ක්‍රිඩා කිරිමට නොහැකි තත්වයක් ඇති වෙනවාද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

නැහැ . ගරු මන්ත්‍රිතුමනි. පිට්ටනියට පොඩ්ඩක්වත් අවහිර වන්නේ නැහැ.ගහ කපා ඉවත්කළ පසු එම කොටස ගෙන මෙය සැකසිමට හැකිය. කාර්මික නිලධාරි මහත්මිය ගොස් බැලුවා. පිට්ටනිය තිබෙන්නේ කොහේවත් . ගොඩනැඟිල්ල සාදනු ලබන්නේ කොහේවත්. වැඩක් කරන්න නැති වුණාම අරක මෙක කියනවා. ඔබතුමාලා අවසර දෙන්න . මා අනිවාර්යෙන්ම එහි මෙය ඉදිකරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මෙම නිල නිවස ඉදිකරන ස්ථානය පරික්ෂා කිරිමට ගියේ ඔබතුමාද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

කාර්මික නිලධාරි මහතා නෙමේ ගියේ . නිලධාරි මහත්මියයි.

**<u>ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වාර්තාව නම් ලැබි නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මට දුක හිතුණා. ඔබතුමා ගරු සභාවේ තීරණය කළාට ගනු ලබන කිසිම තීරණයක් හරියට කෙරේන්නේ නැහැ. ගරු මන්ත්‍රීවරු 4ම සහභාගි වුයේ නැහැ. මා සවස් වනතුරු සිටියා. ඊට පසු යන්න කෙනෙක් නැහැ. හැම කෙනෙක්ම ලිස්සා ගියා. සභාවේ තිරණයක් ගතහොත් ගරු මන්ත්‍රීවරු වශයෙන් එය කළ යුතුයි. අපි කොට්ඨාශ නියෝජනය කරන ගරු මන්ත්‍රීවරු කියා ඔබතුමා බලය පැවරුවා. එහෙත් කිසිම කෙනෙක් සහභාගි වුයේ නැහැ. කාර්මික නිලධාරිතුමියට මා පැවසුවා ස්ථානය පරික්ෂා කර වාර්තාවක් ලබා දෙන ලෙස. එතුමිය තමයි එකම නියෝජිතයා ලෙස කටයුතු කරනු ලැබුවේ. එතුමිය එම බලය ගෙන එය ඉටු කළා. එම නිසා ඔබතුමා එම බලය ගෙන මට මෙය කිරිමට අවසර ලබා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔය කියන අවස්ථාවේ මා එතැනට ගියා. ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා හා මා ගොස් බලාගෙන සිටියා එහි. වෙන කවුරුවත් ආවේ නැහැ. අනෙක් කාරණය අපේ ගරු මන්ත්‍රීතුමිය සත්භාවයෙන් තමයි මෙම යෝජනාව ඉදිරිපත් කරන්නේ. ඕකන්දේ ජනතාව ඉල්ලා සිටින්නේ කුමක්ද? නිල පියසක්ද ? ජලයද ? ඒ අයගේ පලමු ප්‍රශ්නය ජලය. ඒ ජනතාව ජලය ඉල්ලා සිටිද්දි අපි උප්පැන්න සහතිකය හරි මරණ සහතිකය හරි ලබා දෙනවා. මේ නොගැලපෙන ව්‍යාපෘති නිසා තමයි මේ අර්බුද ඇති වන්නේ. එතුමිය ප්‍රකාශ කරනවා මුදල් ලැබි ඇත්තේ නිල පියසකට. නමුත් මධ්‍යම රජය වේවා මේ නොගැලපෙන ව්‍යාපෘති ඇති කිරිමට ගිය විට තමයි ගැටළුව ඇති වන්නේ. එය මාගේ අදහසක් පමණි. ඔබලා කැමති දෙයක් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනායාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී අයිරාංගනි මහත්මිය මේ පිළිබඳව ගරු සභාවේ තුන හතර වතාවක් උත්සාහ දැරුවා. ජල ප්‍රශ්නය මා සිතන්නේ ඔය මුදලින් විසඳිමට නොහැකියි. එය ඉතා විශාල ගැටළුවකි. එතුමියට මුදල් ප්‍රතිපාදන ලැබි ඇත්තේ නිල පියස ඉදිකිරිමට. ගමේ අවශ්‍යතාවයක් නිසා එතුමියට ඒ සහායෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, රජයෙන් යම් යම් ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කළ විට එම කර්යම ඉටු කළ යුතුයි. ඔබතුමාට ඉතා පැහැදිලි ඇති. නගර සභාව පැත්තෙන් යම් මුදල් වෙන්කළ විට එම කාර්යම කළ යුතුයි. රජය යම් මුදලක් වෙන් කරනු ලබන්නේ එම නිත්‍යානුකූල රාමුවක් තුළයි.මෙතුමිය එක්සත් ජාතික පක්ෂයේ දිස්ත්‍රික් ලේකම්තුමිය එම ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සමඟ වසර ගණනාවක් වැඩ කරනවා.එම නිසා මෙතුමිය ඉල්ලිමක් කර නිසා එය ලබා දුන්නා. මට ආසනයට නිල පියසවල් 10 ක් හදලා ඉවර කර තිබෙනවා . තව 9 කට වැඩ කෙරේ ගෙන යනවා. මෙතුමියට අමතර එකක් දුන්නේ. ඒ මෙතුමියගේ ඉල්ලිමටයි. අපි සතුටු විය යුතුයි අපි ඉල්ලා ගත් එකට වඩා අමතර ඉල්ලා ගත් එකක් නිසා. මධ්‍යම රජයෙන් ලැබිලත් මෙච්චර අඬන්න ඕනද මෙය ඉදිකිරිම සඳහා. මට හරි කනගාටුයි. මගෙත් ගම්පෙරළියේ යම් යම් සංශෝධන වගයක් කළා. තව මාර්ග වගයක් අළුතින් එකතු කළා. එසේ නම් මටත් පුළුවනි නගර සභාවෙන් ඕන විදියට මෙම මාර්ග සාදා ගනිවි කියා සිතා මධ්‍යම රජයෙන් ලැබෙන මෙම මුදල් වලින් වෙන වෙන වැඩ කිරිමට. මට තිබෙනවා චක්‍රලේඛණය. ඒ තිබෙන චක්‍රලේඛණයට අනුව මට හිතෙන ඕනැම දෙයකට මේ මුදල් වෙන්කළ හැකිය. නමුත් අපි එසේ කරන්නේ නැහැ. අපි සිදු කරන්නේ මේ පෙනෙන දකින දෙයට ප්‍රමුඛතාවය ලබා දී තිබෙනවා. එසේ

කරනු ලබන්නේ මෙය නගර සභාවෙන් කළ යුතුයි කියා කිසි මතයක් කිසි දිනක තිබ් නැහැ. අපි නගරයේ ඉපදුනු ජනතාව , ගඳ සුවඳ දන්නා අය.නගර සභාව සීමාව තුළ ජනතාවට මූලික අවශ්‍යතාවයන් ටික ඉටු කර දිමටයි. එම නිසා ප්‍රතිපාදන ලැබෙන එකටයි වැඩ කළ හැක්කේ. ඒ ලැබෙන චක්‍ර ලේඛයෙන් පිට කාටවත් වැඩ කරන්න බැහැ. මොන ඇමති කෙනෙකුටවත් වැඩ කළ නොහැකිය. මෙම නිල සෙවණ ඉදිකිරිම සඳහා අවශ්‍ය කඩිනම් පසුබිම සකසා දෙන ලෙස ඉල්ලා සිටිනවා. ගම්පෙරළිය වැඩ සටහන යටතේ යම් යම් සංශෝධන ටිකක් සිදු විය යුතුයි. ඒ ටික මා ලබා දෙන්නම්. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට මුදල් ලැබි තිබෙනවා. ළමා උද්‍යාන ඉදිකරන භූමි ප්‍රදේශය පෙන්වා දෙන්න.

**<u>ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඊයේ දිනයේදි මාත් සුමේධ මහතාත් ගොස් පෙන්වා දුන්නා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ඔබතුමා එම අයිනක් පෙන්වන්න. මා බංකු ටිකකුත් සවි කරනවා. මොකද දෙමාපියන් පැමිණ සිටගෙන සිටින නිසා. නගරය ලස්සනට තබා ගැනිමට , නගරයට ප්‍රතිපාදන ලබා දි නගරය යම් මට්ටමකට ගෙන එම සඳහා මුදලක් ලබා දීමට කටයුතු කළේ. රජයක් විදියට ප්‍රතිපාදන ලැබි එය සැමදෙනාටම ලබා දි කටයුතු සිදු කිරිමටයි මා හදන්නේ. පනියන්දුව මගේ ගමයි කියා මා කිසිම දිනක එසේ දමා නැහැ. වැඩිපුරම දමා තිබෙන්නේ පටබැඳිමුල්ලට.ළමා උද්‍යානයට විතරක් ලක්ෂ 25ක් දමා තිබෙනවා. එහෙනම් මට තිබුණා මෙය ගෙනගොස් පනියන්දුව පිට්ටනියේ ඉදිකිරිමට. මෙයට සහායෝගය ලබා දෙන ලෙස සියළුම ගරු මන්ත්‍රිවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.බාධා කළ විට අපටත් සිතෙන්නේ නැහැ මෙම සභාවට යමක් කිරිමට. අතදිග හැර වියදම් කරනවා ප්‍රාදේශිය සභාවට. අපිටත් කලකිරිමක් සිදුවුවහොත් මාගේ ග්‍රාමසේවා කොට්ඨාශය බද්දේගම ප්‍රාදේශිය සභාවට අතදිග හැර වියදම් කරනවා. මේ වන විට සමහර ව්‍යාපෘති නිම කර අවසන් . මට විවෘත කිරිම් වලටත් ආරාධනා කර තිබෙනවා. මේ විදියට අසරණ වු විට ගරු මන්ත්‍රිවරුන් බද්දේගමටයි, ගෝනපිනුවලටයි දෙන්න හිතෙනවා ලැබෙන මුදල්. එය කිරිමට පොළඹවන්න එපා කියා ගරු මන්ත්‍රිවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඊ ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ජල ප්‍රශ්නය එතුමාට වඩා මට බලපානවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා මේ සඳහා කතා නොකර සිටින්නයි සිටියේ. මොකද මෙයට අන්තිමට මාතෘකාව වන්නේ මා නිසා. ගිය මස සභාව නිම වි ගරු නගර සභා මන්ත්‍රි සරත් චන්ද්‍ර මහතා හා මා බලා සිටියා ඔබතුමා පැමිණෙයි කියා. අපගේ කිසිම විරෝධතාවයක් නැහැ. නමුත් අපි එහි ගොස් බලාගෙන සිටියා.

**<u>ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සභාව නිම වී යන් කිව්වට කට්ටිය ඔක්කොම මාරු වෙලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නැ මෙතන තිබෙන ගැටළුව ඔබතුමා මෙයට මැදිහත් වි මාව ඔතනින් ඉවත් කරන්න. කමිටු පත් කළා. අපි කමිටු වලට පැමිණියා. පැමිණ කළයුතු දෙය ප්‍රකාශ කළා. අත්සන් කර දුන්නා. විරුද්ධනම් අත්සන් කර දෙන්නේ නැහැ. ගමේ කොපමණ විරුද්ධ වුණත් අපි අත්සන් කර දුන්නා.

**<u>ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් ඒ අත්සන් කරපු එක ඉවරයි. එතැන සැදීමට බැහැ කියා තිබෙනවා. දැන් මෙතනට විරෝධතාවයක් තිබෙනවාද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නැහැ අපේ කිසිම විරෝධතාවයක් නැහැ. දැන් මෙතැන ක්‍රිඩා සමිති වලට සෙල්ලම් කිරිමට හැකි පරිදි කටයුතු සිදු කිරිමට හැකි නම් කිසිම ගැටළුවක් නැහැ. නැතිනම් සැමදෙනාම ප්‍රකාශ කර සිටියි මා විරුද්ධ වූ නිසා කරන්න බැරි වුණා කියා

**<u>ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමිය කවුරුත් විරුද්ද නැහැනේ . ඔය වැඩේ කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නැ. ඔබතුමා ගිහින් එය බලන්න. යම් විරෝධතාවයක් පැමිණි පසු මෙතුමිය අසිරුතාවයකට පත්වෙනවා. එමනිසා තමයි ප්‍රදේශයේ ගරු මන්ත්‍රිවරුන්ට ගොස් මෙය තින්දු කරන්න කිව්වේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි.ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා, දැන් ගරු රාහුල මන්ත්‍රීතුමා කිවුවා විරෝධතාවයක් පැමිණියොත් කියා . එය නගර සභාව සතු ඉඩමක්ද? නගර සභාව සතු ඉඩමක් නම් ජනතාවට විරුද්ධ වෙන්න බැහැනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ක්‍රිඩා පිට්ටනිය සඳහා ලබා දී තිබෙන එකට ගොඩනැගිලි ඉදිකිරිමට ගියාම ගැටළුනේ. එම නිසා තමයි එසේ නොවන විදියට වැඩ කටයුතු කර ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි.ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

සභාව සතු ඉඩමක පරම අයිතිය තිබෙන්නේ නගර සභාවට. ඔබතුමා නිතිඥයෙක් විදියට එය දන්නවා. ඔබතුමා පැකිලෙන්න එපා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙතුමිය දන්නේ නැහැ. මෙය වෙන්කර ඇත්තේ පොදු ක්‍රිඩා කටයුතු සඳහා ක්‍රිඩා පිටියකට ලබා දි ඇති ඉඩමයි. නිවාස සංවර්ධන අධිකාරියෙන් මෙය ලබා දී ඇත්තේ. ඔය මෙහා පැත්ත ළිඳ තිබුණ තැන තමයි ළිඳ ගොඩ කිරිමෙන් පසු.ප්‍රජා ශාලාව ඉදිකර තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි.ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

එය හරි ගරු මන්ත්‍රීතුමා. මා පවසන්නේ එහෙම දෙයක් නොවේ. සභාව සතු දෙයක් නම් සභාවට ගත නොහැකිද තීරණයක් . ඔබතුමා ඊට පිළිතුරක් මට ලබා දෙන්න.

**<u>ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමියත් ඉල්ලා සිටින්නේ එයයි. විරුද්ධ නැතිනම් මෙය ලබා දි ඉවර කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මා ඔතනින් ඉවත් කරන්න. මා නිහඩව ඉන්නවා. එච්චරයි. අනික් අය එය කර ගන්න.

**<u>ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කවුරුත් කියන්නේ මෙහෙමයි. මා නිහඩව සිටියා කියා ඡන්දය විමසා හරි ලබා දිය යුතුයි.

**<u>ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ සඳහා පක්ෂ අය සිටිනම් අත ඔසවන්න. පක්ෂව ඡන්ද 13කි. නිහඩව ඡන්ද 5කි. යෝජනා සම්මතයි. ඒ අනුව කටයුතු කරන්න.

**තිරණය :-**

නිල සෙවන ඉදිකිරිම සඳහා දැනට ප්‍රජා ශාලා ගොඩනැඟිල්ල ඇති බිමෙහි ජයබෝධි විහාරයට ඉදිරිපසට වන්නට භූමි ප්‍රදේශයේ මෙම ගොඩනැගීල්ල ඉදිකිරිමට අවශ්‍ය භූමි ප්‍රදේශය ලබා ගැනීම සඳහා කරනු ලබන යෝජනාවට පක්ෂව ඡන්ද දහතුනක් හා ඡන්දය දීමෙන් පස්දෙනෙකු නිහඩව සිටි අතර මෙම යෝජනාව සභා සම්මත විම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතාගේ ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

**<u>ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රිවරු 9කු අත්සන් කරන ලද ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය විසින් ඉදිරිපත් කරන යෝජනාවයි.

**05.05.** **හිරේවත්ත කොට්ඨාශයේ ගාළුපාර ( ප්‍රධාන මාර්ගයේ) බුදු පිළිමය අසළින් රේල්පාර යටින් ඇති ( බෝක්කුව )බිං ගෙය යටින් හිරිකැටිය පාරට මාරුවිම සඳහා සුදු ඉරි දෙකක් සපයන ලෙස මා ගරු සභාවට යෝජනා කරමි.**

**<u>ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔබතුමියගේ යෝජනාව ඉදිරිපත් කරන්න. මා කියවන්න ද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ඔබතුමා කියවන්න.

**<u>ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

හිරේවත්ත කොට්ඨාශයේ ගාළුපාර ( ප්‍රධාන මාර්ගයේ) බුදු පිළිමය අසළින් රේල්පාර යටින් ඇති ( බෝක්කුව )බිං ගෙය යටින් හිරිකැටිය පාරට මාරුවිම සඳහා සුදු ඉරි දෙකක් සපයන ලෙස මා ගරු සභාවට යෝජනා කරමි. නැහැ කතා කරන්න දෙයක් නැහැ මේ යෝජනාව ස්ථිර කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙමයෝජනාව සම්මතයි. මාර්ග සංවර්ධන අධිකාරියට හා අම්බලන්ගොඩ පොලිසියට යෝජනා කරන්න.

**තීරණය**

හිරේවත්ත කොට්ඨාශයේ ගාළුපාර ( ප්‍රධාන මාර්ගයේ) බුදු පිළිමය අසළින් රේල්පාර යටින් ඇති ( බෝක්කුව )බිං ගෙය යටින් හිරිකැටිය පාරට මාරුවිම සඳහා සුදු ඉරි දෙකක් සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට හා පොලිසියට දන්වා යැවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නරග සභා මන්ත්‍රි ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මියගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(06 **කාරක සභා වාර්තා සලකා බැලීම**

**06.01 2019.03.22 මුල්‍යා කමිටු වාර්තාව සභා ගත කරන ලදී.**

මූල්‍යා කමිටුව

**2019.03.22** දින ප.ව. **2.30**

සහභාගීත්වය

1. ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව
2. ඇම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා ගරු නගර මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
3. එම්.අතුල ප්‍රියන්ත මහතා ගරු නගර මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
4. ඩබ්.ඒ .සෝභිත රංජිත් මහතා ගරු නගර මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
5. රණසි උත්පලා ගුණවර්ධන මිය ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව
6. බී.ඒ.ධම්මිකා මිය ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව

පිළිගැනීම

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා මූල්‍යා කමිටුව සදහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රීවරුන් , නගර සභා ලේකම්, ඇතුලු සියලු නිලධාරී මහත්ම මහත්මීන් ඉතාමත් ගෞරවයෙන් පිලිගන්නා ලදී.

අනතුරුව එදිනට කමිටුව සදහා ඉදිරිපත් කරන ලද පහත විස්තර ඇතුලත් ගෙවීම් වවුචර් පත් සදහා කමිටු සාමාජිකයින් විසින් අනුමැතිය ලබා දෙන ලදී.

| **ගෙවීම් ලබන්නාගේ නම** | **මිලදීගෙන ඇති භාණ්ඩ පිලිබද** | |
|---|---|---|
| | **විස්තර** | **මුදල රු.** |
| 01.බිටුමික්ස් (ප්‍රයිවට් ) ලිමිටඩ් (ඇ.අ.2033) | මාර්ග ප්‍රතිසංස්කරණය සදහා තාර මිලදී ගැනීම (01 ක් 16500*30) | 495000.00 |
| 02. එන්.හෙන්දහේවා (ඇ.අ.2013) | කාර්යාල නිලධාරීන් සදහා හැදුනුම්පත් සකස් කිරීම (01 ක් 310*106) | 32860.00 |

03. නිව් සරසි රෙදි ගෙදර පෙර පාසැල් ළමුන් සදහා නිල ඇඳුම් රෙදි ගැනීම 65250.00
(ඇ.අ.2018) අගල් 60 පළල රෙදියාර 01ක් 195*150 /අගල් 45 පළල රෙදි යාර 240*150 )

04.ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී 2018 දෙසැම්බර් දුම්රිය බිල් නිරවුල් කිරීම 10660.00

05. එම 2019 ජනවාරි දුම්රිය බිල් නිරවුල් කිරීම 13620.00

06. සමගි ලී බඩු වෙළඳ සැල කාර්යාලයට අවශ්‍ය ලිපිකරු පුටු 01 හා මේස 01 16400.00
(ඇ.අ.2039) (පියෙස්ට්‍රා පුටු 01 -7500/-, මේස 01- 8900.00)

07. ටී.එච්. ජයලත් ද සිලිවා සෞඛ්‍ය අංශයට අවශ්‍ය පිරිසිදුකාරක ද්‍රව්‍ය මිලදී ගැනීම (හාපික් 190*50 /ටොයිලට් බ්‍රෂ් 25*30 / ෆිනෝල් 190*50) 19750.00
(ඇ.අ.2029)

08. එස්.එච්.එන්.ඒ.එස් ද සිල්වා ආදාහනාගාර සදහා ගෑස් මිලදී ගැනීම 48400.00
(ඇ.අංක 2035) 01 ක් (6050*08)

09. එම ආදාහනාගාර සදහා ගෑස් මිලදී ගැනීම 48400.00
(ඇ.අංක 2026) (01 ක් 6050*08)

10. බිටුමික්ස් (ප්‍රයිවට් ) ලිමිටඩ් මාර්ග ප්‍රතිසංස්කරණය සදහා තාර මිලදී ගැනීම 825000.00
(ඇ.අ.2025) (01 ක් 16500*50)

11.ගම්පහ ඉලෙක්ට්‍රිකල්ස් විදුලි උපකරණ සදහා ගෙවීම 11700.00
(ඇ.අ 1877) මේන් ස්විච් 01ක් 900*05 / මර්කරි බල්බ් 450*16)

12.ඒෂියන් ඉලෙක්ට්‍රිකල්ස් විදුලි උපකරණ සදහා ගෙවීම 37250.00
(ඇ.අ 1988) (3 පින් හෝල්ඩර්ස් රු.55*100/ආම් හෝල්ඩර්ස් 50*260/ ආම් 50*375 )

13. එම විදුලි උපකරණ සදහා ගෙවීම 25625.00
(ඇ.අ 1946) (ලයින් ටොප්ස් 01 ක් 200*100 /15 ඒ ප්ලග් ටොප් 01 ක් 25*225 )

14. එස්.එච්.එන්.ඒ.එස් ද සිල්වා ආදාහනාගාර සදහා ගෑස් මිලදී ගැනීම 48400.00
(ඇ.අංක 2062) (6050*08)

15.සදුන් දිනේෂාන් සභාව සතු කම්පැක්ටර් රථයේ අඩුපාඩු සැකසීම සදහා ලබාදුන් අත්තිකාරම 20000.00

16.පී.එච්.එල්.සී.පුෂ්පරාණි ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය ඉවත් කිරීමේ වැඩ සටහන සදහා පරිසර අමාත්‍යාංශයෙන් ලද මුදල අදාල වැඩසටහන සදහා වියදම් දැරීම (ප්‍රචාරණ ගාස්තු /සංග්‍රහ /ග්ලවුස් /ගාබේජ් බෑග් ආදිය සදහා ) 10000.00

17.සී/ස ලංකා විදුලි පෞද්ගලික සමාගම 2018 දෙසැම්බර් නගර සභා ආයතනයන්හි විදුලි බිල 84886.39

18.ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී. 2018 දෙසැම්බර් නගර සභා මන්ත්‍රී මණ්ඩයේ

දූරකථන බිල් කොටසක් ප්රතිපූර්ණය 11804.22

19.ජාතික ජලසම්පාදන හා ජලාපවාහන ගලි ලෝඩ් 25 සඳහා ගෙවීම
25875.00
මණ්ඩලය

20.එම්.එස්. වීරසිංහ 2019 ජනවාරි පුස්තකාලසඳහා ලබාගත් පුවත්
- පත් බිල් නිරවුල් කිරීම 49020.00

21.යුනයිටඩ් මෝටර්ස් පීඑෆ්-7424 දරණ කැබ් රථයේ සේවා වාරය
සඳහා ගෙවීම 13355.28

22.ලියාපදිංචි සේවක /සේවිකා වැටුප ලියාපදිංචි සේවක /සේවිකා 2019 පෙබරවාරි වැටුප
425725.00

23. ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී. 2019 ජනවාරි දූරකථන බිල් ප්‍රතිපූර්ණය
22511.49

24.දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්2019 පෙබරවාරි NBT කොටසක් ගෙවීම
15000.00

25. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් 2019 පෙබරවාරි 16-28 දක්වා VAT ගෙවීම
45514.00

26.පී.එච්.සී.සී. ද සිල්වා 90520.00

27. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් VAT ගෙවීම
87986.01

28.යුනයිටඩ් මෝටර්ස් ලංකා පී.එල්.සී. කැබ් රථය අලුත් වැඩියා කිරීම 73621.70

29.සඳුන් දිනේෂ් වාහන බලපත්‍ර ගාස්තු ගෙවීම සඳහා අත්තිකාරම්
ලබා දීම
29000.00

ඉහත වවුචර්පත් වලට අමතරව කාර්යාලයේ මෙතෙක් චෙක්පත් සඳහා පළමු අත්සන් තබන ලද ප්‍රධාන කළමණාකරණ සහකාර මිහිරි කාන්ති ද සිල්වා මිය ස්ථානමාරු ලබා යාම හා ලේකම් බී.ජ්. ධම්මිකා මිය 2019.03.25 දිනසිට ස්ථානමාරු ලබා යාමට නියමිත බැවින් , ඒ සඳහා අත්සන් කිරීමේ බලය පැවරීම සහා අනුමැතියට යටත්ව පහත පරිදි තීරණය කරන ලදී.

**01** අත්සන් - **ලේකම්** **- ආර්.යූ.ඩබ්. ගුණවර්ධන**
**මිය**

- ආර්.යූ.ඩබ්. ගුණවර්ධන මිය නිවාඩු අවස්ථාවලදී ,

**ප්‍රධාන කළමණාකරන සහකාර - එස්.සී.දයාරංසි මිය**

02 අත්සන් - **ගිණුම් අංශ ප්‍රධානී** **- එම්.එච්.රෝෂිණි මිය**

එම්.එච්.රෝෂිණි මිය නිවාඩු අවස්ථාවලදී ,

**ප්‍රධාන ආදායම් කළමණාකරණ සහකාර -ආර්.ජී.ඉන්දිකා**
**ස්වර්ණමාලි මිය**

පැමිණි සැමට ස්තුති කරමින් ප.ව.4.10 ට පමණ කමිටුවේ කටයුතු නිම කරන ලදී.

| ....................................... | ............................................... | ................................................. |
|---|---|---|
| සකස් කලේ | ලේකම්, | ගරු සභාපති, |
| එම්.එච්. රෝෂිණී | බී.ජී. ධම්මිකා , | ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් |
| කළමණාකරණ සහකාර | නගර සභාව , අම්බලන්ගොඩ | නගර සභාව , |
| අම්බලන්ගොඩ | | |

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>
2019.03.22 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව මා යෝජනා කර සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>
එම යෝජනාව මා ස්ථිර කරනවා.

**තීරණය-**
2019.03.22 දින පැවති මුල්‍ය කමිටු වාර්තා පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.02 2019.03.21. දින පැවැති පුස්තකාල කමිටු වාර්තාව සභා ගත කරන ලදි.**

<u>**2019 මාර්තු මස 21 වන දින පුස්තකාල කමිටු වාර්තාව**</u>

- **ගරු සභාපති** — **ඇම්.ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා**
- **ගරු නගර සභා මන්ත්‍රී** — **නන්දන රාජපක්ෂ මහතා**
- **ගරු නගර සභා මන්ත්‍රීනි** — **එම්. චම්පා සුමුදු කුමාරි මහත්මිය**
- **කමිටු සාමාජික** — **සිරිපාල මාදුවගේ මහතා**
- **කමිටු සාමාජික** — **එම්.ජී. ජයවීර මහතා**
- **කමිටු සාමාජික** — **සුගත් හෙට්ටිආරච්චි මහතා**
- **කමිටු සාමාජික** — **එන්.එච්. ධන්කන් ද සිල්වා මහතා**
- **කමිටු සාමාජික** — **ප්‍රේමසිරි රතුවඩු මහතා**
- **කමිටු සාමාජික** — **හර්බට් වීරක්කොඩි මහතා**
- **පුස්තකාලයාධිපති (ධර්මාශෝක වි.)** — **ජී.එච්.එල්. ප්‍රියංගනී**
- **ලේකම්** — **ආර්.යූ.වයි. ගුණවර්ධන මහත්මිය**

- ප්‍රජා සංවර්ධන නිලධාරී ඩී.වී. තරංගි මහත්මිය
- පුස්තකාලයාධිපති කේ.ඩබ්ලිව්. රංජනී මානෙල්

  මෙනවිය
- පුස්තකාල සහායිකා ජී.එච්.එල්. පියන්ති මෙනවිය
- පුස්තකාල සහායිකා එස්. සුසිලා දීපානි මහත්මිය
- පුස්තකාල සහායිකා ඒ.ජී. ලක්ෂ්මී පෙරේරා මෙනවිය
- පුස්තකාල සහායිකා ඩී.එම්.ජී.එස්. දිල්රුක්ෂි මහත්මිය
- පුස්තකාල සහායිකා කේ.ඒ. විසුද්ධි රේණුකා මහත්මිය
- පුස්තකාල සහායිකා මාලති සමන්තා ආරියසිංහ මහත්මිය
- පුස්තකාල සහායිකා එස්.එම්. මනෝරි චන්ද්‍රවංශ

  මහත්මිය

<u>අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා මූලාසනය දැරූ **2019/03/21** දින පැවති පුස්තකාල කමිටු වාර්තාව</u>

- ගරු සභාපතිතුමා පුස්තකාල කමිටුවට පැමිණීමෙන් පසුව ප.ව. **2.30** ට පමණ පුස්තකාල කමිටුවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.
- ගරු සභාපතිතුමා විසින් පුස්තකාල කමිටුවට පැමිණි සියලුම ගරු නගර සභා මන්ත්‍රීවරු, මන්ත්‍රීවරිය, පුස්තකාල කමිටු සාමාජික මහතුන්, ලේකම්තුමිය සහ ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය, පුස්තකාලයාධිපතිනිය සහ පුස්තකාල සහායිකාවන් ඇතුලු සියලුම මහත්ම මහත්මීන් පිළිගන්නා ලදි.
- ගරු සභාපතිතුමා අලුතින් පැමිණි ලේකම්තුමිය පුස්තකාල කමිටුවට හඳුන්වා දීම සිදු කරන ලදි. එහිදී එතුමියට නිලධාරී මණ්ඩලය හඳුනා ගැනීම සඳහා නිලධාරීන් විසින් තම තමන්ගේ විස්තර ඉදිරිපත් කරන ලදි.
- පළමුවෙන්ම ප්‍රගති වාර්තා කමිටුවට ඉදිරිපත් කිරීම සිදුකරන ලදි.

  ප්‍රධාන පුස්තකාලයේ ප්‍රගති වාර්තාව පුස්තකාලයාධිපතිනිය විසින්ද ශාඛා පුස්තකාලවල ප්‍රගතිය ඒ ඒ ශාඛා භාර පුස්තකාල සහායිකාවන් විසින් ද විද්‍යුත් පුස්තකාලයේ ප්‍රගති වාර්තාව සහ කෙරමිණිය ශාඛාව සහ පොල්වත්ත ශාඛාව භාර පුස්තකාල සහායිකාවන් පුස්තකාල කමිටුවට සහභාගී නොවන බැවින් එම වාර්තාව ජී.එච්. එල් .පියන්ති මෙනවිය විසින් කමිටුවට ඉදිරිපත් කරන ලදි.
- ප්‍රධාන පුස්තකාලයට වඩා ඕකන්ද ශාඛා පුස්තකාලයේ ඉංග්‍රීසි පොත් නිකුත් වීම වැඩි බව පෙනී යන බව ගරු සභාපතිතුමා කමිටුවට දන්වන ලද අතර ප්‍රධාන පුස්තකාලයේ සමීක්ෂණ කටයුතු පැවති බැවින් පොත් නිකුත් කිරීමට මාස එකහමාරක කාලයක් ගත වූ බව පුස්තකාලයාධිපතිනිය කමිටුවට දන්වන ලදි.
- නගර සභා මන්ත්‍රීවරුන් වන ධනසේන මාදුවගේ මහතා සහ දිනයාදූර ධර්මදාස මහතා පුස්තකාල කමිටුවට පැමිණීමට නොහැකි බව දැන් වූ බව ගරු සභාපතිතුමා පුස්තකාල කමිටුවට දන්වන ලදි.

▪ වෙනත් කරුණු පිළිබඳ සාකච්ඡා කිරීම.

දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා රු.**1,015,885.00** (දසලක්ෂ පහලොස් දහස් අටසිය අසූපහ) පොත් ලබාදීම **2019/03/15** වන දින සිදු කල බවත් එම පොත් ලැයිස්තුව පුස්තකාල කමිටුවට ඉදිරිපත් කරන ලදි. සංකේත වශයෙන් සුළු පොත්

ප්‍රමාණයක් ලැබුණු අතර ඉතිරි පොත් ඉදිරියේදී ලබා දෙන බව පුස්තකාලයාධිපතිනිය කමිටුවට දන්වන ලදි.

එහිදී ගරු සභාපතිතුමා එම පොත් ලබාදීම පිළිබඳ ස්තූතිය ප්‍රකාශ කර පළාත් පාලන ආයතනයට ලිපියක් යවන ලෙස ප්‍රජා සංවර්ධන නිලධාරීතුමියට උපදෙස් ලබා දෙන ලදි.

- පසුගිය වසරේ අප අතරින් වියෝ වූ පුස්තකාල කමිටු සාමාජික ප්‍රවීන ලේඛක ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතාට උපහාර පිණිස අම්බලන්ගොඩ නගර සභාව මගින් අනුග්‍රහය දක්වා එළි දක්වන ලද අම්බලන්ගොඩ පුරාණය ග්‍රන්ථය යළි පුනර්ජීවනය කර පාඨකයින්ට ඉදිරිපත් කිරීම යෝග්‍ය බව ගරු සභාපතිතුමාගේ අනුශාසකත්වය ඇතිව, පුස්තකාල කාර්ය මණ්ඩලය ඉදිරිපත් කරන ලද ලිපියේ සඳහන් කර ඇත.

  මේ කර්තව්‍ය ඉටු කිරීමට කමිටු සාමාජික මහතුන්ගේ සහ පුස්තකාල කාර්ය මණ්ඩලයේ අදහස් විමසීමට ගරු සභාපතිතුමා කටයුතු කල අතර එහිදී සුගත් හෙට්ටිආරච්චි මහතා යෝජනා කළේ කමිටුවක් පත් කිරීම මගින් එම කාර්ය ඉටු කල හැකි බවය. කමිටු සාමාජික හර්බට් වීරක්කොඩි මහතා එම යෝජනාව ප්‍රතික්ෂේප කල අතර ඒ මගින් එය ඉටු කිරීමට නොහැකි බව දන්වන ලදි. එහිදී ගරු සභාපතිතුමා කරුණු පැහැදිලි කල අතර මේ කාර්ය ඉදිරිපත් කිරීමට ප්‍රථමයෙන්ම නාට්‍යයක් වශයෙන් රචනා කිරීමට කෙනෙකු තෝරා ගත යුතු බවය. හර්බට් වීරක්කොඩි මහතා ප්‍රකාශ කළේ රත්නසිරි පරණවිතාන මහතා සුදුසු බවය. ගරු සභාපතිතුමා එම අදහසට එකග වූ අතර එය ඉටු කර ගැනීමට ප්‍රජා සංවර්ධන නිලධාරීතුමියට ඒ මහතා හමු වී සාකච්ඡා කිරීමට උපදෙස් ලබා දෙන ලදි. සිංදු ලිවීම හා ගායනය යන අංශ හර්බට් වීරක්කොඩි මහතාට කල හැකි බව ගරු සභාපතිතුමාගේ අදහස විය.

- පොත් රාක්ක සාදා නිම කර පුස්තකාලවලට ලබා දීම පිළිබඳ සාකච්ඡා කිරීම.

  ප්‍රධාන හා ශාඛා පුස්තකාලවලට පොත් රාක්ක ලැබුණු බවත් එම පොත් රාක්ක පුස්තකාලවල ඇසිරීමේ දී යම් යම් අපහසුතාවන් ඇති බව ශාඛා භාර පුස්තකාල සහායිකාවන් පවසන ලදි. එහිදී බිත්ති වලට ඇණ ගසා කම්බි වලින් බැඳ තැබීමට හැකිබව යෝජනා වූ අතර ඒවා සකස් කර ගැනීමට  පාඨකයන්ගේ උදව් ලබා ගත යුතු බව ගරු සභාපතිතුමාගේ අදහස විය.

- තාක්ෂණ සේවා නිලධාරි මහතාගේ නොපැමිණීම පිළිබඳ කමිටු සාමාජික එන්.එච්. ඩන්කන් මහතා කරුණු විමසන ලද අතර ගරු සභාපතිතුමා පවසා සිටියේ එදින රාජකාරී කටයුතු ඇති බැවින් පැමිණීමට නොහැකි බව දැන් වූ බවය. නමුත් ඉදිරි කමිටු වල දී ඔහුගේ පැමිණීම බලාපොරොත්තු වන බවය.
- මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලය තීන්ත ආලේප කර අළුත්වැඩියා කිරීමට ටෙන්ඩර් දැන්වීමක් එල කර ඇති බැවින් ඉදිරියේදී ඒ අනුව ඉක්මනින් කටයුතු කරන බව ගරු සභාපතිතුමාගේ අදහස විය.
- හෙප්පුමුල්ල ශාඛා පුස්තකාලයේ  පාඨකයකු රැගෙන ගොස් ඇති ප්‍රමාද පොත් පිළිබඳ සාකච්ඡා කල අතර අලුතින් පොත් දෙකක් ලබා ගැනීම හෝ පොත් වල මිළ ගෙවීම සුදුසු බව යෝජනා විය.
- ප්‍රධාන පුස්තකාලයේ පොත්වල පාඨකයින් දැනුවත් කිරීම සඳහා පොත් නිකුත් කිරීම සම්බන්ධ නීති මාලාව ඇතුලත් පත්‍රිකාවක් පොත්වල ඇතුලත් කිරීම සුදුසු බව එන්.එච්. ඩන්කන් මහතා යෝජනා කල අතර ගරු සභාපතිතුමා එය ඉටු කරන ලෙස උපදෙස් ලබා දෙන ලදි.

- ඕකන්ද ශාඛා පුස්තකාලයේ අඩුපාඩු වන වහල සහ වෙනත් කටයුතු ඉක්මනින් කර දීමට කටයුතු කරන ලෙස ලේකම්තුමියට ගරු සභාපතිතුමාගන් උපදෙස් ලබා දෙන ලදි.
- හිරේවත්ත ශාඛා පුස්තකාලයේ දොර ඇරීමට සහ වැසීමට අපහසු බව එම පුස්තකාල සහායිකාව කමිටුවට දන්වන ලදි. එම කටයුතු සොයා බැලීමට උපදෙස් දෙන ලදි.
- ප්‍රධාන පුස්තකාලයට ලැබී ඇති කුසලතා සහ සහතික මහජන ප්‍රදර්ශනය සඳහා තැබීමට සුදුසු බව කමිටු සාමාජික සුගත් හෙට්ටිආරච්චි මහතාගේ අදහස වූ අතර ඒ සඳහා අළුත් වීදුරු අල්මාරියක් මිලදී ගෙන එම කුසලතා සහ සහතික මහජනයාට ප්‍රදර්ශනය වන ස්ථානයක තැබීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා ලේකම්තුමියට උපදෙස් ලබා දෙන ලදි.
- පොත් බැඳීම (Binding) සම්බන්දව සාකච්ඡා කිරීම.

  පොත් බැඳීම ඉතා පිළිවෙලට සිදු කරන බවත් එම කාර්ය ඉටු කිරීමට වෙනත් නිලධාරීන් යොදවන ලෙස කමිටු සාමාජික එන්.එච්. ධන්කන් මහතාගේ අදහස වූ අතර එම කාර්ය ඉටු කිරීමට වෙනත් අය යොදා ගැනීම සහ වෙනත් අයකු මගින් මුදල් ගෙවා එම කටයුතු ඉටු කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා පුස්තකාලයාධිපතිනියට උපදෙස් ලබා දෙන ලදි.
- පාඨක අදහස් පොත් පිළිබඳ සාකච්ඡා කිරීම.

  ප්‍රධාන හා ශාඛා පුස්තකාල සඳහා පොත් මිළදී ගැනීම පිළිබඳ ස්තූතිය ප්‍රකාශ කර ඇති බවත් ඒවා පාඨක අදහස් පොතේ සටහන් කර ඇති බව ගරු සභාපතිතුමා පුස්තකාල කමිටුවට දන්වන ලදි.
- ප්‍රධාන පුස්තකාලයේ කාණු පද්ධතිය පිරිසිදු කර ගැනීමට සහ අළුතින් ඉදිකර ඇති වැසිකිලිය භාවිත කිරීමට සුදුසු මට්ටමකට ගෙන යා යුතු බව එන්.එච්. ධන්කන් මහතාගේ අදහස වූ අතර ලේකම්තුමියට මේ පිළිබඳ සොයා බලා කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා උපදෙස් ලබා දෙන ලදි.
- නව ලේකම්තුමිය විසින් පුස්තකාල කමිටුවට පැමිණි ගරු සභාපතිතුමා, ගරු නගර සභා මන්ත්‍රීවරු, මන්ත්‍රීවරිය සහ ස්වේච්ඡාවෙන් පැමිණි කමිටු සමාජික මහතුන්, ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය, පුස්තකාලයාධිපතිනිය සහ පුස්තකාල සහායිකාවන් ඇතුළු සියලුම මහත්ම, මහත්මීන්ට ස්තූතිය පුද කල අතර එතුමිය පවසා සිටියේ ප්‍රථම රාජකාරිය වූයේ පුස්තකාල කමිටුවට සහභාගී වීමත් ඒ පිළිබඳ ගරු සභාපතිතුමාගේ උපදෙස් අනුව ප්‍රධාන හා ශාඛා පුස්තකාලවලට ගොස් අත්දැකීමක් ලබාගත් බවය. ඒ අනුව ඉදිරි කටයුතු සාර්ථකව කිරීමට තමන් බලාපොරොත්තු වන බවත් මේ සඳහා සියලුම දෙනාගේ උදව් උපකාර බලාපොරොත්තු වන බවත් දන්වා පුස්තකාල කමිටුවේ වැඩ කටයුතු එදිනටඅවසන් කරන ලදි.

.....................................

කමිටු ලේකම්

නගර සභාව අම්බලන්ගොඩ

.......................................

ලේකම්

නගර සභාව අම්බලන්ගොඩ

..................................

අත්සන් කළේ සභාපති

නගර සභාව අම්බලන්ගොඩ

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
2019.03.21. දින පැවැති පුස්තකාල කමිටු වාර්තාව මා යෝජනා කර සිටිනවා.

**<u>නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**
එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය-**
2019.03.21. දින පැවැති පුස්තකාල කමිටු වාර්තාව යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.03 2019.03.25 දින පැවැති ටෙන්ඩර් කමිටු වාර්තාව සභා ගත කරන ලදී.**

<u>ටෙන්ඩර් කමිටුව</u>

**<u>2019/03/25 දින ප.ව. 2.30</u>**

**සහභාගීත්වය**

| නම | තනතුර |
|---|---|
| 01. අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව |
| 02. කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති, අම්බලන්ගොඩ නගර සභාව |
| 03. සරත් ශ්‍රී ලාල් මහතා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 04. ධම්මික කොඩිකාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 05. නන්දන රාජපක්ෂ මහතා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 06. රාහුල ලලිත වික්‍රම මහතා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 07. බී.ඒ. ධම්මිකා මහත්මිය | ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව |
| 08. එස්. සී. දයාරත්සි මහත්මිය | පධාන කළමනාකරණ සහකාර, අම්බලන්ගොඩ නගර සභාව |
| 09. ඩී. එච්. එස්. ඩී. ගුණවර්ධන මහතා | තාක්ෂණ සේවා නිලධාරී, අම්බලන්ගොඩ නගර සභාව |
| 10. බී. පාටලී මදාරා | තාක්ෂණ සේවා නිලධාරී, අම්බලන්ගොඩ නගර සභාව |
| 11. කේ. පී. දුල්මිණී භාග්‍යා | කළමනාකරණ සහකාර, අම්බලන්ගොඩ නගර සභාව |

<u>කමිටු වාර්තාව</u>

1. ලිපි ද්‍රව්‍ය {ලිපි ශීර්ෂ (විශේෂ) } මුද්‍රණය සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද සක්වා ප්‍රින්ටර්ස් ආයතනය ඉදිරිපත් කල මිල ගණන් පිළිගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | ඩී. ආර්. එස්. ප්‍රින්ටර්ස් ආයතනයේ | ශක්ති ප්‍රින්ටර්ස් ආයතනයේ | සීල එන්ටපුයිසස් ආයතනයේ | ආරියදාස ප්‍රින්ටර්ස් ආයතනයේ |
|---|---|---|---|---|---|---|---|
| | | | | ඒකක් තොගය | ඒකක් තොගය | ඒකක් තොගය | ඒකක් තොගය |
| 1 | ලිපි ශීර්ෂ (විශේෂ) | 1000 | | 9500.00 | 7750.00 | 8175.00 | 8400.00 |

2. රාජ්‍ය සේවා ක්‍රිකට් තරගාවලියට සහභාගීවීම සඳහා සහ ක්‍රිකට් පුහුණුවීම් කටයුතු සඳහා ක්‍රිකට් පිති හා පන්දු සඳහා අවම මිල ඉදිරිපත් කල ගිත්මි ස්පෝර්ට්ස් ගුඩ්ස් ආයතනයේ මිල පිලිගැනීම සුදුසු බවට තීරණය කරන ලදී

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | සාර ස්පෝර්ට්ස් ආයතනයේ | ගිත්මි ස්පෝර්ට්ස් ගුඩ්ස් ආයතනයේ | ගින්සන ක්‍රීඩා භාණ්ඩ ආයතනයේ |
|---|---|---|---|---|---|---|
| | | | | ඒකක් තොගය | ඒකක් තොගය | ඒකක් තොගය |
| 01 | ක්‍රිකට් පිති | 02 | | 3600.00 | 3500.00 | 3650.00 |
| 02 | ක්‍රිකට් පන්දු ටින් | 02 | | 1080.00 | 1080.00 | 1100.00 |

3. සෞඛ්‍ය අංශය අවශ්‍ය ඉදල් සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ශ්‍රියා ඉන්ඩස්ට්‍රීස් ආයතනයේ මිල ගණන් පිළිගැනීම සුදුසු බව තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | නයනි රංජනි සේල් පොල ආයතනයේ | ශ්‍රියා ඉන්ඩස්ට්‍රීස් ආයතනයේ | ශර්ණා බෙලෙපැල ආයතනයේ | රවිදු ස්ටේෂනරීස් ඇන්ඩ් ගාඩියර් බයින්ඩර් |
|---|---|---|---|---|---|---|---|
| | | | | ඒකක් තොගය | ඒකක් තොගය | ඒකක් තොගය | ඒකක් තොගය |
| 01 | ඉදල් | 100 | | 120.00 | 100.00 | 140.00 | බෙලෙක් ආවරණ 135.00 |
| | | | | | | | සාමාන්‍ය 128.00 |

4. කර්මාන්ත අංශයට අවශ්‍ය බිල් පොත් මුද්‍රණය සඳහා (බිල් පොත් මුද්‍රණය හා ප්‍රමාණ පත්‍ර මුද්‍රණ සඳහා ) මුළු එකතුවෙහි අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති සක්වා ප්‍රින්ටර්ස් ආයතනයේ මිල ගණන් පිළිගැනීම සුදුසු බව තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | සක්වා ප්‍රින්ටර්ස් ආයතනයේ මිල | ආරියදාස ප්‍රින්ටර්ස් ආයතනයේ මිල | ශ්‍රීල එන්ටර්ප්‍රයිසස් ආයතනයේ මිල | ශ. ආර්. එස්. ප්‍රින්ටර්ස් ආයතනයේ මිල |
|---|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 1 | ප්‍රමාණ පත්‍ර පොත (මුල් පිටපත හා තවත් පිටපත් 2 ක් සහිත ) | 20 | පොතකට බිල්පත් 100 බැගින් | 11800.00 | 13000.00 | 23750.00 | 15000.00 |
| 2 | බිල් පත්‍ර පොත (මුල් පිටපත හා තවත් පිටපත් 2 ක් සහිත ) | 10 | පොතකට බිල්පත් 100 බැගින් | 12500.00 | 23750.00 | 6850.00 | 15000.00 |

5. පරිගණක සඳහා වෙළඳ පොළේ පවත්නා මිල ගණන්, වෙළඳ නාමය, සාපේක්ෂ මිල හා අලවියෙන් පසු සේවාව ලබා ගැනීමේ පහසුව සලකා බලා ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් ටියුලිප් කම්පියුටර්ස් ආයතනයේ මිල ගණන් පිළිගැනීම සුදුසු බව තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | මැක් ටෙක්නොලජී ආයතනයේ මිල | ටියුලිප් කම්පියුටර්ස් ආයතනයේ මිල | ලෝජික් කම්පියුටර්ස් ආයතනයේ මිල |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 1 | HP (Pro) 400 G5 Core is (Intel) with operating system 3Y W | | HP | 120000.00 | 119500.00 (with Kasper Key) | |
| 2 | Acer Ves 2730 core is (Intel) with operating system 3Y W | | Acer | | | 109500.00 |
| 3. | HP Prodesk 600 G3 core is operating sys. No details | | HP | 124000.00 | | |
| 4. | Asus core is /hard disk 1 Y warranty/OS no details | | Asus | 100000.00 | | |

6. බැටරි සඳහා (නගර සභාවට අයත් 49-9421 මැසී ෆර්ගිවුසන් ට්‍රැක්ටරයට සඳහා) ඉදිරිපත්වූ මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ජයසිංහ බැටරි සෙන්ටර් ආයතනයේ මිල ගණන් පිළිගැනීමට තීරණය කරන ලදී

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | ජයසිංහ බැටරි සෙන්ටර් හික්කඩුව | නිව් ජයසිංහ බැටරි බර්ක්ස් බටපොල | සේන බැටරි සේල් සෙන්ටර් අම්බලන්ගොඩ |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 01 | ඇමරෝන් ඇම්පියර් 90 (සීල් ටයිප්) බැටරිය | 01 | ඇමරෝන් | 21950.00 | 22490.00 | 23620.00 |

07. ළමා උද්‍යාන උපකරණ සැපයීම සඳහා ඉදිරිපත් වී ඇත්තේ එක් මිල ගණනක් බැවින් පිරිවිතර ඉදිරිපත් කර නැවත මිල ගණන් කැඳවීමට තීරණය කරන ලදී.

............................................

සකස් කලේ

සැපයුම් නිලධාරී

කළමනාකරණ සහකාර

අම්බලන්ගොඩ නගර සභාව

..................................................

පරීක්ෂා කලේ

තාක්ෂණ සේවා නිළධාරී

අම්බලන්ගොඩ නගර සභාව

....................................................

ලේකම්

බී.ඒ.ධම්මිකා

අම්බලන්ගොඩ නගර සභාව

..............................................

සභාපති

ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප්

අම්බලන්ගොඩ නගර සභාව

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
2019.03.25 දින පැවැති ටෙන්ඩර් කමිටු වාර්තාව මා යෝජනා කර සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**
එම යෝජනාව මා ස්ථිර කරනවා.

**තීරණය-**
2019.03.25 දින පැවැති ටෙන්ඩර් කමිටු වාර්තාව පිළිගතයුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.04 2019.03.25. දින පැවැති ක්‍රිඩා කමිටු වාර්තාව සභා ගත කරන ලදී.**

**<u>ක්‍රීඩා කමිටු වාර්තාව</u>**
**<u>2019.03.25</u>**

**සහභාගිත්වය-**

ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා -ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.

ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා -ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.

ඒ.ඩබ්ලිව්.ජගත් කුමාර මහතා -ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.

ධම්මික කොඩිකාර මහතා - ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.

එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මිය -ගරු නගර සභා මන්ත්‍රිණී,අම්බලන්ගොඩ නගර සභාව.

එස්.එම්.මහේන්ද්‍ර ගුණරත්න මහතා - ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලය,අම්බලන්ගොඩ.

කේ.ඩබ්ලිව්.සී.දර්ශනී ද සිල්වා මිය -උපගුරු,ගා/ප්‍රජාපතීගෝතමී බා.වි,අම්බලන්ගොඩ.

ඒ.කේ.එස්.ඩී.ශ්‍යාමලී මිය -ගා/ග්‍රාමණී විද්‍යාලය,අම්බලන්ගොඩ.

එගොඩගේ ජයසේන මහතා -ලේකම්,අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමය.

ජේ.ජයවීර මහතා -රියෝ ක්‍රීඩා සමාජය,අම්බලන්ගොඩ.

එස්.කේ.දිලංකා මෙ.වි -ඩොල්ෆින් ක්‍රීඩා සමාජය, අම්බලන්ගොඩ.

එස්.එම්.නීල් වසන්ත මහතා -පිහිණුම් පුහුණුකරු,අම්බලන්ගොඩ.

එම්.ජී.දිලිප් ඉන්ද්‍ර මහතා -ජල ක්‍රීඩා සංගමය,අම්බලන්ගොඩ.

මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා -ක්‍රීඩා කමිටු සාමාජික,පෝරඹ, අම්බලන්ගොඩ.

බී.ඒ.ධම්මිකා මිය -ලේකම්,අම්බලන්ගොඩ නගර සභාව.

ඩී.එච්.එස්.ඩී.ගුණවර්ධන මහතා -තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව.

බී.පී.මදාරා මෙ.වි - තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව.

ජී.අශෝක කුමාර මහතා -ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.

ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා -දකුණු පළාත් පා පන්දු පුහුණුකරු.

ඩී.වී.තරංගි මිය -ප්‍රජා සංවර්ධන නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව

**පිළිගැනීම.-ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව**

අද දින ක්‍රීඩා කමිටුව සඳහා සහභාගිවන ගරු මන්ත්‍රීතුමන්ලා,මන්ත්‍රීතුමියන්ලා, ගුරු මහත්ම මහත්මීන්, ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් පැමිණි මහත්ම,මහත්මීන් ලේකම්තුමිය ඇතුළු සියළුම නිලධාරි මහත්ම,මහත්මීන් පිළිගනිනමින්, ක්‍රීඩා කමිටුවේ කටයුතු ආරම්භ කරන ලදි.

<u>පසුගිය කමිටුවේ දී සාකච්ඡා කරන ලද කරුණු සමාලෝචනය</u>

- කළුවඩුමුල්ල ක්‍රීඩාංගණයේ දූර පනිනවල සෑදීම,Tap එකක් හා ගේට්ටු දැමීම.

  **ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
  මොකක්ද දැන් තත්වය.
  **ජී.අශෝක කුමාර මහතා,ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.**
  වල විතරක් කැපුවා.ඉතිරි වැඩ කරන්න අවශ්‍ය බඩු ලැබුනේ නැහැ.

  **ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
  මොනවද බඩු මට ලේඛනයක් ආවේ නැහැ නේ. කාටද දුන්නේ.

  **ජී.අශෝක කුමාර මහතා,ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.**
  To මහත්තයට තමයි දුන්නේ.

  **ධම්මික කොඩිකාර මහතා,ගරු නගර සභා මන්ත්‍රී, නගර සභාව,අම්බලන්ගොඩ.**
  කළුවඩුමුල්ල ක්‍රීඩාංගණය ගැන කථා කරන නිසා මම කියන්නේ. පළමුවෙනි ක්‍රීඩා කමිටුවේ දී මම ඉල්ලීම කළේ කළුවඩුමුල්ල ක්‍රීඩාංගණයෙ වැට ගහන්න.බම්බූ ටික විතරක් ගහල තියෙනවා.තාම වැඩ අවසන් කරන්න බැරිවුනා. දැන් අවුරුද්දක් වෙනවා. මටම ඇත්තටම ලැජ්ජයි ගමේ අය මේ ගැන අහන කොට.

  **සඳුන් ගුණවර්ධන මහතා, තාක්ෂණ සේවා නිලධාරි,නගර සභාව,අම්බලන්ගොඩ.**
  නෙට් එකේ මදිකමක් නිසා තමයි වැඩ නතර කලේ මම ඒත් කිව්වා තියෙන ටික ගහන්න කියල. මම පෞද්ගලිකව මේ ගැන සොයා බලන්නම්.

  **ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
  සඳුන් මහත්තයා මේ වැඩ ටික සභාවට කළින් අවසන් කරන්න.

- මාදම්පා ගඟ පිහිනුම් තටාකයේ ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳව.
  **නීල් වසන්ත මහතා,පිහිණුම් පුහුණුකරු.**
  වැඩ කරගෙන යනවා.

  **ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
  කවුද කොන්ත්‍රාත්කරු? පැමිණිල්ලක් නැති විදියට වැඩ කරනවද?මොකද මට බලන්න එන්න බැරි වුණා.

**එම්.ජී.දිලිප් ඉන්ද්‍ර මහතා,ජල ක්‍රීඩා සංගමය,අම්බලන්ගොඩ.**
නාලක තමයි කරන්නෙ.පඩි පෙළයි,අත්වැලයි, Blocks දෙකක් හදල තියෙනවා.ඒවා හොඳට කරල තියෙනවා.ටිකක් වැඩ ප්‍රමාදයි.නමුත් වැඩ හොඳයි.

- මානාන ක්‍රීඩාංගණයේ පස් දැමීමට අදාළ ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීම හා ගේට්ටු සකස් කිරීම.

**ඩී.වී.තරංගි,ප්‍රජා සංවර්ධන නිලධාරි,නගර සභාව,අම්බලන්ගොඩ.**
පස් දාන්න ඇස්තමේන්තුව පසුගිය සභාවට ඉදිරිපත් වුණා.ගේට්ටු නම් දැමුනේ නැහැ.

**ඒ.ඩබ්ලිව්.ජගත් කුමාර,නගර සභා මන්ත්‍රී,නගර සභාව,අම්බලන්ගොඩ.**
පිට්ටනියේ මැදට කැරකෙන ගේට්ටුවක් දාලා. ඇළ අයිනේ බැරියර් එකක් දාන්න සභාවේ වාහනයක් දාන්න පුළුවන් විදියට.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
To මිස් මේ කියන කාරණා ලියාගෙන මේ උපදෙස් අනුව කරල දෙන්න.

- කොන්ක්‍රීට් බංකු 10ක් මිලදී ගැනීම. (මානාන ක්‍රීඩාංගණයට 08 මාදම්පා හඟ පිහිනුම් තටාක පරිශ්‍රයට 02)

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අද හවස ටෙන්ඩර් කමිටුව තියෙනවා.මිල ගණන් ඉදිරිපත් වෙනවද?

**ඩී.වී.තරංගි මිය,ප්‍රජා සංවර්ධන නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව.**
සැපයුම් විෂය දැන් කරන්නෙ දුල්මිණි මිස්.කළින් කල ලක්මාලි මිස්ගෙන් ඒ ඉල්ලීම ඇවිත් නැහැ.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
මිස්ලා අලුත් වුණාට විෂය වෙනස් වෙන්න විදියක් නැහැනේ. ඒවා ලිඛිතව භාර දීල යන්න ඕනේ. මේ සභාවට හරි ඉදිරිපත් කරන්න කියන්න.

**ජී.අශෝක කුමාර මහතා,ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.**
මානාන ක්‍රීඩාංගණයේ වෙඩරු ගස් ඉක්මනට වැවෙනා.දැන් සෑහෙන ප්‍රමාණයක වැවිලා තියෙන්නේ, අතින් ගලවන්න පුළුවන්. මේ දවස්වල සේවකයෝ ගැනීමේ ප්‍රශ්නයක් තියෙන නිසා ඒ වැඩය කර ගන්න බැරිවුනා.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
To මිස් දෛනික ගෙවීම් මත බඳවා ගත්ත සේවකයෝ තුන්දෙනෙක් සෙනසුරාදයි, ඉරිදයි යොදවල මේ වැඩය කරන්න.කොට්ඨාශ ක්‍රමයට වැඩ කරන්නේ සතිය දවස් පහ විතරයිනේ.

- බැඩ්මින්ටන් ක්‍රීඩාංගණය ඉදිකිරීමට අදාළ ඇස්තමේන්තුව ඉදිරිපත් කිරිම.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
එකත් ලැබුනේ නැහැ. මේ බැඩ්මින්ටන් ක්‍රීඩාංගණය කියන්නේ මීට වසර 20 විතර කළින් ක්‍රීඩා අමාත්‍යාංශයෙන් අත්තිවාරම් දාල තියෙන එක.ක්‍රීඩාංගණයම ඉදිකරන්න ඇස්තමේන්තුව

එකපාරටම දෙන්න එපා, අදියර වශයෙන් දෙන්න. පළමු අදියර වශයෙන් කොන්ක්‍රීට් කණු අඩි 30 උස්සන් හදන්න දෙන්න. අපි හෙමිහිට ඉදිරි වැඩ කටයුතු කරමු.

- ❖ මහජන ක්‍රීඩාංගණයේ ප්‍රතිසංස්කරණ කටයුතු හා ක්‍රීඩා මණ්ඩපයේ අඩු පාඩු සකස් කිරිමට අදාළ ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම.

.

**ඇම්.ඩබ්ලිව්.අරුණ මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
කොහොමද අශෝක ඒ වැඩ කටයුතු බැලුවද?

**ජී.අශෝක කුමාර මහතා,ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.**
හර්ෂණ මහත්තයත් එක්ක ගිහින් ඔක්කොම බලල මැනගෙන ඇවිත් තියෙන්නේ. වැට හදන එකනම් බැලුවේ නැහැ.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
පිට්ටනියේ තණකොල අල්ලන්න කළින් වැට හැදෙන්න ඕනේ හරක්ට පිට්ටනියට පනින්න බැරිවෙන්න. Frame එක ගහල Green Net එක අල්ලන්න. පිට්ටනියේ අනිත් වැඩ කොහොමද?

**ජී.අශෝක කුමාර මහතා,ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.**
ජිනසේන එකෙන් දැන් පයිප්ප දාල වහල තියෙන්නේ අනිත් ඒවා අපි වහන්න ඕනේ. JCB එක ක්‍රිෂාන්තත් එක්ක දෙනවනම් ඒ වැඩ ටික අවසන් කරන්න පුළුවන්.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
ඒ වැඩටික අවසන් කරන්න.

- ❖ පොල්වත්ත ක්‍රීඩාංගණයේ මීටර් 100 ධාවන පථය සකස් කිරීම.

**ජී.අශෝක කුමාර මහතා,ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.**
ඒක හැදුවා ඒ වුනාට 100ට යන්න බැරි වුණා. 80ට හැදුවේ ඒ අය හදපු විදිය වැරදියි.අයිනෙන්ම හැදුවනම් 100ට යන්න තිබුණා. ඒ අය හැදුවේ කෙළින්.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
මීටර් 100ට යන්න මොකක්ද කරන්න පුළුවන්.

**ජී.අශෝක කුමාර මහතා,ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.**
ඇන්ගල් කරල ගහන්න තමයි තියෙන්නේ.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
මීටර් 100 ගන්න බැරිනම් ඔතන ට්‍රැක් එක හදල වැඩක් නැහැ. අද ක්‍රීඩා නිලධාරිතුමා නැහැ නේද? අපි ඒ අය එක්ක සාකච්ඡා කරල බලමු.

- ❖ මාදම්පා හග තොටුපොළ ප්‍රතිසංස්කරණයට අදාළ ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීම.

**එම්.ජී.දිලිප් ඉන්ද්‍ර මහතා,ජල ක්‍රීඩා සංගමය,අම්බලන්ගොඩ.**
ඊයේ To මහත්තයා ඇවිත් මැනගෙන ගියා.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
ඇස්තමේන්තුව මේ සභාවට ඉදිරිපත් කරන්න.

- නගර සභා පාපන්දු සංචිතයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම.
**ඩී.වී.තරංගි,ප්‍රජා සංවර්ධන නිලධාරි,නගර සභාව,අම්බලන්ගොඩ.**
මිල ගණන් කැඳවන්න දිල තියෙන්නේ.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අද ටෙන්ඩර් කමිටුවක් තියෙනවා නේ.

**ඩී.වී.තරංගි,ප්‍රජා සංවර්ධන නිලධාරි,නගර සභාව,අම්බලන්ගොඩ.**
අද කමිටුවට එන එකක් නැහැ.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
සභාවට ඉදිරිපත් කරන්න. ඔයාලගේ ප්‍රමාදය තමයි තියෙන්නේ.

<u>අදහස් හා යෝජනා</u>

**මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා,ක්‍රීඩා කමිටු සාමාජික,අම්බලන්ගොඩ.**
දැන් සභාපතිතුමනි, පිට්ටනියේ බට ටික වැහැව්වාම අපට තව මොනවද කරන්න තියෙන්නේ?

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
Cricket Board එකේ වැඩ තමයි ඊළඟට තියෙන්නේ.ඒ අය දන්වල තියෙන විදියට තණකොළ අල්ලලා විකට 03 හදන්න ඕනේ.මම දන්න විදියට දැන් ටෙන්ඩර් කරලත් තියෙන්නේ.ඒ අයගේ Job එක BOQ විදයට ඒ අය කරයි.

**ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා,ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**
සඳුන් මහත්තයා, අපි ළඟ පයිප්ප එළපු සැළැස්ම තියෙනවද Measurement එක්ක.

**ඩී.එච්.එස්.ඩී.ගුණවර්ධන මහතා,තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව.**
ඒ අය Drawing එකක් දෙනවා.

**ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා,ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**
Damage එකක් වුනොත් කොහොමද සොයා ගන්නේ.මීටර් එකක් තියෙනවද?

**ඩී.එච්.එස්.ඩී.ගුණවර්ධන මහතා,තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව.**
ඒ අය Pressure chq  කරල දෙනවා.Leak එකක් වුනොත් හදල දෙනවා. ඒ සම්බන්ධයෙන් වසර දෙකක වගකීමක් තියෙනවා.

**ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා,ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**
වතුර ගන්නෙ කොහොමද? Water Board එකෙන් විතරක් ද? නැත්නම් Well එකක් හදනවද?

**ඩී.එච්.එස්.ඩී.ගුණවර්ධන මහතා,තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව.**
අපි උඩ ළිඳෙන් වතුර ගන්න තමයි බලාපොරොත්තු වෙන්නේ.

**ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා,ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**
එකේ විතරක් වතුර මදියි නේ. මම නම් හිතන්නේ ළිඳට හොඳම තැන තමයි පහළ Score Board තියෙන තැන. නගර සභාවේ වාහන නවතා තැබිමේ ප්‍රශ්නත් තියෙන නිසා මේ ළිඳ වහන එක තමයි හොඳ. Pumper House එකයි ඔක්කොම එතැනට ගත්තාම ලේසියි.ආරක්ෂාවටත් හොඳයි.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අපි ඒ අයත් එකකත් කථාකරල මේ ගැන තීරණයක් ගනිමු.

**ජී.අශෝක කුමාර මහතා,ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.**
ලොකු කාණුවත් ශුද්ධකර ගන්න අවශ්‍යයි.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
සෞඛ්‍ය අංශයේ සේවක මහත්වරු යොදවල Slab කැලි ඉවත් කරල ශුද්ධ කරන්න.

**එම්.ජී.දිලිප් ඉන්ද්‍ර මහතා,ජල ක්‍රීඩා සංගමය,අම්බලන්ගොඩ.**
මාදම්පා ගඟ පිහිණුම් තටාකය ආශ්‍රිත ප්‍රදේශය සතියකට සැරයක් පිහිදල,මාසයකට සැරයක් තණ කොළ කපල දෙන්න පුළුවන්නම් හොඳයි.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
ඔබතුමා එම ස්ථානයේ ව්‍යාපාරයක් කරනවනේ ඔබතුමන්ලම ඒ වැඩටික කරගන්න.

**ජී.අශෝක කුමාර මහතා,ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.**
ඉස්සර සෙල්ලම් කරන්න ගියත් අපිම තමයි පිට්ටනිය ශුද්ධ කරගන්නේ.දැන් හැමදෙයක්ම නගර සභාවට කියනව කරල දෙන්න කියල.

**ධම්මික කොඩිකාර මහතා,ගරු නගර සභා මන්ත්රී, නගර සභාව,අම්බලන්ගොඩ.**
අපේ එළිහමහන් ව්‍යායම මධ්‍යස්ථානය හදන වැඩේ නතර වෙලා තියෙනවා ස්ථානයේ ප්‍රශ්නය නිසා.පුළුවන්නම් වෙන තැනක් දෙන්න කියල ඉල්ලා සිටිනවා.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
කළුවඩුමුල්ල ක්‍රීඩාංගණයේ හදන්න.

**ඒ.කේ.එස්.ඩී.ශ්‍යාමලී මිය,ගා/ග්‍රාමණී විද්‍යාලය,අම්බලන්ගොඩ.**
අපට ක්‍රීඩා උත්සවය තියන්න ඉඩ මදිවෙයි.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
ග්‍රාමණී විද්‍යාලයේ දරුවන්ට ක්‍රීඩා කරන්න අවස්ථාව ලබා දීම තමයි ප්‍රමුඛතාවය,ඒ කටයුතු වලට බාධාවක් නොවන පරිදි සෙල්ලම් උපකරණ තියෙන ස්ථානයේ හදන්න පුළුවන්ද කියල ගිහින් බලන්න.

**ස්තූති කථාව**

**ස්තූති කථාව- ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

අද දින ක්‍රීඩා කමිටුව සඳහා සහභාගී ගරු සභාපතිතුමාටත්, සියළුම නගර සභා මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාටත් පාසල් හා ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් පැමිණි මහත්ම මහත්මීන්ටත්,සියළුම නිලධාරි මහත්ම මහත්මීන්ටත් ක්‍රීඩා කමිටුවට සහභාගිවීම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වෙමින් අද දින සාකච්ඡා කරන ලද කරුණු පිළිබඳව නිරන්තර අවධානය යොමු කරන ලෙස හා අඩු පාඩු සකස් කර ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් කමිටුවේ වැඩ අවසන් කරන ලදි.

සකස් කළේ,

.........................................

ප්‍රජා සංවර්ධන නිලධාරි,

නගර සභාව- අම්බලන්ගොඩ.

| | |
|---|---|
| ......................................... | ......................................... |
| ලේකම්, | සභාපති, |
| නගර සභාව- අම්බලන්ගොඩ. | නගර සභාව-අම්බලන්ගොඩ. |

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2019.03.25 දින පැවැති ක්‍රිඩා කමිටු වාර්තාව මා යෝජනා කර සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

තීරණය-

2019.03.25. දින පැවැති ක්‍රිඩා කමිටු වාර්තාව පිළිගතයුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.05 2019.03.18 දින පැවැති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව සභා ගත කරන ලදී.**

**<u>පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව</u>**

**2019.04.25 ප.ව.2.30**

**<u>සහභාගීත්වය</u>**

| | | |
|---|---|---|
| **01.** | ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් | ගරු සභාපති ,අම්බලන්ගොඩ නගර සභාව. |
| **02.** | ඒ.ඩබ්.ජගත් කුමාර | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |

**03.** එච්.බී.පී.නදීල් හංසික — මහජන සෞඛ්‍ය පරීක්ෂක ,අම්බලන්ගොඩ උතුර.

**04.** ආර්.එම්.ඩබ් පන්ඩුල. — උප පොලිස් පරීක්ෂක, පොලිස් ස්ථානය,අම්බලන්ගොඩ.

**05.** එස්.සී.දයාරංසි — ප්‍රධාන කළමණාකරන සහකාර,අම්බන්ගොඩ නගර සභාව.

**06.** ඊ.අජන්තා සිරිමලී — කළමණාකරන සහකාර.අම්බලන්ගොඩ නගර සභාව.

**07.** පාටලී මදාරා — තාක්ෂණ සේවා නිලධාරී, අම්බලන්ගොඩ නගර සභාව

**08.** ඒ.අයි සාරංග — සෞඛ්‍ය පරිපාලක,අම්බලන්ගොඩ නගර සභාව.

**09.** එච්.එල්.සුමිත් යසරත්න — සෞඛ්‍ය වැඩ පරීක්ෂක,අම්බලන්ගොඩ නගර සභාව.

පිළිගැනීම

ගරු නගර සභා සභාපති,ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව සඳහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රීවරුන් ඇතුළු සියළු නිලධාරී මහත්ම මහත්මීන් හා නගර සභා ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලය ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදි

| මාතෘකාව | ප්‍රකාශය කවුරුන් විසින් ද යන වග. | සාකච්ඡා වූ කරුණු. | තීරණය. |
|---|---|---|---|
| **2019.03.18 දින පැවති රැස්වීමේ සාකච්ඡා වු කරුණු සමාලෝචනය.** | | | |
| ධම්මානන්ද මාවත කාණු කැඩී ඇති බව<br>. | ගරු නගර සභා සභාපති අරුණ ප්‍රදීප් මැතිතුමා | කාණුව කැඩී ඉතාමත් අවධානම් තත්වයක පවතින බැවින් මෙය නගර සභාව සතු මාර්ගයක් නොවන බැවින්ද මීට පෙර දන්වා ඇති බැවින්ද මේ සම්බන්ධව නඩු පවරන බව දන්වීම සුදුසු බව | නඩු පවරන ලෙස මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාට දැන්වීම |
| නගර සභාව වෙත ලබාගෙන ඇති අත්කරත්ත සඳහා මුදල් ගෙවීම සම්බන්ධව | ගරු නගර සභා සභාපති අරුණ ප්‍රදීප් මැතිතුමා | මෙම කරත්ත වල අඩුපාඩු ඇත්නම් සකස් කර තා.සේ.නි.වාර්තාවක් ඉදිරිපත් කර අදාල පුද්ගලයාට මුදල් ගෙවීම සුදුසු බව | කරත්තවල අඩුපාඩු සකසා තා.සේ.නි. වාර්තාවක් ඉදිරිපත් කර ගෙවීම් කටයුතු කරන ලෙස තා.සේ.නි.වෙත දැන්වීම. |
| කසළ අංගනයේ ගේට්ටුව සවිකළයුතු බව | වැඩ පරීක්ෂක සුමිත් මහතා | ගේට්ටුව සාදා නිමකොට ඇති බැවින් සතියක් ඇතුලත කණු යොදා ගේට්ටුව සවිකර දිය යුතු බව | සතියක් ඇතුලත සවි කිරීමට තා.සේ.නි.වෙත උපදෙස් ලබාදීම |

| අදහස් හා යෝජනා | | . | . |
|---|---|---|---|
| බස් නැවතුම්පලේ කසළ එකතුවන බව | ගරු නගර සභා සභාපති අරුණ ප්‍රදීප් මැතිතුමා | බස්නැවතුම්පලේ කසළ එකතුවී ඇති බව පොලීසිය මගින් දැනුම් දී ඇති බැවින් දැනට පවතින අවධානම් තත්වයත් සමග හැකි ඉක්මණින් කසළ ඉවත් කිරීමට කටයුතු කිරීම සහ අවදානම් තත්වය පිළිබඳව සේවකයින් දැනුවත් කළ යුතු බව | කසළ ඉවත්කිරීම පිළිබඳවත් සේවකයින් දැනුවත් කිරීම සම්බන්ධවත් සාරංග මහතා දැනුවත් කිරීම. |
| සෙළාන් බැංකුව අසළ කුණු දමන බව | පොලිස් පරීක්ෂක පණ්ඩුල මහතා | මේ සම්බන්ධව දැඩි සැලකිල්ලක් දැක්වුවද මෙම කුණු දමන පුද්ගයන් සොයා ගැනීමට නොහැකිවී ඇති බව පණ්ඩුල මහතා විසින් පවසා සිටීම | උදෑසනම ගොස් එම කසළ ඉවත් කරන ලෙස සභාපතිතුමා විසින් සාරංග මහතා වෙත උපදෙස් ලබාදීම. |
| කසළ අංගනය සඳහා සේවකයින් නොමැතිවීම නිසා කසළ තුනී කිරීමට නොහැකි බව | වැඩ පරීක්ෂක සුමිත් මහතා | කසළ නියමිත ස්ථානයට අනිවාර්යයයෙන්ම දැමිය යුතු බවත්,එසේ නොදමන්නේ නම් රියදුරන්ගේ වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කරන ලෙසත් සභාපතිතුමා විසින් දැන්වීම | රියදුරන් සඳහා මෙම කරුණ දැන්වීම සඳහා සාරංග මහතාට උපදෙස් දෙන ලදී. |
| සෞඛ්‍ය අංශයේ සේවකයින් සඳහා හැඳුනුම්පතක් නිකුත් කරන ලෙස | සෞඛ්‍ය පරීක්ෂක සාරංග මහතා | සෞඛ්‍ය අංශයේ සේවකයින් උදෑසන 3.00 ට සේවයට වාර්තා කරන බැවින් පවතින වාතාවරනය අනුව ඔවුන්ට තාවකාලික හැඳුනුම්පතක් සකස් කරදෙන ලෙස සභාපතිතුමා විසින් පැවසීම | අදාල අංශ වෙත දැනුම්දීම සඳහා |
| ටේලර් දෙකක් කැඩී ඇති බව | සෞඛ්‍ය පරීක්ෂක සාරංග මහතා | කසළ ඉවත් කිරීම සඳහා යොදවා ගන්නා ටැක්ටර් දෙකක් කැඩී ඇති බැවින් අළුත්වැඩියා කරදෙන ලෙස | ටැක්ටර් අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට ම.සෞප.වෙත දැන්වීම |
| නිමාව | | ප.ව 2.30 | |

සකස් කළේ,
කළමණාකරන සහකාර

නිර්දේශ කරමි,
ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

අනුමත කරමි.
සභාපති
අම්බලන්ගොඩ නගර සභාව.

.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
2019.03.18 දින පැවැති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව මා යෝජනා කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්ත මෙනවිය කතා කරමින්</u>**
එම යෝජනාව මා ස්ථිර කරනවා.

තීරණය**-**
2019.03.18 දින පැවැති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**
ගරු සභාපතිතුමනි, අපි ඉදිරිපත් කළ යෝජනා සභාවේ කියෙව්වේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
වන්දි ගෙවීම සඳහා මා ලේකම්තුමියට උපදෙස් ලබා දී තිබෙනවා. මීට කලින් අපි එහෙම ගෙවා තිබෙනවා. එය පළාත් සභාවට යවා පළාත් සභාවෙන් තමයි මුදල් ගෙන්වා ගනු ලබන්නේ.
**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**
අදහසක් විදියට හෝ යෝජනාවක් විදියට ඉදිරිපත් කරන්න බැහැ ද?
**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
නෑ අවශ්‍ය වන්නේ නැහැ. සේවය කරමින් සිටින වේලාවක තුවාල වෙලා පළාත් සභාවෙන් වන්දි ගෙවනු ලැබුවා. එම වන්දි ගෙවීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙයි.

## (07) ටෙන්ඩර් හා මිළ ගණන්

**07:01 ටෙන්ඩර් :-**

**07:02 මිළ ගණන් :-**

07.02.01 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ටයර් මිලදි ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිළ ගණන්

| ආයතනයේ නම | අයිතමය | එකක් තොගය |
|---|---|---|
| K.E Office Automation (PVT) Ltd | Dell Optiplee<br>Ups Dip 650 | රු.109500.00<br>රු. 3950.00 |

**තීරණය**
අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ටයර් මිලදි ගැනිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතුරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ක්‍රවුන් ටයර් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය මඟින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

07.02.02 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය බඟලෝ සෙප්ටික් ටැංකි සඳහා මිළ ගණන්

| අනු අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | අම්පේගම කොන්ක්‍රිට් වර්ක්ස් | දහරා හාර්වේයාර් අම්පේගම | චන්දන කන්ට්‍රක්ෂන් ඇන්ඩ් හාඩ්වේයාර් |
|---|---|---|---|---|---|
| 01 | කොන්ක්‍රිට් පෙර නිම වැසිකිලි බඳුන් ( Septic tank ) විශ්කම්භය අඩි 3 ½ දිග අඩි 08 | 02 | 25000/= | 27000/= | 28000/= |
| 02 | කොන්ක්‍රිට් පෙර නිම වැසිකිලි බඳුන් ( Septic tank ) විශ්කම්භය අඩි 3 දිග අඩි 08 | | 220000/= | 25000/= | 23600/= |
| 03 | ඉවතලන ජලය බහාලන බඳුන් පියන සහිතව | | 4500/= | 5000/= | 6000/= |
| 04 | ප්‍රවාහන වියදම් | | 3500/= | 5000/= | 5000/= |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට බඟලෝ සෙප්ටික් ටැංකි(පෙර නිර්මිත සෙප්ටික් ටැංකි) මිලදී ගැනිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතුරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති අම්පේගම කොන්ක්‍රිට් වර්ක්ස් ආයතනය මඟින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

07.02.03 පොත් බැඳිම සඳහා ( හාඩ් කවරය සහිතව ) මිලදී ගැනිම සඳහා මිළ ගණන්

| ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ආයතනයේ නම | එකක් තොගය |
|---|---|---|
| පොත් බැඳිම සඳහා (හාඩ් කවරය සහිතව) | හරිස්චන්ද්‍ර මහතා | රු.75/= |
| පොත් බැඳිම සඳහා ( හාඩ් කවරය සහිතව) | ජී.එම්.බන්දුසිරි මහතා | රු.200/= ( නවකතා පොත් හා කුඩා පොත් ) රු.500/= ( විෂයන් පොත් සඳහා හා වටිනා පොත් සඳහා සම්පූර්ණ රෙක්සින් ආවරණය සහිතව ) |

<u>**ගරු සභාපති එම්.ඩබ් .අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේ සඳහා නැවත මිළ ගණන් ඉදිරිපත් කිරිමට තීරණය කර ඇත. මොකද මේ සඳහා නැවත මිළ ගණන් කැඳවන්නේ. අපි ළඟ ඉතා විශාල ප්‍රමාණයක් පොත් තිබෙනවා. නැවත මිළ ගණන් කැදවන්න නෙමේ . මෙය ලබා දී කරගත යුතුයි. ප්‍රශ්නයක් නැහැ . මෙහි එක්කෙනෙක් තමයි මෙහි කලින් වැඩ කළ

බන්දුසිරි මහතා , අනෙක් කෙනා හරිස්චන්ද්‍ර මහතා. එත් පොත් බඳින කෙනෙකි. මීට අමතරව මා දකින්නේ නැහැ.සභාව මොකද කියන්නේ. ගැටළුවක් නැහැ නේද?

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ගැටළුවක් නැහැ. මෙය ලබා දෙන්න . පොත් බැඳිය යුතුයි.

<u>**ගරු සභාපති එම්.ඩබ් .අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

පළාත් සභාව මඟිනුත් අපට ලක්ෂ 10ක පොත් ලැබුණා. පොත් බැඳීම සම්බන්ධව ප්‍රතික්ෂේප කරන ලද මිළ ගණන් සභාව පිළිගැනීමට තීරණය කරනවා. මෙහි පොත් රාශියක් දැනට ලැබී තිබෙනවා. එම පොත් බැඳීම අපේ තනි පුද්ගලයෙකුට කරන්න බැහැ. පිළිගත් මිළ ගණන් වලට දෙන්නෙක් හෝ තුන්දෙනෙකු යොදවා මෙය ඉක්මනින් බැඳ ගත යුතුයි. එම නිසා මෙය මේ පුද්ගලයා ලවා කරගන්න.

**තීරණය**

පොත් බැඳීම සඳහා ( හාර්ඩ් කවරය සහිතව ) මිළ ගණන් ඉදිරිපත් කර ඇති පුද්ගලයන් අතුරින් ප්‍රමාණයක් සුදුසු පුද්ගලයන් මඟින් ලබා දී නොමැති නිසා නැවත මිළ ගණන් කැඳවීම සුදුසු බව නිර්දේශ කර තිබුණත් මෙය අත්‍යාවශ්‍ය කරුණක් නිසා මෙම මිළ ගණන් ඉදිරිපත් කර ඇති පුද්ගලයන් දෙදෙනා අතරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ හරිස්චන්ද්‍ර මහතා ඉදිරිපත් කරන ලද මිළ ගණන් පිළිගැනීම ගරු සභාව තීරණය කරන ලදී.

07.02.04 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය කොන්ක්‍රීට් බංකු මිලදී ගැනිම( මානාන ක්‍රීඩාංගණය ) සඳහා මිළ ගණන්

| ආයතනයේ නම | අයිතමය | එකක් තොගය |
|---|---|---|
| ජයන්ත කොන්ක්‍රීට් වර්ක්ස් | කොන්ක්‍රීට් බංකු ( මුළු උස අඩි 03 ක් පමණ දිග අඩි 05ක් පමණ අසුන් ගැනීමේ තට්ටුව බිම සිට උස අඟල් 20 පමණ කොන්ක්‍රීට් පුවරුවේ අවම ඝනකම අඟල් 03ක්) | රු.5500/= දිග අඩි 04 |
| කපිල කොන්ක්‍රීට් වර්ක්ස් | කොන්ක්‍රීට් බංකු ( මුළු උස අඩි 03 ක් පමණ දිග අඩි 05ක් පමණ අසුන් ගැනීමේ තට්ටුව බිම සිට උස අඟල් 20 පමණ කොන්ක්‍රීට් පුවරුවේ අවම ඝනකම අඟල් 03ක්) | රු.5000/= කකුල් 03 |
| K.G.S. කොන්ක්‍රිට් වර්ක්ස් | කොන්ක්‍රීට් බංකු ( මුළු උස අඩි 03 ක් පමණ දිග අඩි 05ක් පමණ අසුන් ගැනීමේ තට්ටුව බිම සිට උස අඟල් 20 පමණ කොන්ක්‍රීට් පුවරුවේ අවම ඝනකම අඟල් | රු.6000/= කකුල් 2 |

| | | |
|---|---|---|
| | 03ක්) | |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය කොන්ක්‍රීට් බංකු( කකුල් තුනේ) මිලදී ගැනිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතුරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති කපිල කොන්ක්‍රිට් වර්ක්ස් ආයතනය මඟින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

07.02.06 පොත් බැඳිමට ගන්නා චිප් බෝඩ් මිලදි ගැනිම සඳහා

| අංකය | ආයතනය | ප්‍රමාණය | එකක් තොගය |
|---|---|---|---|
| 01 | රෝයල් බුක් ෂොප් | 1000 | 42/= |
| 02 | චාමර බුක් ෂොප් | 1000 | 28/= |
| 03 | ලුමිනෙක්ස් බුක් ෂොප් | 1000 | 27/= |

**තීරණය**

පොත් බැඳිමට අවශ්‍ය චිප් බෝඩ් මිලදි ගැනිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතුරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ලුමිනෙක්ස් බුක්ෂොප් ආයතනය මඟින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

07.02.05 පාපන්දු ක්‍රීඩා සඳහා අවශ්‍ය ක්‍රිඩා උපකරණ සඳහා මිළ ගණන්

| අනු අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ස්පෝට්ස් කෝනර් | GD.M.ක්‍රිඩා භාණ්ඩ | කාවින්දි ක්‍රීඩාභාණ්ඩ | ගිත්මි ක්‍රිඩාභාණ්ඩ | |
|---|---|---|---|---|---|---|---|
| 01 | PANවර්ගයේ බුට් සපත්තු | 35 | 3400/= | 3850/= | 3710/= | 3600/= | |
| 02 | පා අවරණ ( සිංගාඩ් | 35 | 550/= | 875/= | 790/= | 700/= | |
| 03 | දැල් රකින්නාගේ අත් අධාරක | 03 | 5500/= | 6150/= | 5930/= | 5850/= | |
| 04 | ක්‍රිඩක ක්‍රීඩිකා ( කලිසම හා ටීෂර්ට් | 35 | 2100/= | 2650/= | 2460/= | 2300/= | |
| 05 | ක්‍රීඩක ඇඳුම් දැල් රකින්නා | 03 | 2400/= | 2750/= | 2680/= | 2600/= | |
| 06 | ස්ටෝකින්ස් | 35 | 330/= | 540/= | 480/= | 400/= | |
| 07 | පුහුණුව සඳහා යොදාගනු ලබන බීජ්ස් | 20 | 400/= | 575/= | 510/= | 450/= | |
| 08 | පුහුණුව සඳහා යොදා ගනු ලබන මාක්ස් (සෙට් 1) | සෙට්1 | 2750/= | 3500/= | 3320/= | 3200/= | |
| 09 | පුහුණුව සඳහා යොදාගනු | 20 | 160/= | 290/= | 210/= | 180/= | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ලබන 9 කෝන්ස් | | | | | | |
| 10 | පුහුණුව සඳහා යොදාගනු ලබන 12 කෝන්ස් | 20 | 260/= | 375/= | 325/= | 290/= | |
| 11 | ගොල් නෙට් ජෝඩු | 01 | 12000/= | 12650/= | 12700/= | 12600/= | |

**තීරණය**

පාපන්දු ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතුරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ස්පොර්ට්ස් කෝනර් ආයතනය මගින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.07** කොන්ක්‍රිට් සිලින්ඩර් මිලදී ගැනිම සඳහා ඉදිරිපත් කර ඇති මිළ ගණන්

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | අංජන බ්ලොක් ගල් වැඩපල | අම්පේගමකොන්ක්‍රිට් වර්ක්ස් ඇන්ඩ් කන්ට්‍රක්ෂන් | දහාරා හාඩ්වෙයාර් |
|---|---|---|---|---|
| 01 | කොන්ක්‍රිට් සිලින්ඩර් ඇතුලත විශ්කම්භය අහල් 4 2 , උස අඩි 2 | රු.3300/= | රු.2700/= | රු.2900/= |
| 02 | විශ්කම්භය අගල් 3.6 උස අඩි 3 | රු.3200/= | | |
| 03 | කොන්ක්‍රිට් පියන 3*3 විශ්කම්භය 36 කොන්ක්‍රිට් පියන | රු.1750/= | | |
| 04 | කොන්ක්‍රිට් පියන 3*3 ½ විශ්කම්භය 4 2 කොන්ක්‍රිට් පියන | රු.1950/= ප්‍රවාහනය නොමිලේ | රු.2000/= | රු.2100/= |

<u>ගරු සභාපති එම්.ඩබ් .අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

කොන්ක්‍රිට් සිලින්ඩර් මිලදී ගැනිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතුරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති අම්පෙගම කොන්ක්‍රිට් වර්ක්ස් ආයතනය විසිනි

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , ප්‍රවාහනය සඳහා රු5000/= ක මුදලක් අය අර ප්‍රවාහනය සඳහා ලබා ගන්නවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්.</u>**

ටෙන්ඩර් කිරිමේදි ඔබතුමලා ගෙනවිත් සපයා ගන්නවා කියා නෙමේද සටහන් කර ඇත්තේ. ප්‍රවාහනය සමඟ සපයනවා කියා නේද ටෙන්ඩරය දමා ඇත්තේ. එයා ටෙන්ඩරයට යටත්නේ. නැවත ඇයි ප්‍රවාහනයක් ගැන කතා කරන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ටෙන්ඩරයේ ප්‍රවාහනය සමඟ කියා දමා නැත.

**<u>ගරු සභාපති එම්.ඩබ් .අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙහි හිස්තැනක් තිබෙනවා. ඇණවුම සපයා ගත යුතු අතර අවශ්‍යා ද්‍රව්‍ය සැපයියි යුතුයි කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ් .අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි මේ පිළිගත් ටෙන්ඩරය පිලිගන්නවා.

**තීරණය**

කොන්ක්‍රිට් සිලින්ඩර් මිලදි ගැනිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතුරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති අම්පෙගම කොන්ක්‍රිට් වර්ක්ස් ආයතනය විසින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් අවම මිළ ගණන් වුවත් ප්‍රවාහනය නොමිලේ සපයන අංජන බ්ලොක්ගල් ආයතනය මඟින් ඉදිරිපත් කර ඇති අනු අංක 01 හා 04 මඟින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

**(08)** ගෙවීම්

08.01 අම්බලන්ගොඩ නගර සභාව සතු සියළුම වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා 2019 ජනවාරි මස ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් සීමාසහිත විවිධ සේවා සමුපකාර සමිතිය වෙත රු.323198/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සභා අනුමතියට යටත්ව ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.02 අම්බලන්ගොඩ නගර සභාව මඟින් පාලනය වන පුස්තකාල සඳහා පුවත්පත් සැපයීම වෙනුවෙන් එම් එස් වීරසිංහ මහතා වෙත රු.45500/=ක මුදලක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.03 අම්බලන්ගොඩ නගර සභාවේ නිලධාරීන් 37 දෙනෙකු සඳහා උත්සව අත්තිකාරම් වශයෙන් ( කර්මාන්ත) රු.370000/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සහා අනුමතියට යටත්ව ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.04 කාර්යාලීය ඡායා පිටපත් යන්ත්‍රය අලුත් වැඩියා කිරීම වෙනුවෙන් John Keells Office Auatomation (Pvt)Ltd වෙත රු.44277.07 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.05 ගබඩාව සඳහා විදුලි උපාංග ලබා දීම වෙනුවෙන් එෂියන් ඉලෙක්ට්‍රිකල් වෙත රු.102750/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.06 නගර සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මුද්‍රණය වෙනුවෙන් සක්වා ප්‍රින්ටස් ආයතනයට රු.98500/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.07 2019.02.01දින සිට 2019.02.28 දක්වා ආරක්ෂක සේවාව සැපයීම වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි LRDC Services (PVT)LTD ආයතනයට රු.267677.50ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සඳහා සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.08 නගර සභාවට අයත් ස්ථාන සඳහා ජල බිල්පත් වෙනුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සඳහා 2019 ජනවාරි මාසය සඳහා වෙනුවෙන් රු.25619.07 ක ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.09 2019 වර්ෂය සඳහා සෞඛ්‍ය අංශය සඳහා උත්සව අත්තිකාරම් සඳහා රු.220000/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සහා අනුමතියට යටත්ව , ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.10 අම්බලන්ගොඩ නගර සභාවේ නිලධාරින් 28 දෙනෙකු සඳහා උත්සව අත්තිකාරම් වශයෙන් ( කර්මාන්ත) රු.280000/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සහා අනුමතියට යටත්ව ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.11 අම්බලන්ගොඩ නගර සභාවේ නිලධාරින් 20 දෙනෙකු සඳහා උත්සව අත්තිකාරම් වශයෙන් ( ප්‍රජා) රු.200000/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සහා අනුමතියට යටත්ව ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.12 හල්වතුර කසල බැහැරලන ස්ථානයේ කසල තුනි කිරිම සඳහා D4 යන්ත්‍රය යෙදවීම වෙනුවෙන් රු.74761.50 ක මුදලක් විස්කම් කොන්ක්‍රිට් වර්ක්ස් (ප්‍රයිවඩ්) ලිමිටඩ් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.13 හල්වතුර කසල බැහැරලන ස්ථානයේ කසල තුනි කිරිම සඳහා D4 යන්ත්‍රය යෙදවීම වෙනුවෙන් රු.624277.50 ක මුදලක් විස්කම් කොන්ක්‍රිට් වර්ක්ස් (ප්‍රයිවඩ්) ලිමිටඩ් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
ගරු සභාපතිතුමනි, මේ 08:13 අපි බලයට පැමිණිමට පෙර ගෙවිමක් නේද ?

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>
ඕව් අපි බලයට පැමිණිමට පෙර ඉටුකරනු ලැබු කසළ තුනිකිරිම සම්බන්ධව ගෙවිමකි

08.14 අම්බලන්ගොඩ නගර සභාවේ ගබඩාව සඳහා අවශ්‍ය ලිපිද්‍රව්‍ය ගෙනඒම වෙනුවෙන් රු.49200/= ක මුදලක් සක්වා ප්‍රින්ටස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.15 අම්බලන්ගොඩ නගර සභාවේ ගබඩාව සඳහා අවශ්‍ය ලිපිද්‍රව්‍ය මුද්‍රණය කිරිම වෙනුවෙන් රු.25520/= ක මුදලක් සක්වා ප්‍රින්ටස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.16 අම්බලන්ගොඩ නගර සභාවේ ගබඩාව සඳහා සිමෙන්ති ලබා ගැනිම වෙනුවෙන් රු.28130/= ක මුදලක් පුර්ණා වෙළඳ සැල වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.17 අම්බලන්ගොඩ නගර සභාව සතු 49-9421 දරණ ට්‍රැක්ටර් රථය සඳහා ඇම්පියර් 90 සිල් ටයිප් බැටරියක් මිලදි ගැනිම වෙනුවෙන් රු.21950/= ක මුදලක් ජයසිංහ බැටරි සෙන්ටර් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි සහා අනුමතියට යටත්ව ගෙවීම වෙනුවෙන් සහා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.18 අම්බලන්ගොඩ නගර සභාව සතු ගලි බවුසරය අළුත්වැඩියාව සඳහා අවශ්‍ය අමතර කොටස් මිලදි ගැනිම වෙනුවෙන් රු.19800/= ක මුදලක් එස්.එම්. මොටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි සහා අනුමතියට යටත්ව ගෙවීම වෙනුවෙන් ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.19 අම්බලන්ගොඩ නගර සභාව සතු සියළුම වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා 2019 පෙබරවාරි 01 දින සිට පෙබරවාරි 15 දින දක්වා ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් සිමාසහිත විවිධ සේවා සමුපකාර සමිතිය වෙත රු.180675/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සහා අනුමතියට යටත්ව ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.20 THW සුනාමි නිවාස සඳහා පිඹුරුපත් සැදිම සඳහා පී.එච්.රබින් චන්ද්‍රසිරි මහතා වෙත රු.160000/= ක මුදලක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.21 අම්බලන්ගොඩ නගර සභාවේ ගබඩාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත රු.56015/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

08.22 අම්බලන්ගොඩ නගර සභාවේ නිලධාරීන් 18 දෙනෙකු සඳහා 2019 වර්ෂයේ උත්සව අත්තිකාරම් වශයෙන් රු.180000/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සභා අනුමතියට යටත්ව ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

08.23 අම්බලන්ගොඩ නගර සභාවේ සේවය කරන එම්.ඩබ්ලිව්. හිරාන් සංජීව මහතා සඳහා 2019 වර්ෂයේ උත්සව අත්තිකාරම් වශයෙන් රු.10000/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සභා අනුමතියට යටත්ව ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

08.24 පී.එච්.සී. ද සිල්වා මහතා වෙත මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය ගල් ලබා දීම වෙනුවෙන් රු.257180/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

08.25 ගබඩාවට අවශ්‍ය විදුලි උපාංග සැපයීම වෙනුවෙන් Asion Electricals වෙත රු.75900/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

08.26 අම්බලන්ගොඩ නගර සභාවේ නාගරික මන්ත්‍රීවරුන්ගේ ගමන් වියදම් වශයෙන් රු.120000/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සභා අනුමතියට යටත්ව ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

08.27 අම්බලන්ගොඩ නගර සභාවේ 2019 පෙබරවාරි මස අභ්‍යන්තර දුරකථන පද්ධතිය සඳහා රු.13770.07 ක මුදලක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

08.28 CHPB පුහුණු මධ්‍යස්ථානයේ පැවැත්වීමට නියමිතTraining Programme on Contract Administration පාඨමාලාව සඳහා තාක්ෂණ සේවා නිලධාරි සඳුන් මහතා සහභාගි කර වීම වෙනුවෙන් සභාපති, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙත රු.15000/= ක මුදලක් ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.29 වයිබ්‍රේෂන් රෝල භාවිතා නොකිරිම වෙනුවෙන් ඒ සඳහා ගෙවු මුදල වන රු.2660.17 ක මුදලක් ටී.සී.එස්.එස් මෙන්ඩිස් මහතා වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.30 රණසූරිය පාරේ පෙට්ටි බෝක්කුව ඉදිකිරිම වෙනුවෙන් පෝරඹ පනියන ග්‍රාම සංවර්ධන සමිතියට රැඳවුම් මුදල ලෙස තැන්පත් කරන ලද රු.100298.83 ක මුදලක් නිදහස් කිරීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.31 අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනයේ කොන්ක්‍රීට් කාණුව ඉදිකිරිම වෙනුවෙන් පොල්වත්ත ග්‍රාම සංවර්ධන සමිතියට රැඳවුම් මුදල ලෙස තැන්පත් කරන ලද රු.62183.40 ක මුදලක් නිදහස් කිරීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.32 තල්ගස්ගොඩ ඩිපෝ හන්දිය අසළ ඉඩම මිනුම් කටයුතු සිදු කිරිම වෙනුවෙන් රබින් චන්ද්‍රසිරි මහතා වෙත රු50000/= ක මුදලක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.33 චනත් ගුණරත්න මහතා විසින් ඉදිරිපත් කරනු ලැබු රත්නවල්ලි නර්තන ප්‍රසංගගය සඳහා විනෝද බදු ලෙස තැන්පත් කරන ලද වන රු.37500/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි නිදහස් කිරීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

## (09) ගිණුම්

**09.01** 2019 පෙබරවාරි මාසයට අදාළ පොදු ගිණුම් - වියදම් විශ්ලේෂණය හා 2019 පෙබරවාරි මාස වියදම් වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය .

## (10) ඇස්තමේන්තු

**10.01 ඕකන්ද සිරිල් මහතාගේ නිවස අසළින් ඇති මාර්ගය සංවර්ධනය කිරිම සඳහා තාක්ෂණසේවා නිලධාරි මහතා විසින් සකස් කරන ලද රු.250000/= ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>
ඇස්තමේන්තු ඉදිරිපත් කරනවා. ඕකන්ද සිරිල් මහතාගේ නිවස අසළින් ඇති මාර්ගය සංවර්ධනය කිරිම සඳහා රු.250000/= ක ඇස්තමේන්තුව ඉදිරිපත් කර සිටිනවා.

**තීරණය**

ඕකන්ද සිරිල් මහතාගේ නිවස අසළින් ඇති පාර සංවර්ධනය කිරිම කරන ලද රු.250000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතාගේ විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.02 නගර සභා මහජන ක්‍රීඩාංගණයේ ළිඳ ඉදිකිරිම සඳහා සඳහා තාක්ෂණසේවා නිලධාරි මහතා විසින් සකස් කරන ලද රු.1,300,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

<u>ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, කොහේද

<u>ගරු සභාපති එම්.ඩබ්. අරු්ණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>
ළිඳ

<u>ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>
කොතනද එය සාදන්නේ. මේ සඳහා ලක්ෂ 13 ක වියදමක් ඇයි යන්නේ. ළිඳ සිලින්ඩර් නෙමේ නේද ? සිලින්ඩර් වලට ඇස්තමේන්තුව ලක්ෂ 13 ක් නිසා තමයි මා මෙසේ විමසන්නේ. මොටර්වලට නැතිව මේ ළිඳට විතරක් ද මේ මුදල යන්නේ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරු්ණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

කොහොමත් විසිරි ජල පද්ධතිය සැකසිමේ වැඩ ටික නිම වන විට ලක්ෂ 60 පනිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>
ඇස්තමේන්තුව පරික්ෂා කරන එක නෙමේ වැඩේ තියෙන්නේ. දැන් මෙතුමාත් කලබල වෙනවා ඕන කෙනෙක් කලබල වෙනවා ළිදක් සැදිමට ලක්ෂ 13 ක් වියදම් විම පිළිබඳ . අපේ තරුණ කවුරුහරි සිටිනවා කසාද බදින්නේ නැහැ. ළිඳට ලක්ෂ 13 ක් යනවා නම් නිවසක් සැදිමට කොපමණ මුදලක් යයිද.?

<u>ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>
අපි මෙහෙම යෝජනාවක් ගෙන එන්න. ටියුබ් බේල් එක දමා ඕවැනි ටැංකියක් ගැනිමෙන් ඔච්චර මුදලක් යන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**
අනෙක් එක ටියුබ් බෙල් එක ගැසුවිට අපට හැමදාම වතුර තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ළිඳ ඉදිකරනවා වගේම පිට්ටනියේ තවම නැහැනේ වැඩ නිමකර.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**
මා තාක්ෂණ නිලධාරින් සමඟ වාද කරනවා නෙමේ. විශ්කම්භය කොපමණද සිලින්ඩරයේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අඩි 8කි

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

අඩි 8 ක් විෂ්කම්භය . පස්ටික අයින් කරන එකනේ තියෙන්නේ. අඩි 8 සිලින්ඩර් ටිකනේ දැම්මට තිබෙන්නේ. මෙය අඩි 100ක් හරන්නේ නැහැනේ. ළිඳ අඩි 10 කට වඩා හැරීමට පුළුවන් කියා මා හිතන්නේ නැහැ..

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නෑ මේ අයගේ ඇස්තමේන්තු මෙහෙම තමයි. වැඩය කරද්දි මීට වඩා අඩු වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**
මා අසන්නේ ප්‍රායෝගිකව මේ ගණන් වලට කළ හැකිද අඩි 2 තින් වතුර ළිදේ .මෙම ක්‍රීඩාංගනය තිබෙන්නේ ජල මට්ටමේ. එවිට අඩි 5ක් කපන විට ජලය. මෙපමණ මුදලක් වියදම් කර මේ ප්‍රමාණයට ළිඳක් හැරීමට උවමනා ද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එකවිට ලිටර් 64000 ක ප්‍රමාණයක් තිබිය යුතුයි. ඒ කියන්නේ එකවර පම්කර ඉවර වන විට ලිටර් 64000 න් වැය වෙනවා. එවිට ටැංකියේ තිබිය යුතුයි 64000 ක් අනිවාර්යෙන්ම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

එතකොට මෙහි ගැඹුර කියක්ද ? මා හිතන්නේ ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා ප්‍රකාශ කළ ආකාරයට සිලින්ඩර් බස්සන එක නෙමේ වැඩේ. සොලිට්ටෙක් වගේ ආයතනයක් ගෙන්වා ටියුබ්වෙල් එකක් ගසන්න. සමහර විට අඩි 64000 වඩා ජලය ලබා ගැනිමට පුළුවන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

එය ගසන විට අපට ඔවුන් පරික්ෂා කර දෙනවා කොපමණ ප්‍රමාණයක ගැඹුරකට ගැසිය යුතු ද කියා.එම ප්‍රමාණයට ගැසුවිට ගණට එනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ජලය ගබඩා කරගත යුතුයි. එය කරන්නේ කොහොමද ? කොහොම ගියත් මෙය ගැසිය යුතයි. දැන් මෙ ළිඳ ඉදිකළ විට ජලය ගබඩා වි තිබෙනවා එහි.

__ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්__

මට තිබෙන ප්‍රශ්නය මේ ළිඳට ලක්ෂ 13ක මුදලක් යනවාද කියන එකයි. මේ ළිඳ හරි.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

අපි මෙය මුදල් කොපමණ ගියත් ඉදිකළ යුතුයි.

__ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්__

ඒ මුදල නෙමේ මා අසන්නේ මේ ළිඳකට ලක්ෂ 13 ක මුදලක් වැය වන වාද කියා. මේ සඳහා ලක්ෂ 20ක් වැය වු වත් මෙය සැදිය යුතුයි.

__ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්__
ඒ අය දෙනු ලැබු ක්‍රමයට අනුව .තමයි මෙය ඉදිකරන්නේ. පස් කැපෙන ප්‍රමාණයට ( අඩි ගණනට) තමයි මෙය සාදා ඇත්තේ.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

මෙහි අඩි 5 න් පහට ගැඹුර වැඩිවෙන්න වැඩිවෙන්න තමයි මෙම ගණන් සකස් කර ඇත්තේ.අඩි 50ක් පමණ වෙනතුරු. අපිට අඩි 50ක් අවශ්‍ය වෙනකම් නැහැ. එවිට ගණන අඩු වෙනවා.

__ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්__

මෙයට හොඳම දෙයනම් අපිළඟ බැකෝ යන්ත්‍රය තියෙනවා. මේ කොන්ක්‍රිට් සිලින්ඩර් පිටින් ගෙනවිත් අපේ සේවකයන් යොදවා මෙම කාර්ය ඉටු කරන්න. අඩි 50, 40 ද කිසි ප්‍රශ්නයක් නැහැ. මේ සඳහා ලක්ෂ 20 ද 30 ට ගියත් කමක් නැහැ. ප්‍රමුඛතාවය ක්‍රීඩාංගණය. මෙය කොන්ත්‍රාත් නොදී අපේ සම්පත් යොදා ගෙන මෙම කාර්ය කරන ලෙස යෝජනා කර සිටිනවා.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__
මේ සඳහා මා නම් දකින්නේ පැරණි ළිං සාදා ඇති ක්‍රමයයි. උඩ සාදා බස්සන ලෙසයි. නමුත් මේ අය දමා ඇත්තේ සිලින්ඩර් වලින් බස්සන එකයි. සිලින්ඩර්වල මටනම් ගැටළුවක් තිබෙනවා. මොකද පැරණි ළිඳක් ගත්විට උඩ සිට පහළට එනකම්ම කපරාදු කර තිබෙනවා. උඩ සාදා කප කප බස්සන එකයි කරන්නේ. ඒ විදියට කරන්න ලක්ෂ 19 ක් පමණ වැයවන බවට තාක්ෂණසේවා නිලධාරින් ප්‍රකාශ කරනවා. එයට වියදම වැඩියි.

__ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්__
ගරු සභාපතිතුමනි, එම ක්‍රමය හොඳයි.

__ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්__
ප්ලාස්ටර් කඩන් වැටෙන්න ගන්නවා. එම නිසා සිලින්ඩර් බස්සන එක හොඳයි.

__ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්__
ඔබතුමා ප්‍රකාශ කරන ආකාරයට හොඳ ස්ථානයකින් සිලින්ඩර් ලබා ගෙන මෙය කිරිම හොඳයි.

**10.03 අම්බලන්ගොඩ මේධානන්ද මාවත ( අකුර අධ්‍යාපන ආයතනය ) මාර්ගය සකස් කිරිම සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් පිළියල කරන ලද රු550000/=ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහි ප්‍රශ්නයක් තිබෙනවා. මෙහි පැවරුම් ලිපි නැහැ. පවරා ගන්නේ නැතිව මෙය කළ නොහැකිය. මෙය කිරීමට නම් ගරු මන්ත්‍රීතුමා මුලින් නගර සභාවට මෙය පැවරිය යුතුයි. මා මෙය බැලුවා මෙහි පැවරීමේ එක ලිපියක් පමණයි තිබෙන්නේ. අනෙක් අයිතිකරුවන්ගෙනුත් පැවරීම් ලබා ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි. දැන් ඔය කියන ලද මාර්ගයට මුදල් ප්‍රතිපාදන ලැබී තිබෙනවා නේද

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ප්‍රතිපාදන ලැබී නැහැ. නමුත් අමාත්‍යාංශයෙන් දන්වා එවා තිබෙනවා ඇස්තමේන්තු සකස් කර එවන ලෙස. එසේ එවන්න කිවුවට නගර සභාවට අයත් නොවන නම් එය ප්‍රධාන ගැටළුවකි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

නැහැ. අපි කිපවතාවක් ඔය මාර්ගය සෑදීමට ගියා. නමුත් ප්‍රධාන විරුද්ධතාවය දක්වන පුද්ගලයා දැන් කැමැත්ත ලබා දී තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අනෙක් අයගේ කැමැත්ත ප්‍රකාශ කරන ලිපි නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

අනෙක් අය කලින් කැමැත්ත ප්‍රකාශ කළා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

කැමැත්ත ප්‍රකාශ කර ඒ අවස්ථාවල ඔහු විරුද්ධයි. ඔහු කැමැත්ත දී ඇති විට අනෙක් අය විරුද්ධයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

මා ගියවර සභා කාලයේදි මෙම මාර්ගය සැදිමට ගිය අවස්ථාවේ ඔහු විරුද්ධ වුණා. දැන් ඔහු කැමති විට අනෙක් අය අකමැතියිනේ. එම නිසා දැන් කාටවත් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

මෙම මාර්ගය මා මැයි වෙසක් පෝයට මාගේ පෞද්ගලික මුදල් වලින් මාර්ගය සදනවා. **<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. රජයේ මුදලුත් ඉතිරිකර සභාවේ මුදලුත් ඉතිරි කිරිම පිළිබඳ

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

මෙම මාර්ගය සැදිමට යන අවස්ථාවේ පලමුවෙනි කෙනා විරුද්ධ වුණා.දැන් කැමැත්ත ලබා දී තිබෙනවා . අනෙක් අය අකැමැති වුණාට මගේ පෞද්ගලික වියදමින් මා මෙම මාර්ගය සාදනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ඒ වුණාට ගරු මන්ත්‍රීතුමා ආණ්ඩුවෙන් එන මුදල් ටික ලබා ගන්න. ඔබතුමාගේ මුදල් වෙනත් මාර්ගයක් හදන්න. විලෝගොඩ වෙනත් මාර්ගයක් හදන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**

නෑ එම මුදල් විලේගොඩ වෙනත් මාර්ගයක එම මුදල් යවන්න . ජී.ජීගේ නිවස අසළ මාර්ගය මා තමයි සාදන්නේ.මාගේ ඡන්ද පොරොන්දුවකි ඔය මාර්ගය සාදන එක.

**එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

එතුමා මට කලිනුත් කිව්වා එතුමාගේ අතින් හරි මෙම මාර්ගය හදන බව. දැන් වසර 20 ක පමණ කාලයක සිට මා උත්සාහ ගනු ලැබුවා මෙම මාර්ගය සැදිමට . නමුත් කිසිම දිනක ඒ පුද්ගලයා කැමැත්ත ලබා දුන්නේ නැහැ.නැහැ මෙම මාර්ගය සාදා පවරා ඉතිරි පැවරුම් ටිකක් ලබා දෙන්න එවිට හරි.

තීරණය

මේධානන්ද මාවත අතුරු පාර ( අකුර පුදුගලික අධ්‍යාපන ආයතනය අසළ ) ඉදිකිරිම ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල ගරු නගර සභා මන්ත්‍රි ලසන්ත අජිත් කුමාර මහතාගේ පෞද්ගලික අරමුදලින් ඉටුකිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

## (11) වෙනත් කරුණු

11.01 නිදහස් ආයුර්වෙදයේ ආයතනයට අත්‍ය අවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය ලබා ගැනිම සම්බන්ධව වාර්තාව සභාගත කරන ලදී

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

නිදහස් ආයුර්වේදයට අත්‍ය අවශ්‍ය ද්‍රව්‍ය වගයක් ඉල්ලා ඇත. දැනට ඉල්ලා නැති බෙහෙත් වර්ග 21 ඉල්ලා ඇත. එම බෙහෙත් වර්ග 21 සඳහා රු.51521/= ක මුදලක් වැයවන බව දන්වා සිටිනවා. ඒ සඳහා සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා සභාවේ මුදල් වලින් මෙම බෙහෙත් වර්ග ටික ලබා දීමට.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

එය ලබා දෙන්න

**තීරණය**

2019 වර්ෂයේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා අවශ්‍ය වී ඇති (අත්‍යවශ්‍ය ඖෂධ කීහිපයක් ලබා ගැනීම සඳහා සභා අනුමතියට යටත්ව ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සම්මත විය.

**11.02 2019.03.30 දිනෙන් කල් පිරෙන ගිණුම් අංක 035600100014848-2 හා 035600100014851-6 දරණ ස්ථාවර තැන්පතු ගිණුම් දෙකේ ඇති රු2000000/= ක මුදල ලබා ගැනිමටත් ඒ සඳහා රු.1698290/= ක් වටිනා වවුචර්පත් සඳහා ගෙවීම කටයුතු සිදු කිරීම සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ ලිපිය කුමක්ද ? මේ සඳහා ගිය සභාවේ බලය ලබා දි තිබෙනවා. ගරු සභාපතිතුමාටත් ,ලේකම්තුමියටත් , ඔබතුමියටත් බලය ලබා දි තිබෙනවා. ඒ අනුව කටයුතු සිදු කරන්න. නැවත මෙය ඉදිරිපත් කිරිමට අවශ්‍ය නැහැ.

**තීරණය**

2019.03.30 දිනෙන් කල් පිරෙන ගිණුම් අංක 035600100014848-2 හා 035600100014851-6 දරණ ස්ථාවර තැන්පතු ගිණුම් දෙකේ ඇති රු2000000/= ක මුදල ලබා ගැනිමටත් ඒ සඳහා රු.1698290/= ක් වටිනා වවුචර්පත් සඳහා ගෙවීම කටයුතු සිදු කිරීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සම්මත විය.

**11.03 අම්බලන්ගොඩ ප්‍රාදේශිය මහ ලේකම් කාර්යාලය මඟින් දකුණු පළාත් සභා සංවර්ධන සැලැස්ම 2019 වර්ෂයේ දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන හිඟල්දුවේ එම්.ඩබ්.ජී.ඩබ්.ප්‍රේමකුමාර මහතාගේ නිවස අසල කාණුව සකස් කිරීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ ප්‍රාදේශිය මහ ලේකම් කාර්යාලය මඟින් දකුණු පළාත් සභා සංවර්ධන සැලැස්ම 2019 වර්ෂයේ පසුබට පළාත් සංවර්ධන වැඩ සටහන. පනියන්දුව ප්‍රදේශයේ උක්ත කරුණ යටතේ දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක විමට දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍යංශයෙන් පහත මාර්ග අනුමත කර එවා ඇත. හිඟල්දුවේ එම්.ඩබ්.ජී.ඩබ්.පේමකුමාර මහතාගේ නිවස අසල පැති කාණුව සකස් කිරීම සඳහා රු.500000/= උක්ත සංවර්ධන කටයුත්ත සඳහා නගර සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා. මේ සම්බන්ධව සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි . කොතනද මේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මෙය විලේගොඩ ඔය පාර පටුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ගරු ප්‍රධාන අමාත්‍යතුමා නම් කර එවා ඇත්තේ මෙම මාර්ග .

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

මාර්ග නම්කර තිබුණට කමක් නැහැ. මාර්ගය පටු වෙනවා. මෙම ස්ථානය බලා මැන අවශ්‍ය කටයුතු සිදු කරන්න දෙන්න. නැතිනම් ඒ අයට අවශ්‍ය ප්‍රමාණයට කපා දමයි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ප්‍රදේශිය ලේකම් කාර්යාලයේ තාක්ෂණසේවා නිලධාරි ඇස්තමේන්තු කර එවා තිබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි , මේ හිගල්දූව මාර්ගයේ තාර දමනු ලැබුවේ මා හට ලැබුණු ප්‍රතිපාදන මත තමයි.මෙම මාර්ගයේ බී.කේ.එස්. වෙළඳ සැල අයිති අයගේ නිවැසියන් පාර හරස් කර කණුඩියක් දමා තිබුණා. මා පැමිණ එහි භාගයක් කැප්පුවා මාර්ගය හදන විට.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒ අයගේ වැට තිබුණා. තාප්පය බැද්දේ පස්සට කර.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මේ ස්ථානය පරික්ෂා කර බලන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙය අනුමත කරනවාද ?

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

අනුමත කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

අපගේ තාක්ෂණසේවා නිලධාරිතුමාගේ වාර්තාවක් ලබා ගෙන ඔහුගේ උපදෙස් මත මෙය ඉටු කරන්න කියන්න.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මුදල් ලැබුණාම ඒවා යවන්න එපා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නැහැ . අපිට ලැබි නැහැ. ප්‍රා දේශිය ලේකම් කාර්යාලයට ලැබි තිබෙන්නේ. මේ සඳහා වාර්තාවක් කැඳවන්න

**තීරණය**

අම්බලන්ගොඩ ප්‍රාදේශිය මහ ලේකම් කාර්යාලය මගින් දකුණු පළාත් සභා සංවර්ධන සැලැස්ම 2019 වර්ෂයේ දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන හිගල්දූවේ එම්.ඩබ්.ජී.ඩබ්.ප්‍රේමකුමාර මහතාගේ නිවස අසල කාණුව සකස් කිරීම සඳහා තාක්ෂණසේවා නිලධාරි මහතාගේ වාර්තාවක් ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සම්මත විය.

**11.04 කේ. කේ . පාලිත සරත්, නො 107/4, මහ අම්බලන්ගෙඩ පාර ,කටන්තොට ධම්මකුසල විද්‍යාලය අසළ මාර්ගය සංවර්ධනය කරන ලෙස කරනු ලබන ඉල්ලීම සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

කේ. කේ . පාලිත සරත්, නො 107/4, මහ අම්බලන්ගෙඩ පාර ,කටන්තොට ධම්මකුසල විද්‍යාලය අසළ නිවෙස්වලට යන මාර්ගය සංවර්ධනය කරන ලෙස ඉල්ලීමක් කර ඇත. කේ.කේ පාලිත සරත්, එස්.ඒ පද්ම කුමාර , එස්.එම් . සිල්වා, එස් .ඒ. ක්ෂේමානන්ද යන අය ඉල්ලීමක් කර තිබෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

මේ කියන්නේ ධම්මකුසල විද්‍යාලය පිටුපසින් තිබෙන මාර්ගයද ?

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

මෙය ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා මාහට ප්‍රකාශ කර ගියා මේ පිළිබඳව. ගමේ ජනතාව විරුද්ධ නැතිනම් යෝජනාවක් විදියට හරි දමා මෙම මාර්ගය කිරිමට.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙහි පැවරුම් නියෝග ලබා ගන්න.

**තීරණය**

අම්බලන්ගොඩ ධම්ම කුසල පාසල ලඟ ඇති මාර්ගය සංවර්ධනය කර දෙන ලෙස කේ.කේ පාලිත සරත්, එස්.ඒ පද්ම කුමාර , එස්.එම් . සිල්වා, එස් .ඒ. ක්ෂේමානන්ද සඳහන් නිවෙස් වල නිවැසියන් විසින් කරන ලද ඉල්ලීමට අනුව එම මාර්ගය සංවර්ධනය කිරිම සඳහා එම නම් සඳහන් නිවැසියන්ගෙන් පැවරුම් නියෝග ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සම්මත විය.

**11.05 ගාල්ල දිස්ත්‍රික්කයේ මැතිවරණ ලේකම් කාර්යාලය මඟින් තරුණ නියෝජනය වැඩි කිරීම පිළිබඳව එවන ලද ලිපිය සභා ගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ගාල්ල දිස්ත්‍රික්කයේ මැතිවරණ ලේකම් කාර්යාලය මඟින් තරුණ නියෝජනය වැඩි කිරීම පිළිබඳව යෝජනා ඉදිරිපත් කිරිම 2018 වර්ෂයේ සිදු කරනු ලැබූ අංක 17 යටතේ සංශෝධන යටතේ මහජන නියෝජිතයන්ගේ ප්‍රතිශතය 30% කින් වැඩි කළ යුතු බවට නෛතික ප්‍රතිපාදන සකස් කොට තිබුණි. එසේ වුවද 2019 වසරේ පළාත් පාලන පනතට සංශෝධන ප්‍රතිශතය ඉවත් කර ඇති අතර ඒ අනුව 25% කාන්තා නියෝජනය පෙන්වා දී ඇත. ඉහත කී තරුණ නියෝජනය වැඩි කිරිමේ වැදගත්කම පිළිබඳව පළාත් පාලන ආයතන වලින් අදහස් හා යෝජනා ඉදිරිපත් කර ඇති අතර මේ කරුණ පිළිබඳ පළාත් පාලන නියෝජිතයන්ගේ අවධානය යොමු කර අදහස් ලබා ගැනිමට අදහස් කර ඇත.එබැවින් ඔබ ආයතනයේ පළාත් පාලන නියෝජිතයන් මේ කරුණ කෙරෙහි දැනුවත් කර යෝජනා හා තීරණ වෙතොත් නියෝජ්‍ය මැතිවරණ ලේකම්තුමාට දන්වන ලෙස කරුණිකව ඉල්ලීමක් කර ඇත.

**තීරණය**

ගාල්ල දිස්ත්‍රික්කයේ මැතිවරණ ලේකම් කාර්යාලය මඟින් තරුණ නියෝජනය වැඩි කිරීම පිළිබඳව එවන ලද ලිපිය  පිළිබඳ මහජන නියෝජිතයන්ගේ අදහස් හා යෝජනා වෙතොත් ඒ පිළිබඳව ඔවුන් දැනුවත් කර යෝජනා හා තීරණ ලබා දිම සම්බන්ධ ලිපිය ගරු සභාවේ දැන ගැනිම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 11.06 ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදූ කුමාරි මහත්මිය විසින් පින්නදූව ඇළ පිළිසකර කිරිම හා පින්නදූව හංදියේ පාර මාරුවිම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදි

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදූ කුමාරි මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති ලිපියයි. මේ සම්බන්ධව ඇළ පිළිසකර කිරිම සම්බන්ධව මේ වන විටත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට දන්වා යවන ලෙසත්ය. දෙවැනි ගැටළුව නම්  පොල්වත්ත පින්නදූවට ප්‍රවේශ වන ස්ථානය අසළ කෙරමිණිය දිශාවේ පවතින වංගුව නිසා පාර මාරුවීමේ අවධනම් තත්වයක් පවති. බසයෙන් බැස මාර්ගය මාරුවිමට යන මගින්ට අවධානම් තත්වයක් පවතින අතර ඒ සඳහා විසඳුමක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔය වාරිමාර්ගයට දන්වා සිටියත් ඔය ඇළ පිළිසකර වෙන්නේ නැහැ. වෙනදා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සම්බන්ධිකරණ රැස්විමට සහභාගි වුවා. දැන් ඔබතුමාලා විතරයි සහභාගි වෙන්නේ.එම රැස්විම තිබෙන දිනයට වාරිමාර්ග ඉංජිනේරුතුමා හෝ තුමිය එතැනට එනවා. මෙතුමිය මේ ඉදිරිපත් කරන මේ ඇළ ගම් කිහිපයකටම සම්බන්ධයිනේ.මහ අම්බලන්ගොඩ කෙළවර දක්වාම හිර වෙනවා. මේ ප්‍රශ්නය පිළිබඳ ඉංජිනේරුතුමාට ඉදිරිපත් කර විසඳුමක් ලබා ගන්නා ලෙස ඉල්ලිමක් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදි ප්‍රකාශ කර සිටිනවා මෙම ඇළ සකස් කිරිමට මේ වන විට ඇස්තමේන්තුවක් සකස් කර අවසානයි. මේ සම්බන්ධව ගරු පළාත් නායකතුමා දැනුවත් කළා. නමුත් ඊට වඩා බලපිටිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ඊට වඩා ඉක්මන් වුණා. මෙම ඇළ සම්බන්ධව. මේ පින්නදූව ඇළෙන් භාගයකට විසඳුම් ලැබුණා. බලපිටිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් සකස් කරන ලද ඇස්තමේන්තුව නිසා.තව අර්ධ කොටසක් තමයි නිම කිරිමට තිබෙන්නේ.ගරු පළාත් ප්‍රධාන අමාත්‍යතුමාට යම් අදහස් මේ පිළිබඳව ලබා දුන්නා. නමුත් අපිට නොදනිම පළාත් සභාවේ ආයු කාලයත් නිම වි අවසානයි. තව දින 10 ක් තිබෙනවා. මේ මුදල් ගෙන්වා ගැනිමට හැකියාවක් තිබෙනවාද මෙම මුදල් ගෙන්වා ගැනිමට.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එය එතුමාගෙන්ම අසන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

මෙය ඉතා ඉක්මනින්ම නිම විමට නියමිතයි . පළාත් සභාවට නැවත අද වුණත් කමක් නැහැ දැනුම් දි මෙම කාර්ය ඉටු කර ගැනිමට ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා උදවු කරයි මෙම ඇළ නවිකරණය කර ගැනිම සඳහා.

**ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මට මතක විදියට නම් ඔය ඇළ පවිත්‍ර කටයුතු වල යෙදුනේ මීට වසර 7,8 කට ඉහත දී. දින වකවානු නම් මට මතක නැහැ. ගමේ සෑම නිවසක තිබෙන ද්‍රව්‍ය ඇළ තුල තැන්පත් වීම නිසා ඇළ ගොඩ වී ඇත.ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහත්මයාණෙනි මේ පිළිබඳව මා දැනුවත් වී සිටියේ නැහැ. නමුත් මේය මගේ හිතට එන ලද අදහසකි. කවුරුත් මේ පිළිබඳව කිවුවේ නැහැ. ඒ අදහස තමයි ඉදිරිපත් කරනු ලැබුවේ. එම නිසා කුණුරොඩු රැදී තිබෙනවා. මෙය ගලායන ඇළක් නෙමේ. මේය පිළිසකර කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.අනෙක් යෝජනාව කාලයත් තිස්සේ පෙනි ගිය කාරණයක්. දිනපතාම බස්රථයෙන් බැස මාත් පැමිණෙනවා. එහිදි පාර මාරුවීම සඳහා විනාඩි දෙක තුනක් අපිත් එහි සිටිනවා. විශේෂයෙන්ම වංගුව තමයි. පුංචි දරුවන් , වයසක උදවිය මෙය බලන්නේ නැහැ. එම ස්ථානය ගොඩක් අවදානම් තැනකි. මේ වන විට එහෙම දෙයක් සිදු වී නැහැ. වෙනත් එපා කියා ප්‍රාර්ථනා කරනවා. අනතුරුදායක ස්ථානයක් ලෙස තමයි මා මේ යෝජනාව ඉදිරිපත් කරනු ලැබුවේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**
එතැන නවත්වන්නේ නැහැ. එහි මාර්ගය ටිකක් පටුවට තමයි ගිහින් තිබෙන්නේ. මා සිතන්නේ කණ්නාඩියක් සවිකිරිමට පුළුවන් නම් හරි.

**ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්**
මොකක් හරි විසඳුමක් තමයි අවශ්‍ය වන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**
අපි එතැන කණ්නාඩියක් සවිකිරිමට කටයුතු කරන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**
අනික් කරුණ තමයි එහි සුදු ඉරක් හරි යෙදුවා නම් හරි.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**
ගරු සභාපතිතුමනි, කුඩා දරුවන් මේ කණ්නාඩිය දෙස බලයිද?

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**
දැනට මේ නගරයේ කණ්නාඩි 5ක් සවිකර තිබෙනවා. දැනට ඒවා පිස දමාවත් තබන්නේ නැහැ. ඇත්තටම එය දැන් දූවිලිවලින් වැහිලා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**
ගරු සභාපතිතුමනි , ඔතනට බම්පර් දෙකක් දැමිය නොහැකිද ?

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**
එය මාර්ග සංවර්ධන අධිකාරියට යැවිය යුතුයි.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**
මා සිතනවා වඩාත් ප්‍රායෝගිකයි කියා බම්පර් දෙකක් දමන එක.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

බම්පර් දමන එක ප්‍රායෝගික නැහැ. වාහනයේ වේගය අඩු වුණාට ඊළඟට පැමිණෙන වාහනය හැපෙන්න පුළුවනි. බයිසිකල් වගේ ඒවා වැටෙනවා.මෙහි බස් නැවතුම්පොළ එහාට කළාම හරි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මොකක්ද තීරණය

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කණ්නාඩියක් සවිකිරිම

**තීරණය**

ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදු කුමාරි මහත්මිය විසින් පින්නදූව ඇළ පිළිසකර කිරිම සම්බන්ධයෙන් මේ වන විටත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට දන්වා යැවිමට කටයුතු කර ඇති අතර , පොල්වත්ත පින්නදූවට ප්‍රවේශ වන ස්ථානය අසළ කෙරමිණිය දිශාවේ පවතින වංගුව නිසා පාර මාරුවීමේ අවධනම් තත්වය මඟ හරවා ගැනිම සඳහා තල දර්පණයක් සවි කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදු කුමාරි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සම්මත විය.

## 11.07 අම්බලන්ගොඩ දිස්ත්‍රික් රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකකය විවෘත කිරිම් සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අප රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකකය විවෘත කිරිම 2019.04.04 වන දිනට යෙදි ඇත. ඒසඳහා එදිනට ටෙන්ට් 6ක්, කොඩි කණු 40 ක් හා පුටු 200 ක් නොමිලේ ලබා දෙන ලෙස  දිස්ත්‍රික් වෛද්‍යවරයා විසින් ඉල්ලිමක් කර ඇත. එය සභා අනුමතියට යටත්ව ලබා දි ඇත. එ සඳහා අනුමතිය ඉල්ලා සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ දිස්ත්‍රික් රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකකය වීවෘත කිරිම 2019.04.04 වන දිනට ටෙන්ට් 6 ක් , කොඩි කණු 40 ක් හා පුටු 200 නොමිලේ  සභා අනුමතියට යටත්ව ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සම්මත විය.

## 11.08 අම්බලන්ගොඩ දිස්ත්‍රික් රෝහල මඟින් 2019.03.31 දකුණු පළාත් රාජ්‍ය සේවා සය සමාජීක ක්‍රිකට් තරඟාවලිය පැවැත්විම සඳහා මානාන ක්‍රීඩාංගනය සභා අනුමතියට යටත්ව නොමිලේ ලබා දිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ දිස්ත්‍රික් රෝහල මඟින් 2019.03.31 දකුණු පළාත් රාජ්‍ය සේවා සය සමාජීක ක්‍රිකට් තරඟාවලිය පැවැත්විමට කටයුතු සංවිධානය කර ඇති බව  දිස්ත්‍රික් වෛද්‍යවරයා විසින් දන්වා ඇත. එදින ක්‍රිකට් කණ්ඩායම් විශාල සංඛ්‍යාවක් සහභාගි වන අතර  එම අවශ්‍යතාවයට සඳහා මානාන ක්‍රීඩාංගනය නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලිමක් කර ඇත. සභා අනුමතියට යටත්ව එය ලබා දි ඇත. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ දිස්ත්‍රික් රෝහල මඟින් 2019.03.31 දින දකුණු පළාත් රාජ්‍ය සේවා සය සමාජික ක්‍රිකට් තරඟාවලිය පැවැත්වීම සඳහා මානාන ක්‍රීඩාංගනය සභා අනුමතියට යටත්ව නොමිලේ ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සම්මත විය.

## 11.09 ගා/පී ද එස් කුලරත්න විද්‍යාලයේ අවුරුදු චාරිත්‍ර හඳුන්වා දීමේ වැඩසටහන 2019.04.30 වන දින හා 2019.04.29 වන පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණය සභා අනුමතියට යටත්ව නොමිලේ ලබා ගැනිමසම්බන්ධ ලිපිය සභා ගත කරන ලදී .

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ගා/පී ද එස් කුලරත්න විද්‍යාලයේ අවුරුදු චාරිත්‍ර හඳුන්වා දීමේ වැඩසටහන 2019.04.30 වන දින හා 2019.04.29 වන දින සඳහා පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණයේ පැවැත්වෙන බැවින් එම ක්‍රීඩාංගණය නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. එය ලබා දිමට සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

**තීරණය**

ගා/ පී ද එස් කුලරත්න විද්‍යාලයේ අවුරුදු චාරිත්‍ර හඳුන්වා දිමේ වැඩසටහන 2019.04.30 වන දින හා 2019.04.29 දින පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණය සභා අනුමතියට යටත්ව නොමිලේ ලබා ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සම්මත විය.

## 11.10 ප්‍රධාන පුස්තකාලයට විදුරු අල්මාරියක් ලබා ගැනිම සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදි.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ප්‍රධාන පුස්තකාලයට විදුරු අල්මාරියක් ඉල්ලා ඇත. 2019.03.31 දින පැවති පුස්තකාල කමිටු රැස්වීමේදි ගනු ලැබූ තීන්දුවක් අනුව පුස්තකාලය සඳහා ලැබුණු සහතික පත්‍ර හා කුසලාන ප්‍රදර්ශනය කිරිමට විදුරු අල්මාරියක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර සිටිනවා. එය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ ප්‍රධාන පුස්තකාලය සඳහා 2019.03.21 දින පැවති පුස්තකාල කමිටු රැස්වීමේදි තීරණය වූ පරිදි පුස්තකාලය සඳහා ලැබුණු සහතිකපත් සහ කුලසතා ප්‍රදර්ශනය කර තැබීමට වීදුරු අල්මාරියක් ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සම්මත විය.

## 11.11 ආදේශක සේවක සේවකා සඳහා උත්සව අත්තිකාරම් මුදල රු.10000/= දක්වා වැඩි කිරිම සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදී.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

කාර්යාලයේ දෛනික වැටුප් ලබන සෞඛ්‍ය අංශයේ හා කර්මාන්ත අංශයේ සේවකයින් සඳහා උත්සව අත්තිකාරම් ලෙස රු.8000/= පමණයි කලින් ගෙවා ඇත්තේ. එම මුදල රු.10000/= දක්වා වැඩි කිරිමට සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

<u>**ගරු උප සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, අනියම්, ආදේශක සේවයන් සඳහා ස්ථිර සේවකයින් 2කු අත්සන් කර එම මුදල ඔවුන්ටත් ලබා දෙන්න. පෞද්ගලික ආයතනයක වැඩ කළත් මෙම මුදල ලබා දෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

උත්සව අත්තිකාරම් මුදල් ඔවුන්ගේ වැටුපෙන් ඉක්මනින් අයකරගන්නා විදියට ලබා දෙන්න. එම උත්සව අත්තිකාරම් මුදල ලබා ගැනිම සඳහා සභාවේ ස්ථිර සේවකයින් 2කු අත්සන් කළ යුතුයි.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ කාර්යාලයේ ,සෞඛ්‍ය අංශයේ , කර්මාන්ත අංශයේ දෛනික වැටුප් ලබන සේවක මහත්ම මහත්මීන් සඳහා උත්සව අත්තිකාරම් මුදල රු.10000/= දක්වා වැඩි කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සම්මත විය.

**11.12 ජාත්‍යාන්තර කම්කරු දිනය බෞද්ධ ක්‍රමයට පැවරීමේ මහෝත්සවය අම්බලන්ගොඩ දි පැවැත්විම සම්බන්ධව මහාචාර්ය විලේගොඩ ආරියදේව ස්වාමින් වහන්සේ විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභා ගත කරන ලදි.**

**<u>ගරු උප සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මහාචාර්ය විලේගොඩ ආරියදේව ස්වාමින් වහන්සේ විසින් එවන ලද ජාත්‍යාන්තර කම්කරු දිනය බෞද්ධ ක්‍රමයට පැවරීමේ මහෝත්සවය අම්බලන්ගොඩ දි වශයෙන් ලිපියක් එවා ඇත. 98% බෞද්ධයන් වෙසෙන ප්‍රථම වතාවට උපහාර දක්වන මැයි දිනයක් 2019.05.01 දින අම්බලන්ගොඩදි පැවැත්විමට විහාරස්ථ දායක සභාව සංවිධාන කටයුතු සිදු කරමින් පවති. ඒ සඳහා ඔබ සභාවේ පූර්ණ සහායෝගය අපේක්ෂා කරනවා. ඒ සඳහා පූර්ව ප්‍රචාරය සඳහා අඩි10*6 ප්‍රදර්ශන ඵලක සඳහා සභා අනුමතිය ලබා දීමටත්, 2019.05.01 දින නගර සභාවේ සුළු සේවක සේවිකාවන් සියළු දෙනා සහ ට්‍රැක්ටරයක් ලබා දෙන ලෙසත් එම සංදර්ශන රථය සැරසීමට අවශ්‍ය බැවින් අප්‍රේල් මස 30 වන දින සවස සිට මැයි මස රාත්‍රි 7.00 දක්වා රථය නිදහස් කර දීමටත්, නගරය සැරසීමට අවසරය හා සහායෝගය ලබා දෙන ලෙසත් ගරු ස්වාමින් වහන්සේ විසින් ඉල්ලිමක් කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි ,සමාජ අදහස් සමාජගතකරවන මහා තෙරපණක් විදියට මහාචාර්ය විලේගොඩ ආරියදේව ස්වාමපාදයෝ මේ අපේ නගර සභාවේ සුළු සේවකයන් වෙනුවෙන් සුවිශාල මෙහෙවරක් ඉටු කළා. අපට මතකයි අපේ සෞඛ්‍ය අංශයේ සේවකයන්ගේ ඒ ප්‍රබෝධය සඳහා අපේ දුගඳ ඔබට ඔබේ සුවඳ අපට කියන තේමා ව යටතේයි. ඇත්තටම කිසිවෙකුට සිතා ගැනිමට වත් බැරි තරමට ඒ තේමාව හැඳින්විම සිදු කරනු ලැබුවේ උන් වහන්සේයි.උන් වහන්සේ මේ නවමු වැඩ සටහන යටතේ පැතිරුණු සුවිශාල මෙහෙවරක් කිරිම සඳහා මේ සැරසෙන්නේ.කිසිවෙකු නොපැකිලිව උන් වහන්සේට සහාය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , ජාත්‍යාන්තර කම්කරු දිනය බිහිවෙන්නේ කොහොමද කියා ගරු ආරියදේව ස්වාමින් වහන්සේ පලමුවෙන්ම දැන ගත යුතුයි. ලෝක කම්කරු දිනය ආරම්භ වන්නේ චිකාගෝ නුවර සේවකයෝ පැය 8ක වැඩ මුරයක් ඉල්ලා කරන ලද සටනේ ප්‍රතිඵලයක් ලෙසයි.කවුරු වුණත් මට කෙලින් කතා කරන්න වෙනවා. එවිට මේ ස්වාමින් වහන්සේ දන්නේ නැත්නම් එය දැන ගත යුතුයි. බෞද්ධ උත්සව වෙනම තිබෙනවා. කම්කරු උත්සව වෙනම තිබෙනවා. ඔය දෙක පටලවන්න බැහැ. විකාරයකි. මේ හදන්නේ එන්ජී. එක හරහා පැමිණි කුමන්ත්‍රණයක් බව මා භය නැතිව ප්‍රකාශ කරනවා. මා අසා ඇති ආකාරයට බෞද්ධ කටයුතු සඳහා මේ සිවුර දමා ගන්නේ මෙම සසරින් එතෙර විම සඳහායි.නමුත් දැන් මොකක්ද මේ වෙන්නේ. මට පක්ෂයෙන් දෝෂාරෝපණය පැමිණිය හැකියි.

නමුත් මා භය නැතුව කතා කරනවා.දැන් නොකරන්නේ එකමයි. සසරින් එතෙර වීම සඳහා කටයුතු නොකිරීමයි. මා පක්ෂයෙන් නෙරපීමටත් පුළුවනි හෙට. කමක් නැහැ. මේවා විකාර වැඩ. මා එකට හිටියා පක්ෂයත් සමඟ . නමුත් කියන්න ඕන දෙය කිව්ය යුතුයි භිය නොවී. මා මේ අදහසට විරුද්ධයි. ඔබතුමාලා මෙයට කොඩි කණු දෙනවාද , පුටු දෙනවාද මට අවශ්‍ය නැහැ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙහි සටින කිසිදු ගරු මන්ත්‍රීවරයෙක්ට වත් ඔය උත්සවයට යන්න බැහැ. ඒ අයට තම පක්ෂයේ මැයි දින රැලියට යා යුතුයි. මේ ඉල්ලා සිටින උදව්ව කරනවාද නැද්ද කියන එක විතරයි කල්පනා කළ යුත්තේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

වැරදි පූර්වාදේශයක් දෙනු ලබන්නේ . මා මේ අදහසට විරුද්ධයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනායාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතා සඳහන් කළා එන්.ජී.ඕ . ප්‍රශ්නයක් පිළිබඳව. මොකද අම්බලන්ගොඩ සිටින පුරවැසියන් ලෙස ගරු ආරියදේව ස්වාමීන් වහන්සේ පිළිබඳව ඒ ගැන දන්නේ නැහැ. මා එතුමාගෙන් දැන ගැනීමට කැමතියි ගරු ස්වාමීන් වහන්සේ එන්.ජී.ඕ . සාමාජිකයෙක් ද කියන වග

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

ක්‍රියා පටිපාටිය දෙස බැලූ විට ඕනෑම පුද්ගලයෙකු කෙරෙහි සැක කටයුතු පහල වෙනවා.මාගේ ක්‍රියාකාරිත්වය අනුව තමයි මිනිසුන් මා හඳුනා ගන්නේ. මගේ වැඩ පිළිවල අනුව. මා හොරෙක්ද , වංචාකාරයෙක්ද , ප්‍රගතශීලි පුද්ගලයෙක්ද කියන එක . ඒ ඒ පුද්ගලයා කරන කියන දෙය අනුව තමයි මොන මොන කණ්ඩයට අයිති වෙනවාද කියන එක තේරුම් ගත හැක්කේ. සිදුවීම මා මෙතනදි උලුප්පා පෙන්වනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

මටත් මේ පිළිබඳ අදහස් දැක්වීමට අවශ්‍යයි. මා කළුවඩුමුල්ල විහාරස්ථානයේ ප්‍රධාන දායකයෙක් ලෙස කටයුතු කරනවා. මා සම්පූර්ණයෙන්ම විරුද්ධයි හිතවත් ගරු නගර සභා මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතාගේ එන්.ජී.ඕ. කතාවට. අපේ ස්වාමීන් වහන්සේ එම තත්වයේ නැහැ. උන් වහනසේ විහාරස්ථානය දියුණු කිරීමට ගන්නා ලද උත්සාහය කාටවත් නැහැයි කියන්න බැහැ. උන් වහන්සේ තම වෙතනය පවා විහාරස්ථානයට පූජා කරන්නේ.ශිතකරණයක්වත් විහාරස්ථානයේ තබා ගන්නේ නැහැ. ආදර්ශමත් විදියට වැඩ කරනවා. මා එය ප්‍රතික්ෂේප කරනවා. ගරු ස්වාමීන් වහන්සේට නිදහස තිබෙනවා උන් වහන්සේට අවශ්‍ය පරිදි මැයි දිනය සැමරීමට. එය කටවත් නවත්වන්න බැහැ. දැන් මට අවශ්‍ය නම් අපේ නිවසේ කිහිපදෙනෙකු රැස්කරගෙන මැයි දිනය සැමරීමට හැකියි. එය වැරදියි කියා නිගමනය කිරීමට පුළුවනි. එහෙත් එය නැවැත්වීමට බැහැ කාටවත්. ගරු ස්වාමීන් වහන්සේ විවේචනය කරන්න එපා කියා මා ඉල්ලා සිටිනවා. මා දන්නවා ගමට කොතරම් දෙයක් කර තිබෙනවාද ? විහාරස්ථානයට කොතරම් දෙයක් කර තිබෙනවාද ? ඇත්තටම කළුවඩුමුල්ල විහාරස්ථානයේ අම්බැක්කේට වැඩිය කැටයම් තියෙනවා. තනිකරම ඒ ස්වාමීන් වහනසේගේ ධෛර්යෙන් තමයි ඒ දෙය සිදු කර ඇත්තේ. උන් වහන්සේ විදේශ රටකට වැඩියත් මුදල් ටිකක් සොයා ගෙනවිත් එය විහාරස්ථානයට තමයි යොදවන්නේ. මා දැක නැහැ උන්වහන්සේගේ නරක වැඩ මුකුත් . මා සම්පූර්ණයෙන්ම සහායෝගය දක්වනවා උන් වහන්සේගේ මෙම ක්‍රියා වලියට.

## ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි.ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී ධම්මික මහතා ප්‍රකාශ කළ දෙයට වඩා යම් දෙයක් මා ප්‍රකාශ කරනවා. උන්වහන්සේ කම්කරුවන්ව ඉතා හොඳින් අගය කරන ස්වාමීන් වහන්සේ නමකි. ඔබතුමා දන්නවා , මාත් දන්නවා. මේ නගර සභාවේ ගරු මන්ත්‍රීවරු සියළුදෙනාම දන්නවා. අවුරුද්දට වුණත් කෑම වෙලක් ලබා දී ඇඳුම් පැළඳුම් ලබා දි නගර සභාවේ කම්කරුවන්ට හොඳින් සලකන ස්වාමීන් වහනසේ නමකි. කම්කරුවන් ගැන සිති ද දන්නේ නැහැ මේ කම්කරු දිනය ගැන තිරණය ගනු ලැබුවේ. බෞද්ධාගමිකාරියක් වශයෙන් ගරු ස්වාමීන් වහන්සේට දැඩිලෙස විවෙචනයට ලක් කිරිම ගැන විරුද්ධ වෙනවා. පුද්ගලයෙකුට නෙමේ අපි සලකන්නේ . ආගමට සලකන්නේ චීවරයට සලකන්නේ. බෞද්ධ දර්ශනයට සලකන්නේ.මේ සම්බන්ධව මාගේ කනගාටුව ප්‍රකාශ කරන ගමන් මේ වැඩසටහන සාර්ථක කර ගැනිමට මාගේ සහාය ලබා දෙනවා.

## ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

මෙහිදි කරනු ලබන වැඩ පිළිවල සඳහන් කරන්නම්. විහාර නිර්මාණයට දායක වු ශ්‍රමිකයන් හා සුළු සේවකයන්ගේ සැදුම්ලත් එකම වර්ණයෙන් යුත් ඇඳුමකින් සැරසුණු රථයක් නගරයේ විථි සංචාරය කරනු ලබයි. පෙරහහැරේ ගෙන යනු ලබන රථයේ, සේසත්, පුවරු . දද ,පථකයන්හි ආදියෙහි බෞද්ධ දර්ශනය පෙළගැස්වෙන සමානාත්මතාවය , සාධාරණය , මිනිස් ශ්‍රමය හා මිනිස් ශ්‍රමයේ අගය සම්මා අජිවය පිළිබඳ උද්ධෘත පාඨ ප්‍රදර්ශනය කෙරේ.මහ ගල් මත අවුකන ආදි ප්‍රතිමා නෙලන ගල් වඩුවන් මඟින් මහා සෑ ඉදිකරන, මහා වැව් ඉදිකරන මිනිසුන් දක්වන සංදර්ශන රථ පෙරහැරේ ගමන් කරයි.වැඩකරන මිනිසා ආගාධයට ඇඳ දමන සුරා සුදුවේ අදිනවත් ඒ වපුරුවන අධෛර්මය පිළිබඳවත් ඉවුකරන විචිත්‍රංග පෙරහැරට එක් කරයි. සවස 6.30 ට විහාරස්ථානයට ලඟා වන අතර වැඩකරන ජනතාවට ප්‍රණීත ආහාර වේලක් සපයනු ලැබේ. මේ අතර වැඩකරන ජනතාවට උපහාර දක්වන ශ්‍රමඅභිමාණී සංගිත රාත්‍රියක්ද පැවැත්වේ.

## ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, ඔබතුමා ඔය ලිපිය පළමුවෙන්ම කියෙව්වානම් සභාවේ විවිධ අදහස් ඇතිවෙයි කියා මා සිතනවා. ගරු ස්වාමින් වහන්සේ නව මුහුණු වරකින් විහාරස්ථාන නිර්මාණයට දායක වු සුළු සේවක සේවිකාවන් යොදවාගෙන බෞද්ධ ධර්මයට අනුව නව වැඩසටහනක් ලෙස තමයි මැයි දිනය සැමරිමට යන්නේ.මේ කිසිදු දේශපාලන භේදයකින් තොරව. එය එක් පැත්තක් . මොකද ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික මහතා පැවසු ආකාරයට මෙම විහාරස්ථානයට ඇතුල්වනවිටම උන් වහන්සේ විසින් මෙම විහාරස්ථානය ගොඩනැගිම සඳහා විශාල දායකත්වයක් දරා ඇති බව දැක ගත හැකිය. මා දුටුවා මුහුණු පොතෙහි මේ ළඟකදි බෞද්ධයන් සිටින එකම නගරය අම්බලන්ගොඩ . අම්බලන්ගොඩ ඉපදුන ජනතාව හැටියට මේ ගැන සතුටු විය යුතුයි.උන්වහනසේ අම්බැක්කෙට වඩා බුදු පිළිම වහන්සේලා විවිධ ඉරියව් වලින් කර තිබෙනවා. මා මේ සති දෙකකට ඉහතකදි අප නිකායේ නායක ස්වාමින් වහන්සේ සමඟ මේ පෝය සිමාව සැදිම පිළිබඳ යම්කිසි ඉල්ලිමක් කළා. මා එහි ඇල්බමයක් පෙන්නුවා විෂය භාර ගරු අමාත්‍යවරයාට. බුදු පිළිම වහනසේ නමක් ඉල්ලා සිටියා වියට්නාමයට පුජා කිරිම සඳහා. වියට්නාමෙන් අපට උදවු ලබා දෙන්නම් කියා පොරෝන්දු වුණා. උන් වහන්සේ අපේ මතක ඇති කාලයට අම්බලන්ගොඩ නගරයට විශාල සේවයක් සිදු කර ඇත. එම නිසා උන්වහන්සේ අම්බලන්ගොඩ දැඩි අපකිර්තිය ගෙනෙන , දැඩි අපහසුතාවයට පත්වෙන දෙයක් සිදු නොකරන බවටත් මා තරයේ විශ්වාස කරනවා. අපිට කළ හැකි යම් දෙයක් තිබේනම් උපරිමයෙන් ඉටු කර දෙන්න. ඔබතුමා ප්‍රකාශ කල ආකාරයට අපේ පක්ෂවල කවුරුත් මෙහි නැහැ. ඒ ඒ පක්ෂවල මැයි දින රැලි වෙන වෙන තැන්වල පවත්වනවා. බෞද්ධයකු ලෙස උන් වහන්සේට ලබා දිය යුතු සියළු පහසුකම් ලබා දෙන ලෙස ඉල්ලිමක් කර සිටිනවා.

__ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි , ඔබතුමා ඔය ලිපිය කියෙව්වා නම් ඔය තත්වය ඇතිනොවන බව අපේත් හැඟිම. ඒ ගරු නගර සභා මන්ත්‍රි සරත් චන්ද්‍ර මහතාගේ පෞද්ගලික අදහසකි මෙය. නමුත් ගරු ආරියදේව ස්වාමින් වහන්සේ අලුත් දෙයක් කරන නව දැක්මක් ඇති ස්වාමින් වහන්සේ නමකි. නගරයට අනුශසනා දෙනු ලබන ජනප්‍රිය ස්වාමින්වහනිසේ නමකි. එක් එක් පුද්ගලයන්ගේ පෞද්ගලික මතයන් තිබෙනවා. අම්බලන්ගොඩ 100% ක්ම බෞද්ධයන් වෙසෙන නගරයක් ලෙස අලුත් ආකාරයකින් කම්කරු දිනය සැමරිමට තමයි කටයුතු යොදා ඇත්තේ. යම් යම් ගැටළු සහගත තත්වයන් තිබුණත් නායක ස්වාමින් වහන්සේ විසින් කරනු ලැබූ ඉල්ලීම් ලබා දෙන්න. අපි මෙයිට වඩා දේවල් ලබා දී තිබෙනවා. අපි කවුරුත් මෙහේ සිටින්නේ නැහැ. මැයි දින පේළපාළියට යනවා. විහාරස්ථානයට ගියවිට ඒ දියුණුව පෙනෙන්ට තිබෙනවා. අම්බලන්ගොඩ නගරයේ හොඳම විහාරස්ථානයක් ලෙස පවත්වා ගෙන යනවා. මහාචාර්ය ස්වාමින් වහනසේ නමක් ලෙස සමාජයට කරනු ලබන කර්යයන් බොහෝ වේ. කුමන ගැටළුකාරි තත්වයන් තිබුණත් එය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

__ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, අපගේ බෞද්ධ දර්ශනය තුල ගරු මහාචාර්ය අරියදේව ස්වාමින් වහන්සේ අලුත් ක්‍රමයකට මැයි දින රැළිය පැවැත්විම පිළිබඳව නගර සභාවේ සහායෝගය ඉල්ලා සිටිනවා. ඔබතුමා කිවූ ආකාරයට ගරු මන්ත්‍රිවරු එක් එක් පක්ෂවලට අයත් අය. අපි ඒ ඒ මැයි දින රැළි සඳහා සහභාගි වෙනවා. එවිට අපේ සහභාගිත්වයක් කොහොත්ම සිදු වන්නේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රිතුමා විරුද්ධ වෙන්න ඇත්තේ ඔවුන්ට ඉතා දිගු ඉතිහාසායක් තිබෙනවා මේ මැයි දින රැළි සඳහා. ඔබතුමා එම ලිපිය කියවන විට යම් බෞද්ධ දර්ශනයට අනුව මේ මැයි රැළිය සිදු කරන බව යම් අදහසක් ලැබුණේ. මෙය දේශපාලන පෙරහැරක් නොවේ. උන් වහන්සේ නිතරම අලුත් යමක් කරනු ලැබූ ස්වාමින් වහන්සේ නමකි. අම්බලන්ගොඩ නගරයේ ස්වාමින් වහන්සේ කෙනෙකු අම්බලන්ගොඩ නගර සභාවෙන් යම් උදවුවක් , යම් දෙයක් ඉල්ලා සිටියහොත් ඉතිහාසයේ සිටම එය ලබා දිම සිදු කර ඇත. අපි විශ්වාස කරනවා උන් වහන්සේගේ කර්යය ඉටු කර ගැනිමට නගර සභාවෙන් ලබා දිය හැකි දෙයක් උපරිම අයුරින් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

මෙය ඉෂ්ඨ කරන්න.

**තීරණය**

ජාත්‍යාන්තර කම්කරු දිනය බෞද්ධ ක්‍රමයට පැවරීමේ මහෝත්සවයට අම්බලන්ගොඩ දි පැවැත්වීම සම්බන්ධයෙන් මහාචාර්යා විලේගොඩ ආරියදේව ස්වාමින් වහන්සේ විසින් කරනු ලැබූ ඉල්ලීම් පහත සඳහන් පරිදි ලබා දීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

01. පූර්ව ප්‍රචාරය සඳහා අඩි10*6 ප්‍රදර්ශන ඵලක සඳහා සහා අනුමතිය ලබා දීමටත්,

02. 2019.05.01 දින නගර සභාවේ සුළු සේවක සේවිකාවන් සියළු දෙනා සහ වැක්ටරයක් ලබා දෙන ලෙසත් එම සංදර්ශන රථය සැරසීමට අවශ්‍ය බැවින් අප්‍රේල් මස 30 වන දින සවස සිට මැයි මස රාත්‍රී 7.00 දක්වා රථය නිදහස් කර දීමටත්,

03. නගරය සැරසීමට අවසරය හා සහායෝගය ලබා දීමටත් ,

**11.13 ශ්‍රීපති මහා විද්‍යාලයට කොඩි කණු 20ක් ලබා ගැනීම සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදී**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

විදුහල්පති , ශ්‍රීපති විද්‍යාලය , වතුගෙදර. කොඩි කණු 20ක් ලබා ගැනීම . ශ්‍රීපති විද්‍යාලයේ දුවා ප්‍රාථමික අංශයේ දරුවන්ගේ සිහිති අවුරුදු උළෙල 2019.04.04 වන දින වතුගෙදර ශ්‍රීපති විද්‍යාලයේ පැවැත්වීමට කටයුතු සුදානම් කර ඇත. කොඩි කණු 20 ක් ලබා ගැනීමට අවශ්‍යය. එය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි , මා එයට විරුද්ධයි. බලපිටිය ප්‍රාදේශිය සභාව තිබෙනවා. එහි කොඩි කණු තිබෙනවා.මා ඉල්ලා සිටිනවා ප්‍රතිපත්තියක් විදියට අම්බලන්ගොඩ ආසනයේ පමණක් කොඩි කණු හා මේ දෙවල් ලබා දෙන ලෙස. මේ ශ්‍රීපතියට දෙන්න ගියාම තෙල්වත් , තොටගමුව ආදි ප්‍රදේශවලින් ඉල්ලු විට ඒවාට දිය යුතු වෙනවා.ඉන්පසු මෙය මහ විකාරයකි. බලපිටිය ප්‍රාදේශිය සභාවේ මේ කොඩි කණු තිබෙනවා. එය බලපිටියෙන් ඉල්ලන්නේ නැතිව ඇයි අපෙන් ඉල්ලන්නේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ළඟ නිසා වෙන්නැති.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**</u>

මා නම් එයට තදින් විරුද්ධයි.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ශ්‍රීපති විද්‍යාලය කියනනේ ඉතා දුප්පත් පාසලකි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**</u>

මා නම් මෙයට විරුද්ධයි. බලපිටිය ප්‍රාදේශිය සභාවෙත් තිබෙනවාහෙන් ලබා ගැනීමට පුළුවනි. එහෙන් ලබා ගත්තත් එකම දුරයි. මෙතනින් ආවත් එක දුරයි. එම ප්‍රාදේශිය සභාවේ නැති දෙයක් අපි දුන්නාට කමක් නැහැ. එහෙනම් සියළු දේටම ලබා දෙන්න. ඒ අයට ලිපියකින් දන්වා සිටින්න ප්‍රාදේශිය සභාවෙන් ඉල්ලා ගන්නා ලෙස. ඔය දිනයට කොඩි කණු 20 අවශ්‍ය වුණොත් අපි කොහොමද ලබා දෙන්නේ. මේය කොස්ගොඩ හැගල්ල විද්‍යාලයට ඉල්ලා සිටියහොත් ලබා දෙන්න ඕන. සීමා නිර්නයක් තබා ගන්න. මා නම් මෙය දුටු ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතාට කිව්වා මා මෙයට විරුද්ධ වෙනවා. අපේ ගමේ මළගෙයක් සිදු වුණොත් අපිට දින තුනක් යනවා මේ කොඩි කණුටික ගෙන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

නැහැ 2019.04.04 දිනට ඉල්ලා සිටින්නේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

එහෙනම් තින්දුවක් ගන්න සියළුම දේට පිටට බැහැ .අම්බලන්ගොඩ නගර සීමාවට පමණක් කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

අම්බලන්ගොඩ ආසනය තුල

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මානම් කියන්නේ ගරු මන්ත්‍රිතුමිය අපි එච්චර දුරට හිතනවාට වැඩිය මේ පාසල ඇවිත් ඉතාම දුප්පත් පාසලකි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

මා ප්‍රකාශ කරන්නේ එම පාසල සමඟ තරහක් නැහැ. ප්‍රතිපත්තියක් ලෙස කරන්න. අපි ප්‍රාදේශිය සභාවට දුන්නාට කමක් නැහැ. අපි ප්‍රාදේශිය සභාවෙන් ලබා ගන්නා නිසා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අම්බලන්ගොඩ ආසනයේ පමණක් දිමට සීමා නිර්නයක් තබන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

මේ සඳහා මොකක් හරි ප්‍රශ්නයක් තිබෙන්න ඕන. බලපිටිය ආසනයේ තිබෙන පාසලකි. අම්බලන්ගොඩ ආසනයේ පාසලක් නෙමේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ විද්‍යාලයට අපි උදවු කර තිබෙනවා. එකත් කිව යුතුයි. මෙමවිද්‍යාලයේ ක්‍රිකට් පුහුණු කිරිම සඳහා අප සභාවේ ක්‍රිකට් පුහුණුකරු තමයි ලබා දී ඇත්තේ. ඉවත් කර විසි කරනු ලැබූ මැට්න් එක පවා ලබා දි තිබෙනවා. අද ක්‍රිකට් ක්‍රිඩකයෝ පිරිසක් බිහි වි සිටිනවා. අද ඔවුන් ක්‍රිකට් තරඟයක් පවත්වනවා. එ සම්බන්ධව තමයි මේ ඉල්ලිම කරනු ලබන්න ඇත්තේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

මගේ කිසිම විරුද්ධත්වයක් නැහැ. මා කියන කරුණ ප්‍රායෝගිකව සිතා බලන්න. ඔය 2019.04.04 දිනට අම්බලන්ගොඩ කෙනෙකුගේ දෙයක් සිදු වුවහොත් ඔය කොඩි කණු 20 ගෙන හැකිද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එහෙම ප්‍රශ්නයක් තිබෙනවා. අපි ළඟ කොඩි කණු 120ගණක් තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

එම නිසා බලපිටිය ප්‍රා දේශිය සභාවේ තිබෙනවානේ. දැන් අම්බලන්ගොඩ ආසනයේත් නෙමේ. ඔබතුමා කැමතිනම් ලබා දෙන්න . මට නම් ප්‍රශ්නයක් නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නැහැ .මා මෙය සභාවට යොමු කරනු ලැබුවේ ඒ නිසායි. මා කැමති නම් මෙය ලබා දී ඉවරයි. සභාවට යොමු කර ඇත්තේ ඔබලා කියන්නේ කුමක්ද බලන්නයි. හරි එහෙනම් අපි එම ඉල්ලිම ප්‍රතික්ෂේප කරනවා.ඒ අයට බලපිටිය ප්‍රාදේශිය සභාවෙන් ලබා ගන්න කියන්න. මෙය ලබා දුන්නා කියා එච්චර ගැටළුවක් කර ගන්න එපා. මෙය පොඩි දෙයක් . උදාහරණයක් ලෙස කන්දේගොඩ විද්‍යාලයට , ශ්‍රිපති

විද්‍යාලයට අපගේ විසි කරනු ලැබූ මැටින් ලබා දී තිබෙනවා. එම විද්‍යාල ක්‍රිකට් ආරම්භ කළේ අපේ දේවල් වලින්. අපේ ක්‍රිකට් පුහුණු පාසලේ තමයි මේ දරුවන් පුහුණු වෙන්නේ. අපගේ සහායක ක්‍රිකට් පුහුණු කරු සහන් මහතා නොමිලේ ගොස් ක්‍රිකට් පුහුණුව එම ශ්‍රීපති විද්‍යාලයට ලබා දෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

මගේ කිසිම විරුද්ධත්වයක් නැහැ. ප්‍රතිපත්තිමය තින්දුවක් ගන්න. එහෙනම් මේ පාරට පමණක් ලබා දෙන්න.දැන් ඔවුන් අපගෙන් මෙය බලාපොරොත්තු වෙනවා. එම නිසා ලබා දෙන්න. මින් පසු ප්‍රතිපත්තියක් ලබා ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

මින්පසු ප්‍රතිපත්ති තින්දුවක් ගන්න.අම්බලන්ගොඩ ආසනය තුල පමණක් ලබා දිය යුතුයි.එයින් පිට ලබා දෙනවා නම් සභාවට යොමු කර අනුමතිය ලබා ගත යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමනි, අපි එවැනි දෙයක් කිසි දිනක සිදු කර නැහැ. සභාවේ අනුමතිය ලබා ගෙන තමයි ලබා දී තිබෙන්නේ.නැතිනම් සභාවේ අනුමතියට යටත්ව ලබා දී තිබෙනවා. ඒ කියන්නේ ඔබතුමාලා එයට කැමතිවෙයි කියන ආකල්පයේ සිට.

**තීරණය**

වතුගෙදර , ශ්‍රීපති මහා විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ දූවා දරුවන්ගේ සිඟිති අවුරුදු උළෙල 2019.04.04 දික පාසල් ක්‍රීඩාංගනයේදී පැවැත්වෙන අතර ඒ සඳහා කොඩි කණු 20 ක් නොමිලේ ලබා දීමටත් , අම්බලන්ගොඩ ආසනය සඳහා පමණක් ලබා දිය යුතු බවට ගරු සභාවේ සකච්ජා කළ අතර එම කොඩි කණු ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 11.14 අම්බලන්ගොඩ නගර සභා නිලධාරින්ගේ ක්‍රීඩා හා සුබ සාධක සංගමය මඟින් පැවැත්වූ වෙළෙඳ සැණකෙළියේ අයවැය සම්බන්ධ ලිපිය සභාගත කරන ලදි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභා නිලධාරින්ගේ ක්‍රීඩා හා සුබ සාධක සංගමයට අධාර පිණිස පවත්වනු ලැබූ වෙළඳ සැණකෙළිය 2019.03.15 සිට 21දින දක්වා පැවැත්වූ අතර අප සංගමය බලාපොරොත්තු වූවාට වඩා සාර්ථක වීම ගැන අතිශයින්ම සතුටට පත්වෙනවා. ඔබතුමාගේ හා ගරු උප සභාපතිතුමාගේත් විපක්ෂ නායකතුමා ඇතුළු සියළුම නාගරික මන්ත්‍රීවරුන්ගේ සහාය ලැබීම පිළිබඳවත් පොල්තෙල් පහන දැල්වීම පිළිබඳවත් කෘතවේදිව ස්තුතිය පුද කර සිටිනවා. සැණකෙළියේ අයවැය වාර්තාව ඉදිරිපත් කරනවා.ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සහභාගිත්වය අනුව අපි ස්තුතිය පුද කරනවා. ඉදිරි කටයුතු සඳහා ගරු මන්ත්‍රී මණ්ඩලයේ සහාය ලැබෙන බවට අපේක්ෂා කරනවා. ඒ අනුව අයවැය වාර්තාව ඉදිරිපත් කරනවා. ඒ අනුව ආදායම 2019.03.15 දින ටිකට් පත් විකිණීමෙන් 25%ලැබූ ආදායම රු.87000/=ක්, 2019.03.16 ටිකට් පත් විකිණීමෙන් 25% ලැබූ ආදායම රු.20350/=, 2019.03.17 ටිකට් පත් විකිණීමෙන් 25%ලැබූ ආදායම රු.54950/=ක්2019.03.18 සැණකෙළිය නොපැවැත්විණි.2019.03.19 ටිකට් පත් විකිණීමෙන් 25%ලැබූ ආදායම රු.175900/=කි . ඒ අනුව සැණකෙළිය පැවැත්වීමෙන් ලද මුළු ආදායම රු.338200/=කි, 2019.03.15 පොල්තෙල් පහන දැල්වීමෙන් ලද ආදායම රු.12000/= 2019.03.16 වන දින රු.30000/=, 2019.03.17 දින 30000/= කි . 2019.03.18 දින සැණකෙළිය නොපැවැත්විණි. 2019.03.19 රු.28000/= කි. අමුත්තන්ගෙන්

රු.100000/= ලැබී ඇත. ඒ අනු ලද ආදායම රු426000/=කි. වියදම් වශයෙන් ඉටිපන්දම් 01, පොල්තෙල් ලිටර් 01, පහන්තිර කපුරු, කෘතිම මල් , ලියුම් කවර , පොල්තෙල් , රබර් සිල් එක පැඩ් එක තින්ත පිරවීම සඳහා, සේවකයන් සඳහා රාත්‍රි කටවුට් ගැසිම සඳහා රු.1000/= බැගින් 06,මුළු වියදම රු.7781.50කි.ඒ අනුව සංගමයට ඉතිරි වී තිබෙනවා රු.430418.50 ක මුදලකි. මෙය සභාවේ දැන ගැනිම පිණිස ඉදිරිපත් කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , මේ උක්ත සැණකෙළිය බොහොම අපූරුවට පැවැත්වූවා. මේ සැළකෙළියේ මුවාවෙන් මේ අපේ අදාළ නිලධාරින්ගේන් කෙනෙක් ඇතුල් වීමේ ප්‍රවේශ පත්‍ර තමන්ගේ ඥාති පුද්ගලයෙකුට සංග්‍රහයක් කිරිමට යොදා ගෙන තිබෙනවා. ඒ ලේකම්වරයා ගරු මන්ත්‍රීවරයෙකුට ලබා දි එම ගම්මානයේ මෙවා බෙදා දුන් බව ගමුන් අපට පැවසුවා. අපිට ගැලවිච්ජාවට වගේ පහ පහ වගේ ලබා දුන්නා. එක් අයෙකු පමණක් නංවිමට එම වැඩපිළිවළ බොහොම වැරදියි. නමුත් මේ සංගමය රු.430418/=ක මුදලක් උපයාගෙන තිබෙනවා. ඒ ගැන සතුටුයි. එවැනි අක්‍රමිතතා පිළිබඳව මින් ඉදිරියට කටයුතු සිදු නොකරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අම්බලන්ගොඩ නගර සභා නිලධාරින්ගේ ක්‍රීඩා හා සුබ සාධක සංගමය පසුගිය මාසික සභා රැස්විමට ලිපියක් මඟින් ඉදිරිපත් කර ගරු සභාවෙන් ඉල්ලා සිටියා එම සැණකෙළිය සඳහා ක්‍රිඩා පිට්ටනියත් , එම සැණකෙළිය විනෝද බද්දෙන් නිදහස් කර දෙන ලෙස ඉල්ලා සිටියා. අපේ සියළුම ගරු මන්ත්‍රීවරු මේ සඳහා එක පයින් කැමති වී අනුමතිය ලබා දුන්නා. නමුත් මෙය සිදු කළේ වෙන කෙනෙකි. එය අපට පවසන්නේ ගමේ ජනතාව. මේ පිළිබඳව අපගෙන් විමසනවා. ගරු නගර සභා මන්ත්‍රීවරු ලෙස අපිත් මෙයට වගකිව යුතුයි. අපි බලාපොරෝත්තු වූයේ ක්‍රිඩා පිටිය නිදහස් කිරිමත් ,සැණකෙළියේ විනෝද බදු නිදහස් කිරිමේ මුදලුත් සියල්ලම මෙම ක්‍රිඩා හා සුබ සාධක සංගමයට ලැබේ කියා. නමුත් මෙහි රු430418 ක පමණ මුදලකි ලැබී ඇත්තේ. එය අයකරනු ලැබුවේ ඇතුල් වීමේ ටිකට් පත සඳහායි එම මුදල ගනු ලැබුවේ . අතුලේ තිබුණා ක්‍රිඩා කිහිපයක්. එම ක්‍රිඩා සඳහා ටිකට් පත් සඳහා රු100/=,රු.150/=,රු250/=.වැනි මුදල් අයකළා. නමුත් එම මුදල් වලින් සුබ සාධක සංගමයට මුදල් ලැබුණේ නැහැ. ක්‍රිඩා පිටියට දිනකට සංගිත සංදර්ශනයක් හරි සැණකෙළියක් හරි පැවැත්විම සම්බන්ධව කොපමණ මුදලක් දින අටකට අයකරවාද කියා පවසන්න. අපි හිතමු රු.40000/= කියා රු320000/= ක මුදලක් නගර සභාවට අයවිය යුතුයි. ඊට අමතරව ඇප මුදලුත් බැදිය යුතුයි . අපිට මේ වංචාවක් සිදු වී තිබෙන්නේ. මෙම දමන ලද ලිපිය අනුව අපි එය ලබා දුන්නා. සමුත් මෙය සිදු කළේ වෙන කෙනෙකි. මෙහි එල ප්‍රයෝජන ගනු ලබන්නේ වෙන කෙනෙකි. නගර සභාවේ ක්‍රිඩා හා සුභ සාධක සංගමයට එම ආධාර මුදල ලැබිය යුතුයි. ක්‍රිඩා නිලධාරිනුත් එහි ටිකට් කැඩිමට වාඩි කර සිටිනවා. මා අසන්නේ ඔවුන්ට හරි ගෙව්වාද ? අපි කියන්නේ ඒ නිලධාරින්ට හරි කියක් හරි දිය යුතුයි. මෙවන් දේවල් කරන්න යන්න එපා. මෙතුමා ප්‍රකාශ කළා ටිකට් 100ක් පෞද්ගලිකව ගියා කියා.යම් දෙයක් කරනවානම් ක්‍රිඩා හා සුබ සාධක සංගමයට වැඩි මුදල එයට ලැබිය යුතුයි. අපි සියළුදෙනාම එම නිසා තමයි කැමැත්ත දෙනු ලැබුවේ. නමුත් වුණේ වෙන දෙයකි. මෙවැනි දේවල් ඉකිරිපත් කරනවිට සියළු විස්තර ලබා දෙන්න. නැතිනම් මීට වඩා මුදලක් නගර සභාවට ලැබිය යුතුයි. ඇතුල්විමේ ගාස්තු එකයි. නොමිලේ ලබා දි තිබුණා පාසල් දරුවන්ට. එක මවක් දරුවන් 3කු රැගෙන එනවා.ටිකට් එක එකයි යන්නේ. දරුවන් 3නා සැණකෙළිය ඇතුළට ගිය විට ක්‍රිඩා 4කට යනවා.රු.200/= ගණනේ වුණොත් රු.3200= ක මුදලකි . 25% ක් ටිකට් පත්වලින් අපි ලබන විට ඊට වැඩියේ ආදායමක් ඔවුන් ලබනවා. මේ තත්වය මත බලන විට වැඩි ආදායමක් ලබන්න ඇත්තේ මෙය කරන පුද්ගලයායි. ඕක තමයි තත්වය. දැන් උපුල් මාමානේ මෙය කරන්නේ . අපි දෙනවා මොනවා හරි ක්‍රමවේදයක් මෙය කිරිමට. අපි මුලිකත්වය ගනු ලබන්නේ ක්‍රිඩා හා සුබ සාධක සංගමය නගා

සිටුවීමයි. අපගේ අදහස එයයි.මෙයට විරුද්ධව මා පවසන්නේ මින් ඉදිරියට මෙවැනි දේවල් සිදු වන්න ඉඩ දෙන්න එපා.ගරු මන්ත්‍රීවරු නොමග යවා. මීට වඩා ලක්ෂ 10කට අධිකව ලැබිය යුතුයි. නමුත් මින් ලැබුණේ ඇතුල්වීමේ 25% ටිකට්එකට පමණයි. ඔබතුමා සොයා බලන්න. මින් වැඩි ලාභයක් ලබා ගනු ලැබුවේ එම සැණකෙලිය සිදු කළ පුද්ගලයායි. අපි බලවත් ලෙස කනගාටු වෙනවා සභාව නොමඟ යවා ලිපි ඉදිරිපත් කිරිම සම්බන්ධව.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා ප්‍රකාශ කළ අකාරයට නගර සභා ක්‍රිඩා හා සුබ සාධක සංගමයට කිවු නිසා හරස් ප්‍රශ්න මුකුත් නැතිව මෙය අනුමත කළා. මෙය පටන් ගැනිමට දින කිහිපයකට කලින් දන්න අය ප්‍රකාශ කර සිටියා මෙය කරනු ලබනනේ පිට අය බව. මේ සඳහා නගර සභා සුබ සාධක සංගමයට මින් ප්‍රතිලාභ ලැබෙන්නේ නැහැ කියා.අපි සතුටු වෙනවා රු430000/= ක මුදලක් ඉතිරිවීම සම්බන්ධව. නමුත් මෙවාත් එක්ක බලන විට මේ 25% මුදල අපිට කොහොමත් දිය යුතුයි. එවිට ක්‍රිඩා පිටිය ගතහොත් දිනකට රු.40000/= බැගින් රු.200000/= ක් ගෙවිය යුතුයි.මේ පොල්තෙල් පහන දැල්වීම වෙනම කතන්දරයකි. මින් සිදු වුයේ නගර සභාවට ලැබිය යුතු ආදායමක් වෙනත් කෙනෙකු විසින් ගනු ලැබුවා.අනික් කරුණ ගරු මන්ත්‍රීවරු නොමඟ යවන ලිපියක් ඉදිරිපත් වුණා. මින් ඉදිරියට මෙවැනි දෙයක් සිදු කරනවානම් සුබ සාධක සංගමය ඉතා පැහැදිලිව සවිස්තරව ඉදිරිපත් කරන ලෙස දන්වා සිටිනවා. අපිට මින්පසු කොළේ වසා ගහන ගේම් වලට අනුමතිය ලබා දිමට නොහැකි වෙනවා. අන්තිමට මේ සඳහා අපිටත් වග උත්තර සැපයියි යුතු වෙනවා විගණන ප්‍රශ්නයක් පැමිණියහොත්. එම නිසා කරුණාකර මෙය නිවැරදි විය යුතුයි. අපි කැමතියි අපගේ සේවකයින් මීට වඩා තුන් ගුණයක් හරි ලබා ගෙන ඒ අයගේ සුබ සාධනය වෙනුවෙන් මෙම මුදල් යොදවනවා නම්. ලාභය නිසියාකාරව ලැබුණා නම් විරෝධතාවයක් නැහැ. ලැබිය යුතු ලාභය ලැබී නැහැ. නගර සභාවේ සේවකයෝ. නගර සභාවේ සම්පත් හා නගර සභාවේ සියළු දේ යොදවා ගෙනයි මේ ගනු ලැබුවේ.මේ සඳහා විරෝධතාවය ප්‍රකාශ කරන අතර මින් ඉදිරියට මෙවැනි දේවල් සිදු නොවිමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අපගේ නගර සභා ක්‍රිඩා හා සුබ සාධක සංගමය විසින් පවත්වනු ලැබූ වෙළඳ සැණකෙළිය සම්බන්ධව යමක් ප්‍රකාශ කළ යුතුයි. මට චෝදනාවක් එල්ල කරනු ලැබුවා සහෝදර මන්ත්‍රීවරයෙකුට ටිකට්පත් 100 ලබා දි ඇති බවට. අදාල වැඩකටයුතු කරන ලද නිලධාරියා මගේ සහෝදරයෙකි. එහෙම චෝදනා කරන්න එපා ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් මහතාණනි. මට චමින්ද මහතා පාස් 5ක් ලබා දි තිබුණා. මා හරිදේ සැමදාම කතා කරනවා. මට පක්ෂ පාට නැහැ. මා සුහදව ඕනැම දෙයකට උදවු කරන කෙනෙකි. වැඩියේ කතා කරන්නේ නැහැ. අදාල දෙයට පමණයි කතා කරන්නේ. මට හරිම කනගාටුයි. එහෙම චෝදනා කරන්න එපා. අශෝක කියන්නේ මගේ සහෝදරයා. ඔවුන් මෙයට මැදිහත් වි කැප කිරිමක් කළා. ප්‍රායෝගිකව යම් ගැටළුවක් තිබෙනවා. ලිපිය ඉදිරිපත් කිරිම සම්බන්ධව අපිට ලැබිය යුතු මුදල ලැබුණේ නැහැ. මා දැන ගත් විදියට මෙය සංවිධානය කරනු ලැබූ උපුල් මාමා ලක්ෂ 2ක 3ක් පාඩුයි. මෙවැනි සැණකෙළියක් ගමේ පවුල්වලට දරුවන්ට ලබා දිම පිළිබඳව සතුටු වෙනවා. විනෝද බදු නිදහස් කිරිම වැනි සමහර දේවල් වලට මා කැමතියි. ලබන වසරේ මෙය සිදු කරන විට මේ අඩුපාඩු සකසා මෙම කාර්ය ඉටු කර ගැනිමට සහායෝගය ලබා දෙන ලෙස ඉල්ලිමක් කර සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්

අම්බලන්ගොඩ නගර සභාවේ අභිනවයෙන් සුබ සාධක සංගමයක් පත්වෙලා ප්‍රථමයෙන්ම ආරම්භ කරන ලද ක්‍රියාවලිය මෙයයි. සියළුම නිලධාරින් , කම්කරුවන් සියළු දෙනා එකතු වෙලා මේ ව්‍යාපෘතිය සිදු කිරිම සම්බන්ධව සතුටු වෙනවා.ඒ ඔවුන්ගේ සුබ සාධක මට්ටම වැඩි කර ගැනිමට වුවත් රාජ්‍ය ආයතනයක මෙවැනි කටයුත්තක් සිදු කිරිමට ඉදිරිපත් විම ඔවුන්ගේ නිලතල වලට පවා අභියෝගයක් විය හැකියි. මොකද මෙය විශාල භාර දුර කාර්යකි. මෙම කාරණාව සුබ සාධක සංගමය මඟින් සිදු කිරිමට ගියා නම් ඉතාම ශෝචනිය තත්වයට පත්වෙනවා. අවංකවම එය කරන්න බැහැ. කානිවල් කරන අයට වඩා අපගේ නිලධාරින් විසින් ඉල්ලිමක් කිරිමෙන් පසුයි ඔවුන් මෙහාට පැමිණායේ. මාත් පාසලේ මේවැනි සැණකෙළි පවත්වා තිබෙනවා. එය සාමාන්‍ය මුදලකට කළ නොහැකියි. මේ සියළු උපකරණ ගෙනවිත් මේ සියළු දේවල් සවිකර මෙම සැණකෙළිය පැවැත්වුවා නම් ඉතාම අසිරුතාවයකට පත්වෙනවා මෙම නිලධාරින්. දැන් කරපු අය පිළිබඳව මා දන්නේ නැහැ. මෙහිදි විනෝද බදු ලෙස ලැබි තිබෙනවා රු338000/=ක පමණ මුදලක් සම්පූර්ණ ආදායම වන්නේ ලක්ෂ 13කි . අපේ නිලධාරින් තමයි මෙහි ප්‍රවේශපත්‍ර කවුළුවල සිටියේ. සම්පූර්ණ ආදායම ලක්ෂ 13කි. මෙම යන්ත්‍රසුත්‍ර ගෙනවිත් ප්‍රවාහන කටයුතු සිදුකර මේවා සවිකර මෙම සැණකෙළිය අපේ අය කළානම් කොතනද නවතින්නේ. එවිට කරන්න බැහැ අවංකවම. නමුත් ඒ අයගේ උවමනාවට වඩා අපේ සංගමයේ අයගේ උවමනාවට තමයි ඒ අය මෙහි පැමිණියේ . ඒ අය පැමිණියත් විශාල බලාපොරෝත්තු පිට. අම්බලන්ගොඩ ප්‍රදේශයක කනිවල් එකක් කර පාඩු වෙලා යන්න අවශ්‍ය නැහැ. නමුත් මෙය කඩි මුඩියේ සිදු වූ නිසා මෙය අසාර්ථක වුවා යයි මාගේ පුද්ගලික මතය. වර්ෂාවෙන් බාධා වුණා. මෙය හඳුන්වා දි ප්‍රචාරක කටයුතු සිදු කරනු ලැබුවේ ඉතාම ටික කාලයකිනි. ඒ අතින් බැලුවිට මෙය සිදු කර ආයතනයට විශාල පාඩුවක් වෙන්නැති. ඔවුන් බලාපොරෝත්තු වූ දෙය සිදු නොවෙන්න ඇති. ගරු සභාවක් විදියට අපට වැදගත් වන්නේ විනෝද බදු නිදහස් කිරිම සම්බන්ධවයි. මෙම සැණකෙළියට අවසර දෙනවිට වැදගත් වන්නේ එයයි. අපේ ගරු මන්ත්‍රිවරු අදහස් දැක්විමට සම්බන්ධව පුද්ගලිකව කෙනෙකු සැණකෙළියක් ඉදිරිපත් කිරිමට වඩා එහා ගිය දෙයක් මෙහි තිබෙනවා. අපේ සභාවේ නිලධාරින්ගේ , කම්කරුවන්ගේ සුබ සාධනය වෙනුවෙන් යමක් දිමේ බලාපොරෝත්තුව එතැන තිබෙනවා. එය කොහොම වුණත් නගර සභාවට ලැබිය යුතු ආදායම වෙන්න පුළුවනි. ඒ අය මේ සංගමය විසින් මෙය නොකළානම් මෙම සැණකෙළිය පවත්වන්නේ නැහැ. මේ සංගමයේ ඉල්ලිමට තමයි මේ සැණකෙළිය පවත්වන්නේ. එම නිසා ලාභ පාඩු බැලිමේදි ඒ පිළිබඳවත් සැලකිලිමත් විය යුතු වෙනවා. අපි ඉදිරිපත් කරන ලද අපේ කතා තුළ අපි ඉදිරිපත් කරන කරුණු පිළිබඳවත් අපි වැරදි අඩුපාඩු පෙන්වා දිම තුල මේ කියන නිලධාරින්ගේ මානසිකත්වය උද්යෝගය මෙයින් අඩුවිය යුතු යයි මා විශ්වාස කරන්නේ නැහැ. මෙවැනි කාරණා සිද්ධ වෙන්න පුළුවනි. සභාවක් විදියට අපි අනුමතිය ලබා දි තිබෙනවා. මේ පිළිබඳව බරපතල විදියට වාද විවාද කළ හැකියි. මා මේ ඉදිරිපත් කර කරුණු පිළිබඳව යම් මට්ටමක අපට උපේක්ෂා සහගතව මෙම කරුණ මෙතැනින් නවත්වා අපේ ගරු සංගමයට ආශිර්වාද කළ යුතුයි. මේ ගරු මන්ත්‍රිවරුන්ගේ සියළු අදහස් ගරු කරනවා. ඒ පිළිබඳ වැරදි නැහැ කිසි තැනක. ඒ සියළු අදහස් හරි. ඉන් එහා ගිය උතුම් වූ කාර්යයකට මේ සැණකෙළිය පවත්වා තිබෙන්නේ. මා විශ්වාස කරනවා මෙහි යම් අඩුපාඩුවක් තිබුනත් මෙය යම් සාධාරණිකරණයක් විය යුතුයි කියා.

ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, මෙම සැණකෙළිය පැවැත්විමෙන් අපගේ නගර සභා නිලධාරින්ට , සේවකයන්ට , කම්කරුවන්ට ඉතාමත් උද්යෝගි අවස්ථාවකි රු 43000/= ක මුදලක් ලැබිම සම්බන්ධව. මේ සම්බන්ධව නගර සභාවෙන් බදු මුදල් අයකිරිම් කැප කර තිබුණත් ඉන් යහපතක් සිද්ධ වෙනවා. මොකද නිකං හිටියා නම් මේ මුදල වත් ලැබෙන්නේ නැහැ. ඒ සුභ සාධක සංගමයට මෙවැනි මුදලක්

ලැබීම ගැන සතුටු විය යුතුයි. එම සංගමයේ පැවැත්ම සඳහා. ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා ප්‍රකාශ කළ ආකාරයට සංගමයෙන් මෙය සිදු කළානම් උතුර දකුණත් සොයා ගැනීමට බැරි වෙනවා. යම්කිසි මහන්සියක් නොදරා නිකං ඉඳ මෙවැනි මුදලක් ලැබීම අපිට ලොකු භාග්‍යයකි.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේ සියළු අදහස් ගන්නවා . ඒ හැරෙන්න වෙන දෙයක් නැත කිරීමට. ඊළඟ වාරයේ ඉල්ලන විට එසේ සිදු කරන්න.

ගරු සභාපතිතුමනි, නගර සභා සුබ සාධක සංගමය විසින් කරනු ලැබූ සැණකෙළිය පිළිබඳව මා සතුටු වෙනවා. මාහට 15 දින තමයි උත්සවයට ආරධනා කර තිබුණේ. නමුත් දැශමාන ආරංචි නිසා මාත් ටිකක් ගැස්සි සිටියා. මොකක්ද මේ වෙන්නේ කියා. කොහොම නමුත් අවසාන දිනයේදි මා සහභාගි වුණා. නගර සභා නිලධාරින් මෙය සංවිධානය කළානම් අසාර්ථක වෙන්න තිබුණා. දැන් කොහොම වුණත් ආදායමක් ලැබුණා. ඉදිරියේදි කළයුතු දේ පිළිබඳවත් පාඩමක් ඉගෙන ගත්තා. මේ සේවකයන්ටත් සමහර වේලාවට දොස් කියනවා. නමුත් එක් කරුණක් මා ඔවුන්ට ප්‍රකාශ කරනවා පැගුණු කෙසෙල් මොටෙයියා තමයි නැවත හැදෙන්නේ කියා.

**තීරණය**
අම්බලන්ගොඩ නගර සභා නිලධාරින්ගේ ක්‍රීඩා හා සුබ සාධක සංගමය මගින් පැවැත්වූ වෙළෙඳ සැණකෙළියේ අයවැය වාර්තාව ගරු සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 11.15 බලපිටිය ප්‍රාදේශිය සභාව මඟින් ජල බවුසරය ලබා ගැනිම සහා අනුමතියට යටත්ව ලබා දිම සම්බන්ධ ලිපිය සභාගත කිරිම.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ජල බවුසරය ලබා ගැනිම සඳහා බලපිටිය ප්‍රාදේශිය සභාවෙන් ඉල්ලීමක් කර තිබෙනවා. මේ දිනවල පවතින නියඟය නිසා පානිය ජලය ලබා ගැනිමට සිදු ව ඇත. ඒ සඳහා ඔබ සභාව සතු ජල බවුසරය අපවෙත ලබාදෙන ලෙස කරුණිකව ඉල්ලා සිටිමි. එම ජල බවුසරය සති දෙකක කාලයකදි ලැබීමට සලස්වන අතර ඒ සම්බන්ධව ලබා දෙන සහායෝගය ඉතා අඟය කොට සලකන බවත් දන්වා ඇත.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, එය ලබා දෙනවා නම් තල්ගස්ගොඩ, බටපොළ , ගෝනපිනුවල ආදි අප මැතිවරණ කොට්ඨාශයේම තිබෙනවා මෙම ජල ප්‍රශ්නය. එම නිසා බලපිටියට ලබා දෙන්න. අපිට යාබද ස්ථානය. හැබැයි දවස් ගණන් වලට නෙමේ . ඒ අයගේ වැඩය දිනකට කරගෙන අපිට බවුසරය ලබා දෙන්න කියන්න. තල්ගස්ගොඩ, බටපොළ , ගෝනපිනුවල, අලුත්වල, ඕකන්ද ආදි ප්‍රදේශ තිබෙනවා. එවාටත් අපි ජලය ලබා දිය යුතුයි. මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ගෝනපිනුවල දරුණු ජල ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රදේශයේ ළිංවල ජලය නැහැ. ජලය ගන්නත් බැහැ. මා ප්‍රකාශ කර සිටියා මා පුද්ගලිකව මාගේ මුදල් දි එවැනි ප්‍රදේශවලට ජලය මුදල් දි ලබාගෙන සපයා දිමට. අපෙගේ ගරු මන්ත්‍රිවරු සිටිනම් කැමති අයට මේ සඳහා දායක විය හැකියි.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ගරු මන්ත්‍රිවරු 3න් හතර දෙනාටම ප්‍රකාශ කර සිටිනවා එසේ සිදු කරන ලෙස . අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාවෙත් මෙවැනි බවුසරයක් තිබෙනවා. එහෙත් ඉල්ලිමක් ආවොත් අපි ලබා දෙන්නම්.

**තීරණය**

2019.04.05 දින සිට සති දෙකක කාලයකට බලපිටිය ප්‍රාදේශිය සභාවට නගර සභාව සතු ජල බවුසරය ලබා දිමටත් , නගර සභාව සඳහා යම් අවශ්‍යතාවයක් ඇති වුවහොත් ජල බවුසරය ලබා ගැනීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සම්මත විය.

**11.16 පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ හා යෝජනා ක්‍රියාත්මක කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදි.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

ප්‍රධාන පුස්තකාල හා ශාඛා පුස්තකාල වල එම භාණ්ඩ විනාශ කිරිම 2019.04.23 වන දින පැවැත්වේ. ඒ නම්කරනු ලැබු ගරු මන්ත්‍රිවරු එතැනට සහභාගි වන්න.

**තීරණය**

පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාවේ2019.02.05 දින පැවති සභාවේ සභා තීරණ අංක 11.03,හා 11.04 නිර්දේශ හා යෝජනා ක්‍රියාත්මක කිරිම සඳහා ගරු නගර සභා මන්ත්‍රී අතුල ප්‍රියන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා හා ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදු කුමාරි මහත්මිය යන මන්ත්‍රිවරුන් 2019.04.23 වැනි දින එම භාණ්ඩ විනාශ කිරිමේ අධික්ෂණ කටයුතු සඳහා සහභාගි විය යුතුබවට සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## (12) න්‍යාය පත්‍රයට ඇතුලත් නොවු වෙනත් කරුණු

**12.01 ප්‍රතිභා ක්‍රිඩා සමාජය විසින් අම්බලන්ගොඩ දළුක්කන්ද ක්‍රීඩාංගණය 2019.04.16 වන දිනනොමිලේ ලබා දෙන ලෙස ඉල්ලිමක් කර ඉල්ලා ඇති ලිපිය සභා ගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ දළුක්කන්ද ප්‍රතිභා ක්‍රිඩා සමාජය විසින් පවත්වනු ලබන බක්මහ උළෙල 2019.04.16 වන දින දළුක්කන්ද ක්‍රීඩාංගණයේදි පැවැත්විමට කටයුතු සංවිධාන කටයුතු සිදු කරඇත. නගර සභාවට අයත් මෙම ක්‍රිඩාංගණය නොමිලේ ලබා දෙන්න.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, එය ලබා දෙන්න.

**තීරණය**

දළුකන්ද ප්‍රතිභා ක්‍රීඩා සමාජය මඟින් 2019.04.16 වන දින පවත්වනු ලබන බක්මහ උළෙල පැවත්වීමට නගර සභා පොදු කටයුතු වලට අයත් තල්ගස්ගොඩ ක්‍රීඩා පිටිය නොමිලේ වෙන්කර ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා ස්ථිර කරන ලදුව ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**12.02 නිදහස් ආයුර්වෙදයේ බෙහෙත් වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2019 පෙබරවාරි මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව . ආයතනය පවත්වන ලද දින ගණන16 ½ , පැමිණි රෝගීන් සංඛ්‍යාව 155කි . රෝගීන් පැමිණි දෛනික සාමාන්‍ය ගණන 9 කි. මාසය සඳහා වැයවූ ඖෂධ සඳහා ගිය වියදම රු.16479.77 එක් රෝගියකු සඳහා ගිය මුදල රු.106.32 ක් වශයෙන් වාර්තාව ඉදිරිපත් කර ඇත.

**තීරණය**

**අම්බලන්ගොඩ නගර සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ 2019 පෙබරවාරි මස සඳහා වාර්තාව සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි**

- **වෙනත් කරුණු**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , කොට්ඨාශ මට්ටමින් සිදු කරනු ලබන වැඩසටහන යටතේ අප කොට්ඨාශයට JCB යන්ත්‍රය පැමිණෙන විට පෙ.ව. 11.00ත් පසු වී ඇත. පෙ.ව. 11.00 වනතුරු එයට ඉන්ධන ගසා නැත. මෙය පිටත්වීම සඳහා ක්‍රමවේදයක් නිලධාරින්ගේ නැද්ද? දින 2ක් 3ක් පමණයි පැමිණියේ. ඊයේ දිනයේම නැහැ.

**කසල කළමනාකරණය සඳහා ට්‍රැක්ටර් රථ ලබා දීම**

**<u>ගරු සභාපති එම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

උක්ත ශීර්ෂය යටතේ මා වෙත දකුණු පළාත් පාලන කොමසාරිස් විසින් යොමු කරන ලද අංක 3 / 2 හා 2018.12.28 දිනැති ලිපියේ පිටපතක් මේ සමඟ ඇති අතර එම ලිපිය ඔබගේ ගෞරවාන්විත අවධානයට යොමු කරයි. මේ ලිපිය ලියන ලද්දේ ගරු ආණ්ඩුකාරතුමාට .ඒ අනුව ට්‍රැක්ටර් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය ලේඛණ අම්බලන්ගොඩ නගර සභාවෙන් ලබාගෙන ඇති අතර ට්‍රැක්ටරය ලබාගැනීම සඳහා පසුව දැනුවත් කරන බව නගර සභාව වෙත දුරකතනයෙන් පළාත් පාලන කොමසාරිස් කාර්යාලය විසින් දැනුවත් කර ඇත. මෙම ට්‍රැක්රය ලබාදීම සම්බන්ධයෙන් පසු දිනෙක පළාත් පාලන කොමසාරිස් හමු වී සාකච්ඡාවෙන් පසුව දැන ගැනීම ලැබුනේ අම්බලන්ගොඩ නගර සභාව නමින් ලියාපදිංචි කර ඇති ට්‍රැක්ටරය හික්කඩුව නගර සභාව වෙත ලබා දෙන ලෙස ගරු ප්‍රධාන අමාත්‍යතුමා පළාත් පාලන කොමසාරිස් වෙත නියෝග කර ඇති බවයි. ඉහත සඳහන් මහ ඇමතිතුමාගේ වැරදි සහගත ක්‍රියාව ඔබ විසින් පරික්ෂාකර බලා අම්බලන්ගොඩ නගර සභාවට සහනයක් සලසා දෙන මෙන් ගෞරවයෙන් අයැද සිටී. කියා ගරු ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලීමක් කර ඇත. සභාව නමින් ලියාපදිංචි කළ ට්‍රැක්ටරය එය අවලංගු කර හික්කඩුව නගර සභාවට ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් කටයුතු කර ඇත. පළාත් පාලන කොමසාරිස්තුමාට හා ලේකම්තුමාට ඊයේ දිනයේ පැවති රැස්වීමේදී මා ප්‍රකාශ කර සිටියා හික්කඩුව නගර සභාවෙන්ම ගිහින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ නිවසට ගොස් කුණු ගන්නා ලෙස . අපට ලැබිය යුතු ලියාපදිංචි ට්‍රැක්ටරය ලබා දෙන ලෙස .

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා මේ ගැන කතා කළා. මෙහි සිදු වී ඇත්තේ මෙයයි. දිස්ත්‍රික්ක 3ට ට්‍රැක්ටර් 3ක් තමයි ලබා දීමට කටයුතු යොදා තිබෙන්නේ. මෙහිදී තීරණය කළා අම්බලන්ගොඩටත් මාතර වැලිගමටත් , අම්බලන්තොටටත් ලබා දීමට. හික්කඩුව නගාරාධිපතිතුමා විසින් මෙයට ඉල්ලීමක් කළා මේ ප්‍රදේශය සංචාරක පුරවරයක් මෙහි විශාල කසළ ප්‍රමාණයක් තිබෙනවා. එම නිසා ට්‍රැක්ටරයක් ලබා දෙන ලෙස. ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගෙන්වා නිලධාරින් සාකච්ජා කළ විට අම්බලන්ගොඩ නගර සභාවට පසුගිය කොමසාරිස් පාලන තන්ත්‍රයේ ට්‍රැක්ටර් 2ක් ලබා දී තිබෙනවා. එම නිසා ට්‍රැක්ටර් 2ක් මෙහෙට දුන් නිසා එය හික්කඩුව නගර සභාවට ලබා දී පසුව අම්බලන්ගොඩ නගර සභාවට ට්‍රැක්ටරයක් ලබා දීමට. එයයි සිදුවී ඇත්තේ . නැතිව වැරද්දක් නෙමේ සිදු කර ඇත්තේ.

**<u>ගරු සභාපති එම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කිසිම වැරදිමක් නෙමේ සිදුවී ඇත්තේ. මෙය ඕනෑකමින් සිදු කර ඇත්තේ

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා පිළිගන්න එකක් පිළිගන්න . එයයි සිදුවී ඇත්තේ.වැරදි මත පිළිගන්න එපා. මා පිළිබඳව විමසා සිටියා.අපේ පාලන කාලයට කලින් ට්‍රැක්ටර් රථ 2ක් අම්බලන්ගොඩ නගර සභාවට ලබා දී ඇත. හික්කඩුවට ලබාදී නොමැත. හික්කඩුව නගර සභාවේ සභාපතිතුමා ඉල්ලීමක් කර තිබෙනවා . හික්කඩුව සංචාරක පුරවරයක් නිසා එය ලබා දී තිබෙනවා. ඔබතුමා වරද්දා වටහා ගෙන තිබෙනවා. මෙය වැරදිමක් නෙමේ. මෙය සමසේ යන විදියට බෙදා දී ඇත.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කරනු ලබන ප්‍රකාශය ඉතා බොළඳ කතාවකි. මොකද අම්බලන්ගොඩ නගර සභාවට ම ලියාපදිංචි කරන ලද ට්‍රැක්ටර වෙනත් සභාවකට ලබා දිම. එතුමා දන්නවා අම්බලන්ගොඩ නගර සභාවට කසළ එකතු කිරිම පිළිබඳ ප්‍රශ්නය. එසේ තිබියදිත් මෙය ලබා දිම. මේවැනි ඉල්ලීම් කළ හැකියි. සෑම සභාවකටම මෙවැනි ට්‍රැක්ටර් රථ ලබා දුන්නා. හික්කඩුවටත් ලබා දුන්නා. මේ දිපු ට්‍රැක්ටරය ලබා ගත්ත එක පිළිබඳවයි ප්‍රශ්නය ඇත්තේ. ගරු සභාපතිතුමාට මෙය සභාවට යොමු කරන්න අවශ්‍ය නැහැ. මේ ට්‍රැක්ටරයේ අයිතිය අපේ. අපේ නමට ලියාපදිංචි ට්‍රැක්ටරය ලබා ගත හැක. නිත්‍යානුකූලව කටයුතු කර මෙය ලබා ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමිනි, අපට මතුකළ යුතු තවත් ගැටළු තිබෙනවා.ගරු නගර සභා මන්ත්‍රී ගංහේ සරත් ශ්‍රී ලාල් මැතිඳුන් නෙළුම් පොහොට්ටුව බබළවන යෝජනාවක් ඉදිරිපත් කළා. කොට්ඨාශ මට්ටමින් මේ නගරය සංවර්ධනය කිරිම සඳහා සියළුම නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කර කැමැත්ත ප්‍රකාශ කළා. ඔබ අම්බලන්ගොඩ අරුණාලෝකයයි අප නිතර උදම් ඇනුවත් ගරු සභාවේ මතය පසෙකලා ඔබතුමා කටයුතු කළා. එම වැඩසටහනට දිය යුතු ග්‍රාමක බලය ඔබ ලබා දුන්නේ නැහැ. අංක 1 කොට්ඨාශයට සෞඛ්‍ය , කර්මාන්ත, සියළුම අංශ අප ප්‍රදේශයට එවිය යුතු වුවත් අප ප්‍රදේශයට පැමිණියේ සේවකයින් තිදෙනෙකු පමණයි. එනමුත් ගරු ගම්භිර මේ සභාව යෝජනා කළේ එවැන්නක් නෙමේ.කර්මාන්ත අංශය , තාර කර්මාන්තය , සෞඛ්‍ය අංශය , මහජන සෞඛ්‍ය පරික්ෂකවරුන් ආදි සියළු දෙනා යොදා මෙම කොට්ඨාශය වඩා පැහැදිලිබර කොට්ඨාශයක් කිරිමයි. ඔබගෙන් ඒ පිළිබඳ විමසා සිටි විට ප්‍රකාශ කර සිටියේ තාර කර්මාන්තය ඒ අයුරින්ම සිදු විය යුතු බවයි. නමුත් ගරු සභාවේ මතය වුයේ එය නොවේ. එම නිසා මා මේ අවස්ථාවේ විමසා සිටිනවා අපගේ ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ අදිපත්‍යය නෙළුම බැබළවිමයි. ඔබතුමා මේ අවස්ථාවේ නෙළුම විල තුලටම කාවද්දා පල්කිරිමක් තමයි සිදු කරනු ලැබුවේ . මේ වන විට අම්බලන්ගොඩ මහජන ඖෂධ ශාලාව ( නිදහස් ආයුර්වේද මධ්‍යස්ථානය ) මා පසුගිය දිනක එහි ගියා. එහි සුදු ගැණු ළමයෙකු සේවයේ යෙදෙනවා . ඖෂධක සංයෝජක ලෙස. බලාගෙන යනවිට මේ දරුවා දෙනියාය ප්‍රදේශයේ දරුවෙකි. කොහොමද දෙනියායේ අයෙක් සේවය කරන්නේ. අපේ ආසනයේ බත්කන අය නැද්ද?පරිප්පුයි බතුයි කන අය අප ප්‍රදේශයේ සිටිනවා. දෙනියයේ අය අප ප්‍රදේශයේ රැකියාවට පැමිණෙන්නේ කොහොමද? තවත් තොරතුරක් අපට ලැබෙනවා. කරන්දෙණිය මධ්‍යවිල ප්‍රදේශයේ තරුණයෙක් පරිපාලක තනතුරකට අයදුම්පතක් ලබා දී ඇතිබවට. මෙය ඇද්ද නැද්ද කියා දන්නේ නැහැ. අපි විමසනවා අපේ අය බඩගින්නේ සිටියදි පිටස්තරයෙක් මෙහේ සේවයට එන්නේ කොහොමද කියා. මට මෙය ප්‍රකාශ කරනවිට මතකයට එන්නේ දුන්න දුනු ගමුවේ , ඊතල කිතල ගමුවේ, රාල මිගමුවේ, මුවෙක් ඇඩුවයි සබරගමුවේ. ඒ ඒ කේෂ්ත්‍ර ඒ ඒ තැන්වල . කොහොමද කාර්යයක් කෙරෙන්නේ මේ ආයතනයේ. මා විමසා සිටිනවා ගරු සභාව අනුමත කළ යෝජනාවට නිසි බලතල නොදි තමා කළ යෝජනාවක් නොවන නියාවෙන්ද ඒ සංවර්ධනය සඳහා එම යෝජනාව යාථාර්ථ කිරිමට ඉඩ නොදුන්නේ කියා.

**ගරු සභාපති එම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔබතුමාට කියන්න ඕන . අපි දූන්නේ ඔබතුමාගේ කොට්ඨාශයේ වැඩ කරන්න තමයි. ඒ වුණාට ඔබතුමා මාර්ග සංවර්ධ අධිකාරියට අයත් මාර්ග තමයි සුද්ද කිරිමට ගොස් තිබුණේ. එ මදිවට මගේ මහගෙදරට යන මාර්ගයේ ලැලි අස්කර එම ලැලි දමා තිබුණේ නැහැ . මෙම සේවකයන් ලවා. අපි ලබා දුන්නේ අපේ නගර සභාව සතු මාර්ග සුද්ද පවිත්‍ර කිරිමට. ඔබතුමා මාර්ග සංවර්ධ අධිකාරියේ කොන්ත්‍රාත්කරුවන් කරන වැඩ තමයි සිදු කර තිබුණේ. ඒවා එම ආයතනයෙන් කළ යුතු වැඩ. තමන්ට වැඩ කරන්න අවස්ථාව ලබා දූන්නාත් අනුන්ට කඩේ ගිහින් එම කාර්ය කරගත්තේ නැහැ.සභාවේ සේවකයන් දි තිබෙනවා. ඔවුන් ඒ සඳහා යොදවා නැහැ.ඊලඟ දිනයේ මා සේවකයන් යොමු කළා කොන්ක්‍රිට් පතුරු ටික දැමිමට. නමුත් මෙතුමා සේවකයන් යොදවා තිබුණා විහාරස්ථානය අතු ගැම සඳහා. මා ප්‍රකාශ කර සිටියා මුලින්ම පැමිණ කොන්ක්‍රිට් පතුරු ටික දමා දෙන්න කියා. ඔබතුමා අවශ්‍ය දේ නෙමේ කරනු ලැබුවේ . අනවශ්‍ය දේ කළේ. පන්සල සුද්ද කිරිමට නෙමේ. කාණුටික සුද්ද කිරිමට යැව්වේ.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි,සෞඛ්‍ය ප්‍රශ්න, මාර්ග සංවර්ධ අධිකාරිය ආදි වෙන් වෙන්ව ගත නොහැකියි ප්‍රදේශ වශයෙන්. මේ අවස්ථාවේ අපි මතුකරනවා. අපගේ ගරු රාහුල මන්ත්‍රීතුමා දූටුවා එම සිද්ධිය එම ඉදිරිපස ඔබතුමාගේම ඥාති තැනැත්තෙක් ඒ මාර්ගයේ කාණුව අවහිර කර සුවිශාල වැසිකිළි අපද්‍රව්‍ය එන තත්වයට පත්කර මේ අවට ජනතාවට වාසය කිරිමට නොහැකි තත්වයක් උදාකරලයි තිබුණේ. එම නිසා අපි එම කොන්ක්‍රිට් පතුරු ඉවත්කර නැවත එය සවිකිරිමට නොහැකි වුණා. ඒ ටයර් එක පුපුරා ගියා. මේ අහිංසක සේවකයන්ගේ අත්වලින් මෙය දැමිය නොහැකි නිසා බැකෝ එක සාදන කම් දින දෙකක් මෙය පසුවුයේ . එම නිසායි ඒ ප්‍රමාදයට හේතුව. ඔබතුමා සඳහන් කළා විහාරස්ථානයක් අතුගැම සම්බන්ධව. අප අම්බල්නගොඩ ආසනයේ රණශුරයන් ස්මරණය කිරිමට සෙනසුරාදා දිනයේ එම රණශුරින් ඇඟයිමේ උත්සවයක් තිබුණා එම විහාරස්ථානයේ. එම අවස්ථාවේ උදේ පාන්දර එම සේවකයන් පැමිණියේ. අලවංගු නොමැතිව. එම නිසා අපි ඉදල් දෙකක් දී එම සේවකයන්ට විහාරස්ථානය පිරිසිදු කර දෙන ලෙස ඉල්ලා සිටියා. මුළු දවසම යොදා ගත්තේ නැහැ. එම ඉදල් දෙක ලබා දි විනාඩි 30ක වගේ කාලයක් තමයි එම කාර්ය ඉටු කර ගත්තේ. අපි අවශ්‍යතාවයකටයි යොදා ගත්තේ.ඔබතුමා වැරදි අදහසක සිටින බව තමයි ප්‍රකාශ කරන්නේ. මෙය කඩාකප්පල් කිරිමක් ලෙසයි දකින්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මාත් ගියා ඔය කියන ලද ස්ථානයට . එහි මහජන සෞඛ්‍ය ප්‍රශ්නයක් විශාල වශයෙන් තිබුණා.ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා ගම හා ජනතාව පිලිබඳ හොඳින් සොයා බලා විදුලි බිලක් හරි ගෙවා ජනතාවට උදවු කරනු ලබයි. අපි තින්දුවක් ගනු ලැබුවා කොට්ඨාශයක සතියක් එක දිගට වැඩ කිරිමට. අපි සොයා බැලුවාම එක් එක් අංශ වල අඩුපාඩුකම් තිබුණා. සභාපතිතුමාට බලය තිබෙනවා මෙය සිදු කිරිමට. මෙය සත්භාවයෙන් සිදු කරන විට සත්භාවයෙන් උදවු කළ යුතුයි. එයයි මෙතැන නැත්තේ.අපි යෝජනවාක් දැමුවිට ඔබතුමා එය ඉටු කරන්නේ නැහැ. ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා යෝජනාවක් දැමු විට එය ඉටු කරනවා. පොහොට්ටුවද , එක්සත් ජතික පක්ෂයද , නිදහස් පක්ෂයද නෙමේ.මහජනතාවගේ වැඩ කරන්නේ කවුද එතුමන්ට සහායෝගය ලබා දිය යුතුයි.අපි ඔබතුමාට සහායෝගය දෙනවා. ඔබතුමාත් සහායෝගය ලබා දෙන්න. එය අඩුවිමක් තිබෙනවා.

**ගරු සභාපති එම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සභාව ගනු ලැබු තින්දුව පරිදි ක්‍රියා කරන්න. එය නිලධාරින්ගේ වැඩකි . මා එය සිදු කළ යුතු නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

නිලධාරින් සහභාගි නොවෙන්නේ යට මොනවා හරි වැඩ පිළිවළකුත් ඇති කියා අපි හිතනවා. මා දන්නේ නැහැ .තියෙනවාද නැද්ද කියා.මහජනතාවට නගර සභාව විදියට යම් වැඩ කොටසක් සිදු

කරන විට උත්පත්තියේ සිට මරණය දක්වා සහායෝගය ලබා දිය යුතුයි. අපි බලෙන් වගේ මෙම යෝජනාව සකසා දෙනු ලැබුවේ. මෙය සාර්ථක විමෙන් එහි ගෞරවය හිමි වන්නේ පාලන තන්ත්‍රයටයි. සමහර වේලාවට විපක්ෂය කරන්නේ මෙය කඩා කප්පල් කිරිමයි. අපි ඔබතුමාලාගේ ගරු මන්ත්‍රිවරයෙකුගේ යෝජනාවක් අනික් කොට්ඨාශවල සිදු කරන විට සහායෝගයෙන් ඉටු කර දෙන්න. ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරමිණියගේ මන්ත්‍රිතුමා ගත්විට අපට වඩා මහජනතාව වෙනුවෙන් කැප වි වැඩ කරන ගරු මන්ත්‍රිවරයෙකි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරමිණියගේ මහතාගේ කොට්ඨාශයේත් අපි වැඩ කර තිබෙනවා. අනෙක් කොට්ඨාශ වලත් වැඩ කර තිබෙනවා. අපිට ඡන්දය දුන් ජනතාවට පාඩුවක් නොවන අයුරින් අපි වැඩ කර තිබේනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**.

මට වැඩ කරනවා කිවුවා. මාගේ වැඩ නොකර මා හිතා හිටිටියේ ඔබතුමා ගරු නගර සභා මන්ත්‍රි අතුල මහතාගේ වැඩ කරනවා කියා. මට හරි ප්‍රේහෙළිකාවකි. ගරු සභාපතිතුමා කරන්නේ කුමක්ද කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**.

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රි ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් කරන ලද යෝජනාවට සභාවේ එකඟතාවයක් ලබා දුන්නා. සැමදෙනාටම සාධාරණ වන විදියට එය ක්‍රියාත්මක කරන්න. ඔබතුමා ප්‍රශ්නයක් ගන්න එපා. පුළුවන් විදියට ඒ වැඩ කොටස් ටික කරන්න.මා ඔබතුමාගෙන් මේ මොහොතේ යෝජනාවක් ලෙස ඉදිරිපත් කර සිටිනවා. අපේ ගරු හිටපු ලේකම්තුමිය ඉතා අපහසුතා මධ්‍යයේ වුණත් වැඩ කළා.සමහර වේලාවට ඔබතුමාගෙන් හා අපෙන් බැණුම් ඇසු අවස්ථා ඇති යම් යම් අපහසුතා වලට. මොනවා වුණත් එතුමිය බාධක මැඩ අපහසුතා මැද වුවත් නගරයේ දියුණුව වෙනුවෙන් ජනතාවගේ සුබ සිද්ධිය උදෙසා වැඩ කළා. මා  ඉල්ලා සිටිනවා ඒ පිළබඳව එතුමියට කරන්න පුළුවන් යම් චරිත්‍රයක් තිබෙනවා එසේ සිදු කිරිමෙන්  හරි එසේ නොවන්නේ නම්  නගරයට කරන ලද සේවාව වෙනුවෙන් ප්‍රසංශා ලිපියකින් හෝ එතුමිය කළ කාර්යය අගය කෙට සලකන්න . එසේම මාර්ග ලේඛණය  බැලුවිට  යම් යම් සංශෝධන තිබෙනවා කළ යුතු.තවත් මාර්ග වගයකට මුදල් ප්‍රතිපාදන එවා තිබෙනවා . යම් මාර්ග වගයක් සකස් කිරිම් සඳහා ගම්පෙරළිය වැඩ සටහන මඟින් සිදු කිරිමට නියමිතයි. සමහර මාර්ග ඇත්තටම ඉතා හොඳ මාර්ග. හොඳ මාර්ගයක් කඩා ඉන්ටලොග් අල්ලන්න එපා. දැන් චන්ද්‍රවාස පාර. එම පාර හොඳයි. එහි වළවල් නැහැ

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නැහැ. ඉ න්ටලොග් ඇල්ලිමට ඇත්තේ චන්ද්‍රවාස පාරේ අතුරු මාර්ගයකි.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**.

ඒ වගේ ගැටළුවක් නැහැ. ඔබතුමා නිතරම බලන්න අපි දෙන මුදලුත් සමහර වේලාවට ගරු ඇමතිවරුන්ගෙන් ලැබෙන මුදලුත් ,ගරු  ප්‍රධාන අමාත්‍යතුමාගේ මුදලුත් ඒවාට මුදල් නැති පාරවල් සභාව විසින් සාදා ගැනිමට නැතිනම් අපරාදේ එම මුදල් අපතේ යනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔබතුමා යෝජනා කළ ඒවා විතරක් මෙතැනට ඇතුලත් කර නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>.**

තවත් මාර්ග වගයක් දැම්මා . එම මුදල් මා ඔබතුමාට එවන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>.**

ගරු සභාපතිතුමනි, මා මේ කරුණ ඉදිරිපත් කරනු ලබන්නේ අපගේ ගරු විපක්ෂනායක ගරු ඩෙනට් පනියන්දුවගේ මහතාට. පොලිස් නිවාස වලට යන මාර්ගය සම්බන්ධව.හෙප්පුමුල්ල ප්‍රජා මූල මණ්ඩලයට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් පොලිස් නිවාස මාර්ගය සකස් කිරිම සම්බන්ධව. එම ප්‍රජා මූල මණ්ඩලයේ සභාපතිතුමා එම මාර්ගය බැලිමට ගියා. ඔහුට සැකයක් තිබෙනවා. මේ සඳහා රු.485000/= ක මුදලක් තමයි සකස් කර ඇත්තේ. පොලිසියේ එක් මහතෙකු පවසා තිබෙනවා. අපගේ පැත්තේ මාර්ගය බැලිමට නොපැමිණි බව. එම සභාපතිතුමාට ලැබුණු ලිපිය මට දුන්නා. මා ඔහුට ප්‍රකාශ කර සිටියා මේ පිළිබඳව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් විමසා සිටින ලෙස. එහි තාක්ෂණසේවා නිලධාරි මහතාගෙන් හා මහත්මියගෙන් විමසු විට ප්‍රකාශ කර ඇත්තේ මෙම මාර්ගය බැලිමට අප ගියෝ හෙප්පුමුල්ල් ප්‍රදේශයේ කෙනෙකු සමඟ බව. නමුත් මාර්ගය මැන ඇත්තේ මිටර් 93 කි. බෝධිය තිබෙන්නේ ( බුදු පිළිමය ) ළඟ සිට වම්පැත්ත පමණකි. දකුණු පැත්ත ඇස්තමේන්තු කර නැත. එවිට අසා තිබෙනවා. කවුරු සමගද ගියේ කියා. හෙප්පමුල්ලේ ටොරින් කියන මහතා සමඟ තමයි ගොස් ඇත්තේ.පසුව මා සික්කුගේ සරත් මහතාගෙන් විමසා සිටියා. එතුමා දන්නේත් නැහැ. පසුව මා ඔහුට කිවා මේ පිළිබඳ මා ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතාට කියන්නම් .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>.**

ගරු මන්ත්‍රිතුමනි , එහිදි මට දෙන්න පුළුවන් ප්‍රමාණය තමයි ලබා දුන්නේ. එතැන පොලිසියේ ස්ථානාධිපතිතුමා ඉල්ලිමක් කළා පොලිස් නිවාස වලට යන මාර්ගය හොඳටම අබලන් වී තිබෙනවා. ඔබතුමා මට පුළුවන්නම් එය සාදා දෙනලෙස.එහිදි මා ඇස්තමේන්තු මුදල ලෙස රු.500000/=ක මුදලක් දමා ඇත. මෙවර මුදල් වලින් මාර්ගයේ එක් පැත්තක් සාදා දෙන්නම්. ලබන වර ප්‍රතිපාදන වලින් ඉතිරි කොටස සාදා දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා මාස 2කට උඩදි සභා වාරයකදි ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව ගරු මන්ත්‍රිවරුන් 15කුගේ කැමැත්ත මත සම්මත වුණා. අප ගරු මන්ත්‍රිවරු ලෙස මෙම සභාවට පත්කර ටවා ඇත්තේ අප ගම් ප්‍රදේශයේ ජනතාව විසිනි. එම ජනතාවට ලිඛිතවම ලියා දුන්නා ගමේ රටේ සිදුවන දේශපාලනයට වඩා එයා ගිය දෙයක් අප විසින් කරනු ලබන්නේ. ගම ගොඩනැඟිමට මිසක් රටට ගොඩනැගිමටතරම් ජාතික තලයේ දේශපාලනඥයෝ නෙමේ . එම නිසා අද වන විට මෙම ගම නියෝජනය කරනු ලබන ප්‍රාදේශිය දේශපාලඥයින් නිසා අපගෙන් තමයි ජනතාව විමසා සිටින්නේ මේ මාර්ගය සුද්ද කළේ නැහැ. මෙම මාර්ග කැඩිලා . ගමේ විදුලි ආලෝක පහන් නැහැ. එය වැඩ කරන්නේ නැහැ. මේ කාණු ගොඩවෙලා , බෝක්කුව කැඩිලා,ඔබතුමා මොනවාද කියන්නේ. මේ අසවල් ප්‍රජා සමිතිය ක්‍රියාත්මක වන්නේ නැහැ. නමුත් මේ 10ට එක් පුද්ගලයෙකු පැමිණ ඔබතුමාට ප්‍රකාශ කරනවා. මෙ ගම්වල ගරු මන්ත්‍රිවරයෙක් ලෙස පත්වි තිබෙනවා. කලින් වගේ දිස්ත්‍රික් ක්‍රමය නෙමේ. මෙය තිබෙන්නේ ආසන ක්‍රමයට එම නිසා තමයි මා මේ යෝජනාව දමනු ලැබුවේ ගරු සභාවට. මා බලාපොරොත්තු වුයේ මෙම වැඩසටහන තුළ සියළුම මහජන සෞඛ නිලධාරින් ගෙවතු පරික්ෂාවට සහාගි විය යුතුයි.මා දැනටමත් සෞඛ්‍ය අධ්‍යක්ෂකතුමියට දැනුම් දි තිබෙනවා. දිනයක් දිම තමයි තිබෙන්නේ.එම සියළු ගෙවතු පරික්ෂා කර ඩෙංගු සම්බන්ධව අපක්ෂපාති පරික්ෂණයක් පවත්වා මේ ආකාරයට පටන් ගෙන ඒ මංමාවත් , කාණු , ඇළ මාර්ග ආදිය සියල්ල ප්‍රතිසංස්කරණය කර සුද්ද කර මාස 2කට හෝ එම ගම පිරිසිදු කිරිම තමයි මා අදහස් කළේ. මෙය ජාතික තලයේ විය යුතු

දෙයකි. ඊළගට කවුරු ආණ්ඩු කළත් ගමේ ජනතාව ළඟට සමීපතම පුද්ගලයෝ අපි. මේ බලය ලබා ගැනිම සඳහා ජනතාවට සේවය ලබා දිය යුතු බැවින් . එම ජනතාව බලාපොරෝත්තු වන්නේ නැහැ වෙනත් කිසිම දෙයක් අපගෙන්. විශේෂයෙන්ම අප ගම් ප්‍රදේශයේ අප නියෝජනය කර අය අඩුම ගණනේ රජයේ රැකියාවක් වත් ඉල්ලා නැත. ඒ අය ඉල්ලා සිටින්නේ ගමට වැඩක් පමණි. ඔබතුමා කිව්වත් , මේ නිලධාරින්ට ඔබතුමා කිව්වත්, පිට එතුමන්ලා යන්නේ නැහැ.එවිට ඒ පුද්ගලයන් කරනු ලබන්නේ ඔබතුමාගේ වචනය  පමණි.නිවාඩු සමයේ පාසල් ආරම්භ විමට ප්‍රථම දෙමාපියන් විසින් ඉල්ලිමක් කළා. නිවාඩු කාලයේ ක්‍රිඩා පිටියේ වැඩ සුද්ද කරන්න කියා.වැටේ පඩරුල් ටික ගැලවෙනවා. ඊට මාස 2කට පසු කණුවේ භාගයක් සුද්ද වෙනවා. මාසයකට පසු තණකොළ ආදිය ඔවුන්  පුච්චා දමනවා.මෙහෙම තමයි මේ නරගයේ සංවර්ධනය සිදු වුයේ. මෙහේම තමයි මේ නගරයේ පවිත්‍රතාවය සිදු වුයේ. මෙය කොහේහරි වැරද්දක් සිදුවිය යුතු නිසා තමයි  නිවැරුදි විය යුතු නිසාය. අප ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරම්ණිය මහතා වැනි අයගේ ප්‍රදේශ තව සංවර්ධ විය යුතුයි. අලුතින් තාර දැමියයුතු මාර්ග තිබෙනවා. මේ නගර සභාවේ ගස් කොළන් මං මාවත් වල .අපේ ප්‍රධාන කාර්ය ගස් කොළන් කපන්නේ කවුද ?අපේ නගර සභාවෙන් එවැනි දේ සිදු කරනවාද? මාර්ග වසාගෙන . මාර්ග වල යන්න බැහැ. අපි අපේ සේවකයන් යොදවා ඒවා කළ යුතුයි. අඩුම වශයෙන් මාස 2කට සැරයක් මහජනතාව දැනුවත් කර ප්‍රචාරය කර මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ හැකිය. ඔබතුමා මෙය අත්දැකිමටකටවත් මෙය කරන්න.ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික මහතා ප්‍රකාශ කළා ඊයේ දිනයේ සේවකයින් 3කු එම කොට්ඨාශයට එවා ඇති බවට. ඉදලක් නැහැ . අලවංගුවක් නැහැ. එතුමා කඩෙන් ඉදලක් ලබා දි ඇත්තේ. මේ යෝජනාවෙන් අප අදහස් කළේ මෙය නොවේ.මෙය බොහොම කනගාටුදායක තත්වයකි. අපට ඡන්දය දුන් ජනතාව මෙය බලාපොරෝත්තු නොවේ. මාගේ කොට්ඨාශය තුල මේටික කරන්න බලාපොරෝත්තු වෙන්න එපා. මා මීට කලින් උපදෙස් දෙනවා මාගේ කොට්ඨාශයේ මේ කරණා විය යුතුයි කියා. එහෙනම් මා මේ සභාව නියෝජනය කරන්නේ නැහැ. මා පත්කර එවා ඇත්තේ ජනතාව විසිනි. ජනතාව එපා කියන වේලාවට මා යායුතුයි. එම නිසයි මේ ප්‍රකාශ කර සිටින්නේ.නිලධාරින් එයට අනුගත වි ඒ යන්ත්‍ර සුත්‍ර නිසියාකාරව සකස් කර එයට සුදානම් විය යුතුයි. උදයේ 8.30 ට නම් වැඩ ආරම්භ වන්නේ JCB යන්ත්‍රය එතැනට යන්නේ උදේ 11.30 ට . අපට කල්වේලා තිබෙනවා කල් වේලා ඇතිව මේවාට සුදානම් විමට.එය අදාල ගරු මන්ත්‍රිවරයාගේ යුතුකම හා වගකිම. අප කොට්ඨාශයට වඩා විශාල වශයෙන් ප්‍රශ්න තිබෙන කොට්ඨාශ මා දකිනවා. ගරු මන්ත්‍රිවරුන්ගේ අසරණකමකුත් තිබෙනවා. සමහර ඒවාගේ වැඩ කෙරෙන්නේ නැහැ.එම නිසා තමයි මා ප්‍රකාශ කළේ මාස 2කට එක් සුමානයක් එක් කොට්ඨාශයක වැඩ කරන්න කියා. එයට ශක්තියක් යොදවා කළ යුතුයි. මා දන්නේ නැහැ මේ නිලධාරින් මෙයට කෙසේ අනුගත වෙනවාද කියා. ලේකම්තුමිය මේ සභාවට අළුත්. නමුත් ඔබතුමිය මෙය පරිශිලනය කර මෙයට අනුගත වෙන්න. මාගේ දින 7දි මේ විදියට කරන්න බලාපොරෝත්තු වෙන්න එපා කිසිම නිලධාරියෙක්. මා ඉදිරිපත් කරනවා සැලැස්ම . මේ සභාවේ අනුමතිය ලබා දි තිබෙනවා. සභාවේ අනුමත වු පරිදි කරිත්ත කන්ද වසමේ මෙම වැඩසටහන ක්‍රියාත්මක විය යුතුයි.මට කියන්න එපා JCB යන්ත්‍රය කැඩි ඇත. ට්‍රැක්ටරය නැහැ. ජල බවුසරය නැහැ. කියා. මේ අකාරයට සේවකයින් 3කු එයා කරිත්තකන්ද වසමේ වැඩ කටයුතු සිදු කරන්න එන්න එපා.ගරු සභාවේදි මේ බව ප්‍රකාශ කර සිටින්නේ නිලධාරින්ට.

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, පොල්වත්ත අදාහනාගාරයේ පරණ ගොඩනැගිල්ල කඩා ඉවත් කරන්න. එය එච්චර ලොකු නැහැ. දැන් බිමට වගේ සමතලා වී තිබෙන්නේ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

එය ඉවත් කිරිම සඳහා වාර්තාවක් ලබා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එතැන තිබෙනවා ප්‍රධාන කරුණු 2කි. එකක් සුසාන භූමියට ඇතුළුවන ප්‍රදාන මාර්ගයේ බෝක්කුව අසළ ජලය . එය සාදන්න . අපිත් මලගෙදරවල් වල යන විට බනිනවා

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ සඳහා බෝක්කුවක් යොදන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔය ඉවත් කිරිම ගොඩක් කල් ඇයි සිදු නොකරන්නේ.අපගේ හිටපු ලේකම්තුමිය විශාල භාර්ය දූර්ය කර්තාාවක් සිදු කරනු ලැබුවා.හොඳින් වැඩ කටයුතු කළා. අපි එතුමියට බෙහෙවින් ස්තුති වන්ත වෙනවා. අප සභාවෙන් ස්ථාන මාරු ලැබ ගියත් අම්බලන්ගොඩ නගරය වෙනුවෙන් ජනතාවට කරන ලද සේවය අගයා ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් මහතා ප්‍රකාශ කළ අකාරයට ලිපියකින් ප්‍රශංසා කර යවන්න. නව ලේකම්තුමියත් පිළිගන්නවා. එතුමියටත් වැඩ කටයුතු සිදු කරන්න ශුභාශිංසන එක්කරනවා.හොඳින් වැඩ කටයුතු සිදු කරගෙන යන්න කියා. මෙය ගරු මන්ත්‍රිවරු 21කු සමඟ වැඩ කටයුතු සිදු කරනවා කියන්නේ ඉතා භාර්ය දූර්ය කාර්යයකි.ඔබතුමිය කල්පනා කර බලා හොඳින් වැඩ කටයුතු සිදු කරන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්.</u>**

ගරු සභාපතිතුමනි. මා දැන ගැනිමට කැමතියි ගරු දකුණු පලාත් ප්‍රධාන අමාත්‍යතුමා ලක්ෂ 150 ක මුදලක් ලබා දුන්නා නේද අපගේ අදාහනාගාරයේ වැඩ කටයුතු සිදු කරන්න. දැන් කොතෙක් දුරට එය සිදුවේගෙන යනවාද දන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අදාහනාගාරය ඉදිකිරිමට නෙමේ. එහි වාහන අංගනය ඉදිකිරිම සඳහා

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්.</u>**

දැන් කොතෙක් දුරට එය සිදු වි ගෙන යනවද ? එම මුදල් වෙන් වී නැතිනම් සභාවෙන් හරි ඵ මුදල් වෙන්කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මට කරුණු 3ක් ඉදිරිපත් කරන්න තිබෙනවා. මාර්ගයේ රථවාහන නවතා තැබිම පිළිබඳ නාමපුවරු සවිකරන බවට ප්‍රකාශ කළත් එය සිදු වුණේ නැහැ.අම්බලන්ගොඩ නගරයේ කිසිම මාර්ගය නම පිළිබඳ බෝඩ් එකක් නැහැ. එයත් ඔබතුමා කරන බවට පොරෝන්දු වෙනවා.සමාගමකට ලබා දෙනවා කිවුවා. සිමෙන්ති බැමි භාවිතා කරන යෝජනාව ප්‍රතික්ෂේප කරනවා. එය සිදු වුයෙත් නැහැ. සම්බන්ධිකරණ කමිටු සඳහා වෙනදා අපි සහභාගි වුණා. මට හිතුනා එය බොහොම වැදගත් දෙයක් ලෙස හිතුණා. ජනතා නියෝජිතයන් ලෙස එය අපේ අයිතියකි.සම්බන්ධිකරණ කමිටුවට ගියවිට රජයේ නිලධාරින් සියළු දෙනාම මුණ ගැසෙනවා.ඒ පිළිබඳව අපිව දැනුවත් විම් සිදු කරනු ලැබුණේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සම්බන්ධිකරණ රැස්වම් පැවැත්වුයේ නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

එහෙමනම් එය අපේ අයිතියකි. ඇයිද මෙය වැළැඳැම්මට හදන්නේ.ඔබතුමා මේ ගැන මැදිහත් වී අපේ අයිතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.මෙහි සිටිනවා සම්බන්ධිකරණ රැස්වීමේ සභාපතිතුමා මෙහි සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

අතිගරු ජනාධිපතිතුමා මේ වසරේ කැලැන්ඩරය එවා තිබෙනවා. කැලැන්ඩරය එවා තිබුණාට චක්‍ර ලේඛණයේ යම් යම් සංශෝධනයක් නිසා සංවර්ධන කමිටු රැස්වීම තවම පැවැත්වුයේ නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

එහිදි අපට කතා කරන්න කාරණා ගොඩක් තිබෙනවා. අනික් කරුණු දෙක සම්බන්ධයෙන් මා ඔබතුමාගෙන් කෙලින් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

බෝඩ් සම්බන්ධයෙන් පුද්ගලිකව ආයතනයක් තමයි මෙය සිදු කරනු ලබන්නේ. එයත් මෙය පාවිච්චි කරනවා.ලාෆ් ගෑස් සමාගමෙන් සකස් කර ලබා දි තිබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, පාර අයිනේ රථ වාහන නතර කර තැබිම තහනම් කියන බෝඩ් තිබෙන්නේ පොලිසියේ. ඒවා පොලිසියේ තබා ගෙන සිටිම නිවැරිදිය.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පොලිසිය තබන බෝඩ් ත්‍රිරෝද රථ හිමියන් විසින් රැගෙන යනවා.වෙනම ගසා රිම් එකක සවිකර එය ලබා දී තිබුණා

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , මා පවසන්නේ එවැනි දෙයක් නෙමේ. උදාහරණයක් ලෙස පොල්වත්ත මාර්ගයේ පටු ස්ථානයේ රථවාහන නතර කරනවා. මෙය රිම් එකක ගසා තබා හරියන්නේ නැහැ. මෙය ස්ථිර එකක ගැසිය යුතුයි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එවැනි අලුත් තැන්වල ගසනවා නම් පොලිසිය සමඟ එකතු වී කටයුතු කළ යුතුයි. එහෙම වාහන නවතා තැබිම සම්බන්ධව පොල්වත්ත පාරේ එහෙම කිසිම එකඟතාවයක් නැහැ.නැති ස්ථානයක එසේ ගැසිය නොහැකිය.දැනට රථ වාහන නතර කර නොහැකි වන්නේ සරසවිය හංදියේ සිට බස්නැවතුම්පොළ කෙලවර දක්වා පමණි. එහෙම නැතිව අපිට ඕන විදියට බෝඩ් ගහන්න බැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ත්‍රිරෝද රථගාල්වත් නම්කර නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ත්‍රිරෝද රථගාල් නම්කර තිබුණා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

නැහැ. නම්කර තිබුණේ නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

කොහේද ? පොල්වත්තේද ?

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

නැහැ .නගරයේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැන් මැකිලා ඇති. අයිත් අවශ්‍යනම් ගහන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් හිටපු ලේකම්තුමියට ස්තුතිය පුද කළා. ඔබතුමා වැනි සභාපති කෙනෙකු සමඟ රාජකාරි සිදුකිරීම ඉතාම අමාරු කරුණකි. එතුමිය ඇයට පුළුවන් උපරිම අයුරින් නගර සභාවට එම සේවය ලබා දුන්නා. මා අභිනවයෙන් පැමිණි ලේකම්තුමියටත් ඔබතුමා සමඟ නිත්‍යානුකූල විදියට සාර්ථකව වැඩ කටයුතු සිදු කරගෙන යාමට අවස්ථාව ලැබේවා. ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා ප්‍රකාශ කල ආකාරයට අපි ගරු මන්ත්‍රීවරු සභාවට යෝජනාවක් දැමූ විට එය සභාවේ ගෞරවය තැබිය යුතුයි.මගේ සහෝදර ගරු මන්ත්‍රීවරු  සැමදාම යෝජනා සභාවට ඉදිරිපත් කරනවා. නමුත් ඒවා ක්‍රියාත්මක වීමේ ප්‍රමාදය තමයි තිබෙන්නේ. එම නිසා එම යෝජනාවලට ගෞරවාන්තවිත සැලකිමට අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. අපි සියළුමදෙනා ශක්තිමත් වී අපගේ ශක්තිය තුල අපගේ වැඩකටයුතු සිදු කිරිමට කටයුතු කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අපගේ ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා මට චෝදනාවක් කළා. මා එය ප්‍රතික්ෂේප කරනවා. මේ කොට්ඨාශ ක්‍රමයට අනුව ගරු මන්ත්‍රීවරුන් දෙන්නා තුන්දෙනා පත් වුවා එක් කොට්ඨාශයකට. පෝරඹ ප්‍රදේශයේ මා විතරයි ගරු මන්ත්‍රීවරයෙක් ලෙස පත්වුයේ. වැඩ කිරිමේදි අපහසුතාවයටත් පත්වුවා. දේශපාලනයකින් තොරව ඒ පිළිබඳව සහායෝගය ලබා දිම පිළිබඳව ස්තුතිය පුද කරනවා.2018 වර්ෂයේ මා ගරු සභාවට යෝජනා 3ක් ඉදිරිපත් කළා. එකක් රණසූරිය පාරේ පෙට්ටිබෝක්කු . එහෙත් වසරක් පමණ ගියපසු තමයි එය ඉටුකර ගත්තේ. අනිත් දෙකක ඉෂ්ඨ කරගනු ලැබුවේ ඒ ආකාරයෙනි.එතුමාට ඇඟිල්ල දික්කරන්න එපා මට සහායෝගය ලබා දෙනවා කියා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල්  මහතා කතා කරමින්**

මෙය අදාහනාගාරය සම්බන්ධ ප්‍රශ්නයකි. වැඩි වාර ගණනාවක් මුණ ගැසෙන්නේ අදාහනාගාරයේදි. මෙහි විශාල අඩුපාඩු තොගයක් එදා සිටම තිබි  ඇත. වඩිම්බු අතරින් වැසි ජලය බසිනවා. එහි සහායකයාගෙන් ඇසුවිට  බොහෝ විස්තර සපයනු ලැබුවා. මාත් ඒ ගැන සොයා බැලුවා. වඩිම්බු ලෑලි

අඩි 15 ක් පමණ අවශ්‍ය බව ඔහු පැවසුවා. විශේෂයෙන්ම ගැස් තිබෙන කාමරයේ ජනේලය ඇර ගන්න බැහැ.ගැස් තිබෙන එකක විශාල ප්‍රශ්නයකි. ගැස් අරින වට ජනේලය ඇරිය යුතුයි. පිටුපස දොරත් වසන්න බැරි බව පැවසුවා.ඔහු විසින් ඉල්ලීමක් කළා ගැස් කාමරයේ තින්ත ආලේප කර දෙනලෙස. ප්‍රධාන ගේට්ටුව. කර්මාන්ත අංශයේ මේ සඳහා යොමුකළ හැකි එකම පුද්ගලයා යෙදෙවෙනවා ට්‍රැක්ටර් ට්‍රෙලර් සෑදීම සඳහා. එය ඉතාම කල්යන යෝජනාවකි. අපට ට්‍රැක්ටර් රථය සඳහා ට්‍රෙලරයක් මිලදී ගැනීම අවස්ථාව තබාගෙන, අපගේ නගර සභාව සතු වාහන රජයේ හෝ එදිරිසිංහ පුද්ගලික සමාගම වැනි ආයතනයකින් සිදු නොකර සභාවේ සිටින එකම සේවකයා යොදවනවා මේ සඳහා. එවිට පයිප්පයක් කැඩුවිට , ගේට්ටුවක් සෑදීමට වේලාවක් නැහැ. මේ කාර්යයන් සිදු කිරීමට අපේ සේවකයා මේ සඳහා යොදවන ලෙස යෝජනා කරනවා.ට්‍රැක්ටර් ටේලරයක් සදනවා කියන්නේ මාස ගණනාවක් යන බවයි. අවශ්‍ය උපකරණ අඩුවැඩිය එකපාරට ගන්න බැහැ.විශාල කරණාවක් එය.මේ යකඩ , රෝද ආදිය වෙනම ටෙන්ඩර් කළ යුතුයි. ඊට වඩා හොඳයි ට්‍රැක්ටරයක් හා ටේලරයක් මිලදී ගැනීමට.හැබැයි එම සේවකයාට කියා නගර සභාවේ ගේට්ටු දෙක සාදා ගත හැකියි ඉක්මනින්ම.දැන් මේ ගේට්ටු දෙක කැඩී මාස ගණනාවක් වේ. ඔහු මඟින් මෙම කාර්ය ඉටුකර ගත හැකිය. මා අපගේනිලධාරින්ගෙන් විමසා සිටින්නේ කවදාද මේ කර්ය ටික නිමකර ගත හැක්කේ. අඩු වශයෙන් ඊළඟ සභා වාරය වන විට පුළුවනිද මෙය කරන්න. මහ බරපතල කාරණා නෙමේ තිබෙන්නේ.එම නිසා ගේට්ටු දෙක සවිකිරීම, ජනෙල් පියන් ටික සෑදීම අදියයි. සිංහ සමාජයෙන් මල්පැල 300 කට වඩා පරිත්‍යාග කළා. නගරයේ හෝ සියළුම දෙනා මෙහි පැමිණෙනවා. මෙය නිවැරදිව තබ ගැනීම අපි හැමදෙනාටම වගකීමක් තිබෙනවා. එම නිසා දින වකවානුව වෙන්කර මෙය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධයෙන් කිව යුතුයි. සභාව ගනු ලැබූ තීන්දු කරන්න ඕන නිලධාරින් විසිනි. ඔබතුමියගේ ප්‍රධානාත්වයෙනි. මේ සියළු කරන දේවල් ගරු සභාපතිවරයා විසින් කළ යුතුයි යන මතයේ සිටිනවා. එයට නිලධාරි මණ්ඩලයක් සිටිනවා. ඔවුන් මේවා ක්‍රියාත්මක කළ යුතුයි. සමහර මගෙන් විමසන දේවල් වලට මා පිළිතුරු දිය යුතු නැහැ. හිටපු ලේකම්තුමිය සම්බන්ධයෙන් එතුමියට මා පැවසුවේ ස්ථාන මාරුවක් සාදාගෙන යන එක හොඳයි කියා. එතුමියට අපි අද කියනවා නම් හෙටත් ඒ දෙයම කිව යුතුයි.සමහර වේලාවට වැඩක් කරන්න කිව්වාම කෙරෙන්නේ නැහැ. මේ දේවල් සිදු වන්නේ ඒ නිලධාරින් නිසි විදියට මෙහෙයවනු නොලැබීම නිසායි. සේවකයින් වැඩට යනවිට උදැල්ල ගෙන යනවාද කියන එක සභාපතිතුමා බැලිය යුතු නැත.ඒ සඳහා තාක්ෂණසේවා නිලධාරින්, වැඩ කංකනම්ලා, සිටින්නේ ඒ සඳහායි.සෑම තනතුරක්ම දරන ලද අය සිටිනවා. ඒ දරන අය තමයි ඔය වැඩ කරන්නේ. ඒ යටතේ සිටින අයගෙන් වැඩ ගැනීම නිලධාරින්ගේ වැඩකි. නිලධාරින් නිසියාකාරව වැඩ කරන්නේ නැතිනම් සොයා බලා කටයුතු කළ යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

කොපමණ වැරදි තිබුණත් , ඔබතුමා විධායකයා නිසා අපට ඇමතිය යුතුව තිබෙනවා. අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ රණවිරු පවුල් ගණනින් 98කි .ඔවුන් අතරින් සිය ජීවත කැපකිරීම් කළ , සිය ශරිරාංග කැපකිරීම් කර විරුවන් 100 කට අසන්න ගණනකි. රණවිරුවන්ට උපහාර පිදෙන මිහිඳු කුසුම් උපහාර උළෙල එවකට ජනාධිපතිව සිටි ගරු මහින්ද රජපක්ෂ මැතිදුන්ට පිටුවහලක් වුණු ගරු හිටපු අමත්‍යාතුමන් වන විමල් විරවංශ මහතාගේ ප්‍රධානත්වයෙන් 2009.04.07 ඉරුදින බටපොළ ශ්‍රවනාගාරයේදි පැවැත්වේ.එම අවස්ථාවට අප සභාව සතු පුටු 350ක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. ඒ සඳහා සියළුම ගරු මන්ත්‍රිවරුන්ට ආරාධනා කර සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔබතුමා පුටු ඉල්ලා සිටියේ දේශපාලන කටයුත්තකට නෙමේ නේද? ඔය කියන ලද කාරණයට නේද? ගරු මන්ත්‍රිවරු ගිහින් බලා ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, රථවාහන හා ත්‍රිරෝද රථ කමිටුව මෙතෙක්කල් ගත් තීරණ අනුව බස්නැවතුම්පොළේ වැට පිළිබඳවයි. එය එක්කෝ ගැලවිය යුතුයි.මාර්ගය තුල වාහන ඇතුල්වීම සඳහා පමණක් කියන බෝඩ් එක ගහන්න කිව්වා. ඒ නිලධාරින් මහතුන් කිසිම දෙයක් කරන්නේ නැහැ. නවක ලේකම්තුමිය ඔබතුමිය වත් මේ ගැන ක්‍රියා කරන ලෙස ඉල්ලා සිටිනවා.

- **පස්වරු 2.30 ට රැස්වීමේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

රණසි උත්පලා ගුණවර්ධන මිය
ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

අරුණ ප්‍රදීප් මණිමෙල් වඩු,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

**2019 -05–02** වන දින,
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.